වුත්තාලංකාරය

නම් වූ

වුත්තෝදය වර්ණනාව

පටුන වෙත

සංස්කරණය
පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස හිමි.

වුත්තාලංකාරය

නම් වූ

වුත්තෝදය වර්ණනාව

ධර්ම දානය පිණිසයි

සංස්කරණය

පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස හිමි

2021 - 2565

ආශිර්වාදය...

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!

"අත්ථිකෙහි උපඤ්ඤතො මග්ගො"

නිවන සොයන්නන් විසින් මග දැන ගන්නා ලද්දේ ය.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය හා බැඳුනු ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක සිරි ජිනවංශාභිධානයන් වහන්සේ සහ මාතර සිරි ඤාණාරාම මහා සාමීන්ද්‍රයන් වහන්සේලාගෙන් පැවත එන සම්බුද්ධ ශාසනය නැමැති මැණික් මාලාවේ තවත් මැණික් ලෙසින් ප්‍රභාසම්පත්තියට පත්වන ගල්පොතුගොඩ ඤාණවංස ආයස්මතුන් හැඳින්වීමට පුලුවන.

වසර ගණනාවක් ශාසන ප්‍රතිපදාවන්ගෙන් තම දිවිය අලංකාර කරගත්තා පමණක් නොව ශාසන උන්නතිය උදෙසා තමන්වහන්සේ සිදුකරන කාර්‍යන් අතර ඉතා වටිනා දුර්ලභ ශාස්ත්‍රීය හස්ථසාරයක් බඳු "වුත්තාලංකාර" නම් වූ වුත්තෝදය ගණ වර්ණනාව ගතකුරු කිරීම වර්ථමානයට ඉතා කාලෝචිත ය.

තථාගත ජින වචනය තුල පැතිර පවතින ගාථා පංතීන්හි ව්‍යාකරණ රීති තථාගත ආශ්චර්යෙන් නිර්මිත ය.

වත්මන්හි ගාථා පංතියක්, පද බැඳීමක් සිදුකරන්නේ නම් එහි ගුණාත්මකබව විදහාපෑමට අතිශයෙන් මහෝපකාරී වන්නා වූ මෙගත ඉතා හොබනේ ය.

භාෂා ශාස්ත්‍රය වනාහී ඉතා විස්ථාර ඇත්තේ ය. සකුබසින් අරුත්විවරණ මෙන්ම පාලි විවරණද ඇත්තේ ය. හෙළබස තුල අරුත් වියරණයට ද ඉතාම අනර්ග ඉතිහාසයක් තිබේ. වීදගම මහා නෙත්‍රප්‍රසාද මූල මහා ස්වාමින්වහන්සේ ලඝුතන්ත්‍ර බන්ධනය අරුත් වියරණය කාව්‍ය ලක්ෂණ මණිමාලාව මෙන් විය. පද පන්තියක ගණ මෙන්ම ස්වරවේදයේ සිට මාත්‍රා ආදිය ද නිවැරදි ආකාරයට යෙදීමට රචකයා ව්‍යක්ත විය යුතු ය.

එවන් ව්‍යක්ත බවක් "වුත්තෝදය" හැදෑරීමෙන් බුද්ධි වෘධියට හේතු වේ. එවන් ගුණාත්මක අභාෂයෙන් පද බැඳීමට සමත් භික්ෂූන් බිහිවන්නේ නම් එය සම්බුද්ධශාසනයට ඉතා හොබනේ ය.

බොහෝ ශාස්ත්‍රීය පතපොත අතහැරෙන මෙම යුගය තුල මෙවන් ගත් වර්ණනාවන් බිහිවීම අපගේ නිරාමිස සතුටට හේතු වේ.

මෙයින් ජනිතවන කුසල සම්භාරය ඤාණවංස අයස්මතුන්වහන්සේට ස්වකීය අභිමතාර්ථයන් ඉෂ්ඨවීම පිණිස වේවායි ආශිර්වාද කරමි.

"චිරං තිට්ඨතු සද්ධම්ම සාසනං"

මේ වගට

පහලවිටියල ජනානන්ද මහා ස්ථවිර
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහෝපාධ්‍යාය,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති,
ප්‍රධාන අනුශාසක හා ප්‍රධානාචාර්ය.
ශ්‍රී කල්‍යාණධර්ම ආශ්‍රමය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

බුද්ධො පවදතං වරො

වචන කථාකරන්නවුන් අතර සම්මාසම්බුදුරජාණන් වහන්සේ අග්‍ර වන සේක. මෙය ශ්‍රී මුඛ දේශනයකි. ඇත්ත ඇති සැටියෙන් දැක්වීම බුදු සිරිත යි. එය අත්තුක්කංසනයක් නොව සර්වඥ ගතිය යි. බුදු උපත නිවන සඳහා ම ය. තමන් ලත් නිවන අපමණ දෙනාට පෙන්වා දීම හැර වෙනත් බුදු කිසක් නැත. පිරිනිවෙනා තුරු සිදු කළ සේක් ඒ උදර මෙහෙවර ය.

පරම ගම්භීර වූ ඒ දේශනා පරම අගම්භීර ලෙස ලොවට දයාද කළ බවම උන්වහන්සේගේ සර්වඥ භාවය යි. ඒ බුදු දහම තුල ගද්‍ය (නිවැරදි වාක්‍ය) මෙන් ම පද්‍ය (නිවැරදි වූ ද- සිත් කලු වූ ද ගාථා) යන ක්‍රම දෙක ම නො අඩුව පවතී. දීර්ඝ විස්තරයක් කෙටි කිරීම ගාථාවක ලක්ෂණයකි. සුමධුර බව තවත් ලක්ෂණයකි. අර්ථවත් බව වැදගත් ම ලක්ෂණය යි. මේ ලක්ෂණ ඇති ගාථාවක් ඇසීම කණට අමාවකි. සිතට ආහාරයකි. ගාථාවක බරපතල වටිනාකම නම් කට පාඩම් කොට මතක තබා ගැනීමේ පහසුව ය. අර්ථ රසය - ධර්ම රසය හා ශබ්ද රසයෙන් රසබර වූ ගාථාව අසන පිනැත්තියන් ගේ සිත් නිවී - සැනසී - පිබිදී - මෘදු වී - නිරෝගී වී - විනීවරණ වී - නිවනට හැරී යන හැටි කොතරම් අසිරිමත්ද?

දම් සෙනෙවි සැරියුත් මාහිමියන් වහන්සේ ට නිවන් අවබෝධය වූයේ ගාථා පද දෙකක් ඇසීමෙනි. ත්‍රිපිටකයේ ගාථා විශාල ප්‍රමාණයක් අසංඛ්‍ය ගනන් දෙනාට නිවන් දෙරටු විය. ත්‍රිපිටක ධර්මයට එකතු වූ අටුවා - ටීකා - ධර්ම සංග්‍රහ - ව්‍යාකරණ - ඡන්දස් - වංශ කථා - යනාදී ගාථා ග්‍රන්ථවල නමස්කාර ගාථා වුව ද, නිවන් රසය වගුරුවන හැටි විමසමු.

ව්‍යක්ත වූ ද සාර්ථක වූ ද ගාථාවක් නිපදවීම පහසු නොවේ. පාලිභාෂාඥනය තිබූ තරමින් එය නොකළ හැකි ය. ගාථාවක නියම ස්වරූපය ඒමට නම් එහි අක්ෂර නියමය - ගරු ලඝු නියමය - යතිස්ථාන නියමය - යනාදියෙන් ගාථාව ශාස්ත්‍රීය විය යුතුය.

මේ සඳහා අපට ඇති වටිනාම ග්‍රන්ථය වුත්තෝදය යි. එහෙත් එයද එයට ඇති සන්න ද ගැඹුරු ය. එබැවින් වර්තමානයේ එය උගෙනීම බොහෝ දුෂ්කරය. ඒ දුෂ්කර උගැනුම ලබා - ආධුනිකයන්ගේ පහසුව පිණිස මේ වුත්තාලංකාර විස්තරාර්ථ සන්නය නිපද වූ ගල්පොතුගොඩ ඤාණවංස ස්ථවිරයන් වහන්සේ ඊට හොඳම සුදුස්සෙකි. ඒ සුදුසුකම් මෙම පොතෙහි හැඳින්වීමේ ලිපියෙන් ඉබේම කියවී ඇත.

ශ්‍රද්ධාව - වීර්යය - ධර්මකාමිත්වය - පශ්චිම ජනානුකම්පාව - ගුරු ගෞරවය - පින්දීම විවේචන ඉල්ලීම - බුද්ධ ශාසනාදරය යනාදිය ඒ සුදුසුකම් ය. නිවන් මගට බැස ගත්තෝ නම් මෙවැනි පින්වන්තයෝ ය. සහායක සත්පුරුෂයන් සහිත ගත් කතුවරයන් වහන්සේට මේ පින නිවන් පිණිස වේවා.

මෙයට
හැවැන්පැලැස්සේ චන්දවංස ස්ථවිර,
නාථගණේ අරණ්‍යය,
මාස්පොත.

සුභාශිංසනය...

සබ්බග්ලා මිනා,'දිග් - ලහූ භ්‍යා මජ්ඣ'න්ත ගුරූ ජසා;
මජ්ඣ'න්තලා රතෙ'ත'ට්ඨ - ගණා, ගො ගුරු ලො ලහු

(වුත්තෝදය)

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ තථාගත බුදු පියාණන් වහන්සේ වදළ ශ්‍රී බුද්ධ වචනය ගද්‍ය රචනා පද්‍ය රචනා වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක. ගද්‍ය රචනා යනු තම අදහස වාක්‍යයක් බවට පත් කරමින් සකස් කිරීම යි. පද්‍ය රචනා යනු තම අදහස සුඛෝච්චාරණය සහ මටසිලුටු අර්ථය දෙසවනට මිහිර ගෙන දෙන හැටියට ගාථාවන් නිර්මාණය කරමින් ප්‍රස්තාර ගත කොට සකස් කිරීම යි. විශේෂයෙන් ගද්‍ය රචනාවකට අවශ්‍ය කරන අකුරු තුනකින් වෙන්වී යන "ගණ අටක්" ව්‍යාකරණ සාහිත්‍යයෙහි පෙන්වා ඇත.

'සබ්බ්ග්ලා': හැමතැන ගුරු තිබේනම් එය මගණයක - එනම් ගුරු තුනකින් යුක්ත වීමයි. සැම තැන ලඝු ඇත්තේ නගණයයි - ලඝු තුනකින් යුක්ත වීමයි. මුලට ගුරු අකුරක් ඇතිව තිබේ නම් එය භගනයි - එනම් මුල ගුරක් වීමයි. මුලට ලඝුවක් වී යම් පදයක් සැකසේ නම් එය යගන යයි - මුල ලඝුවක්වීමයි. මැද ගුරක් ඇත්තේ එය ජගණයි. අග ගුරක් ඇත්තේ සගණයයි. මැද ලඝුවක් ඇත්තේ එය රගණයයි, අග ලඝුවක් ඇත්තේ එය තගණනයයි.

මෙසේ ඝන අටකින් යුක්ත ව තිබෙන මේ න්‍යාය අපි වෘත්තයකට නංවා තමයි පද්‍ය රචනාවන් ඉගෙන ගත යුතු වන්නේ. ගාථාවක් පාද සතරකින් යුක්ත විය යුතු යි. එක් පාදයක අවම වශයෙන් අකුරු දෙකක් වීම විශේෂයක්. මෙවැනි උදහරණ පවා පැරණි උතුමෝ පෙන්වා ඇත.

බන්ති - යස්මින්;
සා වෙ, - භූසා.

යස්මින්; යමෙක් කෙරෙහි, **බන්ති;** ඉවසීම ඇත්තේ නම්, **වේ;** ඒකාන්තයෙන්, **සා;** ඒ ඉවසීම, **භූසා;** ඔහුට ආභරණයක් හා සමාන වෙයි.

මෙලෙස පාලි භාෂාව තුළින් උගන්වන ගාථා න්‍යාය නිවැරදිව ඉගෙනීමට නිවැරදි පුහුණුවට ඇති එකම ග්‍රන්ථය වුත්තොදය යි. වුත්තොදය හා සැබැඳි බොහෝ ග්‍රන්ථයන් අතීතයේ සකස් වුවත් වර්තමානයෙහි එයට හොඳම නිදසුනක් ලෙස මෙම වෘත්තලංකාර ග්‍රන්ථය අපට පෙන්විය හැක. යෝගාශ්‍රමීය සම්ප්‍රදයට අනුව ඒ අවශ්‍ය කරන බණ දහම් පුහුණුව ලබමින්, පාලි භාෂා ව්‍යාකරණයෙහි චතුර භාවයට පත් වෙමින්, බොහෝ කාලයක් බුරුම රට වැඩවසමින් විවේකයෙන් වැඩ සිටි සමයක තවත් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින්, මේ වුත්තොදයෙහි පිහිටි වෘත්ත නය ක්‍රම විශ්ලේෂණය කරමින් උදහරණ සහිතව වටිනා ග්‍රන්ථයක් සකස් කිරීම ඉතාමත් සතුටට කාරණාවකි.

මේ සත්කාරයෙහි පුරෝගාමීත්වය ගෙන කටයුතු කළ ගල්පොතුගොඩ ඥාණවංස ආයුෂ්මතුන් වහන්සේට නිදුක් නිරෝගී සුව දීර්ඝායු සම්පත් පිණිස හේතු වේවා. මේ වෙනුවෙන් නන් අයුරින් උදව් උපකාර කර කල්‍යාණ මිත්‍ර සෙසු භික්ෂූන් වහන්සේලාටත්, ධර්ම දානමය පින්කමේ දයකත්වය දරන සුපින්වත් හැම දෙනාටත් අපවත් වී වදළ අතිගරු පූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ ප්‍රධාන කොටගත් සම්භාවනීය යෝගාශ්‍රමීය මහ සඟ රුවනටත්, දෙවියන් සහිත සදේවක ලෝකයාටත්, උතුම් චතුරාර්ය සත්‍යාවබෝධයෙන් නිවන් අවබෝධය පිණිස හේතු වාසනා වේවායි ආශීර්වාද කරමිහ.

මෙයට කාරුණික,
ශ්‍රී කළ්‍යාණී යෝගාශ්‍රම සංස්ථා මහා ලේඛකාධිකාරී,
ත්‍රිපිටකාචාර්‍ය, ත්‍රිපිටක විශාරද,
ශ්‍රී ගුණවරධන යෝගාශ්‍රමාධිපති
කහගොල්ලේ සෝමවංස ස්වාමින්වහන්සේ
ශ්‍රී කළ්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව,
ගල්දූව, කහව,
අම්බලන්ගොඩ.

පූර්විකාව

සා මාගධී මූලභාසා, නරා යායාදිකප්පිකා;
බ්‍රහ්මානො ච'ස්සුතාලාපා, සම්බුද්ධා චාපි භාසරෙ.

(පදරූපසිද්ධි)

ඒ මාගධී හෙවත් පාළි භාෂා තොමෝ ලොව හටගත් මුල්ම භාෂාව බවත්, ආදිකල්පික මනුෂ්‍යයන්ගේ භාෂාව බවත්, බ්‍රහ්මයන්ගේ භාෂාව බවත්, අස්සුතාලාපයන් විසින් පළමු ව කතා කරන බවත්, සියළු සම්බුදු රජාණන් වහන්සේලා විසින් භාවිතා කරන භාෂාව බවත් ද වන්නී ය. සියළු සත්වයන් තම තමන්ගේ අදහස් හුවමාරු කිරීමේ ක්‍රමය/මාධ්‍ය භාෂාව නමින් හඳන්වනු ලැබේ. (**භාසන්ති සත්තා අත්තානං අජ්ඣාසයං පකාසෙන්තීති භාසා**). මාගධී, **පාවචනං, නන්ති** යන වේවචනයන්ගෙන් සමලංකෘත වූ භාෂාව ඉතා රමණීය ය. "**මගධෙ භවා මාගධී, මාගධිකානං භාසා මාගධී භාසා** - මගධයෙහි හටගත් බැවින් මාගධී නම් ය, මගධ වැසියන්ගේ භාෂාව මාගධී භාෂාව නම් වේ." "**පධානං වචනං පාවචනං** - ප්‍රධාන වූ වචනය හෙවත් බුද්ධ වචනය පාවචන නමි." "**අත්ථං පාති රක්ඛතීති පාළි** - බුද්ධවචනාර්ථය විනාස වන්නට නොදී රකින බැවින් ද පාළි නම් වේ." "**තෙලං විය පත්ථරිත්වා පවත්තතීති තන්ති** - තෙලක් මෙන් පැතිරී පවතින බැවින් **තන්ති** නම් වේ." "**තන්ති භාසං මනොරමං**" යැයි බුදුගොස් ස්වාමීහූද පාළි භාෂාවට **තන්ති** යැයි කියූහ.

මෙකී පාළිය පුරාණ ඇදුරෝ "**දේසනා පාළි, අට්ඨකථාපාළි, ටීකාපාළි, පකරණපාළි**" යනුවෙන් කොටස් හතරකට පෙන්වූහ.

ධර්ම - විනය නිකාය සහ ත්‍රිපිටක වශයෙන් වදළ පෙළදහම දේශනා පාළිය යි. එහි අර්ථ කථනය හෙවත් දුරාවබෝධ තැන් සුබොධ කරනු පිණිස රචිත අත්ථසාලිනී ආදී ග්‍රන්ථයෝ අටුවා නමි. අටුවාවන්හි දුෂ්කරාර්ථ සුගම ලෙස ලියවුනු පාළීහු ටීකා නමි. මින් බැහැර වූ යම් යම් අදහස් පෙරටුකොට සුධීන් විසින් කරන ලද ගද්‍ය, පද්‍ය, ගද්‍ය-පද්‍ය වශයෙන් කාව්‍ය නිර්මාණයන් ඇතුළත් බොහෝ ග්‍රන්ථ ප්‍රකරණ පාළි නම් වේ.

ව්‍යාකරණ

යම් භාෂාවක් හැසිරවීමේදී වචන සමූහයක් ගලපමින් ඉදිරිපත් කරන අර්ථ ප්‍රතිපාදනය ව්‍යාකරණ යි. වදළේ මැයි "**සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං** - බුද්ධවචනය අර්ථ සහිත ව්‍යාකරණ සහිත සර්වසම්පූර්ණ දේශනාවක් බැවින් හුදෙක් මෙහි කියවෙන ව්‍යාකරණය හෙවත් නිරුක්තිය නොදැන භාෂාවක් හැසිරවීමේ දුෂ්කරතාවය මෙසේ ප්‍රකාශිතය.

යො නිරුත්තිං න සික්ඛෙය්‍ය, සික්ඛන්තො පිටකත්තයං;
පදෙපදෙ විකඛ්ඛෙය්‍ය, වනෙ අන්ධගජො යථාති.

(කවිදප්පණනීති/ මොග්ගල්ලාන පඤ්චිකා)

ව්‍යාකරණය නොදැන ත්‍රිපිටකය ඉගෙන ගෙන සිටියත්, අන්ධ වූ වල් ඇතෙකු මෙන් පදයක් පදයක් පාසා සැක උපදී. එසේ හෙයින් ම අටුවාවෙහි දසවිධ ව්‍යඤ්ජන ප්‍රභේදයන් මතු කරමින් ව්‍යාකරණ න්‍යාය සුමට කරමින් අතීත ඇදුරෝ කච්චායන, මොග්ගල්ලායන සහ මහාසද්දනීති වශයෙන් ව්‍යාකරණ සම්ප්‍රදයන් තුනක් පාළි භාෂාවෙහි අර්ථ විකාශයට එකතු කළහ.

උගත් ඇදුරෝ මෙකී සම්ප්‍රදයන්ට අනුයාත වෙමින් සංග්‍රහ ග්‍රන්ථ, ගද්‍ය-පද්‍ය ග්‍රන්ථ පොළොන්නරු යුගයෙන් ආරම්භ වී අද දක්වා විකාශ කරති.

වුත්තෝදය

සංස්කෘත ව්‍යාකරන සම්ප්‍රදයට අනුව ලියවුනු වුත්තරත්නාකරය ප්‍රධාන කොටගත් බොහෝ ග්‍රන්ථයන් ආශ්‍රයෙන් නිශ්‍රයෙන් අතීතයේ වැඩසිටි සංඝරක්ඛිත ස්වාමිපාදයන් විසින් පාළි පද්‍ය හෙවත් ගාථා නිර්මාණයට ඇවැසි කරුණු එකතු කරමින් වුත්තෝදය නම් වූ ග්‍රන්ථයක් නිර්මාණය කළේ ය.

වුත්තෝදයෙහි කතෘ දැක්වීම

සුත්තාභිධම්මවිනයෙසු පවීණ ඤුණො[1],
සංසිස්සරොපි විභුධො මුනිධම්මකාමො;
සො සංඝරක්ඛිතයතී අතිපූජනීයො,
වුත්තොදයම්පි ලිඛිතං පරිවාරකෙහි.

[1] පූර්විකාව, පෙරවදන, පිදුම යන තැන්වල ඇති සියලුම ගාථාවන්ගේ ගරු ලහු ස්වරූපය ඉගෙනගන්නන්ගේ අවබෝධය පිණිස ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත.

සුත්ත අභිධම්ම විනයෙසු, සූත්‍ර අභිධර්ම විනය යන පිටකයන්හි; **පවීණ,** ප්‍රවීණ (ප්‍රගුණ ඇති); **ඤාණෝ,** නුවණ ඇති; **සංසිස්සරෝ අපි,** සංඝයාට ඊෂ්වර වූ (නායක වූ); **විභූධො,** ශ්‍රී විභූතිය ඇති; **මුනිධම්මකාමො,** බුදුරජාණන් වහන්සේ දේශිත ධර්මයට කැමති; **අතිපූජනීයො,** අතිපූජනීය වූ; **සො සංඝරක්ඛිතයති,** ඒ සංඝරක්ඛිත නම් යතිවරයන් වහන්සේ; **පරිවාරකෙහි,** පරිවාර ග්‍රන්ථයන් සමග; **වුත්තෝදයං අපි,** වුත්තෝදය නම් වූ ග්‍රන්ථය ද; **ලිඛිතං,** ලියන ලදී.

සූත්‍ර අභිධර්ම විනය යන පිටකයන්හි ප්‍රවීණ ඤාණය ඇති සංඝයාට ඊෂ්වර වූ ශ්‍රී විභූතිය ඇති බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මයට කැමති අති පූජනීය වූ සංඝරක්ඛිත නම් වූ යතිවරයන් වහන්සේ විසින් මෙම වුත්තෝදය නම් ග්‍රන්ථය ලියන ලදී.

පරිවාර ග්‍රන්ථ

සම්බන්ධචින්තසහබුද්දකසික්ඛටීකා,
සුබොධලංකරවිසෙසසුසද්ධසිද්ධි;
නෙකෙහි ගන්ථකරණෙ අතිජෙකපත්තො,
භාසාය මාගධිකතං සුචිරප්පවාහි.

සම්බන්ධචින්ත, සම්බන්ධ චින්තාව; **සහ,** සහිත; **බුද්දකසික්ඛටීකා,** බුද්දකසික්ඛා ටීකාවත්; **සුබොධලංකර,** සුබෝධාලංකාරයත්; **විසෙස,** විශේෂිත වූ; **සුසද්ධසිද්ධි,** සද්ධසිද්ධි යන; **නෙකෙහි,** (මෙසේ) නොයෙක්; **ගන්ථකරණෙ,** ග්‍රන්ථ කරණයන්හි; **අතිජෙකපත්තො,** අති දක්ෂ වූ (උන්වහන්සේ); **මාගධි භාසාය කතං,** මගධ (පාලි) භාෂාවෙන් කළ (සියළුම ග්‍රන්ථ); **සුචිරප්පවාහි,** මනාව බොහෝකල් පවතීවා.

සම්බන්ධචින්තාව සහිත බුද්දකසික්ඛා ටීකාවත් සුබෝධාලංකාරයත් විශේෂිත වූ සද්ධසිද්ධි යන නොයෙක් ග්‍රන්ථ කරණයන්හි අති දක්ෂ වූ ඒ ස්වාමින්වහන්සේ මගධ භාෂාවෙන් කළ සියළුම ග්‍රන්ථයෝ මනාව බොහෝ කල් පවතීවා.

වුත්තෝදය යනු

කච්චායනෙන සහිතඤ්ඤවබ්‍යාකතෙහි,
ථෙරෙන යං විරචිතං වරසද්දසත්ථං;
වුත්තොදයම්පි සකලං කතපජ්ජලීලං,
සාධූහි සම්මතමිමං අතිජොතයං තං.

කච්චායනෙන සහිතං, කච්චායන ව්‍යාකරණය සහිත; **අඤ්ඤ,** අන්‍ය වූ; **ව්‍යාකතෙහි,** ව්‍යාකරණයන් සමග; **ථෙරෙන,** තෙරුන් වහන්සේ විසින්; **විරචිතං,** විරචිත; **යං,** යම්; **වරසද්දසත්තං,** උතුම් ශබ්ද ශාස්ත්‍රයක් වේ ද, **අපි සකලං,** එසේම සියලු (වුත්ත සහිතව); **කත,** කළ; **පජ්ජලීලං,** පද්‍ය ලීලාවක් වූ; **වුත්තොදයං,** වුත්තෝදය නම් ග්‍රන්ථය; **සාධූහි,** සාධු ජනයා විසින්; **සම්මත,** සම්මත කළ; **ඉමං,** මෙය; **අතිජොතයං තං,** අතිශයින් බබළන්නේ වෙයි.

කච්චායන ව්‍යාකරණය සහිත අන්‍ය වූ ව්‍යාකරණයන් සමග තෙරුන් වහන්සේ විසින් විරචිත යම් උතුම් ශබ්ද ශාස්ත්‍රයෙක් වේ ද, එසේම සියලු වුත්ත සහිතව කළ පද්‍ය ලීලාවක් වූ වුත්තෝදය නම් ග්‍රන්ථය සාධු ජනයා විසින් සම්මත කළ මෙය අතිශයින් බබළන්නේ වෙයි.

වුත්තෙහි සක්කතමනෙකපදත්ථසිද්ධිං,
සම්බන්ධකාරකනයෙහි සුසංකතං තං;
භාසාය පාලිවිදුනා අභිබොධයං තං,
සම්භාවිතම්පි සතතං සුපසත්ථ ගන්ථං.

වුත්තෙහි, වුත්තයන්ගෙන්; **සුකත,** මනාව කළ (එසේ ම); **අනෙක,** නොයෙක්; **පදත්ථසිද්ධිං,** ගාථා පදයන්ගේ අර්ථ සිද්ධිය; **සම්බන්ධකාරකනයෙහි,** ඒ හා සම්බන්ධ වූ කාරක නොහොත් නය ක්‍රමයන්ගෙන්; **සුසංකතං තං,** මනාව සකස්කරන ලද ඒ (වුත්තෝදය නම් ග්‍රන්ථය); **පාලිභාසාය,** පාලි භාෂාවෙන්; **විදුනා,** දක්ෂ වූ ඤාණවන්තයා විසින්; **අභිබොධයං තං,** විශේෂයෙන් අවබෝධ කළ යුතු; **සතතං,** නිරන්තරයෙන්; **සම්භාවිතං අපි,** මනාව භාවිතා කළයුතු වූත්; **සුපසත්ථ ගන්ථං,** මනා ප්‍රශස්ථ ග්‍රන්ථයකි.

වුත්තයන්ගෙන් මනාව කළ එසේ ම නොයෙක් ගාථා පදයන්ගේ අර්ථ සිද්ධිය හා සම්බන්ධ වූ කාරක නොහොත් නය ක්‍රමයන්ගෙන් මනාව සඳහන්කරන ලද ඒ වුත්තෝදය නම් ග්‍රන්ථය පාළි භාෂාවෙහි දක්ෂ වූ ඤාණවන්තයා විසින් විශේෂයෙන් අවබෝධ කළයුතු වූත් නිරන්තරයෙන් මනාව භාවිතා කළයුතු වූත් මනා (වටිනා) ප්‍රශස්ථ ග්‍රන්ථයකි.

වුත්තාලංකාරය යනු

ටීකා සහත්ථ වචනාපි පුරාකතා යා,
තෙ මිස්සිතෙහි කතවුත්තහිලංකරං යං;

ලංකාය භික්ඛුගණනාය හිතාවහං තං,
ව්‍යාඛ්‍යාපදත්ථසහිතං ච නිදස්සනං තං.

පුරාකතා, අතීතයේ කළ; **යා,** යම් ඒ; **ටීකා සහ අත්ථ වචනා අපි,** (ඒ වුත්තෝදය) ටීකා සහිත අර්ථ විවරණයෝ වෙත් ද; **තෙ මිස්සිතෙහි,** ඒ සියල්ල මිශ්‍ර කරමින්; **යං කතං වුත්තාභිලංකාරං,** කළ යම් වුත්තාලංකාරයක් වේ ද; **තං ව්‍යාඛ්‍යා,** එය ව්‍යාඛ්‍යා; **පදත්ථ සහිතං ච,** පද අර්ථ සහිතව ද; **නිදස්සනං ච,** නිදර්ශන ද සහිත වූ ද; **තං,** එය; **ලංකාය,** ලංකාවෙහි; **භික්ඛුගණනාය,** භික්ෂු සමූහයාට; **හිතාවහං,** හිත-සුව පිණිස වන්නේ ය.

අතීතයේ කළ ඒ වුත්තෝදය ටීකා සහිත අර්ථ විවරණයෝ වෙත් ද, ඒ සියල්ල මිශ්‍ර කරමින් කළ යම් වුත්තාලංකාරයක් වේ ද, එය ව්‍යාඛ්‍යා, පද අර්ථ, නිදර්ශන සහිත වූ ද, එය ලාංකික භික්ෂු සමූහයාට හිත-සුව පිණිස වන්නේ ය.

වුත්තාලංකාර කතෘ දැක්වීම

ඒවුක් විහාර නහසී චිරවාසයන්තො,
සො ඤාණවංස ගරු ථෙර පරත්ථකාමො;
තෙනෙව සංලිඛිත වුත්තභිලංකරං තං,
සම්බුද්ධසාසනජලෙ සුචිරං වහාතු.

ඒවුක් විහාර, ඒ-අවුක් විහාර නැමැති; **නහසී,** අහස් කුසෙහි; **චිරවාසයන්තො,** බොහෝ කාලයක් වාසය කරමින්; **පරත්ථකාමො,** අන් අයට හිත කාමී වූ; **සො ඤාණවංස ගරු ථෙර,** ඒ ඤාණවංස නම් වූ ගරු තෙරුන් වහන්සේ (නමක් වේ ද); **තෙනෙව,** උන්වහන්සේ විසින් ම; **සංලිඛිත තං,** මනාව ලියන ලද ඒ; **වුත්තභිලංකරං,** වුත්තාලංකාරය (නම් වූ ග්‍රන්ථය); **සම්බුද්ධසාසන,** සම්බුද්ධ ශාසනය නැමැති; **ජලෙ,** ජලයෙහි; **සුචිරං,** බොහෝ කාලයක්; **වහාතු,** ගලා බසීවා.

ඒ-අවුක් විහාරය නැමැති අහස්කුසෙහි බොහෝ කාලයක් වාසය කරමින් අන් අයට හිතකාමී වූ ඒ ඤාණවංස නම් වූ ගරු තෙරුන් වහන්සේ නමක් වේ ද, උන්වහන්සේ විසින් ම මනාව ලියන ලද ඒ වුත්තාලංකාරය නම් වූ ග්‍රන්ථය සම්බුද්ධ ශාසනය නැමැති ජලයෙහි බොහෝකලක් ගලා බසීවා.

නිගමන සහ ප්‍රාර්ථනාව

වස්සෙ ජිනස්ස සතපඤ්චපිවීසධිකෙ,
සංසොධිතම්පි සුපටිග්ගහිතං බුධෙහි;
භික්ඛූපි පාඨකජනා පණිහිත්ව සම්මා,
නිබ්බානමුත්තමසුඛාය සුබොධයන්තු.

ජිනස්ස, ජිනේන්ද්‍රයන්වහන්සේගේ; **වස්සෙ,** වරෂයෙහි; **සතපඤ්චපිවීසධිකෙ,** (පිරිණිවනින්) සියවස් විසිපහකට අධික වූ කල්හි; **බුධෙහි,** ඤාණවන්තයන් විසින්; **සංසොධිතම්පි,** සංසෝධනය කරන ලද; **සුපටිග්ගහිතං,** මනාව පිළිගන්නා ලද (යම් ඒ ග්‍රන්ථයක් වේ ද); **භික්ඛූපි,** භික්ෂූන් වහන්සේලාද; **පාඨකජනා,** කියවන සියළු ජනයෝ ද; **සම්මා,** මනාව; **පණිහිත්ව,** සිත පිහිටුවාගෙන; **උත්තමං,** උතුම් වූ; **නිබ්බානං සුඛාය,** නිර්වාණ සුවය පිණිස; **සුබොධයන්තු,** (එම වුත්තාලංකාර ග්‍රන්ථය) මනාව අවබෝධ කරත්වා.

ජිනේන්ද්‍රයන් වහන්සේ පිරිනිවී අවුරුදු සතවර්ෂ විසි පහකට අධික වූ කල්හි (අවුරුදු 2500 කට වඩා ඉක්මවූ කල්හි එනම් 2567 හි) ඤාණවන්තයන් විසින් සම්පාදනය කරන ලද හා මනාව පිළිගන්නා ලද යම් ඒ ග්‍රන්ථයක් වේ ද, එය භික්ෂූන් වහන්සේලා ද, පාඨක ජන කොටස් ද, මනාව සිත පිහිටුවාගෙන උතුම් වූ නිර්වාණ සුවය පිණිස එම වුත්තාලංකාර ග්‍රන්ථය මනාව අවබෝධ කරත්වා.

"සබ්බෙසත්තා භවන්තු සුඛිතමුදිතත්තා"

මෙයට
ත්‍රිපිටකාචාර්‍ය, අභිධර්ම විශාරද, ධර්ම කීර්ති ශ්‍රී
දිගන සුගතවංස ස්ථවිර

ප්‍රස්තාවනා

ඡන්දස් ශාස්ත්‍රය

අදහස් සන්නිවේදනයේ දී පද්‍ය භාවිතය බොහෝ භාෂාවල දක්නට ලැබෙන්නකි. මාගධී හෙවත් පාළි භාෂාවෙහි ද පද්‍ය භාවිතය ඉතා සුලභ බව ත්‍රිපිටකය හා ඒ ආශ්‍රිත ග්‍රන්ථ අධ්‍යයනයේ දී පෙනී යයි. **ගාථා** යනු ද පද්‍යයන්ට ම නමකි. බුදුරජාණන් වහන්සේ බොහෝ ධර්ම දේශනාවන් පද්‍ය හෙවත් ගාථා මාධ්‍යය උපයෝගී කර ගනිමින් සිදු කර ඇති බව අප එදිනෙද සජ්ඣායනා කරන මංගල සූත්‍රය, රතන සූත්‍රය, මෙත්ත සූත්‍රය ආදි කොට ඇති දහස් ගණනක් සූත්‍ර අනුසාරයෙන් වටහා ගත හැකිය. බුද්ධ භාෂිත වූ ද ශ්‍රාවක භාෂිත වූ ද ධම්මපද, උදාන, ඉතිවුත්තක, ථේරගාථා ආදි වූ බොහෝ ග්‍රන්ථවල අන්තර්ගතය ගාථාවන් ම ය.

අන් භාෂාවල මෙන් ම පාළි භාෂාවෙහි ද පද්‍ය බන්ධනය සිදු වන්නේ යම් කිසි රීති රාමුවකට අනුකූලව ය. පද්‍ය බන්ධනයේ දී අනුගමනය කළ යුතු රීතීන් දක්වන ශාස්ත්‍රයට **ඡන්දස් ශාස්ත්‍රය** යැයි කියනු ලැබේ. ඡන්දස් ශාස්ත්‍රය ඉතා පෞරාණික වූවකි.

"කප්පො බ්‍යාකරණං ජොති - සත්ථං සික්ඛානිරුත්ති ච,
ඡන්දෝවිචිති චෙතානි - වෙදඞ්ගානි වදන්ති ඡ"

(සීලක්ඛන්දවග්ග අභිනව ටීකා)

යන බ්‍රාහ්මණ සමයෙහි එන වේදංග සය දක්වන ගාථාවෙහි "**ඡන්දෝවිචිති**" කියා දැක්වෙන්නේ ඡන්දස් ශාස්ත්‍රය යි.

වුත්තෝදය

ඡන්දස් ශාස්ත්‍රය ඉගෙනීමට පිංගල, යජදේව, කාලිදසාදි පඬිවරුන් විසින් සංස්කෘත භාෂාවෙන් විරචිත ග්‍රන්ථයන් මිස පාළි ඡන්දස් ග්‍රන්ථයක් අතීතයේ නො තිබුණි. සංස්කෘත හා පාළි භාෂාවන් බොහෝ සෙයින් සමාන බැවින් පාළි ඡන්දස් ග්‍රන්ථයක අවශ්‍යතාවක් අතීතයේ නො තිබෙන්නට ඇත. සංස්කෘත ඡන්දසට අනුකූල වූ ගාථාවන් බුද්ධ භාෂිතාදියෙහි සුලභව දක්නට ලැබීමෙන් ද මේ බව පසක් වෙයි. පසු කාලීනව සංස්කෘත දැනුම නොමැත්තවුන්ට ඡන්දස් ශාස්ත්‍රය ඉගෙනීමට ඇති බාධාව දුටු ලංකාද්වීපයෙහි වැඩ සිටි සංඝරක්ඛිත මහාසාමි නමැති තෙරණුවන් විසින් මාගධී හෙවත් පාළි භාෂාවෙන් ඡන්දස් ග්‍රන්ථයක් කරනු ලැබීය. ඒ මේ වුත්තෝදය ග්‍රන්ථය යි.

සංඝරක්ඛිත මහාසාමි

සංඝරක්ඛිත මහාසාමි යනු පොළොන්නරු යුගයේ වැඩ සිටි මහතෙර නමකි. මහා පරාක්‍රමබාහු රජ සමයේ වැඩ සිටි ටීකාචාර්‍ය්‍ය සාරිපුත්ත සංඝරාජ මහ තෙරණුවන්ගේ හා ගලතුරුමුල විහාරවාසී සීල තෙරණුවන්ගේ ශිෂ්‍යභූත වූ මෙම තෙරණුවෝ ඒකශ්‍රුතියෙන් ගාථා දහස් ගණනක් ධාරණය කිරීමට සමත් වූ දස මහා පණ්ඩිත තෙරුන් වහන්සේලා අතරින් එක් නමක් බව ශාසනාවතාරයෙහි සඳහන් වන අතර දඨෝපතිස්ස නම් රජුගේ මුණුබුරෙක් වන බව මහාවංශයෙහි සඳහන් ය. බුද්දකසික්ඛාටීකා, සුබෝධාලංකාරය, පයෝගසිද්ධි, සම්බන්ධචින්තා, සුසද්දසිද්ධි යන ග්‍රන්ථයන් ද මෙම තෙරණුවන් විසින් රචිත ඒවා ය.

වුත්තෝදය අධ්‍යයනයෙහි වැදගත්කම

ඡන්දස් ශාස්ත්‍රය යනු පර්‍යාප්තිධරයෙකු විසින් අවශ්‍යයෙන් ම උගත යුත්තකි. "එවං ගාමෙ මුනී චරෙ" යන තැන 'මුනි' යන්න 'මුනී' කියාත්, "අත්තසම්මාපණිධී ච" යන තැන 'පණිධි' යන්න 'පණිධී' කියාත් දීර්ඝ කොට දේශනා කර ඇත්තේ ඡන්දනුරක්ෂණය පිණිස ය. ඡන්දස් ශාස්ත්‍රය ගැන නො දැනුවත්කම නිසා පාළි පාඨයන් නොයෙක් අයුරින් වෙනස් කොට සජ්ඣායනය කරනු අසන්නට ලැබේ. "එතං බුද්ධාන සාසනං" යන්න "එතං බුද්ධානුසාසනං" කියා වෙනස් කිරීම මීට සරල සාධකයකි. අර්ථයට දැඩි හානියක් නො වුන ද බුද්ධ වචනයට ඉන් සිදුවන්නේ අගතියකි. ඡන්දස් ශාස්ත්‍රය පර්‍යාප්තිධරයෙකු විසින් අවශ්‍යයෙන් ම උගත යුත්තක් වන්නේ එබැවිනි.

තව ද කාලානුරූපී ව වෙනස් ව ඇති ගාථාගත පාඨ අතුරින් නිවැරදි පාඨයන් නිගමනට කිරීමටත්, ත්‍රිපිටකගත වූ නොයෙක් වර්ගයේ ගාථාවන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමටත්, නිවැරදිව ගාථා

රචනය කිරීමටත් ඡන්දස් දැනුම අත්‍යාවශ්‍ය වේ.

වුත්තාලංකාරය

වුත්තෝදය නමැති මාගධී ඡන්දස පහසුවෙන් ඉගෙනීමට උපකාර කර ගත හැකි සිංහල ග්‍රන්ථ වර්තමානයේ දුර්ලභ ය. එබැවින් එවැනි ග්‍රන්ථයක අවශ්‍යතාව දුටු මියන්මාරයෙහි එා අවු භාවනා මධ්‍යස්ථානයේ වැඩ වසන පූජ්‍ය ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේ විසින් ලංකාවේ දී හා මියන්මාරයේ දී වුත්තෝදය ග්‍රන්ථය දෙතුන් වතාවක් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ගුරු ඇසුරෙහි ලද දැනුම හා විශේෂයෙන් ම අභිධජ මහාරට්ඨගුරු නන්දමඤ්ජූ තෙරුන් විසින් විරචිත ඡන්දමේදනී නම් වූ මියන්මාර් ග්‍රන්ථයෙහි ඇතුළත් දැනුම ද පැරණි සිංහල සන්නයන්ගෙන් ගත් දැනුම ද එක් කොට වුත්තාලංකාරය නමැති මෙම විස්තරාත්මක විවරණය බොහෝ වෙහෙස වී සකසන ලදී. සියලු ගාථාවන්ගේ අර්ථ විවරණ හා විස්තරයන්ට අමතරව ගාථාවක් පාසා ගණ, ගරු, ලහු ආදිය වගු මගින් පෙන්වා දී තිබීම නිසා ඕනෑම අයෙකුට මෙම ග්‍රන්ථය පරිශීලනයෙන් ඡන්දස් ශාස්ත්‍රය පහසුවෙන් උගත හැකි බව කිව යුතු ය. මෙම ග්‍රන්ථය සකස් කිරීමේ දී අවශ්‍ය දැනුම ලබා දීමෙන් හා සංස්කරණයෙන් මා හට ද සම්බන්ධ වීමට ලැබීම ගැන සතුටු වෙමි.

මෙම ග්‍රන්ථය පරිශීලනයෙන් බොහෝ දෙනාගේ ගාථා කෞශල්‍යය දියුණු වේවා!

වුත්තොදයාව්හයසුභාවිතඡන්දසින්ධුං,
යෙ ඉච්ඡකාපි තරිතුං න පහොන්ති සාමං;
තෙ ඤාණවංසයතිථෙරපණීතවුත්තා
ලඛකාරනාවමභිරුය්හ තරන්තු පාරං.

යෙ; යම් ශිෂ්‍ය කෙනෙක්, **වුත්තොදයා+ව්හය+සුභාවිත+ඡන්ද+සින්ධුං;** වුත්තෝදය නමැති සම්භාව්‍ය වූ ඡන්දස් සාගරය, **තරිතුං;** තරණය කිරීමට, **ඉච්ඡකාපි;** කැමති මුත්, **සාමං;** තම තමා විසින් තනිව ම, **න පහොන්ති;** තරණය කිරීමට නොහැකි වෙත් ද, **තෙ;** එම ශිෂ්‍යයෝ, **ඤාණවංස+යතිථෙර+ පණීත+වුත්තාලඛකාර+නාවං;** ශීලාදී සංයමයෙන් යුතු ඥනවංස නැමැති තෙරුන් විසින් කරන ලද වුතතාලංකාරය නැමැති නෞකාවට, **අභිරුය්හ;** නැග, **පාරං;** එහි පරතෙරට, **තරන්තු;** තරණය කරත්වා!

වුත්තෝදය නමැති සම්භාව්‍ය වූ ඡන්දස් සාගරය තරණයට කැමැති මුත් තම තමා විසින් තනිව තරණයට අසමර්ථ වූ අය වෙත් ද, ඔවුහු ශීලාදිසංයමයෙන් යුතු ඥනවංශ නමැති තෙරුන් විසින් කරන ලද වුත්තාලංකාරය නමැති නෞකාවට නැග එහි පරතෙරට තරණය කරත්වා!

පැල්මඩුල්ලේ විජිතානන්ද හිමි
(සාසනධජ ධම්මාචරිය)

හැඳින්වීම

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

අතීත භාරතීය පඬිවරුන් සංස්කෘත භාෂාවෙන් රචනා කර ඇති ග්‍රන්ථයන්හි ඇති ශ්ලෝක ආදිය රචනා වී ඇත්තේ පද බැඳීම් නීතියක් මූලික කරගෙන ය. භාරතීය බොහෝ උගතුන් පද බැඳීමෙහි ලා බොහෝ හපන්කම් පෙන්වා තිබෙන්නේ ඔවුන්ගේ පද බැඳීම් ශාස්ත්‍රයේ දැනුම ලොවට කියා පාන්නට මෙනි. එම ගාථා, ශ්ලෝක කියවන ගායනා කරන ජනී ජනයාගේ සිත් සතන් නන්දනීය වනවා සේ ම එය සිත්හි දරා ගැනීමට ද පහසු වනවා නොඅනුමාන ය. මෙකල ගාථාවන් රචනා කිරීමේ දී මූලික වශයෙන් ගාථා බන්ධන නීතියක් මූලික කරගෙන ම සිදු කරයි. එම නීති මාලාව අතීතයේ ගලතුරුමුල වෙහෙර විසූ සීල ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍ය සංඝරක්ඛිත ස්වාමිපාදයන් වහන්සේ විසින් රචිත "වුත්තොදය" නම් ග්‍රන්ථයෙහි සැකවින් විස්තර කෙරේ. එය පාළි භාෂාවෙන් පමණක් ලියූ ග්‍රන්ථයකි. එය දැනට අප භාවිතා කරන ඡට්ඨසංගායනා නම් ත්‍රිපිටක මෘදුකාංගයෙහි දැකිය හැකි ය. මා දන්නා පරිදි මෙකල සොයාගැනීමට පහසු ගාථා බන්ධනය ගැන ලියවී ඇති එකම ග්‍රන්ථය එය යි.

පසුව ආචාර්ය පණ්ඩිත ලබුගම ලංකානන්ද ස්වාමින්වහන්සේ විසින් ඉහත කියන ලද වුත්තෝදය ග්‍රන්ථයට ම සන්නයක් ද ඇතුලත් කරමින් "**ලංකානන්දව්‍යාඛ්‍යා සහිත වුත්තෝදය**" නම් ග්‍රන්ථයක් 1946 දී සම්පාදනය කර ඇත. ඊට අමතරව පූජ්‍ය උදම්මිට ධම්මරක්ඛිත තිස්ස ස්ථවිරපාදයන් වහන්සේ විසින් ද වුත්තෝදය නම් වූ පාලි ග්‍රන්ථයට ම සන්නය, ටීකාව හා උදහරණ ගාථා ද එක් කරමින් "**වුත්තෝදය සන්නය විවරණය හා ටීකාව**" නම් ග්‍රන්ථයක් 1916 දී සම්පාදනය කර ඇත. එම ග්‍රන්ථයන් ද්වයත් හා අප එම වුත්තෝදය ඉගෙනීමෙන් ලද දැනුමත්, මියන්මාරයේ වුත්තෝදය සම්බන්ධව ලියැවුණු ග්‍රන්ථයනුත් උපකාර කරගෙන, ලංකාවෙන් තුරන් වී ගෙන යමින් පවතින ගාථා බන්ධනය යළි ගොඩ නගනු වස් අප විසින් මෙම වුත්තාලංකාර නම් ග්‍රන්ථය හැකි තාක් සරල ලෙස සම්පාදනය කරන ලද්දේ පාලි භාෂාව උගත්, ගාථා බන්ධනය ගැන දැනුමක් ලබා ගැනීමට කැමති ගිහි පැවිදි පින්වතුන් හට පහසුවෙන් මෙම ග්‍රන්ථය පරිශීලනය කොට ගුරුවරයෙක් නොමැතිව ගාථා බන්ධනය ගැන දැනුමක් ලබා ගැනීම උදෙසා ය.

මෙම වුත්තෝදය ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී උපකාර කරගත් ග්‍රන්ථයක් වන පූජ්‍ය උදම්මිට ධම්මරක්ඛිත තිස්ස ස්ථවිරපාදයන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද "**වුත්තෝදය සන්නය විවරණය හා ටීකාව**" නම් ග්‍රන්ථය අවසානයෙහි තවත් ගාථා දෙකක් ඇතුලත් වී ඇත. එම ගාථා ද්වය ඡට්ඨසංගායනා ත්‍රිපිටකයේ ඇතුලත් වන වුත්තෝදයේ හා ලබුගම ලංකානන්ද ස්වාමින්වහන්සේ විසින් සම්පාදනය කරන ලද "**ලංකානන්දව්‍යාඛ්‍යා සහිත වුත්තෝදය**" නම් ග්‍රන්ථයන්හි ඇතුලත් නොවේ. එය පසු කාලීනව ඇතුලත් වීමක් ද නැතහොත් පසුව වුත්තෝදයෙන් හැලීයාමක් ද යන්න ස්ථිරව ම කිව නොහැකි බැවින් හා එම ගාථා ද්වය අභාවයට යෑම වැළැක්වීම පිණිස එම ගාථා යුගලය මෙහි ඇතුලත් කරමි. එය කලින් කියන ලද "**වුත්තෝදය සන්නය විවරණය හා ටීකාව**" නම් ග්‍රන්ථයෙහි අංක 138 හා 139 වන ගාථා ලෙස දක්වා ඇත. එම ගාථාවන් මෙසේ ය.

❖ **යෙනන්තතන්ත රතනාකරමන්ථනෙන,**
මන්ථාවලොල්ලසිතඤ්ඤවරෙන ලද්ධා;
සාරාමතාතිසුඛිතා සුඛයන්තිවඤ්ඤෙ,
තෙ මෙ ජයන්ති ගුරවො ගුරවො ගුණෙහි.

යෙ, යම් ආචාර්යවරයෙක්; **අනන්තතන්තරතනාකර**, නොයෙක් අර්ථවත් ග්‍රන්ථයන්ගේ; **මන්ථනෙන**, හැදෑරීමෙන්; **මන්ථාවල**, මන්දර පර්වතය සේ; **උල්ලසිත**, ප්‍රකාශිත වූ; **ඤ්ඤවරෙන**, උත්තම වූ ප්‍රඥාවෙන්; **ලද්ධා**, ලබන ලද; **සාරාමතා**, සාරවත් (ලෞකික නොවූ) පණ්ඩිත මත ඇතිව; **අතිසුඛිතා**, අතිශයින් සුවපත් වූවාහු ද; **අඤ්ඤෙව**, සෙසු පණ්ඩිත බුද්ධි ඇත්තවුන් ද; **සුඛයන්ති**, සැපයට පමුණුවද් ද; **ගුණෙහි ගුරවො**, ගුණයෙන් මහත් වූ; **තෙ මෙ ගුරවො**, ඒ මාගේ ආචාර්යවරයෝ ද; **ජයන්ති**, ජයග්‍රහණය කරත්වා.

යම් ආචාර්යවරයෙක් නොයෙක් අර්ථවත් ග්‍රන්ථයන් හැදෑරීමෙන් මන්දර පර්වතය සේ ප්‍රකාශිත වූ උත්තම වූ ප්‍රඥාවෙන් ලබන ලද සාරවත් පණ්ඩිත මත ඇතිව අතිශයින් සුවපත් වූවාහු ද, සෙසු පණ්ඩිත බුද්ධි ඇත්තවුන් ද සැපයට පමුණුවත් ද, ගුණයෙන් මහත් වූ ඒ මාගේ ආර්යවරයො ද ජයග්‍රහණය කරත්වා.

❖ **පුඤ්ඤෙන තෙන ජිනපත්ති යද භවෙය්‍ය,**
තාවාහ සාරිතනුජොව සතීමතීමා;
තෙජො තිහෙතුපටිසන්ධි අමොඝරූපී,
ලක්ඛ්‍යා ධිතීබලපසත්ථගුණො භවෙය්‍යං.

තෙන පුඤ්ඤෙන, ඒ පුණ්‍ය කර්මය හේතුකොට ගෙන; **යද,** යම් කලෙක්හි; **ජිනපත්ති,** සර්වඥපද ප්‍රාප්තිය; **භවෙය්‍ය,** වන්නේ ද; **තාව,** ඒතාත් කල්; **අහං,** මම; **සාරිතනුජොව,** සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙන්; **සතීමතීමා,** සති ප්‍රඥ ඇත්තෙක් ද; **තෙජො,** තේජස් ඇත්තකේ ද; **තිහෙතුපටිසන්ධි,** ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන්; **අමොඝරූපී,** අවලක්ෂණ නො වූ රූප ඇත්තෙක් ද; **ලක්ඛ්‍යා,** ලක්ෂ්මියෙන් හා; **ධිතිබලපසත්ථගුණො,** ධෛර්යයෙන් හා බලයෙන් ප්‍රශස්ත වූ ගුණ ඇත්තෙක් ද; **භවෙය්‍යං,** වෙම්වා.

යම් කලෙක්හි එම පුණ්‍ය කර්මය හේතුකොටගෙන සර්වඥපද ප්‍රාප්තිය වන්නේ ද, ඒ තාක් කල් මම සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙන් සතිමත් ප්‍රඥ ඇත්තෙක් ද, තේජස් ඇත්තෙක් ද, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ඇතිව අවලක්ෂණ වූ රූප නැත්තෙක් ද, ලක්ෂ්මියෙන් ධෛර්යයෙන් හා බලයෙන් ප්‍රශස්ත වූ ගුණ ඇත්තෙක්ද වෙම්වා.

මෙම ගාථා ද්වය වුත්තෝදය නිගමනයෙහි දැක්වෙන "සීලන්තරායතනවාසික" යන ගාථාව මෙන් "වසන්තතිලකා" වුත්තයට අනුව සැකසී ඇත. එය පැහැදිලි වීම පිණිස මෙම ගාථා දෙකෙහි ගරුලහු ස්වරූපය ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත.

වුත්තාලංකාරය ගැන

පළමුවෙන් මෙම ග්‍රන්ථය කියවන්නන් හට පහසු වීම පිණිස ඉහත කී "**ලංකානන්දව්‍යාඛ්‍යා සහිත වුත්තෝදය**" නම් පොතෙන් ගත් උපකාරයත් ඇතුව පදර්ථ සන්නය ඇතුළත් කළ අතර එහි යම් යම් තැන් සුදුසු පරිදි වෙනස් කළෙමු. එසේ කරන විට පැරණි සිංහල ඉවත් කොට සරල සිංහල යොදා සකස් කළේ පැරණි සිංහලයට අගෞරවයකින් නොව මෙම පොත කියවන්නන් හට පහසු වීම උදෙසා ම ය. තවද සියළු වුත්තයන් ගරු ලහු බෙද දක්වන ලද්දේ ද පහසු වීම පිණිස ම යි. යම් කෙනෙක් වුත්තයක නමක් දැන එහි ගරු ලහු ස්වරූපය සොයන්නේ නම් එයට පහසු වීම පිණිස මෙම ග්‍රන්ථයට වුත්ත නාමයන්ගෙන් පමණක් යුත් පසුපිටක් ද ඇතුලත් කළෙමි. හැකි තාක් උදහරණ ගාථා ත්‍රිපිටක අටුවා ටීකාවෙන් ගෙන ඇතුළත් කළේ ද තේරුම් ගැනීමට පහසු වීමට යි. යම් කෙනෙක් වුත්තෝද පාලිය පාඩම් කරන්නේ නම් එයට පහසු වීම පිණිස වුත්තෝදය පාලිය පමණක් ග්‍රන්ථයේ මුලින් ඇතුලත් කළෙමු. වුත්ත නාමයන්ට දී ඇති නිරුත්ති පදයන් ද හැකිතාක් සරළ ලෙස මෙම ග්‍රන්ථයට ඇතුලත් කළෙමු. වුත්තෝදය ඉගෙන ගන්නවුන්ගේ දැනුම වඩාත් වර්ධනය කිරීමට සමත් වන ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් බුරුමබසින් රචිත "**වුත්තෝදයබෝධි**" නම් ග්‍රන්ථයේ දක්වා ඇත. එය ද මෙහි ඇතුලත් කළේ දැනුම සොයන්නන්ට එය පහසුවෙන් ලබා ගැනීම පිණිස යි. ඊට අමතරව මෙම ග්‍රන්ථයෙහි එන පළමු පරිච්ඡේදයෙහි හා සයවන පරිච්ඡේදයෙහි එන ගාථාවලත් පෙරවදන, ප්‍රස්ථාවනාව, පිදුම යන ලිපිවල ඇති ගාථාවලත් ගරු ලහු බෙද දක්වන ලද ප්‍රස්තාරයන් හා එම ගාථාවන්ගේ වුත්තනාමයන් ද ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත. එසේ කළේ ගාථාබන්ධනය ඉගෙන්ගන්නවුන් හට එය ප්‍රයෝජනවත් වේ යැයි සිතුන බැවිනි.

අපගේ උත්සාහය

අප විසින් පළමු වර මෙම වුත්තෝදය පොත උගත්තේ ත්‍රිපිටකාචාර්ය පූජ්‍ය දිගන සුගතවංස ස්වාමින්වහන්සේගෙනි. බුරුම රටට වැඩම කර සිටි ගරු ස්වාමින්වහන්සේගේ කටයුතු පසෙක ලා අපගේ ඉල්ලීම නිසා ම අප කෙරේ කරුණාවෙන් ස්වාමින්වහන්සේගේ වටිනා කාලය වැය කරමින් උගන්වන්නට යෙදුණත් යම් යම් කාරණා හේතුවෙන් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට නොහැකි විය. ත්‍රිපිටකය මැනවින් හදරා ඇති ඒ ස්වාමින්වහන්සේ වුවද මෙම පොත ඉගෙන ගෙන ඇත්තේ තනිවම ය. ඒ වෙනකක් නිසා නොව වුත්තෝදය ඉගෙන ගැනීමට ගුරුවරයෙකු සොයා ගැනීමට අපහසු වූ බැවිනි. තනිවම උගත්තේ වුව ද අපහට මෙම පොත මනාව වටහාගත හැකි ආකාරයෙන් කියා දෙන ලදී. වැඩ අධිකව වුවත් පසුව සෝදුපත් බලා මෙම පොතට ඒ ස්වාමින්වහන්සේ විසින් කරන ලද ගාථා බන්ධනයෙන් යුත් වටිනා පෙරවදනක් සපයාදීමට ද කාරුණික විය.

දෙ වෙනි වරට මා හට මෙම පොත හැදෑරීමට අවස්ථාවක් සපයා දුන්නේ පූජ්‍ය පැල්මඩුල්ලේ විජිතානන්ද ස්වාමින්වහන්සේ විසිනි. බුරුම රටට පැමිණ, බුරුම භාෂා ඥනය මැනවින් ප්‍රගුණ කර ධර්මය උගෙන අභිවංස, ධර්මාචරිය ආදී උසස් විභාගයන් සමත් වූ පූජ්‍ය විජිතානන්ද ස්විමින්වහන්සේ බුරුම බසින් උගත් වුත්තෝදය පොත අපට ඉගැන්වූවා පමණක් නොව මෙම පොත සම්පාදනයේ දී සෝදුපත් බලමින්

අඩු පාඩු සකස් කරමින් ඉතාමත් වෙහෙසක් දරමින් තමන්ගේ වැඩ කටයුතු තිබියදීත් මෙම පොත සකස් කිරීමෙහිලා උපකාර කිරීම නිසා ම මේ ආකාරයෙන් පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිද්දෙන් පොතක් ඉදිරිපත් කිරීමට හැකිවිය. ඒ ස්වාමින්වහන්සේ මෙම ග්‍රන්ථය බුරුමයේ දී උගත් නිසා මත්තාවුත්ති නිද්දේසයෙහි ඇති යම් වුත්තයන්ගේ අසම්පූර්ණ අර්ධයන් බුරුම ස්වාමින්වහන්සේලා විසින් සකස් කර ඇති බවත් එම වුත්තයන් පැහැදිලි වීම පිණිස එම අර්ධයන් මෙයට එක් කිරීම යෝග්‍ය යැයි සඳහන් කළ බැවින් එයද මෙම ග්‍රන්ථයට එක් කළෙමි. (ඒවා "වුත්තෝදය පාළියෙහි ඇතුලත් නොවේ" යනුවෙන් සඳහන් කර ඇත.) මෙම ග්‍රන්ථයට බුරුම බසින් රචිත ග්‍රන්ථයකගෙන් උපුටාගත් වුත්තයන්ගේ නාමයන්ට දී ඇති නිරුත්තිපදයන් එක් කිරීමේ දී, එම ස්වාමින්වහන්සේ එය සිංහලයට පරිවර්ථනය කිරීමෙහිලා මහත් සේ උපකාර විය. එසේ ම ඒ ස්වාමින්වහන්සේ මෙම පොතට වටිනා ප්‍රස්තාවනාවක් ද සපයා දෙන ලදී.

වරක් ඉගෙන ගත් බැවින් දෙ වෙනි වර පහසුවෙන් අවබෝධ කර ගත හැකි වූ නිසා මුලින් අසම්පූර්ණ වශයෙන් පරිසණක ගත කර තිබූ මෙම පොත දෙ වෙනි වර ඉගෙනීමෙන් පසු මෙසේ සම්පූර්ණ පොතක් වශයෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ කළෙමි.

පුණ්‍යානුමෝදනය

එම ස්වාමින්වහන්සේලා දෙනම නොසිටින්නට මෙවැනි පොතක් කිසිසේත් සම්පාදනය නොවෙනු ඇත. යම් කෙනෙක් මේ පොත පරිශීලනය කරමින් ගාථා බන්ධනය පිළිබඳ යම් දැනුමක් ලබා ගනිමින් යම් කුසලයක් රැස් කෙරේ ද, ඒ සියළු කුසල් ඒකාන්තයෙන් ම ඒ ස්වාමින්වහන්සේලා නිසා ම බව නිර්ලෝභීව කිව හැකිය. ඒ ස්වාමින්වහන්සේලාට මේ කුසලය පැතූ උතුම් බෝධියකින් නිවන් අවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

මෙම ග්‍රන්ථයට වටිනා ලිපියක් ලබා දෙමින් මෙහි වටිනාකම වැඩි කරදුන් අප අචාර්යෝත්තම අති පූජනීය පහලවිටියල ජනානන්ද මාහිමිපාණන් වහන්සේට උතුම් නිරෝගී සුව ලබමින් විංසත් ශතවර්ෂාරධික කාලයක් ආයු සැප වළඳ අවසානයේ පතන්නාවූ උතුම් බොධියකින් නිවන්සුව අවබෝධය පිණිස ම මෙම කුසලය හේතු වාසනා වේවා!

මෙම ග්‍රන්ථය බලා මෙහි සුදුසුකම් දැක සතුටු වී අප කෙරෙහි අනුකම්පාවෙන් මෙම ග්‍රන්ථය අගය කරමින් ලිපියක් ලබා දුන් අප ආචාර්යෝත්තම අති පූජනීය හැවැන්පැලැස්සේ චන්දවංස මාහිමිපාණන් වහන්සේට මෙම සත් ක්‍රියාවේ කුසල බලයෙන් නිදුක් නිරෝගී සුව ලබමින් විංසත් ශතවර්ෂාරධික කාලයක් ආයු සැප වළඳ අවසානයේ පතන්නාවූ බොධියකින් උතුම් නිවන්සුව අවබෝධය පිණිස ම හේතු වාසනා වේවා! එසේ ම එම ලිපිය මා වෙත යොමු කිරීමට මහත් උත්සාහයෙන් කටයුතු කළ අති පූජනීය කන්දෙගෙදර විමලධම්ම ස්වාමින්වහන්සේටත් ප්‍රාර්ථනීය උතුම් බෝධියකින් අමාමහ නිවන සාක්ෂාත් වේවා!

මෙම ග්‍රන්ථය බලා අප කෙරෙහි අනුකම්පාවෙන් වටිනා ලිපියක් ලබා දුන් ශ්‍රී කළ්‍යාණ යෝගාශ්‍රම සංස්ථා ලේඛකාධිකාරී අප ආචාර්යෝත්තම අති පූජනීය කහගොල්ලේ සෝමවංස මාහිමිපාණන් වහන්සේට මෙම කුසල බලයෙන් නිදුක් නිරෝගී සුව ලබමින් විංසත් ශතවර්ෂාරධික කාලයක් ආයු සැප වළඳ අවසානයේ පතන්නාවූ බොධියකින් උතුම් නිවන්සුව අවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

ශ්‍රී කළ්‍යාණී යෝග්‍රාශ්‍රම සංස්ථාවේ මුදුන් මල් කඩක් බඳු අපවත්වී වදළ අති පූජනීය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ, අප හට සාමණේර උපාධ්‍යාත්වයෙන් අනුග්‍රහ කරමින් අපව පැවිදි භූමියට ඇතුලත් කළ අති පූජනීය කඩවැද්දූවේ ශ්‍රී ජිනවංස මාහිමිපාණන් වහන්සේ, අප හට උපසම්පදා උපාධ්‍යාත්වයෙන් අනුග්‍රහ කරමින් අපව උපසම්පදා භූමියට ඇතුලත් කළ අති පූජනීය දේවගොඩ ශ්‍රී මංගලසිරි මාහිමිපාණන් වහන්සේ, අපට කර්මාචාර්යත්වයෙන් අනුග්‍රහ කළ අති පූජනීය මාවතගම ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ, අපහට අවවාද අනුශාසනා දෙමින් අපව නිවරදි මගට යොමු කළ අති පූජනීය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ, මා පැවිදි මගට යොමුකළ අති පූජනීය දෙම්පේ ඤාණරතන ස්වාමින්වහන්සේ යන ස්වාමින්වහන්සේලා ප්‍රධාන අපවත්වී වදළ සියළුම ස්වාමින්වහන්සේලාට මෙම කුසලය උතුම් නිවන් සුව පිණිසම හේතු උපනිශ්‍රය වේවා! මෙම කුසල බලයෙන් අප කල්‍යාණමිත්‍ර මහා සංඝරත්නය නිර්මල සම්බුද්ධ ශාසනය බබළවමින් සද කල් වැජඹේවා!

මේ වුත්තෝදය ග්‍රන්ථය ඡට්ඨසංගායනා නම් මෘදුකාංගයට ඇතුලත් නොවන්නට අපට කිසිසේත් ම එය සොයාගැනීමට පහසු නොවනු ඇත. ඒ ග්‍රන්ථය සම්බන්ධයෙන් කටයුතු කළ සියළු දෙනාටමත් මෙම ග්‍රන්ථය අතීතයේ සම්පාදනය සංස්කරණය කළ සියළු ම ස්වාමින්වහන්සේලාටත් පූජ්‍ය ලබුගම ලංකානන්ද

ස්වාමින්වහන්සේ වැනි මෙම ග්‍රන්ථය පහසු අවබෝධය පිණිස සකස් කරන්නට යෙදුණු ඒ සියළුම ස්වාමින්වහන්සේලාටත් මේ කුසලය උතුම් නිවන් අවබෝධය පිණිස ම හේතු උපනිශ්‍රය වේවා!

මෙම ග්‍රන්ථය අවසානයේ සෝදුපත් බලමින් ග්‍රන්ථයෙහි නොතේරෙන තැන් හැකිතාක් දුරට සරළ ලෙස සකසමින් නොගැළපෙන තැන් පෙන්වමින් මහත් වෙහෙසක් ගෙන ඉතා කැපවීමෙන් උදව් උපකාර කළ පූජ්‍ය කඩුවෙල අතුලඤ්ඤ ස්වාමින්වහන්සේටත්, ග්‍රන්ථයේ ඇති වුත්තයන්ගේ පදගත අර්ථයන් පරිඝණක ගත කිරීමේ දී උදව් කළ පූජ්‍ය කටුවන ධම්මසාර ස්වාමින්වහන්සේටත් මෙම පින උතුම් වූ නිවන් පිණිස ම හේතු වේවා!

විශේෂයෙන් ම මෙය මුද්‍රිත ග්‍රන්ථයක් හැටියට ඔබ අතට පත් වූයේ පූජ්‍ය දිගන සුගතවංස ස්වාමින්වහන්සේගේ කැපවීම නිසා ම ය. මේ ග්‍රන්ථය සුදුසු තැන් වෙත යොමු කරමින්, අවශ්‍ය ලිපි ලබා ගනිමින්, මුද්‍රණය සඳහා දයකත්වය ලබා දෙමින් අවසානය දක්වා ම ගත් උත්සාහය අප්‍රමාණ ය. එම කුසල බලයෙන් එම ස්වාමින්වහන්සේ පතන්නා වූ උතුම් බෝධියකින් නිර්වාණය සුවසේ අවබෝධ වේවා!

උතුම් බුද්ධ දේශනාවට අනුව යමින් මෙම ධර්මදානමය සත්ක්‍රියාවට සහසම්බන්ධ වූ පින්වත් සියළු දෙනාට ම මේ කුසල බලය ප්‍රාර්ථනීය උතුම් බෝධියකින් අජර අමර වූ නිවන් සුවය, සුවසේ ම අවබෝධය පිණිස හේතු උපනිශ්‍රය වේවා!

අප මෙලොවට ජනිත කර හදවඩා ගත් පින්වත් සුජීවත්ව සිටින මෑණියන්ටත් අභාවප්‍රාප්ත පියාණන්ටත් සහ නොයෙක් අයුරින් උදව් උපකාර කළ පින්වත් ඥාතිහිතමිත්‍ර සියළු දෙනාටමත් නන් අයුරින් මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම උදෙසා උදව් උපකාර කළ සියළුම දෙනාටත් මේ කුසල බලය උතුම් නිවන් සුව පිණිස ම හේතු උපනිශ්‍රය වේවා!

ආයාචනය සහ පැතුම

කොතෙක් සෝදුපත් බැලුව ද මෙහි අක්ෂර දෝෂයන්, නොපැහැදිලි තැන් තිබෙන්නට ඉඩ ඇත. ඒ ගැන සියළු දෙනා ක්ෂමාව භජනය කරත්වා. මෙහි යම් වරදක්, නො තේරෙන තැනක් හෝ ඇතුලත් විය යුතු දෙයක් ඇත්නම් අප කෙරේ අනුකම්පාවෙන් අපට පෙන්වා දෙත්වා. අප විසින් හැකි අයුරින් එම වරද නිවැරදි කර ගන්නටත් නොතේරෙන තැන් සරල ලෙසත් සකසන්නටත් උත්සාහ ගන්නෙමු. සුධීහු මෙම පොත පරිශීලනය කොට ගාථා බන්ධන ඥනය වැඩි දියුණු කර ගනිත්වා!, එමගින් නිවන් දෙරටුව විවර කර ගැනීම පිණිස කුසල ධර්මයන් රැස් කරගනිත්වා! යන්න අපගේ පැතුම යි.

සියළු දෙනාටම තෙරුවන් සරණයි !

මෙයට,

ගල්පොතුගොඩ ඤාණවංස හිමි.

එා-අවුක් ආරණ්‍යය සේනාසනය,

මියන්මාරය.

(gnanavansa1985@gmail.com)

"සබ්බං රසං ධම්මරසෝ ජිනාති"

සියලුම රස අතර ධර්ම රසය ශ්‍රේෂ්ඨ යි. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදළ ධර්මය නිවැරදිව ඉගෙනීම සහ සුබෝච්චාරණයට බෙහෙවින් උපකාර වන දේශනා අතර වුත්තෝදය නමැති ග්‍රන්ථය ඉතාමත් වටිනා ග්‍රන්ථයක් බව අපි අසා ඇත. නමුත් කිසිම දවසක එවැනි ග්‍රන්ථයක් කියවන්නට තරම් අපට ඤාණයක් තවමත් නොලැබුනත් එහි ඇති වටිනාකම අපේ ස්වාමීන් වහන්සේලාගෙන් විමසා දැනගෙන තිබෙන නිසා එම වුත්තෝදය නමැති පාලි ගාථාවන් නිර්මාණය කිරීමට උපකාර වන විශේෂ ව්‍යාකරණ ග්‍රන්ථය ඇසුරු කරගෙන මේ සකස්වෙන වුත්තාලංකාරය නමැති ව්‍යාකරණ ග්‍රන්ථය වර්තමානයේ භික්ෂූන් වහන්සේලාට ගුරුවරයෙක් නැතුව නමුත් ඒ ග්‍රන්ථය ස්වඋත්සහයෙන් කියවා එහි තිබෙන හැටියට අර්ථය හසුරුවා පාලි ගාථාවක් නිවැරදිව නිර්මාණය කරන්න හැකි බවයි අපි තේරුම් ගෙන තිබෙන්නේ.

ගිහි පින්වතුන් හැටියට අපට මේ ග්‍රන්ථය ලොකු ප්‍රයෝජනයක් නොවුනත් මේ සාසනය ගුණ පිළිවෙත් පුරා ගන්න ධර්මය ඉගෙනගන්න ස්වාමීන්වහන්සේලාට බෙහෙවින් උපකාර වන ග්‍රන්ථයක් බැවින් අපි හැම දෙනාම එකට එකතු වෙලා මේ ග්‍රන්ථය මුද්‍රණය කොට නොමිලයේ බෙදා දීමට අධිෂ්ඨාන කර ගත්තෙමු.

විශේෂයෙන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව එදත් අදත් වටිනා මහා පිං කෙතක්. ගුණ-ධර්මයන්ගෙන් පිරිපුන් නානාවිධ භාවනා ක්‍රම ධර්ම මාර්ගයෙන් ඔපවත් වූ ගුණමිණි පඬිරුවන් පහළවුණු පිං කෙතක්. අතිගරු පූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සමුප්පාදකත්වයෙන් සකස් වූ යෝගාශ්‍රමීය පින්කෙතක, අතිගරු පූජනීය මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ, අතිගරු පූජනීය මහකුඹුක්වැවේ උත්තරවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ සංසපිතෘන් වහන්සේලාගෙන් සෝභමාන වූ පින්කෙතකි.

ඒ පින්කෙත තුළ එදත් අදත් එවැනි ගුණ පිළිවෙත් පුරන භික්ෂූන් බොහෝ වහන්සේලා වැඩ වෙසෙති. එම නිසාම බුරුම රට වැඩවාසය කරන ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේ විසින් උන්වහන්සේට කල්‍යාණ මිත්‍රත්වයෙන් උපකාර වන ස්වාමීන් වහන්සේලාගේ ඇසුරද උපකාර කොටගෙන උගත් පාලි ගාථා බන්ධනයෙහි අර්ථ න්‍යාය නොහොත් අත්පොත ඉතාමත් වටිනා සරල වචන වලින් ග්‍රන්ථයක් ලෙස සකස් වූ මෙහොතේ විශේෂයෙන් අපි භාග්‍යවන්ත වුණා ඒ ග්‍රන්ථය මුද්‍රණය කොට ධර්ම දනමය වශයෙන් යෝගාශ්‍රමීය භික්ෂූන් වහන්සේලා අතර පමණක් නොව සමස්ත භික්ෂූන් වහන්සේලා අතර බෙදහරින්නට.

මේ සත්කාරයෙහි අපට මග පෙන්වූ ඒ පූජනීය දිගන සුගතවංස ස්වාමීන් වහන්සේටත් නිදුක් නිරෝගී සුව දීර්ඝායුෂ ලැබේවා, මෙම වටිනා සත්කාරයේ යෙදුන අතිපූජනීය ගල්පොතුගොඩ ඤාණවංස ස්වාමීන් වහන්සේට තව බොහෝ කාලයක් මේ සිදුකරගන්න ධර්ම සේවාව අඛණ්ඩව මුදුන් පත්කර ගන්නට ශක්තිය ධෛර්යය වීර්ය වාසනාව ලැබේවා.

වර්තමානයෙහි මේ යෝගාශ්‍රම සංස්ථාවේ වැඩ වාසය කරන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ ප්‍රධාන කොට ගත් සියලුම ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ට ද නිදුක් නිරෝගී සුව දීර්ඝායුෂ ලබන්නට ආශිර්වාද වේවා. මෙම ධර්ම දනමය පින්කමට අප හා සම්බන්ධ වූ කල්‍යාණ මිත්‍ර සියලු දෙනාට ඒ වගේම විශේෂයෙන් පූජනීය ඤාණවංස වහන්සේගේ මවුතුමිය ප්‍රධාන කොටගත් ඒ පින්වතුන්, ඒ වගේම පින්වත් ජනක මහත්මා ඇතුළු කල්‍යාණ මිත්‍ර සියලු දෙනාට නිදුක් නිරෝගී සුව දීර්ඝායුෂ ලබන්නටත්, තව තවත් මේ ධර්ම යාත්‍රාව අඛණ්ඩව මුදුන්පත් කරගන්න ආශිර්වාද වේවායි ප්‍රාර්ථනාවත්,

ඒ වගේ මෙතෙකින් රැස්කරගත්ත කුසලය අපවත් වී වදළ අති ගරු පූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන නායක මාහිමිපාණන් වහන්සේටත්, මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ ප්‍රධාන කොටගත් ඒ අපවත් වී වදළ සියලුම ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට මතු ලොව්තුරා බුදු බව පිණිස හේතු වේවා. ඒ වගේම අපට කල්‍යාණ මිත්‍රත්වයේ සිට අභාවයට පත් පින්වත් කමල් ඇඹුල්දෙනිය මහත්මයා ඇතුළු හිතෙෂී සැමදෙනාට නිවන් සම්පත් පිණිස දෙවියන් සහ සදේවක ලෝකයාට චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් නිවන් අවබෝධය පිණිස ම මේ උතුම් ධර්ම දනමය කුසලය හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමි!

මෙයට,
රුවන් රාජපක්ෂ
+61-449604353

පිදුම

වුත්තොදයස්ස පරිවාරසරූපිවුත්තා;
ලංකාරගන්ථකතවා යතිඤාණවංසො,
ගාථත්ථිකෙසු කරුණායභිපූජයිත්වා;
පුඤ්ඤං දදති සකලස්ස සදෙවකස්ස.

වුත්තොදයස්ස; වුත්තෝදය ග්‍රන්ථයාගේ, **පරිවාර සරූපී**; පරිවාර ග්‍රන්ථයක් ලෙස,
වුත්තාලංකාර ගන්ථ කතවා, වුත්තාලංකර නැමැති ග්‍රන්ථය කළා වූ,
ඤාණවංසො යති; ඤාණවංස නැමැති යතිවර තෙමේ,
(එය) ගාථත්ථිකෙසු; ගාථා බන්ධනය කැමැති අය කෙරෙහි, **කරුණාය**; කරුණාවෙන්,
(ඔවුන්ට) අභිපූජයිත්වා; වෙසෙසින් පුද, **සකලස්ස සදෙවකස්ස**; දෙවියන් සහිත සියලු ලෝකයාට,
පුඤ්ඤං; (ඒ) පින, **දදති**; පිරිනමයි.

වුත්තෝදය ග්‍රන්ථියාගේ පරිවාර ග්‍රන්ථියක් ලෙස
වුත්තාලංකාර නැමැති ග්‍රන්ථිය කළාවු
ඤාණවංස නැමැති යතිවර තෙමේ,
එය ගාථා බන්ධනය කැමැති අය කෙරෙහි කරුණාවෙන්
ඔවුන්ට වෙසෙසින් පුද
දෙවියන් සහිත සියලු ලෝකයාට ඒ පින පිරිනමයි.

මාතිකා

1. **වුත්තොදය පාළි** 1
    - සඤ්ඤුපරිභාසානිද්දෙස-පඨමපරිච්ඡේද 1
    - මත්තාවුත්තිනිද්දෙස-දුතියපරිච්ඡේද 2
    - සමවුත්තිනිද්දෙස-තතියපරිච්ඡේද 3
    - අඩ්ඩසමවුත්තිනිද්දෙස-චතුත්ථපරිච්ඡේද 5
    - විසමවුත්තිනිද්දෙස-පඤ්චමපරිච්ඡේද 6
    - ඡප්පච්චයවිභාග-ඡට්ඨපරිච්ඡේද 7
2. **වුත්තාලංකාරය** 8
3. **සඤ්ඤුපරිභාසානිද්දෙස - පඨමපරිච්ඡේද** 8
    - රතනත්තයප්පණාම 8
    - නිමිත්ත 9
    - ගන්ථපරිමාණ 9
    - ගණනියම 11
4. **මත්තාවුත්තිනිද්දෙස - දුතියපරිච්ඡේද** 15
    - අරියාජාතියො 15
    - ගණනියම 15
    - යති නියම. 18
    - ගීතිජාතියො 25
    - වේතාලියජාතියො 29
    - මත්තාසමක ජාතියො 36
5. **සමවුත්තිනිද්දෙස - තතියපරිච්ඡේද** 41
    - ගායත්‍රී ඡන්දස (අක්ෂර 6) 41
    - උණ්හිකා ඡන්දස (අක්ෂර 7) 42
    - අනුට්ඨුභා ඡන්දස (අක්ෂර 8) 43
    - බ්‍රහතී ඡන්දස (අක්ෂර 9) 45
    - පන්ති ඡන්දස (අක්ෂර 10) 46
    - තිට්ඨුභා ඡන්දස (අක්ෂර 11) 50
    - ජගතී ඡන්දස (අක්ෂර 12) 58
    - අතිජගතී ඡන්දස (අක්ෂර 13) 65
    - සක්කරී ඡන්දස (අක්ෂර 14) 67
    - අතිසක්කරී ඡන්දස (අක්ෂර 15) 69
    - අට්ඨි ඡන්දස (අක්ෂර 16) 71
    - අච්චට්ඨි ඡන්දස (අක්ෂර 17) 72
    - ධුති ඡන්දස (අක්ෂර 18) 74
    - අතිධුති ඡන්දස (අක්ෂර 19) 75
    - කති ඡන්දස (අක්ෂර 20) 76
    - පකති ඡන්දස (අක්ෂර 21) 77
    - ආකති ඡන්දස (අක්ෂර 22) 78
6. **අඩ්ඩසමවුත්තිනිද්දෙස - චතුත්ථපරිච්ඡේද** 80
7. **විසමවුත්තිනිද්දෙස - පඤ්චමපරිච්ඡේද** 88
    - වත්ත ප්‍රභේදය 88
8. **ඡප්පච්චයවිභාග - ඡට්ඨපරිච්ඡේද** 103
    - පත්ථාරනය 103
        - සමපාද ගාථාවන්ගේ පත්ථාරනය 103
        - අඩ්ඩසම පාදයන්ගේ පත්ථාරනය. 105
        - විසම පාදයන්ගේ පත්ථාරනය 106

අරියා ජාතියේ පත්ථාරනය. 107
මත්තා පත්ථාරනය. 108
නට්ඨනය 108
සමවුත්ත නට්ඨනය. 109
අද්ධසමවුත්ත නට්ඨනය. 110
මත්තාවුත්ත නට්ඨනය 112
උද්දිට්ඨනය 113
සමවුත්ත උද්දිට්ඨනය 114
අද්ධසමවුත්ත/ විසමවුත්ත උද්දිට්ඨනය 114
අරියා උද්දිට්ඨනය 114
මත්තාවුත්ත උද්දිට්ඨනය 116
සබ්බගලකිරියනය 117
සමවුත්ත සබ්බගලකිරියනය 117
අඩ්ඪසමවුත්ත සබ්බගලකිරියනය 120
විසමවුත්ත සබ්බගලකිරියනය 121
අරියා සබ්බගලකිරියනය 121
මත්තාවුත්ත සබ්බගලකිරියනය 121
වුත්ත සඞ්ඛ්‍යානය 122
සමවුත්ත සංඛ්‍යානය 123
අඩ්ඪසම, විසමවුත්ත සංඛ්‍යානය 124
අරියා, මත්තා වුත්ත සංඛ්‍යානය 124
වුත්ත අද්ධානය 125
නිගමන 127
වුත්තාලංකාර නිගමනය 128
9. වුත්තාලංකාරය ප්‍රශ්නෝත්තර සංග්‍රහය 129
10. ග්‍රන්ථයේ ඇතුලත් නොවූ ගරු ලහු ස්වරූප 145
පඨම පරිච්ඡේදයෙහි ගරු ලහු සරූප 145
රතනත්තයප්පණාම 145
නිමිත්ත 145
ගන්ථපරිමාණ 145
අභිධානාදි 145
ගණසඞ්කෙතසඤ්ඤ 146
ගණනියම 146
ගරු,ලහුසරූප 146
දෙ වෙනි පරිච්ඡේදයෙහි අවසාන ගාථාවෙහි ගරු ලහු සරූප 149
පස් වෙනි පරිච්ඡේදයෙහි අවසාන ගාථාවෙහි ගරු ලහු සරූප 149
සය වෙනි පරිච්ඡේදයෙහි ගරු ලහු සරූප 149
පත්ථාරනය 149
නට්ඨනය 150
උද්දිට්ඨනය 150
සබ්බගලක්‍රියනය 150
වුත්තසඞ්ඛ්‍යානය 150
වුත්තඅද්ධානය 151
නිගමන 151
පූර්විකාව ආදියෙහි ඇති ගාථාවන්ගේ ගරු ලහු ස්වරූප 152
11. පසුපිට 158

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස!

වුත්තොදය පාළි

සඤ්ඤාපරිභාසානිද්දෙස-පඨමපරිච්ඡේද

රතනත්තයප්පණාම

1. නම'ත්ථු ජන සන්තාන, තම සන්තාන භෙදිනො;
ධම්මු'ජ්ජලන්ත රුචිනො, මුනින්දෙ'දත රොචිනො.

නිමිත්ත

2. පිඞ්ගලා'චරියාදීහි, ඡන්දං ය මුදිතං පුරා;
සුද්ධමාගධිකානං තං, න සාධෙති යථිච්ඡිතං [ය'දිච්ඡිතං යති'ච්ඡිතං (ක.)].

ගන්ථපරිමාණ

3. තතො මාගධභාසාය, මත්තා,වණ්ණ,විභෙදනං;
ලක්ඛ්‍ය ලක්ඛණ සංයුත්තං, පසන්න'ත්ථ,පද,ක්කමං.

අභිධානාදි

4. ඉදං වුත්තොදයං නාම, ලොකිය'ච්ඡන්දනිස්සිතං;
ආරභිස්ස'මහං දනි, තෙසං සුඛවිබුද්ධියා.

ගණසඞ්කෙතසඤ්ඤා

5. සබ්බග්ලා මිනා,'දිගලහූ, භ්‍යා',මජ්ඣ'න්ත ගරූ ජසා;
මජ්ඣ'න්තලා ර,තෙ'තෙ'ට්ඨ, ගණා ගො ගරු,ලො ලහු.

ගණනියම

6. භ,ජ,සා සබ්බග,ලහූ, පඤ්ච්'මෙ සණ්ඨිතා ගණා;
අරියාදිම්හි විඤ්ඤෙය්‍යා, ගණො ඉධ චතු'ක්කලො.

ගරු,ලහුසරූප

7. සංයොගා'දි ච, දීඝො ච, නිග්ගහීතපරො ච, යො;
ගරු, වඩ්කො, පාදන්තො,වා, රස්සො'ඤ්ඤෙ මත්තිකො ලු'ජු.

8. පරෙ පාදදිසංයොගෙ, යො පුබ්බො ගරුක'ක්ඛරො;
ලහු ස ක්වචි විඤ්ඤෙය්‍යො, තදුදහරණං යථා.

9. දස්සනරසා'නුභවනෙ, නිබද්ධගෙධා ජිනස්ස'යං ජනතා;
විම්හයජනනී සඤ්ඤත, ක්‍රියා නු කං නා'නුරඤ්ජයති.

10. විඤ්ඤෙය්‍යා ලොකතො සඤ්ඤ, සමුද්දෙසු,රසාදිනං;
පාදෙඤ්ඤෙය්‍යො චතුත්ථං'සො, පදච්ඡෙදෙ යතී භවෙ.

11. සම,මඩ්ඪසමං, වුත්තං, විසමං චා'පරං තිධා;
සමා ලක්ඛණතො පාද, චත්තාරො යස්ස තං සමං.

12. යස්ස'න්තිමෙන දුතියො, තතියෙනා'දිමො සමො;
ත'දඩ්ඪසම, මඤ්ඤං තු, භින්න ලක්ඛණ පාදිකං.

13. පාද'මෙකක්ඛරා'රබ්භ, යාව ඡබ්බීසත'ක්ඛරා;
භවෙ පාදෙහි තං ඡන්දං, නානානාමො'දිතං තතො.

14. දණ්ඩකා චණ්ඩවුට්ඨ්‍යා'දි, පාදෙහි ඡහි, තීහි තු;
'ගාථා'ති ච පරත්ථෙ'වං, ඡන්දෙ සඤ්ඤ පකාසිතා.

15. අනන්තරො'දිතං ච'ඤ්ඤ, මෙතං සාමඤ්ඤ නාමතො;

'ගාථා'ඉච්චෙව නිද්දිට්ඨං, මුනින්දවචනෙ පන.

16. විසෙසනාමතො කිඤ්චි, ගහෙත්වා සබ්බථො'චිතං;
දස්සයිස්සාම'හං තෙ'ත්ථ, නාමානා'වි භවිස්සරෙ.

ඉති වුත්තොදයෙ ඡන්දසි සඤ්ඤාපරිභාසා නිද්දෙසො නාම

පඨමො පරිච්ඡෙදෙ.

මත්තාවුත්තිනිද්දෙස-දුතියපරිච්ඡෙද

ගණනියම

17. ඡට්ඨො'ඛිලලහු,ජො වා, ගයුතා'ඤ්ඤෙ,ඡ'ග්ගණා,න ජො විසමෙ,;
අරියාය'න්තඩ්ඩෙ ලො, ඡට්ඨො,'න්තෙ ගො,ගණා ඡ'ඤ්ඤෙ.

යතිනියම

18. පඨමඩ්ඩෙ ඡට්ඨො චෙ, සබ්බලහෙ,'ත්ථා'දිලහුනි භවතියති;
තප්පරකො,න්තෙපි, සචෙ, චරිමෙපි, භවති චතුත්ථො'න්තෙ.

19. අරියාසාමඤ්ඤං චෙ, පුබ්බො'දිත ලක්ඛණං භවෙ යස්සා.

20. ආදිම'මථ පාදයුගං, යස්සා තාං'සෙහි සා පථ්‍යා.

21. යත්ථ ගණත්තය මුල්ලඩ්සි, යො'භයත්ථා'දිමො භවෙ විපුලා.

22. ගරුමජ්ඣගො ජකාරො, චතුත්ථකො දුතියකො චපලා.

23. චපලා'ගතා'ඛිලං චෙ, දලා'දිමං ලක්ඛණං භජති යස්සා;
පථ්‍යාලක්ඛණ'මඤ්ඤං, මුඛචපලා නාම සා භවති.

24. පථ්‍යාය ලක්ඛණං චෙ, පඨමඩ්ඩෙ ලක්ඛණං තු චපලාය;
දුතියෙ දලෙ'ථ යස්සා, පකිත්තිතා සා ජඝනචපලා.

අරියාජාතියො.

25. සබ්බංපඨමදලෙ යදි, ලක්ඛණ'මරියාය වුත්ත'මුභයෙසු;
යස්සා දලෙසු යුත්තං, වුත්තා සා ගීති වුත්ත යති ලලිතා.

26. අරියායං දුතිය'ඩ්ඩෙ, ගදිතා'ඛිලලක්ඛණං යං තං;
භවති දලෙසු'භයෙසුපි, යදි යස්සා සා'ය මුපගීති.

27. අරියාය'ඩ්ඩද්විතයං, පුබ්බොදිත ලක්ඛණො'පෙතං;
විපරියයෙනා'භිහිතං, යස්සා සම්භවති චෙ'හ සො'ග්ගීති.

28. අරියාපුබ්බ'ඩ්ඩං යදි, ගරුනෙ'කෙනා'ධිකෙන නිධනෙ යුත්තං;
යදි පුබ්බ'ඩ්ඩසමානං, දල මිතරං චො'දිතා'ය'මරියාගීති.

ගීතිජාතියො.

29. විසමෙ ඡ සියුං කලා මුඛෙ, සමෙ ත්ව'ට්ඨ, ර,ල,ගා, තතො'පරි;
වෙතාලීයං ත මුච්චතෙ, ලහු ඡක්කං න නිරන්තරං සමෙ.

30. වෙතාලීයොපමං මුඛෙ තං, ඔපච්ඡන්දසකං ර,යා ය'දන්තෙ.

31. ආපාතලිකා කථිතා'යං, භගගා'න්තෙ යදි පුබ්බමිව'ඤ්ඤං.

32. යද'දිතො දක්ඛිණන්තිකා, ඨිතෙ'ත්ථ පාදෙස්වා'ඛිලෙසු ජො.

33. 'උදිච්චවුත්ති'ති වුච්චතෙ, ජො චා'දෙ විසමෙසු සණ්ඨිතො.

34. පුබ්බත්ථ, සමෙසු චෙ ග, ජා, 'පච්චවුත්ති' රුදිතා'ති සණ්ඨිතා.

35. සමාසමා'ත්‍රා'දිනං සමා, සංයුතා භවති තං පවත්තකං.

36. අස්ස සා සම කතා' පරන්තිකා.

37. තද'ඤ්ඤජා චාරුහාසිනී.

වෙතාලීයජාතියො.

38. ද්විත විහත වසු ලහු අචලධිති රි'හ.

39. මත්තාසමකං නවමො ල්ග'න්තෙ.

40. ජො න්ලා' ඨවා'ණ්ණවා විසිලොකො.

41. තද්වයතො වානවාසිකා'ඛ්‍යා.

42. පඤ්ච,ට්ඨ,නවසු යදි ලො චිත්‍රා.

43. ග,ල්‍යා'ට්ඨහි චෙ'සා වු'පචිත්‍රා.

44. ය'මතීත ලක්ඛණ විසෙස යුතං, (චිත්‍රා)
මත්තා සමා'දි පාද'භිහිතං; (විසිලොක)
අනියත වුත්ත පරිමාණ සහිතං, (වානවාසිකා)
පථිතං ජනෙසු පාදකුලකං. (විසිලොක)

මත්තාසමක ජාතියො.

45. විනා වණ්ණෙහි මත්තා ගා, විනා වණ්ණා ගරුහි තු;
විනා ලහූනි ගරවො, දලෙ පථ්‍යාදිනො මතා.

ඉති වුත්තොදයෙ ඡන්දසි මත්තාවුත්තිනිද්දෙසො නාම

දුතියො පරිච්ඡෙදෙ.

සමවුත්තිනිද්දෙස-තතියපරිච්ඡෙද

46. තා්‍ය' චෙ තනුමජ්ඣා.

ගායත්තී.

47. කුමාර ලලිතා ජ්ස්ගා.

උණ්හිකා.

48. චිත්‍රපද යදි භා ගා.

49. මො මො ගො ගො විජ්ජුම්මාලා.

50. භා ත, ල, ගා මාණවකං.

51. ග්ලා සමානිකා ර,ජා ච.

52. පමාණිකා ජ, රා ල, ගා.

අනුට්ඨුභා.

53. රා න,සා යදි හලමුඛී.

54. භුජග සුසු සටා නා මො.

බ්‍රහතී.

55. මිසාජ්ගා සුද්ධවිරාජිතං මතං.

56. මිනා යො ගො යදි පණවො ඛ්‍යාතො.

57. භ්මා ස,ගයුත්තා රුම්මවතී සා.

58. ඤෙයාා මත්තා ම, භ, ස, ගයුත්තා.

59. චම්පකමාලා චෙ භ, ම, සා ගො [ඉදං නාමන්තරඤ්ඤපනත්ථමෙව පුන වුත්තං (ටී.)].

60. න, ර, ජ, ගෙහි සා මනොරමා.

61. උබ්භාසකං තං චෙ තො ම, රා ල්ච.

62. තො ජා ගරුනා'ය'මුපට්ඨිතා.

පන්ති.

63. ඉන්දදිකා තා වජිරා ජ, ගා ගො.

64. උපාදිකා සා'ව ජ,තා ජ,ගා ගො.

65. අනන්තරො'දීරිත ලක්ඛණා චෙ, (උපෙන්දවජිර)
පාද විමිස්සා උපජාතියො තා; (ඉන්දවජිර)
එවං කිර'ඤ්ඤසුපි මිස්සිතාසු, (ඉන්දවජිර)
වදන්ති ජාතිස්විද' මෙව නාමං. (උපෙන්දවජිර)

66. න, ජ, ජ, ල, ගා ගදිතා සුමුඛී.

67. දෙධක මිච්ඡති චෙ භ,භ,භා ගා.

68. වෙද,ස්සෙහි,ම්තා ත්ගගා,සාලිනී සා.

69. වාතොම්මී සා, යති සා ම්භා ත, ගා ගො.

70. භා ත, න, ගා ගො'සු, රස සිරී සා.

71. රො න, රා ඉහ රථොද්ධතා ල, ගා.

72. ස්වාගතෙ'ති ර, න, භා ගරුකා ද්වෙ.

73. න,න,ර,ලහු,ගරුහි භද්දිකා.

තිට්ඨුභා.

74. වදන්ති වංසට්ඨමි'දං ජ, තා ජ, රා.

75. සා ඉන්දවංසා බලු යත්ථ තා ජ,රා.

76. ඉධ තොටක මම්බුධි,සෙහි මිතං.

77. දුතවිලම්බිත මාහ න, භා භ,රා.

78. වසු යුග විරතී නා,ම්‍යා' පුටො'යං.

79. න, ය, සහිතා න්‍යා' කුසුමවිචිත්තා.

80. භුජඞ්ග'ප්පයාතං භවෙ වෙද, යෙහි.

81. න, භ, ජ, රෙහි භවති'ප්පියංවදා.

82. වුත්තා සුධීහි ලලිතා ත, භා ජ, රා.

83. පමිතක්ඛරා ස, ජ, ස,සෙහු'දිතා.

84. න,න,භ,ර,සහිතා'භිහිතු'ජ්ජලා.

85. පඤ්ච'ස්ස'ච්ඡින්නා, වෙස්සදෙවී ම,මා යා.

86. භවති හි තාමරසං න, ජ, ජා යො.

87. 'කමලා'ති ඤෙයාා ස,ය,සෙහි යො චෙ.

ජගතී.

88. ම්නා ජ්‍රා ගො, තිදසයති'ප්පහස්සිණී සා.

89. චතු,ග්ගහෙ,හි'හ රුචිරා, ජ,භා ස්ජ,ගා.

අතිජගතී.

90. න,න,ර,ස,ලහු,ගා,සරෙහි'පරාජිතා.

91. න,න,භ,න,ල,ගි'ති,ප්පහරණකලිකා.

92. වුත්තා වසන්තතිලකා ත,භ,ජා ජ,ගා ගො.

සක්කරී.

93. ද්විහත හය ලහු ර'ථ ගි'ති සසිකලා.

94. වසු,හය,යති රි'හ,මණිගුණනිකරො.

95. න,න,ම,ය,ය,යුතා'යං,මාලිනී භොගි'සීහි.

96. භවති න,ජා,භ,ජා රසහිතා පභද්දකං.

අතිසක්කරී.

97. න,ජ,භ,ජ,රා සද භවති වාණිනී ග, යුත්තා.

අට්ඨී.

98. ය, මා නො සො භල්ගා, රස, හරවිරාමා සිඛරණී.

99. රස, යුගි, සිතො, නො සො ම්‍රා ස්ලා, ගා'ද හරිණී තද.

100. මන්දක්කන්තා, ම,භ,න,ත,ත,ගා, ගො යුගු,ත්ව,ස්සකෙහි.

අච්චට්ඨී.

101. මො තො නො යො යා, කුසුමිතලතා, වෙල්ලිතා' ක්ඛු,ත්වි,සීහි.

ධුති.

102. රසු,ත්ව,ස්සෙහි ය්මා, න,ස,ර,ර,ගරූ, මෙසවිප්ඵුජ්ජිතා සා.

103. අක්කස්සෙහි යති ම්ස,ජාස,ත,ත,ගා, සද්දූලවික්කීළිතං.

අතිධුති.

104. වුත්ත මීදිසං තු නාමතො ර,ජා ර,ජා ර,ජා ගරූ,ලහූ ච.

කති.

105. ම්‍රා ත්නා යො යො'ත්‍ර යෙන,ත්ති,මුනි, යතියුතා, සන්ධරා කිත්තිතා'යං.

පකති.

106. ත්‍රා න,ර,නා ර,නා ච ථ ගරූ දස,ක්ක,විරමඤ්හි භද්දක'මිදං.

ආකති.

ඉති වුත්තොදයෙ ඡන්දසි සමවුත්තිනිද්දෙසො නාම

තතියො පරිච්ඡෙදෙ.

අඩ්ඪසමවුත්තිනිද්දෙස-චතුත්ථපරිච්ඡෙද

107. විසමෙ යදි සා ස,ල,ගා සමෙ,
භ,ත්තයතො ගරුකා වු'පචිත්තං.

108. භ,ත්තයතො යදි ගා දුතමජ්ඣා;
යදි පුනරෙ'ව භවන්ති න, ජා ජ්‍යා.

109. යදි ස,ත්තිතයං ගරුයුත්තං,
වෙගවතී යදි භ,ත්තිතයා ගා.

110. තො ජො විසමෙ රතො ගරු වෙ;
මිසා ජ්ගා භද්දවිරාජ මෙත්ථ ගො වෙ.

111. විසමෙ ස, ජා ස,ගරු,යුත්තා;
කෙතුමතී සමෙ භ,ර,න,ගා ගො.

112. ආඛ්‍යානකී තා විසමෙ ජ, ගා ගො; (ඉන්දවජිර)
ජ,තා ජ,ගා ගො තු සමෙ'ථ පාදෙ. (උපෙන්දවජිර)

113. ජ,තා ජ,ගා ගො විසමෙ සමෙ තු; (උපෙන්දවජිර)
තා ජො ග,ගා වෙ විපරීතපුබ්බා. (ඉන්දවජිර)

114. ස,ස,තො ස,ල,ගා විසමෙ සමෙ;
න,භ,භ,රා භවතෙ හරිණප්ලුතා.

115. යදි න,න,ර,ල,ගා න,ජා ජ,රා,
යදි ච තද'පරවත්ත මිච්ඡති.

116. විසම මුපගතා න,නා ර,යා වෙ;
න,ජ,ජ,ර,ගා සමකෙ ච පුප්ඵිතග්ගා.

ද්වයං මිදං වෙතාලීය'ප්පභෙදෙ.

117. සා යවාදිකා මතී ර,ජා ර,ජා ත්ව,
සමෙ සමෙ ජ,රා ජ,රා ගරු භවෙයුං.

ඉති වුත්තොදයෙ ඡන්දසි අඩ්ඩසමවුත්තිනිද්දෙසො නාම

චතුත්ථො පරිච්ඡෙදෙ.

විසමවුත්තිනිද්දෙස-පඤ්චමපරිච්ඡෙද

118. න'ට්ඨක්ඛරෙසු පාදෙසු, ස්නා'දිම්හා යො'ණ්ණවා වත්තං.

119. සමෙසු සින්ධුතො ජෙන, පථ්‍යාවත්තං පකිත්තිතං.

120. ඔජෙසු ජෙන සින්ධුතො, ත'මෙව විපරීතා'දි.

121. න,කාරො වෙ ජලධිතො, චපලාවත්ත'මිච්චෙ'තං.

122. සමෙ ලො සත්තමො යස්සා, විපුලා පිඞ්ගලස්ස සා.

123. සෙතවස්සා'ඛිලෙසුපි.

124. හෙන'ණ්ණවා භ'ඛ්බිපුලා.

125. එව'මඤ්ඤ රො චතුත්ථා.

126. නො'ණ්ණවා වෙ නවිපුලා.

127. තො'ණ්ණවා තථා'ඤ්ඤ සියා.

වත්ත'ප්පභෙදෙ.

128. නදිස්සතෙ'ත්ථ යං ඡන්දං, පයොගෙ දිස්සතෙ යදි;
විසම'ක්ඛරපාදං තං, ගාථා සාමඤ්ඤනාමතො.

ඉති වුත්තොදයෙ ඡන්දසි විසමවුත්ති නිද්දෙසො නාම

පඤ්චමො පරිච්ඡෙදෙ.

ඡප්පච්චයවිභාග-ඡට්ඨපරිච්ඡේද

පත්ථාරනය

129. පත්ථාරෙ සබ්බගෙ පාදෙ, පුබ්බගා'ධො ල්ප'රෙ සමා;
පුබ්බෙ ගරු තෙ ච මිමෙ, කත්තබ්බා යාව සබ්බලා.

නට්ඨනය

130. නට්ඨස්ස යො භවෙය්‍ය'ඞ්කො, තස්මිං ලො'ද්ධිකතෙ සමෙ;
විසමෙ ත්වෙ'කසහිතෙ, භවෙය්‍ය'ද්ධිකතෙ ගරු.

උද්දිට්ඨනය

131. එකා'දිනුක්කමෙන'ඞ්කෙ, පුබ්බාධො ද්විගුණෙ ලිඛෙ;
මිස්සකෙහි ලහුට්ඨෙහි, සෙ'කෙහු'ද්දිට්ඨකං භවෙ.

සබ්බගලක්‍රියනය

132. වුත්ත'ක්ඛර සමා සඞ්ඛ්‍යා, ලික්ඛ්‍ය සෙකො'පරූ'පරි;
එකෙකහීන මෙකාදි, නු'ට්ඨානෙ සබ්බගාදිකං.

වුත්තසඞ්ඛ්‍යානය

133. ගරුක්‍රියා'ඞ්ක සන්දෙහෙ, භවෙ සඞ්ඛ්‍යා විමිස්සිතෙ;
උද්දිට්ඨ'ඞ්ක සමාහාරො, සෙ'කො වෙ'මං සමා'නයෙ.

වුත්තඅද්ධානය

134. සඞ්ඛ්‍යෙව ද්විගුණෙ'කූනා, විත්ථාරා'යාමසම්භවා;
වුත්තස්ස'ද්ධ'න්තරානඤ්ච, ගරුලානඤ්ච අඞ්ගුලං.

ඉති වුත්තොදයෙ ඡන්දසි ඡප්පච්චයවිභාගො නාම

ඡට්ඨො පරිච්ඡෙදෙ.

නිගමන

135. සෙල'න්තරා'යතන වාසික සීලථෙර,
පාදෙ ගරුග්ගුණගරුජ්ජයතං මමෙ'සො;
යස්ස ප්පභාව'මවලම්බ මයෙ'දිසොපි,
සම්පාදිතො'භිමත සිද්ධිකරො පරත්ථො.

136. පරත්ථ සම්පාදනතො, පුඤ්ඤෙනා'ධිගතෙන'හං;
පරත්ථ සම්පාදනකො, භවෙය්‍යං ජාති ජාතියං.

137. අවලොකිත මත්තෙන, යථා ඡප්පච්චයා මයා;
සාධිතා සාධයන්තෙ'ව, මිච්ඡිතත්ථම්පි පාණිනොති.

ඉති සඞ්ඝරක්ඛිතමහාසාමිත්ථෙරෙන විරචිතං

වුත්තොදයප්පකරණං පරිනිට්ඨිතං.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

(ඒ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!)

වුත්තාලංකාරය

නම් වූ

වුත්තෝදය වර්ණනාව

සඤ්ඤාපරිභාසානිද්දෙස - පඨමපරිච්ඡේද

රතනත්තයප්පණාම

1. **නම'ත්ථු ජන සන්තාන, තම සන්තාන භෙදිනො;**
   ධම්මු'ජ්ජලන්ත රුචිනො, මුනින්දෙ'දත රොචිනො[2].

(ජනසන්තාන තමසන්තාන භෙදිනො) ජනසන්තාන = ජන සමූහයා කෙරෙහි වූ; **තමසන්තාන** = මෝහාන්ධකාර සමූහය; **භෙදිනො** = බිඳන සුළු වූ; **(ධම්මුජ්ජලන්ත රුචිනො) ධම්ම** = සද්ධර්මය වැනි වූ (නොහොත්) සද්ධම්ම නමැති; **උජ්ජලන්ත** = උසස්ව දිලිසෙන්නා වූ; **රුචිනො** = කාන්ති ඇති; **(මුනින්දෙදතරොචිනො) මුනින්ද** = මුනීන්ද්‍ර නමැති; **ඔදතරුචිනො** = චන්ද්‍රයා හට; (මෙ = මාගේ;) **නමො අත්ථු** = නමස්කාරය වේවා.

❖ මෙහි අර්ථය ක්‍රම දෙකකින් විස්තර කළ හැකි ය. කර්තෘ විසින් අපේක්ෂිත අර්ථය ප්‍රධාන වශයෙන් නොලැබී අන්‍ය අර්ථයක් ලැබෙන කල්හි පරපක්ෂාර්ථය නම් වේ. අපේක්ෂිතාර්ථය ප්‍රධාන වශයෙන් ලැබෙන කල්හි සකපක්ෂාර්ථය නම් වේ.

සත්වයන්ගේ සන්තානයන්හි ඇත්තා වූ මෝහය නමැති අඳුර බිඳින්නා වූ (දුරු කරන්නා වූ) දස වැදැරුම් ධර්මය නමැති දිදුලන රැස් ඇත්තාවූ, බුදුරජාණන් වහන්සේ නමැති පිරිසිදු රැස් ඇති චන්ද්‍රමණ්ඩලයට (මාගේ) නමස්කාරය වේවා! (මෙම අර්ථය මෙහි පරපක්ෂාර්ථය යි.)

සත්වයන්ගේ සන්තානයන්හි ඇත්තා වූ අඳුරක් වැනි වූ මෝහය බිඳින්නා වූ දිදුලන රැස් වැනි වූ දස වැදැරුම් ධර්මය ඇත්තාවූ පිරිසිදු රැස් ඇති චන්ද්‍රමණ්ඩලය වැනි වූ බුදුරජාණන් වහන්සේට (මාගේ) නමස්කාරය වේවා! (මෙම අර්ථය මෙහි සකපක්ෂාර්ථය යි.)

ඉහත එකම ගාථාවට දී ඇති අර්ථ දෙවිධියෙන් පළමු වැන්නෙහි කර්තෘ විසින් මෙහිදී අපේක්ෂා නොකරන, උපමානය වන චන්ද්‍රමණ්ඩලය ප්‍රධාන වශයෙන් ලැබෙන බැවින් පරපක්ෂ අර්ථය නම්. දෙවැන්නෙහි කර්තෘ විසින් අපේක්ෂිත, උපමේය වන බුදුරදුන් ම ප්‍රධාන වශයෙන් ලැබෙන බැවින් සකපක්ෂ අර්ථය නම්.

මෙම අර්ථ දෙවර්ගය හා සකපක්ෂ, පරපක්ෂ යන ව්‍යාවහාර ඡන්දස් ශාස්ත්‍රයට අදාළ නොවේ. අමතර දැනුම සඳහා කියන ලදී.

වුත්තෝදය ග්‍රන්ථය කරන්නා වූ සංඝරක්ඛිත ආචාර්යයන් වහන්සේ විසින් මෙම ගාථාවෙන් පළමුකොට ග්‍රන්ථාරම්භයෙහි රතනත්‍රය ප්‍රණාමය දක්වන ලදී.

[2] මෙම සඤ්ඤාපරිභාසා නිද්දේස නම් වූ පළමු වන පරිච්ඡේදයේ දැක්වෙන ගාථාවන්ගේ ගරු ලහු ස්වරූප ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත.

නිමිත්ත

2. **පිඞ්ගලා'චරියාදීහි, ඡන්දං ය මුදිතං පුරා;**
සුද්ධමාගධිකානං තං, න සාධෙති යථිච්ඡිතං.

පිඞ්ගලා'චරියාදීහි = පිඞ්ගල මුනි ආදී ආචාර්යවරයන් විසින්; **පුරා** = පූර්වයෙහි; **යං ඡන්දං** = (වෛදික ලෞකික වශයෙන් විවිධ වූ) යම් ඡන්දශ්ශාස්ත්‍රයෙක්; **උදිතං** = කියන ලද ද; **තං** = ඒ ඡන්දශ්ශාස්ත්‍රය; **සුද්ධමාගධිකානං** = හුදු මගධ භාෂාව හදරන්නවුන්ගේ; **යථිච්ඡිතං** = (ඡන්දෙ ඥන සංඛ්‍යාත) යමක් කැමති වන්නේ ද එය; (**යතො** = යම් හෙයකින්;) **න සාධෙති** = සිදු නොකෙරේද;

ග්‍රන්ථ රචනයෙහි ප්‍රයෝජනය (නිමිත්ත) දක්වන්නා වූ දෙ වෙනි ගාථාවෙහි සරල අර්ථය මෙසේ ය. පිංගල ආදී[3] ආචාර්‍යන් විසින් පෙර කල්හි යම් ඡන්දසක් කරන ලද්දේද, එය පාලි භාසාව දන්නවුන්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ නොකරයි.

ගන්ථපරිමාණ

3. **තතො මාගධභාසාය, මත්තා,වණ්ණ,විභෙදනං;**
ලක්ඛ්‍ය ලක්ඛණ සංයුත්තං, පසන්න'ත්ථ,පද,ක්කමං.

තතො = එහෙයින්; **මත්තා,වණ්ණ, විභෙදනං** = මාත්‍රා ඡන්දසය වර්ණච්ඡන්දසය යන භේද ඇති; **ලක්ඛ්‍යලක්ඛණ සංයුත්තං** = උදහරණාත්මක සූත්‍රයෙන් යුක්ත වූ; **පසන්නත්ථපදක්කමං** = ප්‍රසන්න වූ (ප්‍රකට වූ) අර්ථවත් පද ක්‍රම ඇති - (මතු ගාථාව හා සම්බන්ධයි)

එහෙයින් මාත්‍රා ඡන්දසය වර්ණ ඡන්දසය යන භේද ඇති උදහරණාත්මක සූත්‍රයෙන් යුක්ත වූ ප්‍රකට වූ අර්ථවත් පද ක්‍රම ඇති, (මතු ගාථාව හා සම්බන්ධයි)

මත්තා විභෙදන යන්නෙහි ස්වරූපාර්ථ වශයෙන් ඉදිරි පරිච්ඡේදයන්හි දක්වෙන්නා වූ අරියා ආදී මත්තා වුත්ති ගාථා සියල්ල ද, වණ්ණ විභේදන යන්නෙහි තනුමජ්ඣා ආදී වණ්ණවුත්ති ගාථාද ගත යුතු ය. ලක්ඛ්‍ය යනු ලකුණු කරනු ලැබෙන බැවින් උදහරණයන්ට නමෙකි. ලක්ෂණ යනු ලකුණු කරන්නා වූ බැවින් සූත්‍රයන්ට නමෙකි. කච්චායනාදී ව්‍යාකරණයන්හි "අත්ථො අක්ඛරසඤ්ඤතො" යනාදිය ලක්ඛණ, සූත්‍ර යන නම් වලින් හැඳින්වෙන්නා සේ, දෙ වෙනි පරිච්ඡේදයෙහි පටන් වුත්තෝදයෙහි එන ගාථාවන් ද ලක්ඛණ, සූත්‍ර යන නම් වලින් හැඳින්වෙයි. මේ වුත්තෝදය ග්‍රන්ථයෙහි ඒ ඒ සූත්‍රයන්ට වෙන වෙනම උදහරණ නොදක්වන අතර සූත්‍රයම උදහරණය වන බව දත යුතුයි.

උදහරණයක් ලෙස දෙ වෙනි පරිච්ඡේදයේ පළමු ගාථාව වන "ඡට්ඨො බිලලහුජොවා" ආදී ගාථාව අරියා ගාථාව දක්වන සූත්‍රය හෙවත් ලක්ෂණය යි. එය ද අරියා ගාථාවක් වන බැවින් එයම අරියා ගාථාවන්ට උදහරණයයි. එය ලක්ඛ්‍යයි.

තවත් උද හරණයක් නම් සමවුත්ති නිද්දේසයේ පළමු වන ගාථාව වන තනුමජ්ඣා ගාථාව දක්විය හැකිය.

ලක්ඛණ	ත්‍යා	වේ	ත	නු	මජ්	ඣා
ලක්ඛ්‍ය	∪	∪	–	–	∪	∪
	තගණ			යගණ		

පසන්නත්ථ පදක්කමං - යන්නෙහි පැහැදිලි වූ අර්ථ පිළිවෙළ ඇත්තා වූ, පැහැදිලි වූ පද පිළිවෙළ ඇත්තා වූ කියා අර්ථ ගත යුතුයි.

අභිධානාදි

4. **ඉදං වුත්තොදයං නාම, ලොකිය'ච්ඡන්දනිස්සිතං;**
ආරභිස්ස'මහං දනි, තෙසං සුඛවිබුද්ධියා.

ලොකියච්ඡන්දනිස්සිතං = ලෞකික ඡන්දස ඇසුරු කළා වූ; **ඉදං** = මේ; **වුත්තොදයං නාම** = "වුත්තෝදය" නම් වූ ඡන්දශ්ශාස්ත්‍රය; **තෙසං** = ඒ ශුද්ධ මාගධිකයන්ගේ; **සුඛවිබුද්ධියා** = සුවසේ අවබෝධය

[3] පිංගලාචරියාදීහි-යන්නෙහි ආදී ශබ්දයෙන් කාලිදාස, යජදේව ආදී අනෙකුත් ඡන්දචාර්යයන් ගත යුතුය.

පිණිස; **ඉදනි** = දැන්; **අහං** = මම; **මාගධභාසාය** = මගධ භාෂාවෙන් (පාලි භාෂාවෙන්); **ආරභිස්සං** = රචනා කෙරෙමි.

(පෙර ගාථාව හා සම්බන්ධයි) ලෞකික ඡන්දස ඇසුරු කළා වූ මේ "වුත්තෝදය" නම් වූ ඡන්දශ්ශාස්ත්‍රය, ඒ ශුද්ධ මාගධිකයන්ගේ සුවසේ අවබෝධය පිණිස දැන් මම මගධ (පාලි) භාෂාවෙන් රචනා කරමි.

වුත්තොදය-යන්නෙහි තමාගේ නම කීමට කාරණ වන්නා වූ බැවින් වුත්ත යනු ගාථාවන්ට නමකි. උප්පත්තිස්ථානය උදය නම්. වුත්ත නම් වූ ගාථාවන්ගේ උප්පත්තිස්ථානය වන බැවින් **වුත්තෝදය** නම් වේ.

ලෝකියඡන්ද-යන්නෙන් ගාථාබන්ධනයෙහි ප්‍රයෝජන රහිත වූ වෛදික ඡන්දස බැහැර කරයි. ලෝකිය, වෛදික යන ඡන්දස් දෙවර්ගය අතුරින් (සංස්කෘත) ලෝකිය ඡන්දස නිශ්‍රය කොට මෙම ග්‍රන්ථය රචනා කරන බව දක්වයි.

5. සබ්බග්ලා මිනාදි ගලහූ, භ්‍යා',මජ්ඣ'න්ත ගරූ ජසා;
මජ්ඣ'න්තලා ර,තෙ'තෙ'ට්ඨ, ගණා ගො ගරු,ලො ලහු.

සබ්බග්ලා = සර්ව ගරු - සර්ව ලහු ඇත්තාහු; **මිනා** = මගණ නගණයෝ වෙති; **ආදිගලහූ** = ආදි ගරු-ආදි ලහු ඇත්තාහු; **භ්‍යා** = භගණ - යගණයෝ වෙති; **මජ්ඣන්තගරූ** = මධ්‍ය ගරු - අන්ත ගරු ඇත්තාහු; **ජසා** = ජගණ සගණයෝ වෙති; **මජ්ඣන්තලා** = මධ්‍ය ලහු - අන්ත ලහු ඇත්තාහු; **රතා** = රගණ-තගණයො වෙති; **ඉති** = මෙසේ (මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි;) **අට්ඨගණා** = ගණයෝ අට දෙනෙක් වෙත්; **ගරු** = ගරු අක්ෂරය තෙම; **ගො** = "ග" නම් වෙයි; **ලහු** = ලහු අක්ෂරය තෙම; **ලො** = "ල" නම් වේ.

සර්ව ගරු සර්ව ලහු ඇති මගණ නගණයෝ වෙති. ආදි (මුලින්) ගරු ආදි ලහු ඇති භගණ හා යගණයෝ වෙති. මධ්‍ය ගරු හා අන්ත ගරු ඇති ජගණ සගණයෝ වෙති. මධ්‍ය ලහු අන්ත ලහු ඇති රගණ තගණයෝ වෙති. මෙසේ ගණයෝ අට දෙනක් වෙත්. ගරු අක්ෂරය "ග" නම් වෙයි. ලහු අක්ෂරය තෙම "ල" නම් වේ.[4]

ගණය යනු සමූහයට නමකි. මෙහි දී ව්‍යඤ්ජනයක් සහිතව හෝ රහිතව ඇති ස්වර තුනක සමූහයට ගණයක් යැයි කියනු ලැබේ. ඒ සමූහයෙහි ඇති ස්වරයන් ගරු හෝ ලහු විය හැක. හ්‍රස්ව අකුරු ලහු වශයෙන් ද, දීර්ඝ අකුරු ගරු වශයෙන් ද කෙටියෙන් හැඳින්විය හැක. ගරු-ලහු පිළිබඳ විස්තරයක් ඉදිරියේ එන 7 වන ගාථාවෙහි දක්වේ. (∪ මෙම ලකුණෙන් ගරු අක්ෂරයන් ද, – මෙම ලකුණෙන් ලහු අක්ෂරයන් ද දක්වේ.)

සබ්බග් ලා මිනා = සියලු ගරු හා සියලු ලහු - ම ගණ, න ගණ වේ.

සබ්බ ගරු (සියලු ගරු)	=	∪	∪	∪	ම ගණ	උදා:-සබ්,බඤ්,ඤූ
සබ්බ ලහු (සියලු ලහු)	=	–	–	–	න ගණ	උදා:-සු,ග,ත

ආදි ගලහූ භ්‍යා = ආරම්භයේ ගරු හා ආරම්භයේ ලහු - භ ගණ, ය ගණ වේ.

ආදි ගරු (ආරම්භයේ ගරු)	=	∪	–	–	භ ගණ	උදා:-මා,ර,ජී
ආදි ලහු (ආරම්භයේ ලහු)	=	–	∪	∪	ය ගණ	උදා:-ස,යම්,භූ

මජ්ඣන්ත ගරූ ජසා = මැද ගරු හා අග ගරු - ජ ගණ, ස ගණ වේ.

මජ්ඣ ගරු (මැද ගරු)	=	–	∪	–	ජ ගණ	උදා:-ම,හෙ,සි
අන්ත ගරු (අග ගරු)	=	–	–	∪	ස ගණ	උදා:-භ,ග,වා

මජ්ඣන්තලා රතා = මැද ලහු හා අග ලහු - ර ගණ, ත ගණ වේ.

මජ්ඣ ලහු (මැද ලහු)	=	∪	–	∪	ර ගණ	උදා:-චක්,ඛු,මා
අන්ත ලහු (අග ලහු)	=	∪	∪	–	ත ගණ	උදා:-සිද්,දත්,ථ

[4] මෙම ගණ අට අතුරෙන් පළමු ව දක්වෙන ම, න, භ, ය යන ගණ සතර සුභ ගණ ලෙසත් ඉතිරි ජ, ස, ර, ත යන ගණ සතර අසුභ ගණ ලෙසත් සඳහන් වේ.

ගණනියම

6. භ,ජ,සා සබ්බග,ලහූ, පඤ්ච්'මෙ සණ්ඨිතා ගණා;
අරියාදිම්හි විඤ්ඤෙය්‍යා, ගණො ඉධ චතු'ක්කලො.

භජසා = (ආදි මධ්‍ය අන්ත ගරු යුක්ත) භගණ, ජගණ, සගණයෝ තුන්දෙන ද; **සබ්බගලහූ** = සර්ව ගරු - සර්ව ලහු වූ මගණ, නගණයෝ දෙදෙන ද යන; **ඉමෙ පඤ්චගණා** = මේ ගණයෝ පස් දෙන; **අරියාදිම්හි** = ආර්ය ජාතියෙහි; **සණ්ඨිතා** = සිටියාහු යයි; **විඤ්ඤෙය්‍යා** = දත යුත්තාහුය; **ඉධ** = මේ ආර්යාදියෙහි; **ගණො** = ගණයෙක්; **චතුක්කලො** = කලා (මාත්‍රා) සතරක් ඇත්තේ ය.

භ, ජ, ස යන ගණයෝ තුන් දෙනද, සර්ව ගරු වූ ම ගණය ද, සර්ව ලහු වූ න ගණය ද යන මේ පස් ගණයෝ ආර්ය ජාතියෙහි සිටියාහු යයි දත යුත්තාහු ය. මේ ආරියා ජාතියෙහි ගණයෙක් මාත්‍රා සතරකින් සටහන් වේ.

ඉහත කී ගණ අට අතුරින්, දෙ වෙනි පරිච්ඡේදයෙහි දැක්වෙන අරියා ආදී මත්තාවුත්ති ගාථාවලදී බොහෝ සෙයින් භාවිතා වන්නේ භ, ජ, ස, ම, න යන ගණ පස (5) යි. 'බොහෝ සෙයින්' යැයි කීවේ සමහර ගාථාවල ය, ර යන ගණයන් ද භාවිතා වන බැවිනි. ඉහත ගාථාවෙහි දී ව්‍යඤ්ජන සහිත හෝ රහිත ස්වර තුනකට (වර්ණ තුනකට) ගණයක් යැයි කියන බව කියන ලදී. ඒ කියමන මත්තාවුත්ති ඡන්දසට අදළ නැත. මත්තාවුත්තියෙහි දී ගණයක් යනු මාත්‍රා හතරකි. මාත්‍රා යැයි කී විට පදරූපසිද්ධි ආදියෙහි කියැවෙන මාත්‍රාව හා ඡන්දසෙහි මාත්‍රාව තරමක් වෙනස් ය. පදරූපසිද්ධියේ "ලහුමත්තා තයො රස්සා" යන සූත්‍රයට අනුව මාත්‍රයක් යනු කෙටි අකුරකි. ඇසිපිය හෙළීමක් අසුරුසැනක් ගහන කාල ප්‍රමාණයක් මාත්‍රා යැයි විස්තර වේ. වුත්තෝදයේ දී මාත්‍රා එකක්, එකහමාරත් එකම මාත්‍රාවක් හැටියට ද ඊට වැඩි නම් මාත්‍රා දෙකක් හැටියට ද සලකනු ලැබේ. තවත් ක්‍රමයෙකින් කියතොත් ලහු නම් එක මාත්‍රාවකි. ගරු නම් මාත්‍රා දෙකකි.

ද්වි යන්නෙහි මාත්‍රා ගණන එකතු කළ විට මාත්‍රා දෙකක් වුව ද ලහු ලෙස ගෙන එක මාත්‍රාවක් සේ මෙහිදී සලකනු ලැබේ. (ද් 1/2 + වි 1/2 + ඉ 1 = 2) මෙයට උදාහරණයක් ලෙස මෙම ග්‍රන්ථයේ ම එන 38 වන ගාථාව දැක්විය හැකි ය.

ද්වි	ක	වි	හ	ත	ව	සු	ල	හු
—	—	—	—	—	—	—	—	—

ගරු 2 = ∪ ∪	අරියා ජාතීන්ට අනුව ගරු 1 ක් මාත්‍රා 2 කි	- එවිට මාත්‍රා 4 කි. (මගණ)
ලහු 4 = — — — —	අරියා ජාතීන්ට අනුව එක ගණයකි.	- මාත්‍රා 4 කි. (නගණ)

එවිට වන විශේෂත්වය නම් "ම" ගණයට අකුරු දෙකක් ද, "න" ගණයට අකුරු හතරක් ද වීමයි.

ගරු,ලහුසරූප

7. සංයොගා'දි ච, දීඝො ච, නිග්ගහීතපරො ච, යො;
ගරු, වඞ්කො, පාදන්තො,වා, රස්සො'ඤ්ඤෙමත්තිකොලු'ජු.

යො = යම් වර්ණයෙක්; **සංයොගාදි ච** = සංයෝගයකට ආදියෙහි වූයෙත් වේද; **දීඝො ච** = (යමෙක්) දීර්ඝ වූයෙත් වේ ද; **නිග්ගහීතපරො ච** = නිග්ගහීතය පර කොට ඇති යමෙකුත් වේ ද; (**සො** = ඒ වර්ණය තෙම;) **ගරු** = ගරු නම් වේ; **වඞ්කො** = (ප්‍රස්තාරයෙහි රේඛා හෙයින්) වක්‍ර වේ; **පාදන්තො** = ගාථා පාදන්තය වූ; **රස්සො** = හ්‍රස්වය තෙම; **වා** = ව්‍යවස්ථිත විභාෂා වශයෙන්; (**ගරු** = ගරු වේ;) **අඤ්ඤෙ** = යථෝක්ත ලක්ෂණයෙන් අන්‍ය වූ; **මත්තිකො** = මාත්‍රිකය හෙවත් ලහු අක්ෂරය තෙම; **ල** = ලහු නම් වේ; **උජු** = (ප්‍රස්තාරයෙහි රේඛා හෙයින්) ඍජු වේ.

බැඳි අකුරු දෙකක් ඇති විට ඒ අක්ෂර දෙකට මුලින් ඇති අකුරද, ස්වභාවයෙන්ම දීර්ඝ අක්ෂර ද[5], නිග්ගහීතයකින් අවසන් වන අක්ෂර ද, ගාථා පාදයක අවසාන අක්ෂරය ද ගරු අක්ෂර වේ. සෙසු සියලුම

[5] ආ, ඊ, ඌ, ඒ, ඕ යන්න ස්වභාවයෙන්ම දීර්ඝ අක්ෂර වේ.

අක්ෂර මාත්‍රා අනුව රස්ස හෙවත් ලහු වේ. ගරු අක්ෂරය වංකයක් (∪) හැටියටත් ලහු අක්ෂරය ඍජුවත් (–) ඇඳිය යුතුය.

ඉහත ගරු හතර වර්ගය පිළිවෙලින් මෙසේ ය.

1. "**භුත්වා තං**" යන්නෙහි "**භූ**" යන අක්ෂරය ඉදිරියේ ඇති සංයෝගයේ පළමු අක්ෂරය වන "**ත්**" යන අක්ෂරයත් සමග සම්බන්ධ වීමෙන් "භුත්" වේ. එය ගරු අක්ෂරයක් වේ.
2. එහි "**වා**" අක්ෂරය ස්වභාවයෙන්ම දීර්ඝ අක්ෂරයක් බැවින් ගරු වේ.
3. "**තං**" යන්න නිග්ගහීතයකින් අවසන් වන බැවින් ගරු අක්ෂරයක් වේ.
4. "**සංයොගාදි ච දීඝො ච**" යන ඉහත ගාථා පාදයෙහි "**ච**" යන අවසාන අක්ෂරය ද ගරු ය[6].

භුත්	වා	තං
∪	∪	∪

සං	යො	ගා	දි	ච	දී	ඝො	ච
∪	∪	∪	–	–	∪	∪	∪

අ, ඉ, උ, ක, ඛ යනාදිය ලහු අක්ෂර වේ.

8. **පරෙ පාදදිසංයොගෙ, යො පුබ්බො ගරුක'ක්ඛරො;**
ලහු ස ක්වචි විඤ්ඤෙයේ‍යා, තදුදහරණං යථා.

පාදදිසංයොගෙ = ගාථා පාදයාගේ ආදි සංයෝගය; **පරෙ** = පර කල්හි; **පුබ්බො** = ඒ (සංයෝගය හට) පූර්ව වූ; **යො ගරුකක්ඛරො** = යම් ගරු අක්ෂරයක් වේද; **සො** = හෙතෙම; **ක්වචි** = කිසි තැනෙක්හි; **ලහු විඤ්ඤෙයේ‍යා** = ලහු වේ යැයි දත යුතුය; **තදුදහරණං** = ඊට උදහරණය; **යථා** = මෙසේයි.

පාදයක මුල සංයෝග අක්ෂරයක් (බැඳි අකුරක්) ඇතිවිට ඊට කළින් පාදයේ අවසන් අකුර ලහු අකුරක් වුව ද එය පෙර ගාථාවට අනුව නම් ගරු අක්ෂරයක් ලෙස සැළකිය යුතු ය. නමුත් සමහර තැනෙක මෙය මෙසේ නොවන බව එනම් පාදදිසංයෝගයක් පරව ඇති කල්හි ඊට පූර්වයෙහි ඇති පාදන්ත ලහු අක්ෂරය ගරු ලෙස සමහර තැනෙක දී නොසැළකෙන බව මෙයින් දැක් වේ. එයට උදහරණ මෙය වේ. (එයට උදහරණ වශයෙන් නවවන ගාථාව දක්වන ලදී)

9. **දස්සනරසා'නුභවනෙ, නිබද්ධගෙධා ජිනස්ස'යං ජනතා;**
විම්හයජනනී සඤ්ඤත, ක්‍රියා නු කං නා'නුරඤ්ජයති[7].

ජිනස්ස = සර්වඥයන් වහන්සේගේ; **දස්සනරසානුභවනෙ** = දර්ශනය රස විඳීමෙහි; **අයං ජනතා** = මේ ජන සමූහය; **නිබද්ධගෙධා** = බඳනා ලද ලෝභ ඇත්තිය; (**හි** = එසේමැය;) **විම්හයජනනී** = (දුටුවන්) විෂ්මය උපදවන්නී වූ; **සඤ්ඤතක්‍රියා** = විනීත වූ කායික ක්‍රියා තොමෝ; **කං නු** = කවර නම් ජනයකු; **නානුරඤ්ජයති** = නො අලවත්ද; (අලවන්නීමැයි).

ජන සමූහය තෙමේ බුදුරදුන් දැකීමේ රසය විඳීමෙහි නිරන්තරයෙන් ඇළුනේ වෙයි. උන් වහන්සේ තුල පවත්නා විස්මය උපදවනා සංයත ක්‍රියාව කවරකුගේ සිත නො අලවාද? (අලවාමය.)

(මෙය අටවන ගාථාවෙහි එන විස්තරයට උදහරණ වශයෙන් දක්වන ලදී. මෙම ගාථාවේ වැදගත් වන්නේ "සඤ්ඤත, ක්‍රියා" යන වචනයි.)

සඤ්	ඤ	තක්	රි	යා	නු
∪	–	∪	–	∪	–

"**විම්හයජනනී සඤ්ඤත**" යන පාදයේ අග ඇති "ත" අක්ෂරය ඊළඟ පාදයේ "ක්‍රි" අක්ෂරය සංයෝගයක් වන බැවින් ගරු අක්ෂරයක් ලෙස ගැනේ. (එය ඉහත වගුවේ දක්වා ඇත.) එහි සංයෝගයට මුලින් ඇති "ත" යන ලහු අක්ෂරය සංයෝගාදී ගරු ලෙස සැළකිය යුතු වුව ද මෙහි දී ලහු ලෙස ම සළකනු ලැබේ. සඤ්ඤත, ක්‍රියා වශයෙනි.

[6] මෙසේ පාදන්ත අක්ෂරය ගරු නොවන අවස්ථා ද ඇත. එය ඉදිරියේ දී විස්තර වේ.
[7] මෙය අරියා ගාථාවකි. (පසුව විස්තර වේ.)

විම්	හ	ය	ජ	න	නී	සඤ්ඤ	ඤ	ත	ක්‍රි	යා	නු	කං	නා	නු
∪	–	–	–	–	∪	∪	–	–	–	∪	–	∪	∪	–
මාත්‍රා 12 කි.														

මෙසේ සළකනු ලබන්නේ, මේ ගාථාව අරියා ගාථාවක් වන නිසා ය. එහි ප්‍රථම පාදයෙහි තිබිය හැක්කේ මාත්‍රා 12 ක් පමණි. (මෙය ඉදිරියේ එන අරියාජාතියේ 17 වන ගාථාව බැලීමෙන් වඩාත් පැහැදිලි වේ.)

10. විඤ්ඤෙය්‍යා ලොකතො සඤ්ඤ, සමුද්දෙ සු, රසාදිනං;
පාදෙ ඤෙය්‍යො චතුත්ථංසො, පදච්ඡෙදෙ යති භවෙ.

(සමුද්දෙසුරසාදිනං) සමුද්ද = සමුද්‍රය; **උසු** = ශරය (ඊතලය); **රසාදිනං** = රසය යනාදීන් සම්බන්ධි වූ; **සඤ්ඤ** = (සතර - පස - සය යනාදී) සංඥා තොමො; **ලොකතො** = වුත්ත ලෝකයා කෙරෙන් හෝ වුත්ත ව්‍යාවහාරයෙන්; **විඤ්ඤෙය්‍යා** = දත යුත්තී ය; **චතුත්ථංසො** = (ගාථාවගේ) සතර වන භාගය; **පාදෙ ඤෙය්‍යො** = පාදයකැ'යි දත යුත්තේ ය; **පදච්ඡෙදෙ** = පද සිඳීම; **යති භවෙ** = "යති" නම් වේ.

සමුද්ද, උසු, රස[8] ආදී පදයන්ගේ සඤ්ඤවෙන් කියවෙන්නා වූ අංකයන් ලෝක සම්මතයට අනුව දත යුතුයි. සමුද්ද යැයි සඳහන් වුවහොත් සමුද්‍ර 4 ක් ඇති බැවින් 4 ඉලක්කම ද, රස යැයි කී විට ඇඹුල් තිත්ත ආදී වශයෙන් රස 6 ක් ඇති බැවින් 6 ඉලක්කම ද ආදී වශයෙන් ගත යුතු ය. ගාථාවක හතරෙන් කොටස (1/4) පාදයක්[9] වේ. පදයන් ඡේදනය කිරීම "යතිය" නම් වේ[10].

11. සම,මඩ්ඪසමං, වුත්තං, විසමංචා'පරං තිධා;
සමා ලක්ඛණතො පාද, චත්තාරො යස්ස තං සමං.

සමං වුත්තං = සම වෘත්තය; **අඩ්ඪසමං වුත්තං** = අඩ්ඪසම වෘත්තය; **අපරං** = අන්‍ය වූ; **විසමංච වුත්තං** = විසම වෘත්තය දැයි; **තිධා** = (වෘත්තය) තුන් වැදෑරුම් වේ; **යස්ස** = යම් වෘත්තයක්හුගේ; **චත්තාරො පාද** = පාද සතර; **ලක්ඛණතො** = ලක්ෂණ වශයෙන්; **සමං** = සම වෙත්ද; **තං** = ඒ වෘත්තය; **සමං** = සම වෘත්තය නම් වේ.

සම, අද්ධ සම හා විසම වශයෙන් ගාථාවන් තුන් ආකාරයකට බෙදේ. මෙයින් සම යනු පාද හතරම සම[11] වන ගාථා යි.

12. යස්ස'න්තිමෙන දුතියො, තතියෙනා'දිමො සමො;
ත'දඩ්ඪසම, මඤ්ඤංතු, භින්න ලක්ඛණපාදිකං.

යස්ස = යම් වෘත්තයක්හුගේ; **දුතියො** = දෙ වෙනි පාදය තෙම; **අන්තිමෙන** = අන්තයෙහි වූ (සතර වන) පාදය හා; **සමො** = (ලක්ෂණ හෙයින්) සම වේද; **ආදිමො** = අදියෙහි වූ පාදය තෙම; **තතියෙන** = තුන් වෙනි පාදය හා; **සමො** = සම වේද; **තං** = ඒ වෘත්තය; **අඩ්ඪසමං** = අඩ්ඪසම නම් වේ; **තු** = නැවත; **අඤ්ඤං** = අන්‍ය වූ විසම වෘත්තය; **භින්න ලක්ඛණපාදිකං** = (එකිනෙකට) වෙනස් වූ ලක්ෂණයෙන් යුත් පාද ඇත්තේ වේ.

පළමු වෙනි පාදය හා තුන් වෙනි පාදය සම වේ නම් හා දෙ වෙනි පාදය හා හතර වන පාදය සම වේ නම් ඒ ගාථා අද්ධ සම ගාථා ලෙස හඳුන්වනු ලැබේ. පාද සතර ම එකිනෙකට අසමාන නම් එය විසම ගාථා නම් වේ[12].

13. පාද'මෙකක්ඛරා'රබ්භ, යාව ඡබ්බීසත'ක්ඛරා;
භවෙ පාදෙහි තං ඡන්දං, නානානාමො'දිතං තතො.

එකක්ඛරං පාදං ආරබ්භ = එක් අකුරක් ඇති පාදය පටන්; **යාව ඡබ්බීසතක්ඛරා** = සවිසි අකුරක් ඇති පාදය වේ ද; (**තාව** = ඒතාක්;) **පාදෙහි** = (එක් එක් අකුරෙන් වඩනා ලද) පාදයන් කරණ කොටගෙන;

---

[8] සමුද්ද = මුහුදු 4 කි, උසු = ඊතල 5 කි, රස = රස 6 කි.
[9] ගාථාවක එක් පාදයක් ගැන කිය වේ.
[10] යති පළිබඳ ඉදිරියේ එන 18 වන ගාථාවේ දී විස්තර වේ.
[11] අක්ෂර වශයෙන් පමණක් නොව මාත්‍රා වශයෙන්ද සමවී තිබීම මෙයින් අදහස් වේ.
[12] ඉහත කී සම, අද්ධසම දෙකට අයත් නොවන සියළු ම ගාථා විසම ගාථාවන් වේ.

නානානාමොදිතං = (උක්තාදී වූ) විවිධ නාමයන්ගෙන් කියන ලද; **යං ඡන්දං භවෙ** = ඒ ඡන්දස්[13] වන්නේ යැයි ද; **තතො** = ඒ සවිසිවන ඡන්දසින් මත්තෙහි-

එක් අකුරක පාදයකින් පටන් ගෙන අකුරු 26 ක් දක්වා වන පාද ඇති ඡන්දස් නොයෙක් නම් වලින් හඳුන්වනු ලැබේ. එක් පාදයක එක් අකුරක් පමණක් ඇත්නම් එම ඡන්දස උත්තා නම් වේ. දෙකක් ඇත්නම් අච්චුත්තා නම් වේ, ආදී වශයෙනි. (තුන් වෙනි පරිච්ඡේදවසානයෙහි මෙය පැහැදිලි කොට ඇත.)

14. දණ්ඩකාචණ්ඩවුට්ඨා'දි, පාදෙහි ඡහි, තීහි තු;
'ගාථා'ති ච පරත්ථෙ'වං, ඡන්දෙ සඤ්ඤපකාසිතා.

චණ්ඩවුට්ඨා'දි = චණ්ඩවෘෂ්ටිප්‍රපාතාදී වූ; **දණ්ඩකා** = දණ්ඩක වෘත්තයෝ වෙත් යයි ද; **තු** = නැවත; **ඡහි තීහි පාදෙහි** = සපාදයකින් තුන් පාදයකින් යුක්ත වූවා; **ගාථා ඉති ච** = ගාථා නම් වන්නී යයි ද; **එවං** = මෙසේ; **පරත්ථ** = පරශාස්ත්‍රයෙහි; **ඡන්දෙ සඤ්ඤ** = ඡන්දස් සඤ්ඤ තොමෝ; **පකාසිතා** = ප්‍රකාශ කරන ලද්දේ ය.

දණ්ඩක, ඡණ්ඩවුට්ඨි ආදී පාද 3 ක් හෝ 6 ක් ඇති ගාථාත් සංස්කෘත ග්‍රන්ථයන් හි ගාථා නමින් හැඳින්වේ.

15. අනන්තරො'දිතං ච'ඤ්ඤ, මෙතං සාමඤ්ඤනාමතො;
'ගාථා'ඉච්චෙව නිද්දිට්ඨං, මුනින්දවචනෙ පන.

අනන්තර + උදිතං ච = ("පාදමෙකක්ඛරාරබ්භ" යනාදින්) අන්තරයෙහි කියන ලද වර්ණ ඡන්දස් ද; **අඤ්ඤං** = අන්‍ය වූ (ආර්යාදී) මාත්‍රා ඡන්දස්ද යන; **එතං** = මේ සියල්ල; **මුනින්දවචනෙ පන** = මුනීන්ද්‍ර වචනයෙහි වනාහි; **සාමඤ්ඤනාමතො** = සාමාන්‍ය නාම හෙයින්; **ගාථා + ඉති + එව** = ගාථා යයි කියා ම; **නිද්දිට්ඨං** = දක්වන ලද්දී ය.

වර්ණ ඡන්දස් හා මාත්‍රා ඡන්දස්[14] යන මේ දෙවර්ගය ම බුදුරජාණන් වහන්සේගේ වචනයෙහි හෙවත් පෙළෙහි "ගාථා" යන සාමාන්‍ය නාමයෙන් ම හඳුන්වා ඇත.

තවත් ක්‍රමයෙකින් මෙයට අර්ථ දක්වන්නේ නම්, පෙර ගාථාවෙහි සඳහන් දණ්ඩක, චණ්ඩවුට්ඨි ආදී ගාථා ද, අන්‍ය වූ අරියා ආදී ගාථා ද බුදුරජාණන් වහන්සේ වචනයෙහි හෙවත් පෙළෙහි 'ගාථා' යන සාමාන්‍ය නමින් ම දක්වා ඇත.

16. විසෙසනාමතො කිඤ්චි, ගහෙත්වා සබ්බතො'චිතං;
දස්සයිස්සාම'හං තෙ'ත්ථ, නාමානා'වි භවිස්සරෙ.

සබ්බතො චිතං = සර්වප්‍රකාරයෙන් උචිත වූ; **කිඤ්චි** = කිසි වෘත්ත කෙනෙක්; **විසෙසනාමතො** = විශේෂ නාමයෙන්; **ගහෙත්වා** = ගෙන; **අහං** = මම; **එත්ථ** = මේ "වුත්තෝදය" නම් ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **දස්සයිස්සාමි** = දක්වන්නෙමි; **නාමානි** = (දැක්විය යුතු ඡන්දස් හා වෘත්තයන්ගේ) නාමයෝ; **ආවිභවිස්සරෙ** = (ඒ ඒ තැන්හි) මතු පහළ වන්නාහු ය.

අරියාදී වූ විශේෂ නාමයන්ගෙන් සර්වප්‍රකාරයෙන් ම රචනා කරනු ලැබෙන්නා වූ ගාථා නාමයන්, ඡන්දස් නාමයන් ඒකදේශයක් පමණක් ගෙනහැර මෙහි දී මා විසින් දන්වනු ලැබේ. ඒ නාමයන් ඉදිරියේ දී ප්‍රකට වනු ඇත.

මේ වුත්තෝදයෙහි නොකියවෙන උත්තා, අච්චුත්තාදී වූ ඡන්දස් ද දණ්ඩකා, චණ්ඩවුට්ඨාදි වූ නා නා විධ ගාථා ද ඇති බව මේ අනුව දත යුතු. ඒ දැක්විය යුතු ඡන්දස් හා වෘත්තයන්ගේ නාමයෝ ඒ ඒ තැන්හි දී මතු ප්‍රකට වන්නාහු ය.

ඉති වුත්තොදයෙ ඡන්දසි සඤ්ඤපරිභාසා නිද්දෙසො නාම

පඨමො පරිච්ඡෙදො.

වුත්තෝදය ඡන්දස් ග්‍රන්ථයෙහි සඤ්ඤපරිභාසා නිද්දේස නම් වූ
පළමු පරිච්ඡේදය නිමි.

---

[13] ගාථාවේ තියෙන අක්ෂර ගණන නියම කිරීම ඡන්දස යනුවෙන් කිය වේ. "අක්ඛර නියමො ඡන්දං."
[14] වරණ ඡන්දස් හා මත්තා ඡන්දස් ගැන ඉදිරියේදී කියවෙන නිසා මෙහිදී විස්තර නො කරමි.

මත්තාවුත්තිනිද්දෙස - දුතියපරිච්ඡේද

වුත්තෝදයෙහි ගාථා කාණ්ඩ දෙකකි.

1. මත්තාවුත්ති ගාථා (මාත්‍රාවන් අනුව ගණ බෙදීමෙන් සෑදෙන ගාථා)
2. වණ්ණවුත්ති ගාථා (අක්ෂරයන් අනුව ගණ බෙදීමෙන් සෑදෙන ගාථා)

මෙහි මත්තාවුත්ති ගාථා කාණ්ඩය ද කොටස් 4 කට බෙදේ.

1. අරියාජාති 2. ගීතිජාති 3. වේතාලියජාති 4. මත්තාසමකජාති යනුවෙනි.

අරියාජාතියො

මත්තානියමෙන අරති පවත්තතීති අරියා. මත්තාවසෙන අරීයතෙ ඤයතෙති අරියා. අරියානං වාචාති අරියා. අරියා වියාති අරියා.

මාත්‍රා නියමයෙන් පවතින බැවින් අරියා නම් වේ. මාත්‍රා වශයෙන් දැනගනු ලැබෙන බැවින් අරියා නම් වේ. ආර්‍යන් වහන්සේලාගේ වචනය වන බැවින් අරියා නම් වේ. ආර්‍යන් වහන්සේලාගේ වචනය වැනි වන බැවින් අරියා නම් වේ.

අරියා වෘත්තයන්හි ගරු 1 ක් මාත්‍රා 2 කි. ලහු 1 ක් මාත්‍රා 1 කි. මාත්‍රා 4 ක් ගණයකි. අරියා ජාතියේ එන මෙම ගණ පස පිළිවෙළින් මෙසේ දැක්විය හැක.

	∪	∪	මගණ
මාත්‍රා ගණන	2	2	4

	–	–	∪	සගණ
මාත්‍රා ගණන	1	1	2	4

	–	∪	–	ජගණ
මාත්‍රා ගණන	1	2	1	4

	∪	–	–	භගණ
මාත්‍රා ගණන	2	1	1	4

	–	–	–	–	නගණ
මාත්‍රා ගණන	1	1	1	1	4

මේ අනුව මත්තාවුත්ති ගාථාවන්හි බොහෝ සෙයින් යෙදෙන්නේ ඉහත පෙන්වන ලද මගණ, නගණ, ජගණ, සගණ හා භගණ යන ගණයන් පමණි. ඒ ගණයකට මාත්‍රා 4 බැගින් පිහිටන නිසා ය[15].

ගණනියම

මෙහිදී අරියා ජාතියේ ගාථාවන්ගේ ගණ නියමයන් දක්වනු ලැබේ. මෙම නීති සියළුම අරියාජාති ගාථාවන්ට පොදු ය.

17. ඡට්ඨො'ඛිලලහු,ජො වා, ගයුතා'ඤ්ඤෙ,ඡ'ග්ගණා,න ජො විසමෙ[16].;
අරියාය'න්තඩ්ඩෙ ලො, ඡට්ඨො,'න්තෙ ගො,ගණා ඡ'ඤ්ඤෙ.

[15] මාත්‍රා 5 ක් ඇති රගණයට යෙදුන අවස්ථා ඇත. ප්‍රධාන වශයෙන් මෙහි කියන ලද ගණ 5 පමණක් ගැනේ.

[16] මෙම මත්තාවුත්ති නිද්දේසයේ ගාථාවන් පාද 4 කින් යුක්ත වේ. ගණ 8 එක දිගට දැක්වීම තේරුම් ගැනීමට පහසු නිසා පාද දෙකක් එකම වගුවක අඳන ලදී. නමුත් කොටස් දෙකක් බව දත යුතුයි. පද දෙක බෙද වෙන්වන තැන තද කළු ඉරකින් පෙන්වා ඇත. මෙම අරියා ජාතියේ ඉදිරියට සියල්ල එසේ ම දක්වා ඇත.

අරියාය = ආරියා ජාතියගේ; **ඡට්ඨො** = (පූර්වාර්ධයෙහි) ස වෙනි ගණය තෙම; **අබිලලහු** = සර්ව ලහු ගණය හෝ; **ජො වා** = ජගණය හෝ වෙයි; **ගයුතා** = (අවසානයෙහි) ගරුවකින් යුක්ත වූ; **අඤ්ඤේ ගණා** = සෙසු ගණයෝ; **ඡ** = සදෙනෙක් වෙති; **විසමෙ** = (ප්‍රථම-තෘතීය-පඤ්චම-සත්තම-යන) විසමස්ථානයෙහි; **ජො** = ජගණය; **න** = නොවේ; **අන්තඩ්ඩෙ** = අන්තඩ්ඩයෙහි හෙවත් අපරාර්ධයෙහි; **ඡට්ඨො** = ස වෙනි වූයේ; **ලො** = ලහුවෙකි; **අන්තෙ** = අන්තයෙහි; **ගො** = ගරුවෙක් වේ; **අඤ්ඤේ ගණා** = සෙසු ගණයො; **ඡ** = සදෙනෙක් වෙති.

මෙම අරියා ජාතියේ පූර්වාර්ධයෙහි සය වෙනි ගණය සර්ව ලහු (නගණය) හෝ ජගණය හෝ වෙයි ද, අවසානයේ ගරුවකින් යුක්ත වේ ද, ඒ හැර සෙසු ගණයෝ සය දෙනෙක් වෙත් ද, විසමස්ථානයන්හි (ප්‍රථම-තෘතීය-පඤ්චම-සත්තම-යන ස්ථානයන්හි) ජගණය නොයෙදෙයි ද, අපරාර්ධයෙහි සය වෙනි ගණය ලහුවක් වේ ද, අවසානයේ ගරුක් සහ ඒ දෙක හැර ගණ සයක් ද වේ.

පළමු වෙනි අර්ධය

1		2				3		4			5		6			7			8
ඡට්	ඨො	බි	ල	ල	හු	ජො	වා	ග	යු	තාඤ්ඤ්	ඤේ	ඡග්	ග	ණා	න	ජො	වි	ස	මෙ
∪	∪	–	–	–	–	∪	∪	–	–	∪	∪	∪	–	∪	–	∪	–	–	∪
මගණ		නගණ				මගණ		සගණ			මගණ		ජගණ			භගණ			ගරු

මෙම 17 වන ගාථාවේ පළමු වෙනි අර්ධයේ ගණ නියමයන් හා දෙ වෙනි අර්ධයේ ගණ නියමයන් සමාන නොවේ. පළමු පාදය හා දෙ වෙනි පාදය ගාථාවේ පළමු අර්ධය නමින් ද, තුන් වෙනි පාදය හා හතර වෙනි පාදය දෙ වෙනි අර්ධය නමින්ද හැඳින්වේ. මෙම ගණ නියමයට අනුව අරියා ගාථාවෙහි ගණස්ථාන 8 ක් තිබිය යුතු ය. එම ගණසථාන 8 ඇතුළත

පළමු අර්ධයට අදාළ නීති තුනකි.

1. 6 වන ගණය අනිවාර්යයෙන් ජගණ හො නගණ වේ.
2. අවසාන අක්ෂරය අනිවාර්යයෙන් ගරු අක්ෂරයක් වේ.
3. 6 වන ගණය හා අන්ත ගරුව හැර තව ගණ 6 ක් තිබිය යුතුයි.

1, 3, 5, 7 යන විසමස්ථානයන්හි ජ ගණය නොවේ. මෙම 1, 3, 5, 7 යන ඔත්තේ ගණස්ථාන 4 ට වුත්තෝදයේ දී විසම ගණස්ථාන ලෙස කියනු ලැබේ.

දෙ වෙනි අර්ධය

1			2		3		4		5		6	7		8
අ	රි	යා	යන්	තඩ්	ඩෙ	ලො	ඡට්	ඨොන්	තෙ	ගො	ග	ණා	ඡඤ්ඤ්	ඤේ
–	–	∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	–	∪	∪	∪
සගණ			මගණ		මගණ		මගණ		මගණ		ලහු	මගණ		ගරු

මෙහි දෙ වෙනි අර්ධයට අදාළ නීති තුනකි.

1. දෙ වෙනි අර්ධයේ 6 වන ගණස්ථානයෙහි ලහු 1 ක් විය යුතුයි.
2. අවසානයේ ගරු 1 ක් ද විය යුතුයි.
3. ඒ දෙක හැර ගණ 6 ක් ද තිබිය යුතුයි.

මෙම දෙ වෙනි අර්ධයෙහිත් විසම තැන් වල ජගණය තැබිය නොහැක. අන් තැන්වල යෙදේ. "**න ජෝ විසමේ**" යන පදය මුල අග අර්ධ දෙකටම සාධාරණ වේ. එනම් විසම ගණයන් හි ජ ගණය නොයෙදේ.

ඒ අනුව පළමු වෙනි අර්ධයෙහි

1. 6 වන ගණය නගණයක් හෝ ජගණයක් විය යුතු යි.
2. අවසානයේ ගරු විය යුතු යි.
3. 6 වන ගණය හා අන්ත ගරුව හැර තව ගණ 6 ක් තිබිය යුතු යි.

දෙ වෙනි අර්ධයෙහි

1. 6 වන ගණය ලහු විය යුතු යි.
2. අවසානයේ ගරු විය යුතු යි.
3. ඒ දෙක හැර ගණ 6 ක් විය යුතු යි.

කලින් කී සේම "**න ජෝ විසමේ**" පාදය අර්ධ දෙකටම සමාන වේ. එනම් විසම ගණයන් හි ජ ගණය නොයෙදේ. (ඒ හැර අන් තැන්වල ජ ගණය යෙදිය හැක.)

ඉහත පළමු වෙනි අර්ධයෙහි නියම තුන හා දෙ වෙනි අර්ධයෙහි නියම තුනත් "**න ජෝ විසමේ**" යන නීතියත් සමග අරියා ගාථාවන්හි මෙම ගණ නියම (නීති) 7 යෙදේ.

මෙම අරියා ගාථාවන්ගේ පූර්වාර්ධයේ සහ අපරාර්ධයේ ඇති ගණස්ථාන 8 හි යෙදිය හැකි විකල්පයන් මෙසේ දැක්විය හැකිය.

පූර්වාර්ධයේ පළමු වෙනි, තුන්ව, පස්වන සහ සත්වන ස්ථානයන්හි ජගණය හැර අන් ගණ සතරින් එකක් යෙදිය හැකි ය. දෙ වෙනි ස්ථානයේ සහ සතරවන ස්ථානයේ ගණ පහෙන් එකක් යෙදේ. සයවන ස්ථානයේ යෙදිය හැක්කේ ජගණය හෝ නගණය පමණි. අටවන ස්ථානය අන්ත ගරු වේ.

අපරාර්ධයේ ඉහත කී සෙයින් ම යෙදේ. වෙනස වන්නේ හයවන ස්ථානයේ එක් ලහුවක් යෙදීම පමණි.

පූර්වාර්ධය							
1	2	3	4	5	6	7	8
මගණ භගණ නගණ සගණ	මගණ ජගණ භගණ නගණ සගණ	මගණ භගණ නගණ සගණ	මගණ ජගණ භගණ නගණ සගණ	මගණ භගණ නගණ සගණ	ජගණ නගණ	මගණ භගණ නගණ සගණ	අන්ත ගරු

අපරාර්ධය							
1	2	3	4	5	6	7	8
මගණ භගණ නගණ සගණ	මගණ ජගණ භගණ නගණ සගණ	මගණ භගණ නගණ සගණ	මගණ ජගණ භගණ නගණ සගණ	මගණ භගණ නගණ සගණ	ලහු	මගණ භගණ නගණ සගණ	අන්ත ගරු

මෙම ලක්ෂණ අරියා ජාතියේ එන සියළුම ගාථාවන්ට සමාන වේ.

මෙම අරියා ගාථාවට උදාහරණයක් නම්:-

කරුණා සීතල හදයං - පඤ්ඤු පජ්ජෝත විගත මෝහ තමං
සනරාමර ලෝක ගරුං - වන්දේ සුගතං ගති විමුත්තං

(සීලක්ඛන්ධවග්ග අට්ඨකථා)

1			2			3			4		5		6				7			8
ක	රු	ණා	සී	ත	ල	හ	ද	යං	පඤ්	ඤු	පජ්	ජෝ	ත	වි	ග	ත	මෝ	හ	ත	මං
–	–	∪	∪	–	–	–	–	∪	∪	∪	∪	∪	–	–	–	–	∪	–	–	∪
සගණ			භගණ			සගණ			මගණ		මගණ		නගණ				භගණ			ගරු

1			2			3			4		5			6	7			8
ස	න	රා	ම	ර	ලො	ක	ග	රුං	වන්	දෙ	සු	ග	තං	ග	ති	වි	මුත්	තං
–	–	∪	–	–	∪	–	–	∪	∪	∪	–	–	∪	–	–	–	∪	∪
සගණ			සගණ			සගණ			මගණ		සගණ			ලහු	සගණ			ගරු

මෙම අරියා ගාථාවට තවත් උදාහරණයක් මෙසේ ය.

දස්සන රසානු භවනේ - නිබද්ධගේධා ජිනස්ස'යං ජනතා
විම්භය ජනනී සඤ්ඤත - ක්‍රියානු කං නානු රඤ්ජයතී

(වුත්තෝදය - ගාථා අංක 9)

1			2			3			4			5		6			7			8
දස්	ස	න	ර	සා	නු	භ	ව	නෙ	නි	බද්	ධ	ගෙ	ධා	ජි	නස්	ස	යං	ජ	න	තා
∪	–	–	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	–	–	∪
භගණ			ජගණ			සගණ			ජගණ			මගණ		ජගණ			භගණ			ගරු

1			2			3			4			5		6	7			8
විම්	භ	ය	ජ	න	නී	සඤ්	ඤ	ත	ක්‍රි	යා	නු	කං	නා	නු	රඤ්	ජ	ය	තී
∪	–	–	–	–	∪	∪	–	–	–	∪	–	∪	∪	–	∪	–	–	∪
භගණ			සගණ			භගණ			ජගණ			මගණ		ලහු	සගණ			ගරු

ඉහත කී සියළුම නියමයන් මෙම උදාහරණ ගාථා දෙකෙහි නිවැරදිව දැකිය හැක.

යති නියම.

පදච්ඡේදය කිරීම යති නම් වන බව 10 වන ගාථාවෙහි කියන ලදී. මෙහි පදච්ඡේදය කිරීම යනු සජ්ඣායනා නොකර මද වේලාවක් නැවතී සිටීම යි. මෙම යතිය පාදන්ත යති, පාදමජ්ඣ යති යනුවෙන් දෙවැදෑරුම් වේ. මේ දෙවර්ගයෙන් පාදන්ත යතිය ප්‍රකට ය. පාදයක් අවසානයේ ඊළඟ පාදය සජ්ඣායනයට පෙර මදක් නවතා සිටීම පාදන්ත යතිය යි. සමහර ගාථාවල පාදය මධ්‍යයෙහි ද නැවතිය යුතු තැන් ඇත. මේවා පාදමජ්ඣ යති නම්. මේ යති නියමයෙහි විස්තර වන්නේ පාදමජ්ඣ යතිය යි. තුන් වෙනි පරිච්ඡේදයේ දී පාදන්ත යතිය ද යති වශයෙන් දක්වා ඇත.

18. **පඨමඩ්ඩෙ ඡට්ඨො වෙ, සබ්බලහෙ'ත්ථා'දිලහුනි භවති යති;**
තප්පරකො'න්තෙපි, සචෙ චරිමෙපි, භවති චතුත්ථො'න්තෙ

පඨමඩ්ඩෙ = ආර්යා ප්‍රථමාර්ධයෙහි; **ඡට්ඨො** = ස වෙනි ගණය; **වෙ** = ඉදින්; **සබ්බලහු** = සර්ව ලහු ගණය වී නම්; **එත්ථ** = මේ (ස වෙනි) සර්ව ලහු ගණයෙහි; **ආදිලහුනි** = ආදි ලහුවෙහි; **යති භවති** = යතිය වෙයි; (ආදි ලහුගේ අන්තයෙහි යතිය වෙයි යන අර්ථය යි) **සො** = ඒ ස වෙනි ගණය තෙම; **වෙ** = ඉදින්; **තප්පරකො** = ඒ සර්ව ලහු ගණය පර කොට ඇත්තේ වී නම්; (සත්වෙනි ගණය ද සර්ව ලහු වී නම් යන අර්ථය යි.) **අන්තෙ + අපි** = ස වෙනි ගණයාගේ අන්තයෙහි ද; යතිය වේ; **චරිමෙ** = අපරාර්ධයෙහි; **චතුත්ථො** = සතර වන ගණය තෙම; **තප්පරකො** = ඒ සර්ව ලහු ගණය පර කොට ඇත්තේ නම්; (පස්වෙනි ගණය සර්ව ලහු වී නම් යන අර්ථය යි.) **අන්තෙ** = සතර වෙනි ගණයාගේ අන්තයෙහි; **පභවති** = යතිය ලැබේ.

පළවෙනි අර්ධයෙහි 6 වන ගණය නගණයක් වේ නම්, එහි පළ වෙනි ලහුවෙන් පසුව යතිය යෙදේ. දෙ වෙනි අර්ධයෙහි හය වෙනි ගණයෙන් පසු නගණයක් වේ නම් හය වෙනි ගණය අවසානයේ යතිය යෙදේ. අවසාන අර්ධයෙහි හතර වෙනි ගණයෙන් පසු නගණයක් වේ නම් හතර වෙනි ගණය අවසානයේ යතිය යෙදේ. (මෙහි දක්වා ඇති ගාථාවෙහි පූර්වාර්ධයෙහි හය වන ගණය නගණයක් වූ නිසා එහ නගණයෙහි පළමු වෙනි මාත්‍රාව හැර යතිය තබා ඇත.)

පූර්වාර්ධය

1			2		3		4			5		6				7				8
ප	ඨ	මඩ්	ඤ	ඡට්	ඨො	චෙ	සබ්	බ	ල	හෙත්	ථා	දි	ල	හු	නි	භ	ව	ති	ය	ති
–	–	∪	∪	∪	∪	∪	∪	–	–	∪	∪	–	–	–	–	–	–	–	–	∪
සගණ			මගණ		මගණ		භගණ			මගණ		නගණ				නගණ				ගරු

මෙහි "**සබ්බල හෙත්ථාදි**" යන්න හා "**ලහුනි භවති යති**" යන්න වෙන්කර සජ්ඣායනා කළ යුතු ය.

අපරාර්ධය

1			2		3			4			5				6	7		8
තප්	ප	ර	කොන්	තෙ	පි	ස	චෙ	ච	රි	මෙ	පි	භ	ව	ති	ච	තුත්	ථොන්	තෙ
∪	–	–	∪	∪	–	–	∪	–	–	∪	–	–	–	–	–	∪	∪	∪
භගණ			මගණ		සගණ			සගණ			නගණ				ලහු	මගණ		ගරු

මෙහි "**චරිමෙ**" යන්න හා "**පි භවති**" යන්න වෙන්කර සජ්ඣායනය කළ යුතු ය.

19. අරියාසාමඤ්ඤං චෙ, පුබ්බො'දිත ලක්ඛණං භවති[17] යස්සා.

ඉහත දැක්වූයේ මෙම ගාථාවේ පූර්වාර්ධය යි. මෙම ගාථාවේ අපරාර්ධය මෙසේ ය. එය වුත්තෝදය පාළියෙහි ඇතුළත් නොවේ.

❖ **ඡට්ඨො බිලාදි නොයති, පඨමඩ්ඩෙච්චාදි යතිමං වා**

මෙම අර්ධ දෙක එක් කර අර්ථය මෙසේ දත යුතු ය.

(**යස්සා** = යම් ගාථාවක;) **නොයති** = යති නැත්තා වූ; **ඡට්ඨො බිලාදි** = ඡට්ඨෝ බිල ආදී වූ; (**පුබ්බොදිතලක්ඛණිකං** = පූර්ව සූත්‍රයේ කියන ලද ලක්ෂණ ද;) **යතිමං** = යති ඇත්තා වූ; **පඨමඩ්ඩෙච්චාදි** = පළමු වෙනි අර්ධයේ ආදී වූ; (පූර්ව සූත්‍රයේ කියන ලද ලක්ෂණ ද) (**චෙ** = ඉදින් වේ ද: **සා** = ඒ ගාථාව; **අරියාසාමඤ්ඤං** = අරියාසාමඤ්ඤ ගාථාව; **භවෙ** = වෙයි.)

ඉදින් යම්කිසි ගාථාවකගේ (පූර්වයේ කියන ලද යති නියම, ගණ නියම) ලක්ෂණය වේ නම් **අරියාසාමඤ්ඤ** (අරියා සාමාන්‍ය) නම් වේ.

සමානස්ස භාවො සමඤ්ඤං. අරියාහි සාමඤ්ඤං අරියාසාමඤ්ඤං.

සමාන වූවගේ භාවය සාමඤ්ඤ නම් වේ. අරියා ගාථාවන් සමඟ සමාන භාවය ඇති බැවින් අරියාසාමඤ්ඤ නම් වේ.

පූර්වාර්ධය

1			2		3		4		5			6			7			8
අ	රි	යා	සා	මඤ්	ඤං	චෙ	පුබ්	බො	දි	ත	ලක්	ඛ	ණං	භ	ව	ති	යස්	සා
–	–	∪	∪	∪	∪	∪	∪	∪	–	–	∪	–	∪	–	–	–	∪	∪
සගණ			මගණ		මගණ		මගණ		සගණ			ජගණ			සගණ			ගරු

අපරාර්ධය

1		2			3			4			5		6	7			8
ඡට්	ඨො	බි	ලා	දි	නො	ය	ති	ප	ඨ	මඩ්	ඤෙච්	චා	දි	ය	ති	මං	වා
∪	∪	–	∪	–	∪	–	–	–	–	∪	∪	∪	–	–	–	∪	∪
මගණ		ජගණ			භගණ			සගණ			මගණ		ලහු	සගණ			ගරු

[17] බුරුම පොත්හි **භවති** යන්න **භවේ** ලෙස දක්වා ඇත. එවිට 7 වන ගණය මගණ වේ.

20. ආදිම'මථ පාදයුගං, යස්සා ත්‍යං'සෙහි සා පථ්‍යා.

මෙම පාඨය ගාථාවේ අපරාර්ධය ය. පූර්වාර්ධය පහත පරිදි ය. මෙය වුත්තෝදය පාළියේ ඇතුළත් නොවේ. (බුරුම පොත් වලින් උපුටා ගන්නා ලද්දකි.)

❖ **පුබ්බොදිත ලක්ඛණිකෙ, පුබ්බඩ්ඪන්තෙ යථුත්ථ ලක්ඛණිකං.**

පද දෙකම එකතුව අර්ථය මෙසේ ගත යුතු ය.

(**යස්සා** = යම් ගාථාවක;) **පුබ්බොදිත ලක්ඛණිකෙ** = ඡට්ඨෝ බිල ආදී වූ ද, ප්‍රථමාර්ධයෙහි ආදී වූ ද පූර්ව සූත්‍රයේ කියන ලද ලක්ෂණ ඇත්තා වූ; **පුබ්බඩ්ඪන්තෙ** = පූර්ව අපර යන අර්ධ දෙකෙහි ම; **යථුත්ථ ලක්ඛණිකං** = යම් යම් සේ කියන ලද ලක්ෂණ ඇත්තා වූ; **ආදිමං** = මුල ඇති; **පාද යුගං** = පාදයුගලය; **ත්‍යංසෙහි** = තුන් ගණයන්ගෙන්; **අථ යුත්තං** = ඉදින් යුක්ත වේ ද; **සා** = එම ගාථාව; **පථ්‍යා** = පථ්‍යාවත්ත ගාථාව නම්; **භවෙ** = වන්නේ ය.

ඉදින් යම් ගාථාවක ඡට්ඨෝ බිල ආදී වූ පූර්ව සූත්‍රයේ ප්‍රථමාර්ධයෙහි කියන ලද ලක්ෂණ ඇත්තා වූ ද, පූර්ව අපර යන අර්ධ දෙකෙහි ම යම් යම් සේ කියන ලද ලක්ෂණ ඇත්තා වූ පාද දෙකෙහි ම පළමු පාදය ගණ තුනකින් යුක්ත වේ ද, එම ගාථාව **පථ්‍යා (පථ්‍යාවත්ත)** ගාථාව නම් වන්නේ ය.

සාමඤ්ඤතො විසෙසෙන පථයතෙ උච්චාරීයතෙති පථ්‍යා.

සාමාන්‍ය වූවට වඩා විශේෂයෙන් උච්චාරණය කරනු ලැබෙන බැවින් පථ්‍යා නම් වේ.

පූර්වාර්ධය

1		2			3			4		5		6			7			8
පුබ්	බො	දි	ත	ලක්	ඛ	ණි	කෙ	පුබ්	බඩ්	ඪන්	තෙ	ය	ථුත්	ථ	ලක්	ඛ	ණි	කං
∪	∪	–	–	∪	–	–	∪	∪	∪	∪	∪	–	∪	–	∪	–	–	∪
මගණ		සගණ			සගණ			මගණ		මගණ		ජගණ			භගණ			ගරු

අපරාර්ධය

1			2			3			4		5		6	7		8
ආ	දි	ම	ම	ථ	පා	ද	යු	ගං	යස්	සාත්	යං	සෙ	හි	සා	පථ්	යා
∪	–	–	–	–	∪	–	–	∪	∪	∪	∪	∪	–	∪	∪	∪
භගණ			සගණ			සගණ			මගණ		මගණ		ලහු	මගණ		ගරු

21. යත්ථ ගණත්තය මුල්ලඩ්ඪි, යො'භයත්ථා'දිමො භවෙ විපුලා.

යත්ථ = යම් ආර්යාවක; **උභයත්ථ** = උභයාර්ධයෙහි; **ගණත්තයං** = ගණ තුනක්; **උල්ලඩ්ඪිය** = ඉක්මවා; **ආදිමො** = ප්‍රථම පාදය; **භවෙ** = වන්නේ ද; (මෝ ආර්යා තොමො) **විපුලා** = "විපුලා" නම් වේ.

මෙයද අරියා ගාථාව හා සම්බන්ධ වේ. යම් කිසි ගාථාවක දෙතැන්හිම (පළමු වෙනි හා දෙ වෙනි කොටස් දෙකෙහිම) පළමු වෙනි පාදය ගණ තුන ඉක්මවා ගොස් තිබේනම් එය **විපුලා** නම් වේ.

පථ්‍යාතො විසිට්ඨෙන පකාරෙන උලති පවත්තතීති විපුලා.

පථ්‍යා ගාථාවට වඩා විශිෂ්ඨ වූ ප්‍රකාරයෙන් පවතින බැවින් විපුලා නම් වේ.

පූර්වාර්ධය

1			2			3		4			5		6			7			8
යත්	ථ	ග	ණත්	ත	ය	මුල්	ලං	සි	යො	භ	යත්	ථා	දි	මො	භ	වෙ	වි	පු	ලා
∪	–	–	∪	–	–	∪	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	–	–	∪
භගණ			භගණ			මගණ		ජගණ			මගණ		ජගණ			භගණ			ගරු

මෙහි "සි" යන ලහුව නිසා ගණ තුනෙන් පළමු වෙනි පාදය අවසන් නොවේ. එසේ ලහු එකක් වැඩිපුර යෙදීම ගණ තුන පැන යාම නම් වේ.

මෙහි දෙ වෙනි භාගය මෙසේ දත යුතුයි. (මෙය වුත්තෝදය පාළියේ සඳහන් නොවේ.)

❖ **පඨමඩ්ඩෙ චරිමෙ දුම්හි, ලංඝතො සා තිධා ඤෙය්‍යා**

සා = එම විපුලා ගාථාව; **පඨමඩ්ඩෙ** = පූර්ව අර්ධයෙහි ද; **චරිමෙ** = අවසන් අර්ධයෙහි ද; **දුම්හි** = අර්ධ දෙකෙහි ම; **ලංඝතො** = ගණ තුන ඉක්මවීම් වශයෙන්; **තිධා** = ත්‍රිවිධ වේ යැයි; **ඤෙය්‍යා** = දත යුතුය.

එම විපුලා ගාථාව පළමු, අවසන් යන අර්ධ දෙකෙහිම ගණ තුන ඉක්මවීම් වශයෙන් ත්‍රිවිධ වේ යැයි දත යුතු ය.

අපරාර්ධය

1			2			3		4			5		6	7		8
ප	ඨ	මඩ්ඩ	ඩෙ	ච	රි	මේ	දුම්	හි	ලං	ඝ	තො	සා	ති	ධා	ඤෙය	යා
–	–	∪	∪	–	–	∪	∪	–	∪	–	∪	∪	–	∪	∪	∪
සගණ			භගණ			මගණ		ජගණ			මගණ		ලහු	මගණ		ගරු

සැ.යු:- අරියා ගාථාවන්හි මාත්‍රා ගණන 57 ක් විය යුතුයි. ගරු අක්ෂරයක මාත්‍රා 2 ක් හැටියටත් ලහු අක්ෂරයක මාත්‍රා 1 ක් හැටියටත් ගෙන ගණන් කළ යුතු ය. ඉදිරියෙහි එන මුඛවිපුලා ගාථාවට දක්වන ලද උදාහරණ ගාථාවේ මාත්‍රා ගණන පෙන්වා ඇත.

මෙම විපුලා ගාථාවන් වර්ග තුනකි

1. අරියා ගාථාවක ප්‍රථම අර්ධයේ පළමු වෙනි පාදය ගණ තුනට වඩා ඉක්මවා යෑම **මුඛවිපුලා**[18] නම් වේ.

1			2			3		
යත්	ථ	ග	ණත්	ත	ය	මුල්	ලං	සි
∪	–	–	∪	–	–	∪	∪	–
භගණ			භගණ			මගණ		

මෙහි "**සි**" මාත්‍රාව පැන ගොස් තිබේ. ඒ අයුරින් එක් අක්ෂරයක් පැන යාම (වැඩිපුර යෙදීම) මෙයින් අදහස් කරයි.

2. අරියා ගාථාවේ දෙ වෙනි අර්ධයෙහි පළමු වෙනි පාදය ගණ තුනට වඩා ඉක්මවා යෑම **ජඝනවිපුලා** නම් වේ. ඉහත ආකාරයටම පළමු වෙනි පාදය ඉක්මවා නොගොස් තුන් වෙනි පාදයේ අක්ෂරයක් ඉක්මවා යාම මෙයින් අදහස් වේ.
3. අරියා ගාථාවේ අර්ධ දෙකෙහිම පළමු පාද දෙකෙහි ම ගණ තුනට වඩා ඉක්මවා යෑම **උභයවිපුලා** නම් වේ.

අංක 1 හි සඳහන් මුඛවිපුලා ගාථාවට උදාහරණයක් නම්:-

එවං පාළිනයෙනෙව, තාව සබ්බානි තානි ජානිත්වා;
තෙස්වෙව අයං භියොා, පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

(අට්ඨසාලිනී අට්ඨකථා)

පූර්වාර්ධය

	1		2			3		4			5		6			7		8
මාත්‍රා	2	2	2	1	1	2	2	1	2	1	2	2	1	2	1	2	2	2
	එ	වං	පා	ළි	න	යෙ	නෙ	ව	තා	ව	සබ්	බා	නි	තා	නි	ජා	නිත්	වා
	∪	∪	∪	–	–	∪	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	∪	∪
	මගණ		භගණ			මගණ		ජගණ			මගණ		ජගණ			මගණ		ගරු

[18] සමහර වුත්තොදය ග්‍රන්තවල මෙම මුඛවිපිලා ගාථාව මහාවිපුලා නමින්ද දක්වා ඇත.

අපරාර්ධය

	1		2			3		4			5			6	7		8
මාත්‍රා	2	2	1	1	2	2	2	1	2	1	1	1	2	1	2	2	2
	තෙස්	වෙ	ව	අ	යං	භියි	යො	ප	කිණ්	ණ	ක	ක	ථා	පි	විඤ්ඤ	ඤෙය්	යා
	∪	∪	–	–	∪	∪	∪	–	∪	–	–	–	∪	–	∪	∪	∪
	මගණ		සගණ			මගණ		ජගණ			සගණ			ලහු	මගණ		ගරු

අංක දෙකෙහි සඳහන් ජසනවිපුලා ගාථාවට උදාහරණයක් නම්:-

සංවණ්ණනා පවත්තා, විනයස්ස විනෙයාදමනකුසලෙන;
වුත්තස්ස ලොකනාථෙන, ලොකමනුකම්පමානෙන.

(පාරාජිකකණ්ඩ අට්ඨකථා)

1		2			3		4			5			6				7			8
සං	වණ්	ණ	නා	ප	වත්	තා	වි	න	යස්	ස	වි	නෙය්	ය	ද	ම	න	කු	ස	ලෙ	න
∪	∪	–	∪	–	∪	∪	–	–	∪	–	–	∪	–	–	–	–	–	–	∪	∪
මගණ		ජගණ			මගණ		සගණ			සගණ			නගණ				සගණ			ගරු

1		2			3		4			5			6	7		8
වුත්	තස්	ස	ලො	ක	නා	ථෙ	න	ලො	ක	ම	නු	කම්	ප	මා	නෙ	න
∪	∪	–	∪	–	∪	∪	–	∪	–	–	–	∪	–	∪	∪	∪
මගණ		ජගණ			මගණ		ජගණ			සගණ			ලහු	නගණ		ගරු

මෙම ගාථාවෙහි තුන් වෙනි පාදයේ "න" අක්ෂරය ගණ තුනට වඩා පැන ගොස් ඇති නිසා මෙයජසන විපුලා ගාථාවක් වේ.

22. ගරුමජ්ඣගො ජකාරො, චතුත්ථකො දුතියකො චපලා.

මේ චපලා ගාථාවේ අපරාර්ධය යි. පාළියෙහි දක්නට නොලැබෙන පූර්වාර්ධය මෙසේ ය.

❖ **පථ්‍යාදි ලක්ඛණත්තා, චතුබ්භිද සො භයත්ථ යස්සා චෙ**

යස්සා = යම් ආර්යාවකගේ; **උභයත්ථ** = උභයාර්ධයෙහි; **චතුත්ථකො** = සතරවැනි වූ ද; **දුතියකො** = දෙවැනි වූ ද; **ජකාරො** = ජගණය; **ගරුමජ්ඣගො** = ගරු දෙකක්හුගේ මැදට පැමිණියේ වේ ද; **සා** = ඕ තොමො; **චපලා** = චපලා නම් වන්නී ය; **සා චපලා** = ඒ චපලා තොමෝ; **පථ්‍යාදිලක්ඛණත්තා** = පථ්‍යාදි ගාථාවන්ගේ ලක්ෂණ ඇති බැවින්; **චතුබ්භිද** = සතර වැදෑරුම් වන්නී ය.

යම් ආරියා ගාථාවකගේ අර්ධ දෙකෙහි ම හතර වෙනි ගණය හා දෙ වෙනි ගණය ජගණය විය යුතුයි. ඒ දෙකෙහි ම දෙපස (එම ගණයන්ට පෙර හා පසුව) ගරු දෙක බැගින් තිබිය යුතුයි. ගරු මැද පිහිටි හතර වන දෙ වෙනි ගණය ඇත්නම් එය **චපලා** වේ.

චුපති එකත්ත න තිට්ඨතීති චපලා.

චලනය වන එක් තැනක නොසිටන බැවින් චපලා නම් වේ.

පූර්වාර්ධය

1		2			3		4			5		6			7		8
පථ්	යා	දි	ලක්	ඛ	ණත්	තා	ච	තුබ්	භි	ද	සො	භ	යත්	ථ	යස්	සා	චෙ
∪	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	∪	∪
මගණ		ජගණ			මගණ		ජගණ			මගණ		ජගණ			මගණ		ගරු

අපරාර්ධය

1			2			3		4			5			6	7			8
ග	රු	මජ්	ඣ	ගො	ජ	කා	රො	ච	තුත්	ථ	කො	දු	ති	ය	කො	ච	ප	ලා
–	–	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	–	–	–	∪	–	–	∪
සගණ			ජගණ			මගණ		ජගණ			භගණ			ලහු	භගණ			ගරු

චපලා ගාථාවන් ද කොටස් හතරකි.

1. පථ්‍යා ගාථාවෙහි අර්ධ දෙකෙහිම චපලා ලක්ෂණ ඇත්නම් එය **පථ්‍යාචපලා** නම් වේ.
2. චපලා ගාථාවක පළමු අර්ධයෙහි පළමු පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාචපලා** නම් වේ.
3. චපලා ගාථාවක ම දෙ වෙනි අර්ධයෙහි පළමු පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාචපලා** නම් වේ.
4. චපලා ගාථාවක ම අර්ධ දෙකෙහි ම මුල් පාද දෙක ම ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලාචපලා** නම් වේ.

23. චපලා'ගතා'ඛිලං චෙ, දලා'දිමං ලක්ඛණං භජති යස්සා;
පථ්‍යාලක්ඛණ'මඤ්ඤං, මුඛචපලා නාම සා භවති.

යස්සා = යම් ආර්යාවකගේ; **ආදිමං දලං** = පළමු වන අර්ධය; **චපලාගතං** = චපලාවෙහි ආවා වූ; **අඛිලං ලක්ඛණං** = සියලු ලක්ෂණය; **චෙ** = ඉදින්; **භජති** = සෙවිනේ ද; **අඤ්ඤං** = අන්‍ය වූ අපරාර්ධය; **පථ්‍යාලක්ඛණං** = පථ්‍යාවෙහි ආ ලක්ෂණය සෙවිනේ ද; **සා** = ඕ ආර්යා තොමො; **මුඛචපලා නාම භවති** = මුඛචපලා නාම වන්නීය.

අරියා ජාතියේ යම් කිසි ගාථාවක ප්‍රථම අර්ධයෙහි චපලා ගාථාවේ ලක්ෂණ පැමිණේ ද, දෙ වෙනි අර්ධයෙහි පථ්‍යා ගාථාවේ ලක්ෂණ පැමිණේ ද, එවැනි ගාථාව **මුඛචපලා** නම් වේ. මුලින් චපලා ගාථාවේ ලක්ෂණ ඇති බැවින් ද **මුඛචපලා** නම් වේ.

මුඛං පධානං චපලං යස්සාති මුඛ චපලා. මුඛෙ ආදිම්හි චපලං යස්සාති මුඛචපලා.

යම් ගාථාවකට ප්‍රධාන වූ චපලා ලක්ෂණය ඇති බැවින් මුඛචපලා නම් වේ. යම් ගාථාවකට පූර්ව අර්ධයෙහි චපලා ලක්ෂණ ඇති බැවින් මුඛචපලා නම් වේ.

මෙම පළමු වෙනි අර්ධයේ චපලා ලක්ෂණ පෙන්නුම් කරයි.

1			2			3		4			5		6			7			8
ච	ප	ලා	ග	තා	ඛි	ලං	චෙ	ද	ලා	දි	මං	ලක්	ඛ	ණං	භ	ජ	ති	යස්	සා
–	–	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	∪	–	∪	–	–	–	∪	∪
සගණ			ජගණ			මගණ		ජගණ			මගණ		ජගණ			සගණ			ගරු

මෙම දෙ වෙනි අර්ධයේ පථ්‍යා ලක්ෂණ පෙන්නුම් කරයි.

1		2			3		4				5		6	7			8
පථ්	යා	ලක්	ඛ	ණ	මඤ්	ඤං	මු	ඛ	ච	ප	ලා	නා	ම	සා	භ	ව	ති
∪	∪	∪	–	–	∪	∪	–	–	–	–	∪	∪	–	∪	–	–	∪
මගණ		භගණ			මගණ		නගණ				මගණ		ලහු	භගණ			ගරු

මුඛචපලා ගාථාවන් ද කොටස් හතරකි.

1. යම් ගාථාවක පළමු අරධයෙහි චපලා ලක්ෂණ ද, දෙ වෙනි කොටසෙහි පථ්‍යා ලක්ෂණ ද ඇත්නම් එය **පථ්‍යාමුඛචපලා** නම් වේ.
2. මුඛචපලා ගාථාවක පළමු අර්ධයෙහි පළමු වෙනි පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාමුඛචපලා** නම් වේ

3. මුඛචපලා ගාථාවක දෙ වෙනි අර්ධයෙහි පළමු වෙනි පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාමුඛචපලා** නම් වේ.
4. මුඛචපලා ගාථාවක අර්ධ දෙකෙහි ම පළමු වෙනි පාද දෙක ම ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලාමුඛචපලා** නම් වේ.

24. පථ්‍යාය ලක්ඛණං වෙ, පඨමඩ්ඩෙ ලක්ඛණං තු චපලාය;
දුතියෙ දලෙ'ථ යස්සා, පකිත්තිතා සා ජඝනචපලා.

යස්සා = යම් ආර්යාවකගේ; **පඨමඩ්ඩෙ** = ප්‍රථමාර්ධයෙහි; **වෙ** = ඉදින්; **පථ්‍යාලක්ඛණං** = පථ්‍යාවගේ ලක්ෂණය වේ ද; **අථ** = නැවත; **දුතියෙ දලෙ** = ද්විතීයාඩ්ඩයෙහි; **චපලාය** = චපලාවගේ; **ලක්ඛණං තු** = ලක්ෂණය වේ ද; **සා** = ඕ ආර්යා තොමෝ; **ජඝනචපලා** = ජඝනචපලා යයි; **පකිත්තිතා** = කියන ලද්දී ය.

අරියා ජාතියේ යම් කිසි ගාථාවක පළමු වෙනි අර්ධයෙහි පථ්‍යා ගාථාවේ ලක්ෂණ තිබේ ද, දෙ වෙනි අර්ධයෙහි චපලා ගාථාවේ ලක්ෂණ තිබේ ද, එය **ජඝනචපලා** නම් වේ.

ජඝනං අප්පධානං චපලං යස්සාති ජඝනචපලා.
යම් ගාථාවකට අප්‍රධාන වූ චපලා ගාථා ලක්ෂණය ඇති බැවින් ජඝනචපලා නම් වේ.

පළමු වෙනි අර්ධයේ පථ්‍යා ගාථාවේ ලක්ෂණ ඇත.

1		2			3		4			5		6			7			8
පත්	යා	ය	ලක්	ඛ	ණං	වෙ	ප	ඨ	මඩ්	ඩෙ	ලක්	ඛ	ණං	තු	ච	ප	ලා	ය
∪	∪	–	∪	–	∪	∪	–	–	∪	∪	∪	–	∪	–	–	–	∪	∪
මගණ		ජගණ			මගණ		සගණ			මගණ		ජගණ			සගණ			ගරු

මෙම දෙ වෙනි අර්ධයේ චපලා ගාථාවේ ලක්ෂණ ඇත.

1			2			3		4			5		6	7				8
දු	ති	යෙ	ද	ලෙ	ථ	යස්	සා	ප	කිත්	ති	තා	සා	ජ	ඝ	න	ච	ප	ලා
–	–	∪	–	∪	–	∪	∪	–	∪	–	∪	∪	–	–	–	–	–	∪
සගණ			ජගණ			මගණ		ජගණ			මගණ		ලහු	නගණ				ගරු

ජඝනචපලා ගාථාවන් ද කොටස් හතරකි.

1. යම් ගාථාවක පළමු අර්ධයෙහි පථ්‍යා ලක්ෂණ ද, දෙ වෙනි කොටසෙහි චපලා ලක්ෂණ ද ඇත්නම් එය **පථ්‍යාජඝනචපලා** නම් වේ.
2. ජඝනචපලා ගාථාවක පළමු අර්ධයෙහි පළමු වෙනි පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාජඝනචපලා** නම් වේ
3. ජඝනචපලා ගාථාවක දෙ වෙනි අර්ධයෙහි පළමු වෙනි පාදය පමණක් ගණ තුනට වඩා ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාජඝනචපලා** නම් වේ.
4. ජඝනචපලා ගාථාවක අර්ධ දෙකෙහි ම පළමු වෙනි පාද දෙකෙහි ම ගණ තුනට ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලාජඝනචපලා** නම් වේ.

මේ ආකාරයට පථ්‍යා ගාථාවො 16 කි. එය නම් වශයෙන් මෙසේ දැක්විය හැක.

01. පථ්‍යා
02. මුඛවිපුලා (මහාවිපුලා)
03. ජඝනවිපුලා
04. උභයවිපුලා
05. පථ්‍යාචපලා
06. මුඛවිපුලාචපලා
07. ජඝනවිපුලාචපලා
08. උභයවිපුලාචපලා
09. පථ්‍යාමුඛචපලා
10. මුඛවිපුලාමුඛචපලා
11. ජඝනවිපුලාමුඛචපලා
12. උභයවිපුලාමුඛචපලා
13. පථ්‍යාජඝනචපලා
14. මුඛවිපුලාජඝනචපලා
15. ජඝනවිපුලාජඝනචපලා
16. උභයවිපුලාජඝනචපලා

ගීතිජාතියො

25. සබ්බං පඨමදලෙ යදි, ලක්ඛණ'මරියාය වුත්ත'මුභයෙසු;
යස්සා දලෙසු යුත්තං, වුත්තා සා ගීති වුත්ත යති ලලිතා.

යදි = ඉදින්; **අරියාය** = ආර්යාවගේ; **පඨමදලෙ** = ප්‍රථම අර්ධයෙහි; **වුත්තං** = කියන ලද; **සබ්බං ලක්ඛණං** = සියලු ලක්ෂණය; **යස්සා** = යම් ආර්ය ජාතියකගේ; **උභයෙසු දලෙසු** = උභය අර්ධයෙහි; **යුත්තං** = යෙදුණේ වේ ද; (**තදෘ** = එකල්හි) **වුත්තයතිලලිතා** = (පෙර ආර්යාවෙහි) කියන ලද යතින් හොබනා වූ; **සා** = ඕ ආර්යා තොමෝ; **ගීති වුත්තා** = ගීති යයි කියන ලද්දී ය.

ගීති ජාතියේ යම් කිසි ගාථාවක පූර්වාර්ධය සහ අපරාර්ධය යන දෙකෙහි ම අරියා ගාථාවල පූර්වාර්ධයෙහි කියන ලද ලක්ෂණ හෙවත් ගණ නියමය හා යති නියමය ඇත්නම් එය **ගීති** නම්.

සමෙන සරෙන ගීයති උච්ඡාරීයතීති ගීති.
සම වූ ස්වරයකින් උච්චාරණය කරනු ලැබෙන බැවින් ගීති නම් වේ.

මෙම ගීති ගාථාවේ අපරාර්ධය, අරියා ගාථාවේ පූර්වාර්ධයට සමාන වන නිසා එහි සයවන ගණස්ථානය ජගණ හෝ නගණ යෙදිය යුතු ය. ලහු නොයෙදිය යුතු ය.

යති යෙදෙන්නේ යති නියමයට අනුකූලව යති යෙදීමට සුදුසු නම් පමණි.

පූර්වාර්ධය

1		2				3			4			5			6			7			8
සබ්	බං	ප	ඨ	ම	ද	ලෙ	ය	දි	ලක්	ඛ	ණ	ම	රි	යා	ය	වුත්	ත	මු	භ	යේ	සූ
∪	∪	–	–	–	–	∪	–	–	∪	–	–	–	–	∪	–	∪	–	–	–	∪	∪
මගණ		නගණ				භගණ			භගණ			සගණ			ජගණ			සගණ			ගරු

අපරාර්ධය

1		2			3		4		5		6			7				8
යස්	සා	ද	ලෙ	සු	යුත්	තං	වුත්	තා	සා	ගී	ති	වුත්	ත	ය	ති	ල	ලි	තා
∪	∪	–	∪	–	∪	∪	∪	∪	∪	∪	–	∪	–	–	–	–	–	∪
මගණ		ජගණ			මගණ		මගණ		මගණ		ජගණ			නගණ				ගරු

මෙම ගීති ගාථාව අරියා ජාතියේ පථ්‍යා ආදී වර්ග පසත් සමග මිශ්‍ර වීමෙන් හා පූර්වාර්ධයේ හා අපරාර්ධයේ වෙනස් වීම් වශයෙන් තවත් ගීති ගාථාවෝ අටක් සෑදෙති.

1. පථ්‍යාවගේ පූර්වාර්ධය සහ ගීතියේ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යාගීති** නම් වේ.
2. පූර්වාර්ධය මුඛවිපුලා (පළමු අර්ධයේ මුල් පාදය පමණක් ගණ තුනට වඩා පැන්ගොස් ඇත්නම්) නම් **මුඛවිපුලාගීති** නම් වේ. (මෙහි දී අපරාර්ධය ජඝනවිපුලා නොවිය යුතු ය. අපරාර්ධය ජඝනවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ.)
3. පථ්‍යාචපලාවගේ පූර්වාර්ධය සහ ගීතියේ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යාචපලාගීති** වේ.
4. එම පූර්වාර්ධයෙ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාචපලාගීති** වේ. (මෙහි දී අපරාර්ධය ජඝනවිපුලා නොවිය යුතු ය. අපරාර්ධය ජඝනවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ. එනිසා විපුලා තුන් වර්ගයෙන් එකක් පමණක් මෙහි ඇතුලත් වේ.)
5. මුඛචපලාවගේ පූර්වාරධය ඇත්නම් **පථ්‍යාමුඛචපලාගීති** වේ.
6. එම පූර්වාර්ධයෙ මුල් පාදයේ ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාමුඛචපලාගීති** වේ. (මෙහිත් විපුලා එක් වර්ගයක් පමණක් ඇතුලත් වේ.)
7. ජඝනචපලාවගේ පූර්වාර්ධය ඇත්නම් එය **පථ්‍යාජඝනචපලාගීති** වේ.
8. එම පූර්වාර්ධයෙ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාජඝනචපලාගීති** වේ. (මෙහිදිත්

විපුලා වර්ගයෙන් එකක් පමණක් ගැනේ.)

26. අරියායං දුතිය'ඩ්ඪෙ, ගදිතා'බ්ලලක්ඛණං යං තං;
භවති දලෙසු'භයෙසුපි, යදි යස්සා සා'ය මුපගීති.

අරියාය = ආර්යාවෙහි; **දුතියඩ්ඪෙ** = දෙ වෙනි අර්ධයෙහි; **ගදිතං** = කියන ලද; **යං අබ්ලලක්ඛණං** = යම් සියලු ලක්ෂණයක් ඇත් ද; **තං** = එය; **යස්සා** = යම් ආර්යාවකගේ; **උභයෙසු දලෙසු අපි** = උභය අර්ධයෙහි ම; **යදි භවති** = ඉදින් වේ නම්; **සා අයං** = ඕ මෝ ආර්යා තොමෝ; **උපගීති** = "උපගීති" යයි කියන ලදි.

ගීති ජාතියේ යම් කිසි ගාථාවක අර්ධ දෙකෙහි ම අරියා ගාථාවේ අපරාර්ධයෙහි කියන ලද ලක්ෂණ වෙයි නම් එය **උපගීති** නම් වේ.

ගීතියා සමීපෙ පවත්තතීති උපගීති.
ගීති ගාථාවේ සමීපයෙහි පවතින බැවින් උපගීති නම් වේ.

මෙහි දී අරියා ගාථාවේ අපරාර්ධය අනුව යන බැවින් උභයාර්ධයේ ම සයවන ගණස්ථානය ලහු විය යුතු ය.

පූර්වාර්ධය

1			2			3		4			5			6	7		8
අ	රි	යා	යං	දු	ති	යඩ්	ඪෙ	ග	දි	තා	බ්	ල	ලක්	ඛ	ණං	යං	තං
–	–	∪	∪	–	–	∪	∪	–	–	∪	–	–	∪	–	∪	∪	∪
සගණ			භගණ			මගණ		සගණ			සගණ			ලහු	මගණ		ගරු

අපරාර්ධය

1				2			3			4			5		6	7			8
භ	ව	ති	ද	ලෙ	සු	භ	යේ	සු	පි	ය	දි	යස්	සා	සා	ය	මු	ප	ගී	ති
–	–	–	–	∪	–	–	∪	–	–	–	–	∪	∪	∪	–	–	–	∪	∪
නගණ				භගණ			භගණ			සගණ			මගණ		ලහු	සගණ			ගරු

මෙම උපගීති ගාථාව අරියා ජාතියේ පථ්‍යා ආදී වර්ග පසත් සමග මිශ්‍ර වීමෙන් හා පූර්වාර්ධයේ හා අපරාර්ධයේ වෙනස් වීම් වශයෙන් තවත් ගීති ගාථාවෝ අටක් සෑදෙති.

1. පථ්‍යාවගේ අපරාර්ධය සහ උපගීතියේ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යූපගීති** නම් වේ.
2. අපරාර්ධය ජඝනවිපුලා (දෙ වෙනි අර්ධයෙ පළමු පාදය පමණක් ගණ තුනට වඩා පැන්ගොස් ඇත්නම්) නම් **ජඝනවිපලූපගීති** නම් වේ. (මෙහි දී පූර්වාර්ධය මුඛවිපුලා නොවිය යුතු ය. පූර්වාර්ධය මුඛවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ.)
3. පථ්‍යාචපලාවගේ අපරාර්ධය සහ උග්ගීතියේ පූර්වාර්ධය ඇත්නම් එය **පථ්‍යාචපලූපගීති** වේ.
4. එම අපරාර්ධයේ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාචපලූපගීති** වේ. (මෙහි දී පූර්වාර්ධය මුඛවිපුලා නොවිය යුතු ය. පූර්වාර්ධය මුඛවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ. එනිසා විපුලා තුන් වර්ගයෙන් එකක් පමණක් මෙහි ඇතුලත් වේ.)
5. මුඛචපලාවගේ අපරාර්ධය ඇත්නම් **පථ්‍යාමුඛචපලූපගීති** වේ.
6. එම අපරාර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාමුඛචපලූපගීති** වේ. (මෙහිත් විපුලා එක් වර්ගයක් පමණක් ඇතුලත් වේ.)
7. ජඝනචපලාවගේ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යාජඝනචපලූපගීති** වේ.
8. එම අපරාර්ධයේ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලාජඝනචපලූපගීති** වේ. (මෙහිදිත් විපුලා වර්ගයෙන් එකක් පමණක් ගැනේ.)

27. **අරියාය'ඩ්ඩද්විතයං, පුබ්බොදිත ලක්ඛණො'පෙතං;**
විපරියයෙනා'භිහිතං, යස්සා සම්භවති චෙ'හ සො'ග්ගීති.

අරියාය = ආර්යාවගේ; **පුබ්බොදිත ලක්ඛණොපෙතං** = පෙර කියන ලද ලක්ෂණයෙන් යුක්ත වූ; **අඩ්ඩද්විතයං** = අර්ධ දෙක; **චෙ** = ඉදින්; **යස්සා** = යම් ආර්යාවකගේ; **විපරියයෙන අභිහිතං** = විපර්යාසයෙන් කියන ලද්දේ; **සම්භවති** = ලැබේ ද; **සා** = ඕ ආර්යා තොමෝ; **ඉහ** = මේ ගීති ජාතියෙහි; **උග්ගීති** = "උග්ගීති" යයි කියන ලදි.

ගීති ජාතියේ යම් කිසි ගාථාවක අරියා ගාථාවේ පෙර කියන ලද්ද වූ ලක්ෂණයෙන් සමන්විත වූ අර්ධ දෙක මාරු කර යෙදේ නම් එය **උග්ගීති** නම් වේ.

න ගීති උග්ගීති.
ගීති ගාථාවත් උපගීති ගාථාවත් නොවන බැවින් උග්ගීති නම් වේ.

මෙම ගාථාවෙහි පූර්වාර්ධයෙහි සයවන ගණස්ථානයෙහි ලහු හා අපරාර්ධයේ සයවන ගණස්ථානයෙහි ජගණ හෝ නගණ යෙදිය යුතු ය.

පූර්වාර්ධය

1			2		3			4		5			6	7		8
අ	රි	යා	යඩ්	ඩද්	වි	ත	යං	පුබ්	බො	දි	ත	ලක්	ඛ	ණො	පෙ	තං
–	–	∪	∪	∪	–	–	∪	∪	∪	–	–	∪	–	∪	∪	∪
සගණ			මගණ		සගණ			මගණ		සගණ			ලහු	මගණ		ගරු

අපරාර්ධය

1				2		3			4		5			6			7		8
වි	ප	රි	ය	යෙ	නා	භි	හි	තං	යස්	සා	සම්	භ	ව	ති	චෙ	හ	සොග්	ගී	ති
–	–	–	–	∪	∪	–	–	∪	∪	∪	∪	–	–	–	∪	–	∪	∪	∪
නගණ				මගණ		සගණ			මගණ		භගණ			ජගණ			මගණ		ගරු

මෙම උග්ගීති ගාථාව අරියා ජාතියේ පථ්‍යා ආදී වර්ග පසත් සමග මිශ්‍ර වීමෙන් හා පූර්වාර්ධයේ හා අපරාර්ධයේ වෙනස් වීම් වශයෙන් තවත් ගීති ගාථාවෝ 16 ක් සෑදෙති.

1. පත්‍යාවගේ ලක්ෂණ මිශ්‍ර වීමෙන් **පථ්‍යුග්ගීති** නම් වේ.
2. පළමු අර්ධයේ මුල් පාදය ගණ තුන පැන ඇත්නම් **මුඛවිපුලුග්ගීති** නම් වේ.
3. දෙ වෙනි අර්ධයේ මුල් පාදය ගණ තුන පැන ඇත්නම් එය **ජඝනවිපුලුග්ගීති** නම් වේ.
4. අර්ධ දෙකෙහිම මුල් පාදය ගණ තුන පැන ඇත්නම් එය **උභයවිපුලුග්ගීති** නම් වේ.
5. චපලාවගේ ලක්ෂණ මිශ්‍ර වීමෙන් **චපලුග්ගීති** නම් වේ.
6. චපලුග්ගීතියෙ පළමු අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලචපලුග්ගීති** නම් වේ.
7. චපලුග්ගීතියෙ දෙ වෙනි අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලචපලුග්ගීති** නම් වේ.
8. චපලුග්ගීතියේ අර්ධ දෙකෙහිම මුල් පාද ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලචපලුග්ගීති** නම් වේ.
9. මුඛචපලාවගේ ලක්ෂණ මිශ්‍ර වීමෙන් **මුඛචපලුග්ගීති** නම් වේ.
10. මුඛචපලුග්ගීතියෙ පළමු අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලමුඛචපලුග්ගීති** නම් වේ.
11. මුඛචපලුග්ගීතියෙ දෙ වෙනි අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලමුඛචපලුග්ගීති** නම් වේ.

12. මුඛචපලුග්ගීතියේ අර්ධ දෙකෙහිම මුල් පාද ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලමුඛචපලුග්ගීති** නම් වේ.

13. ජඝනචපලාවගේ ලක්ෂණ මිශ්‍ර වීමෙන් **ජඝනචපලුග්ගීති** නම් වේ.

14. ජඝනචපලුග්ගීතියෙ පළමු අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලජඝනචපලුග්ගීති** නම් වේ.

15. ජඝනචපලුග්ගීතියෙ දෙ වෙනි අර්ධයේ මුල් පාදය ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **ජඝනවිපුලජඝනචපලුග්ගීති** නම් වේ.

16. ජඝනචපලුග්ගීතියේ අර්ධ දෙකෙහිම මුල් පාද ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **උභයවිපුලජඝනචපලුග්ගීති** නම් වේ.

28. **අරියාපුබ්බ'ඩඪං යදි, ගරුනෙ'කෙනා'ධිකෙන නිධනෙ යුත්තං;**
යදි පුබ්බ'ඩඪසමානං, දල මිතරං චො'දිතා'ය'මරියාගීති.

යදි = ඉදින්; **අරියාපුබ්බඩඪං** = ආර්යාවගේ පූර්ව අර්ධය; **නිධනෙ** = කෙළවර; **අධිකෙන** = අධික වූ; **එකෙන ගරුනා** = එක් ගරුවකින්; **යුත්තං** = යුක්ත වේ ද; **යදි** = ඉදින්; **ඉතරං ච දලං** = අපරාර්ධයත්; **පුබ්බඩඪසමානං** = පූර්ව අර්ධය හා සමාන වේ ද; (**තදෘ** = එකල්හි;) **අයං** = මෝ ආර්යා තොමෝ; **අරියාගීති උදිතා** = "ආර්යාගීති" යයි කියන ලදි.

අරියා ගාථාවේ පූර්ව අර්ධයට අවසානයේ වැඩිපුර ගරු අක්ෂරයක් එක් වේ. දෙ වෙනි කොටස පූර්ව අර්ධයට සමානව යෙදේ. මෙය **අරියාගීති** නම් වේ.

අරියාවියාති අරියා. ගීති වියාති ගීති. අරියා ච සා ගීති චාති අරියාගීති.

අරියා ගාථාව බඳු වන බැවින් අරියා නම් වේ. ගීති ගාථාව බඳු වන බැවින් ගීති නම් වේ. එම අරියා ගාථාව ද ගීති ගාථාව ද බඳු වන බැවින් අරියාගීති නම් වේ.

අවසාන ගරු අක්ෂරයට තවත් ගරු අක්ෂරයක් එක් වීම නිසා අවසාන ගණය මගණය ක් වේ. එක් වූ ගරුවක් ඇති පූර්වාර්ධයට සමානව අපරාර්ධයෙහි ද ගණ යෙදිය යුතු ය.

පූර්වාර්ධය

1			2		3			4			5		6			7			8	
අ	රි	යා	පුබ්	බඩ්	ඪං	ය	දි	ග	රු	නෙ	කෙ	නා	ධි	කෙ	න	නි	ධ	නෙ	යුත්	තං
–	–	∪	∪	∪	∪	–	–	–	–	∪	∪	∪	–	∪	–	–	–	∪	∪	∪
සගණ			මගණ		භගණ			සගණ			මගණ		ජගණ			සගණ			මගණ	

අපරාර්ධය

1			2			3		4				5		6			7			8	
ය	දි	පුබ්	බඩ්	ඪ	ස	මා	නං	ද	ල	මි	ත	රං	චො	දි	තා	ය	ම	රි	යා	ගී	ති
–	–	∪	∪	–	–	∪	∪	–	–	–	–	∪	∪	–	∪	–	–	–	∪	∪	∪
සගණ			භගණ			මගණ		නගණ				මගණ		ජගණ			සගණ			මගණ	

මෙම අරියාගීති ගාථාව අරියා ජාතියේ පථ්‍යා ආදී වර්ග පසත් සමග මිශ්‍ර වීමෙන් හා පූර්වාර්ධයේ හා අපරාර්ධයේ වෙනස් වීම් වශයෙන් තවත් ගීති ගාථාවෝ අටක් සෑදෙති.

1. පථ්‍යාවගේ පූර්වාර්ධය වැඩිපුර ගරුවක් එක් වීමෙන් සෑදුන පූර්වාර්ධය සහ අරියාවගෙ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යාරියාගීති** නම් වේ.

2. පූර්වාර්ධය මුඛවිපුලා (පළමු අර්ධයේ මුල් පාදය පමණක් ගණ තුනට වඩා පැන්ගොස් ඇත්නම්) නම් සහ අවසානයේ තව ගරුවක් වැඩිවී ඇත්නම් එය **මුඛවිපුලාරියාගීති** නම් වේ. (මෙහි දී අපරාර්ධය ජඝනවිපුලා නොවිය යුතු ය. අපරාර්ධය ජඝනවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ.)

3. පථ්‍යාවපලාවගේ පූර්වාර්ධයට තව ගරුවක් වැඩිවී ඇත්නම් සහ අරියාවගෙ අපරාර්ධය ඇත්නම් එය **පථ්‍යාවපලාරියාගීති** වේ.
4. එම පූර්වාර්ධයෙ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාවපලාරියාගීති** වේ. (මෙහි දී අපරාර්ධය ජඝනවිපුලා නොවිය යුතු ය. අපරාර්ධය ජඝනවිපුලා නොයෙදෙන නිසා මෙහි උභයවිපුලාවද නොයෙදේ. එනිසා විපුලා තුන් වර්ගයෙන් එකක් පමණක් මෙහි ඇතුලත් වේ.)
5. මුඛවපලාවගේ පූර්වාරධයට අවසානයේ ගරුවකින් වැඩි වී ඇත්නම් **පථ්‍යාමුඛවපලාරියාගීති** වේ.
6. එම පූර්වාර්ධයෙ මුල් පාදයේ ගණ තුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාමුඛවපලාරියාගීති** වේ. (මෙහිත් විපුලා එක් වර්ගයක් පමණක් ඇතුලත් වේ.)
7. ජඝනවපලාවගේ පූර්වාර්ධය ඇත්නම් එය **පථ්‍යාජඝනවපලාරියාගීති** වේ.
8. එම පූර්වාර්ධයෙ මුල් පාදය ගණතුන ඉක්මවා ගොස් ඇත්නම් **මුඛවිපුලාජඝනවපලාරියාගීති** වේ. (මෙහිදිත් විපුලා වර්ගයෙන් එකක් පමණක් ගැනේ.)

මේ ආකාරයෙන් ගීති ගාථාවන් අරියා ජාතියත් සමග මිශ්‍ර වීමෙන් සෑදෙන ගාථා සියල්ල 40 කි.

ගීති ගාථා	= 8
උපගීති ගාථා	= 8
උග්ගීති ගාථා	= 16
අරියාගීති ගාථා	= 8
සියල්ල	= 40

ඒවා නම් වශයෙන් මෙසේ ය.

1. පථ්‍යාගීති
2. මුඛවිපුලාගීති
3. පථ්‍යාවපලාගීති
4. මුඛවිපුලාවපලාගීති
5. පථ්‍යාමුඛවපලාගීති
6. මුඛවිපුලාමුඛවපලාගීති
7. පථ්‍යාජඝනවපලාගීති
8. මුඛවිපුලාජඝනවපලාගීති
9. පථ්‍යූපගීති
10. ජඝනවිපලූපගීති
11. පථ්‍යාවපලූපගීති
12. ජඝනවිපුලාවපලූපගීති
13. පථ්‍යාමුඛවපලූපගීති
14. ජඝනවිපුලාමුඛවපලූපගීති
15. පථ්‍යාජඝනවපලූපගීති
16. ජඝනවිපුලාජඝනවපලූපගීති
17. පථ්‍යුග්ගීති
18. මුඛවිපුලුග්ගීති
19. ජඝනවිපුලුග්ගීති
20. උභයවිපුලුග්ගීති
21. වපලුග්ගීති
22. මුඛවිපුලවපලුග්ගීති
23. ජඝනවිපුලවපලුග්ගීති
24. උභයවිපුලවපලුග්ගීති
25. මුඛවපලුග්ගීති
26. මුඛවිපුලමුඛවපලුග්ගීති
27. ජඝනවිපුලමුඛවපලුග්ගීති
28. උභයවිපුලමුඛවපලුග්ගීති
29. ජඝනවපලුග්ගීති
30. මුඛවිපුලජඝනවපලුග්ගීති
31. ජඝනවිපුලජඝනවපලුග්ගීති
32. උභයවිපුලජඝනවපලුග්ගීති
33. පථ්‍යාරියාගීති
34. මුඛවිපුලාරියාගීති
35. පථ්‍යාවපලාරියාගීති
36. මුඛවිපුලාවපලාරියාගීති
37. පථ්‍යාමුඛවපලාරියාගීති
38. මුඛවිපුලාමුඛවපලාරියාගීති
39. පථ්‍යාජඝනවපලාරියාගීති
40. මුඛවිපුලාජඝනවපලාරියාගීති

වේතාලියජාතියො

29. විසමෙ ඡ සියුං කලා මුඛෙ, සමෙ ත්ව'ට්ඨ, ර,ල,ගා, තතො'පරි;
වෙතාලීයං ත මුච්චතෙ, ලහු ඡක්කං න නිරන්තරං සමෙ.

යස්මිං = (යම් මාත්‍රා වෘත්තයෙක්හි;) **විසමෙ** = විසම වූ (ප්‍රථම - තෘතීය) පාදයෙහි; **මුඛෙ** = ආදියෙහි; **ඡ කලා** = මාත්‍රාවෝ හයක්; **සියුං** = වෙත් ද; **තු** = යලි; **සමෙ** = සම වූ (ද්විතීය - චතුර්ථ) පාදයෙහි; **අට්ඨ** = (ආදියෙහි) මාත්‍රාවෝ අට දෙනෙක් වෙත් ද; **තතො උපරි** = එයින් මත්තෙහි; **ර ල ගා** = රගණ - ලහු - ගරු යන මොහු වෙත් ද; **සමෙ** = සම පාදයෙහි; **නිරන්තරං** = නිරතුරුව හෙවත් ගරුවකින් අතුරු නැතිව; **ලහු ඡක්කං** = ලහු සයක්; **න** = නොවන්නේ ද; **තං** = ඒ වුත්තය; **වෙතාලියං වුච්චතෙ** = "වෛතාලිය" නමැයි කියනු ලැබේ.

විසම පාදයෙහි (පළමු වෙනි හා තුන් වෙනි ඔත්තේ පාදයන්හි) මුලට මාත්‍රා හයක් වන්නාහුය. සම පාදයෙහි (දෙ වෙනි හා හතර වෙනි ඉරට්ටේ පාදයන්හි) මුලට මාත්‍රා අටක් විය යුතුය. එයින් පසු රගණයක් සහ ලහු එකක් ද ගරු එකක් ද තිබිය යුතුය. එසේ සටහන් වෙන ගාථාව **වේතාලි** ගාථාව වේ. සමපාදයන් හි එක දිගට ලහු හයක් (6) ක් නොවිය යුතුය.

රලගා සහ ඡට්ඨ කලාහි විතලන්ති පතිට්ඨාහන්ති පවත්තතීති එත්ථාති විතලං. විතලමෙව වෙතාලියං.

මෙම ගාථාවෙහි රගණය ලහු ගරු මාත්‍රා සයක් සහ අටක් සමඟ පවතින බැවින් විතලං නම් වේ. විතලය ම වේතාලිය නම් වේ.

❖ මෙම වේතාලිය ජාතියෙහි මුල් මාත්‍රා ගණන සම්බන්ධව යම් නීතියක් දක්වා නැත්නම් එහි මාත්‍රා කැමති ලෙස දැක්විය හැකිය. උදහරණයක් ලෙස මෙම ගාථාවේ නීතිය නම් "එක දිගට ලහු හයක් නොයෙදිය යුතු ය." යන්නයි. එනිසා ලහු හයක් එක දිගට නොයොදා අන් කැමති ලෙස මෙම මාත්‍රා හය දැක්විය හැකි ය. පහත උදහරණයක් ලෙස දක්වා ඇති ධම්මපද ගාථාවෙන් එය මනාව පැහැදිලි වේ.

විසම පාදය

වි	ස	මෙ	ඡ	සි	යුං	ක	ලා	මු	ඛෙ
–	–	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 6					රගණ			ලහු	ගරු

සම පාදය

ස	මෙත්	වට්	ඨ	ර	ල	ගා	ත	තො	ප	රී
–	∪	∪	–	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 8						රගණ			ලහු	ගරු

විසම පාදය

වෙ	තා	ලී	යං	ත	මුච්	ච	තෙ
∪	∪	∪	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 6			රගණ			ලහු	ගරු

සම පාදය

ල	හු	ඡක්	කං	න	නි	රන්	ත	රං	ස	මෙ
–	–	∪	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 8						රගණ			ලහු	ගරු

මේ වේතාලීය ගාථාවට උදහරණයක් නම්

උදකංහි නයන්ති නෙත්තිකා, උසුකාරා නමයන්ති තෙජනං;
දරුං නමයන්ති තච්ඡකා, අත්තානං දමයන්ති පණ්ඩිතා.

(ධම්මපදය, පණ්ඩිත වග්ගය)

විසම පාදය

උ	ද	කං	හි	න	යන්	ති	නෙත්	ති	කා
–	–	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 6					රගණ			ලහු	ගරු

සම පාදය

උ	සු	කා	රා	න	ම	යන්	ති	තෙ	ජ	නං
–	–	∪	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 8						රගණ			ලහු	ගරු

විසම පාදය

ද	රුං	න	ම	යන්	ති	තච්	ඡ	කා
∪	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 6				රගණ			ලහු	ගරු

සම පාදය

අත්	තා	නං	ද	ම	යන්	ති	පණ්	ඩි	තා
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
පළමු මාත්‍රා 8					රගණ			ලහු	ගරු

30. වෙතාලීයොපමං මුඛෙ තං,
ඔපච්ඡන්දසකං ර,යා ය'දන්තෙ.

(**යස්සා** = යම් මාත්‍රා ජාතියකගේ;) **යදි** = ඉදින්; **මුඛෙ** = ආදියෙහි; **වෙතාලියොපමං** = වෛතාලීය හා සමාන ද; **අන්තෙ** = කෙළවර; **ර යා** = රගණ - යගණයෝ වෙත් ද; (**තදෑ** = එකල්හි;) **තං** = ඒ වුත්තය; **ඔපච්ඡන්දසකං** = "ඔපච්ඡන්දසක" නම් වේ.

ඉදින් යම් කිසි ගාථාවක මුල වේතාලිය ගාථාව හා සමාන වේ නම් අග රගණ හා යගණ වේ නම් එය **ඔපච්ඡන්දසක** ගාථා නම් වේ.

වෙතාලියසංඛාතස්ස ඡන්දස්ස සමීපෙ පවත්තතීති උපච්ඡන්දං. උපච්ඡන්දමෙව ඔපච්ඡන්දසකං.

වෙතාලිය සංඛ්‍යාත වූ ඡන්දසේ සමීපයෙහි පවතින බැවින් උපච්ඡන්ද නම් වේ. උපච්ඡන්දය ම ඔපච්ඡන්දසක නම් වේ.

විසම පාදය

වෙ	තා	ලී	යො	ප	මං	මු	ඛෙ	තං
∪	∪	∪	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 6			රගණ			යගණ		

සම පාදය

ඕ	පච්	ඡන්	ද	ස	කං	ර	යා	ය	දන්	තෙ
∪	∪	∪	–	–	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 8					රගණ			යගණ		

මෙම ඔපච්ඡන්දසක ගාථාවට උදාහරණයක් නම්:-

සිථිලං ධනිතඤ්ච දීඝරස්සං, ගරුකං ලහුකඤ්චෙව නිග්ගහීතං;
සම්බන්ධවවත්ථිතං විමුත්තං, දසධා ඛ්‍යඤ්ජනබුද්ධියා පභෙදෙ.

(විනය පිටක, කඞ්ඛාවිතරණී පුරාණ ටීකා)

විසම පාදය

සි	ථි	ලං	ධ	නි	තඤ්	ච	දී	ඝ	රස්	සං
–	–	∪	–	–	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 6					රගණ			යගණ		

සම පාදය

ග	රු	කං	ල	හු	කඤ්	චෙ	ව	නිග්	ග	හී	තං
–	–	∪	–	–	∪	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 8						රගණ			යගණ		

විසම පාදය

සම්	බන්	ධ	ව	වත්	ථී	තං	වි	මුත්	තං
∪	∪	–	–	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 6				රගණ			යගණ		

සම පාදය

ද	ස	ධාබ්	යඤ්ඤ්	ජ	න	බුද්ධ්	ධි	යා	ප	හෙ	දෙ
–	–	∪	∪	–	–	∪	–	∪	–	∪	∪
පළමු මාත්‍රා 8						රගණ			යගණ		

මෙම ඔපච්ඡන්දසක ගාථාව වෙතාලිය ජාතියේ දක්ඛිණන්තිකා ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා සතරක් සෑදේ.

1. ඔපච්ඡන්දසක ගාථාව එලෙසින්ම ඇත්නම් (මුලින් ජගණ නොයෙදේ නම්) එය **සුද්ධඔපච්ඡන්දසක** නම් වේ.
2. ඔපච්ඡන්දසක ගාථාවේ සම විසම පාද සියල්ලේම මුලින් ජගණයක් යෙදෙයි (දක්ඛිණන්තිකා ගාථාව අනුව යයි) නම් එය **දක්ඛිණන්තිකාඔපච්ඡන්දසක** නම් වේ.
3. විසම පාදයේ පමණක් ජගණයක් යෙදෙයි (උද්දිච්චවුත්ති ගාථාව අනුව යයි) නම් එය **උද්දිච්චවුත්තිඔපච්ඡන්දසක** නම් වේ.
4. සම පාදයේ පමණක් ගරුවක් සමඟ ජගණයක් යෙදෙයි (පච්චවුත්ති ගාථාව අනුව යයි) නම් එය **පච්චවුත්තිඔපච්ඡන්දසක** නම් වේ.

31. **ආපාතලිකා කථිතා'යං,**
භගගා'න්තෙ යදි පුබ්බමිව'ඤ්ඤං.

යදි = ඉදින්; (**යස්සා** = යම් මාත්‍රා ජාතියකගේ කෙළවර;) **භගගා** = භගණයක් හා ගරු දෙකක් වෙත් ද; **අඤ්ඤං** = සෙසු ලක්ෂණය; **පුබ්බං ඉව** = පෙර වෛතාලීය මෙන් වේ ද; (**තදෑ** = එකල්හි;) **අයං** = මෝ මාත්‍රා ජාති තොමෝ; **ආපාතලිකා** = "ආපාතලිකා" නමැයි; **කථිතා** = කියන ලදී.

යම් ගාථාවක මුල වේතාලිය ගාථාවට සමාන වේ නම් හා අවසානයෙහි භගණයක් හා ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **ආපාතලිකා** නම් වේ.

(සලක්ඛණෙහි භගගෙහි) පුබ්බාපරසංඛාතං තලං අපෙති ගච්ඡතීති අපාතලා. අපාතලමෙව ආපාතලිකා.

තමාගේ ලක්ෂණය වන්නා වූ භගණය සහ ගරු දෙකකින් පූර්වාර්ධය. අපරාර්ධය යැයි කියනු ලැබෙන්නා වූ කොට්ඨාශයට යන බැවින් ආපාතලා නම් වේ. අපාතලය ම ආපාතලිකා නම් වේ.

විසම පාදය

ආ	පා	ත	ලි	කා	ක	ථී	තා	යං
∪	∪	–	–	∪	–	–	∪	∪
පළමු ව මාත්‍රා 6 කි				භගණ			ගරු	ගරු

සම පාදය

භ	ග	ගාන්	තෙ	ය	දි	පුබ්	බ	මි	වඤ්ඤ්	ඤං
–	–	∪	∪	–	–	∪	–	–	∪	∪
පළමු ව මාත්‍රා 8 කි						භගණ			ගරු	ගරු

මෙම ආපාතලිකා ගාථාව වෙතාලිය ජාතියේ දක්ඛිණන්තිකා ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා සතරක් සෑදේ.

1. ආපාතලිකා ගාථාව එලෙසින්ම ඇත්නම් (මුලින් ජගණ නොයෙදේ නම්) එය **සුද්ධආපාතලිකා** නම් වේ.

2. ආපාතලිකා ගාථාවේ සම විසම පාද සියල්ලේම මුලින් ජගණයක් යෙදෙයි (දක්ඛිණන්තිකා ගාථාව යනුව යයි) නම් එය **දක්ඛිණන්තිකාආපාතලිකා** නම් වේ.
3. විසම පාදයේ පමණක් ජගණයක් යෙදෙයි (උද්දිච්චවුත්ති ගාථාව අනුව යයි) නම් එය **උද්දිච්චවුත්තිආපාතලිකා** නම් වේ.
4. සම පාදයේ පමණක් ගරුවක් සමග ජගණයක් යෙදෙයි (පච්චවුත්ති ගාථාව අනුව යයි) නම් එය **පච්චවුත්තිආපාතලිකා** නම් වේ.

32. යදි'දිතො දක්ඛිණන්තිකා,
ඨිතෙ'ත්ථ පාදෙස්වා'ඛිලෙසු ජො.

යදි = ඉදින්; (**යස්සා** = යම් වේතාලිය ජාතියකගේ;) **අඛිලෙසු පාදෙසු** = සියලු පාදයන් හි; **ආදිතො** = ආදියෙහි; **ජො** = ජගණයෙක්; **ඨිතො** = සිටියේ වී නම්; **එත්ථ** = මෙහි; (**සා** = ඕ මාත්‍රා ජාති තොමෝ;) **දක්ඛිණන්තිකා** = "දක්ඛිණන්තිකා" යැයි කියන ලදි.

වෙතාලිය ජාතියේ සෑම පාදයකම මුලට ජගණයක් සිටීද ඒ ගාථාව **දක්ඛිණන්තිකා** නම් වේ.

දක්ඛන්ති වඩ්ඪන්ති සත්තා යථාධිප්පෙතසම්පත්තීහි එතායති දක්ඛිණා (දතබ්බදනං). සා විය දක්ඛන්ති වඩ්ඪන්ති ගායන්තා යථාධිප්පෙතපඤ්ඤසම්පත්තීහි එතෙනාති දක්ඛිණො (වෙතාලියච්ඡන්දෙ). තස්ස අන්තෙ කොට්ඨාසෙ නියුත්තා දකිඛිණන්තිකා.

සත්ත්වයන් යම්සේ අදහස් කරන්නා වූ සම්පත්තීන්ගෙන් වර්ධනය කරන බැවින් දක්ඛිණා නම් වේ (දිය යුතු දනය යි). ඒ දනය මෙන් මෙම ඡන්දස මගින් සජ්ඣායනය කරන පුද්ගලයන් යම් සේ අදහස් කරන ප්‍රඥ සම්පත්තීන්ගෙන් වර්ධනය කරන බැවින් දක්ඛිණො නම් වේ. (වෙතාලිය ඡන්දසයි) ඒ වෙතාලිය කොට්ඨාසයෙහි නියුක්ත බැවින් වෙතාලිය නම් වේ. එහි අන්තයෙහි නියුක්ත බැවින් දක්ඛිණන්තිකා නම් වේ.

වේතාලී ගාථාවේ මෙන් විසම පාදයේ මුලට මාත්‍රා හයක් සිටින අතර ඒ හයේ මුලින් ජගණය පිහිටයි. සම පාදයේ මාත්‍රා අටහි මුලින් ජගණය පිහිටයි. ජගණය සමග මාත්‍රා හයක් හා අටක් යෙදෙන බව දත යුතුයි.

විසම පාදය

ය	ද	දි	තො	දක්	ඛි	ණන්	ති	කා
–	∪	–	∪	∪	–	∪	–	∪
ජගණය				රගණ			ලහු	ගරු
ජගණය සමග මාත්‍රා 6 කි								

සම පාදය

ඨි	තෙත්	ථ	පා	දෙස්	වා	ඛි	ලෙ	සු	ජො
–	∪	–	∪	∪	∪	–	∪	–	∪
ජගණය සමග මාත්‍රා 8 කි					රගණ			ලහු	ගරු

මෙම දක්ඛිණන්තිකා ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා 3 සෑදෙන බව දත යුතු යි.

33. 'උදිච්චවුත්ති'ති වුච්චතෙ,
ජො චා'දෙ විසමෙසු සණ්ඨිතො.

චෙ = ඉදින්; **විසමෙසු** = විසම වූ; (පළමු වන තුන් වෙනි) පාදයන්හි; **ආදෙ** = ආදියෙහි; **ජො** = ජගණය; **සණ්ඨිතො** = සිටියේ වී නම්; (**තදෙ** = එකල්හි;) **උදිච්චවුත්ති ඉති** = "උදිච්චවුත්ති" යැයි; **වුච්චතෙ** = කියනු ලැබේ.

විසම පාද වල පමණක් මුලෙහි ජගණයක් පිහිටයි ද එය **උදිච්චවුත්ති** නම් වේ.

උච්චං අයති ගච්ඡතීති උදිතං. උදිතස්ස භාවො උදිච්චං. උදිච්චං විසාලං (වෙතාලියලක්ඛණං) යස්සාති උදිච්චවුත්ති.

උස්ව යන බැවින් උදිත නම් වේ. උදිත නම් වන්නාගේ භාවය උදිච්ච නම් වේ. යම් ගාථාවකට උස් වූ විශාල වූ වෙතාලියගේ ලක්ෂණය නැමැති පැවැත්ම ඇති බැවින් උදිච්චවුත්ති නම් වේ.

විසම පාදය

උ	දිච්	ච	වුත්	තී	ති	වුච්	ච	තෙ
–	∪	–	∪	∪	–	∪	–	∪
ජගණය				රගණ			ලහු	ගරු
ජගණය සමග මාත්‍රා 6 කි								

සම පාදය

ජො	චා	දෙ	වි	ස	මෙ	සු	සණ්	ඨී	තො
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මාත්‍රා 8 කි. ජගණ නොයෙදේ.					රගණ			ලහු	ගරු

මෙම උදිච්චවුත්ති ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා සතරක් සෑදෙන බව දත යුතු යි. ඒවා **සුද්ධඋද්දිච්චවුත්ති, ඔපච්ඡන්දසකඋද්දිච්චවුත්ති, ආපාතලිකාඋද්දිච්චවුත්ති, දක්ඛිණන්තිකාඋද්දිච්චවුත්ති** නම් වේ.

34. පුබ්බත්ථ, සමෙසු චෙ ග, ජා,
'පච්චවුත්ති' රුදිතා'ති සණ්ඨිතා.

චෙ = ඉදින්; **සමෙසු** = (දෙ වෙනි - සතරවන) සම පාදයන්හි; **පුබ්බත්ථ** = පූර්වයෙහි; **ග ජා** = ගරුවක් හා ජගණයක් ද යන මොහු; **සණ්ඨිතා** = සිටියාහු වී නම්; (**තදෑ** = එකල්හි;) **පච්චවුත්ති ඉති** = "පච්චවුත්ති" යැයි; **උදිතා** = කියන ලද්දී ය.

සමපාදවල පූර්වයෙහි ගරු එකක් හා ජගණයක් මනාව පිහිටා තියේ නම් එම ගාථාව **පච්චවුත්ති** ගාථා නම් වේ.

පුබ්බලක්ඛණෙන පති විරුද්ධං යස්සාති පච්චවුත්ති.

යම් ගාථාවක පූර්වයේ කියන ලද ලක්ෂණ විරුද්ධව යෙදෙන බැවින් පච්චවුත්ති නම් වේ.

විසම පාදය

පුබ්	බත්	ථ	ස	මෙ	සු	චෙ	ග	ජා
∪	∪	–	–	∪	–	∪	–	∪
				රගණ			ලහු	ගරු

සම පාදය

පච්	ච	වුත්	ති	රු	දි	තා	ති	සණ්	ඨී	තා
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
ගරු	ජගණ				රගණ				ලහු	ගරු
සියල්ල මාත්‍රා 8 කි.										

මෙම පච්චවුත්ති ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා සතරක් සෑදෙන බව දත යුතු යි. ඒවා **සුද්ධපච්චවුත්ති, ඔපච්ඡන්දසකපච්චවුත්ති, ආපාතලිකාපච්චවුත්ති, දක්ඛිණන්තිකාපච්චවුත්ති** නම් වේ.

35. සමාසමා'ත්‍රා'දිනං සමා,
සංයුතා භවති තං පවත්තකං.

අත්‍ර = මේ මාත්‍රා ජාතියෙහි; **ආදිනං** = ආදී වූ උදිච්‍යා වෘත්ති ප්‍රාච්‍ය වෘත්ති යන දෙදෙනාගේ; **සමා + අසමා** = සම වූ ද විසම වූ ද පාදයෝ; **සමා** = (ලක්ෂණ යෙහින්) සමවූවාහු; **සංයුතා** = (විපර්යාසයෙන්)[19] යෙදුණාහු වෙත් ද; **තං** = (එකල්හි) ඒ වුත්තය; **පවත්තකං භවති** = "පවත්තක" නම් වේ.

[19] විපර්යාසයෙන් යෙදීම යනු උද්දිච්චවුත්ති, පච්චවුත්තීන්ගේ සම, විසම පාදයන් එක් වී යනුවෙන් අර්ථ ගත යුතු යි.

මෙම ගාථාවට මුලින් කියන ලද උද්දිච්චවුත්ති ගාථාවේ විසම පාදයත් පච්චවුත්ති ගාථාවේ සම පාදයත් එකට යෙදී සෑදෙන ගාථාව **පවත්තක** ගාථාව නම් වේ.

ලක්ඛණද්වයෙන පවත්තතීති පවත්තකං.

පච්චවුත්ති ලක්ෂණ හා උද්දිච්චවුත්ති ලක්ෂණ නැමැති ලක්ෂණ ද්වයෙන් පවතින බැවින් පවත්තක නම් වේ.

විසම පාදය

ස	මා	ස	මාත්	රා	දි	නං	ස	මා
–	∪	–	∪	∪	–	∪	–	∪
ජගණය				රගණ			ලහු	ගරු
ජගණය සමග මාත්‍රා 6 කි								

සම පාදය

සං	යු	තා	භ	ව	ති	තං	ප	වත්	ත	කං
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
ගරු	ජගණ					රගණ			ලහු	ගරු
සියල්ල මාත්‍රා 8 කි										

මෙම පවත්තක ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා තුනක් සෑදේ. ඒවා **සුද්ධපවත්තක, ඔපච්ඡන්දසකපවත්තක, ආපාතලිකාපවත්තක** නම් වේ.

36. අස්ස සා සම කතා' පරන්තිකා.

සා = යම් මාත්‍රා ජාතියක්; **අස්ස** = මේ පවත්තකයාගේ; **සම කතා** = සමපාදයෙන් රචනා කරන ලද්දී ද; (ඕ තොමෝ) **අපරන්තිකා** = "අපරන්තිකා" නම් වේ.

ඒ පවත්තක ගාථාවේ සමපාදයේ (දෙ වෙනි හා හතර වෙනි පාදයේ) ආකාරයට පාද 4 ම හැදේ නම් ඒ ගාථාව **අපරන්තිකා** නම්.

විසමතො අපරං අන්තො යස්සාති අපරන්තිකා.

යම් ගාථාවකට විසමයෙන් අපර වූ කොට්ඨාශයක් ඇති බැවින් අපරන්තිකා නම් වේ.

අස්	ස	සා	ස	ම	ක	තා	ප	රන්	ති	කා
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
ගරු	ජගණ					රගණ			ලහු	ගරු
සියල්ල මාත්‍රා 8 කි										

මෙම අපරන්තිකා ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා තුනක් සෑදේ. ඒවා **සුද්ධඅපරන්තිකා, ඔපච්ඡන්දසකඅපරන්තිකා, ආපාතලිකාඅපරන්තිකා** නම් වේ.

37. තද'ඤ්ඤජා චාරුහාසිනී[20].

තද'ඤ්ඤජා = එයින් අන්‍ය වූ; (පවත්තකයාගේ) විසම පාදයෙන් ජාත වූ; **චාරුහාසිනී** = "චාරුහාසිනී" නම් වේ.

පවත්තක ගාථාවේ විසම පාදයේ (පළමු වෙනි හා තුන් වෙනි පාදයේ) ආකාරයට පාද 4 ම යෙදී ගාථාවක් සෑදේ නම් එය **චාරුහාසිනි** නම් වේ.

චාරුනා (සොභනෙන) ජනෙ හාසෙතීති චාරුහාසිනී.

ශෝභන වූ ලක්ෂණයෙන් ජනතාව සතුටු කරවන බැවින් චාරුහාසිනී නම් වේ.

[20] සමහර වුත්තෝදය ග්‍රන්ථයන්හි මෙය චාරුහාසිනී යනුවෙන් ද දක් වේ.

ත	දඤ්ඤ	ඤ	ජා	චා	රු	භා	සි	නී
–	∪	–	∪	∪	–	∪	–	∪
ජගණය				රගණ			ලහු	ගරු
ජගණය සමග මාත්‍රා 6 කි								

මෙම චාරුභාසිනී ගාථාව වෙතාලිය ජාතියේ ඔපච්ඡන්දසක ආදී අනෙකුත් ගාථාවන් හා මිශ්‍ර වීමෙන් තවත් ගාථා තුනක් සෑදේ. ඒවා **සුද්ධචාරුභාසිනී, ඔපච්ඡන්දසකචාරුභාසිනී, ආපාතලිකාචාරුභාසිනී** නම් වේ.

මේ ක්‍රමයට වේතාලිය ජාතියේ ගාථාවන් එකිනෙකට මිශ්‍ර වීමෙන් හා වෙතාලිය ජාතියේ සඳහන්ව ඇති ගාථාවන් සමග වේතාලිය ජාතියේ සියලුම ගාථා ගණන 29 ක් බව දත යුතු ය.

මත්තාසමක ජාතියො

පාදයකට මාත්‍රා සොළසක් බැගින් ගෙන සතර පාදය මාත්‍රා වශයෙන් සමකොට බඳනා ලද අචලධිති ආදී වූ වුත්තය මාත්‍රා සමක නම් වේ. මෙහි දී ගණයන්ට හෝ අක්ෂරයන් නොව මාත්‍රාවන්ට ම මුල් තැන දෙනු ලැබේ.

38. ද්විත විහත වසු[21] ලහු අචලධිති රි'හ.

(ද්විත විහත වසු ලහු) ද්විත = දෙකින්; **විහත** = ගුණන ලද; **වසු ලහු** = අට ලහුවක් ඇත්තේ; (ලහු ද සයක් යයි කියන ලද වේ) **ඉහ** = මේ "මාත්‍රාසම" ජාතියෙහි; **අචලධිති** = "අචලධිති" නම් වේ.

ලහු අටක් දෙකෙන් ගුණ කිරීමෙන් සෑදුන ගාථාව **අචලධිති** වේ. එහි ලහු 16 කි. පාද හතර ම සමානව යෙදේ.

උච්චාරණකාලෙ අචලා අකම්පනා ගීති යස්සාති අචලධිති.

යම් ගාථාවකට උච්චාරණය කරන්නා වූ කාලයෙහි නොසෙල්වෙන්නා වූ අකම්පිත වූ සමාහිත බවක් ඇති බැවින් අචලධිති නම් වේ.

මෙම මාත්‍රා 16 ගරු ලහු මිශ්‍ර වීමකින් තොරව ලහු මාත්‍රාවන්ගෙන් ම විය යුතු ය. මෙහි **ද්විත විහත** වසු[21] යන්නෙන් ලහු 16 අදහස් වේ.

සියල්ල මාත්‍රා 16 කි.															
ද්වි	ක	වි	හ	ත	ව	සු	ල	හු	අ	ච	ල	ධි	ති	රි	හ
–	–	–	–	–	–	–	–	–	–	–	–	–	–	–	–

39. මත්තාසමකං නවමො ල්ග'න්තෙ.

(යදි = ඉදින් මාත්‍රා 16 ක් ඇති පාදයෙහි) **නවමො** = නවවැනි වූයේ; **ල්** = ලහුවෙක් වේ ද; **අන්තෙ** = කෙළවර; **ග** = ගරුවෙක් වේ ද; (**තදු** = එකල්හි ඒ වුත්තය;) **මත්තාසමකං** = "මාත්‍රා සමක" නම් වේ.

මෙහි නව වන මාත්‍රාව ලහු වීමෙන් හා අන්තයෙහි ගරු අක්ෂරයක් යෙදීමෙන් සෑදෙන ගාථාව **මත්තාසමක** නම් වේ.

(අනන්ත රසුත්තෙන මත්තාසමකත්තා) මත්තාසමො අසම්මින්ති මත්තාසමකං.

මෙම සූත්‍රයෙහි මාත්‍රා පෙර සූත්‍රයෙහි මාත්‍රා සමග සම වන බැවින් මත්තාසමක නම් වේ.

මෙහි නවවන ලහු මාත්‍රාවත් අවසාන ගරු මාත්‍රාවත් හැරුණු විට අනෙක් මාත්‍රා වෙනස් විය හැකි ය.

සියල්ල මාත්‍රා 16 කි.									
මත්	තා	ස	ම	කං	න	ව	මොල්	ගන්	තෙ
∪	∪	–	–	∪	–	–	∪	∪	∪
					9 ලහු				ගරු

[21] වසු යනු 8 දැක්වීමට යොදන්නකි. සත්ත රතන හා සජීවි රත්නය එක් වීමෙන් 8 ක් වේ.

40. ජො න්ලා' ඨවා'ණ්ණවා[22] විසිලොකො.

අණ්ණවා = අණ්ණවයකින් හෙවත් මාත්‍රා සතරකින් පරව; **ජො** = ජගණය වේ ද; **අඨවා** = නොහොත්; **න්ලා** = නගණ - ලහු යන මොහු වෙත් ද; (එකල්හි ඒ වුත්තය) **විසිලොකො** = "විසිලෝක" නම් වේ.

මුල් මාත්‍රා හතරෙන් පසු ජගණයක් තිබිය යුතුයි. එසේත් නැත්නම් නගණයක් සමග ලහු අක්ෂරයක් තිබිය යුතුයි. එසේ යෙදෙන ගාථාව **විසිලොක** නම් වේ.

යස්ස වුත්තලක්ඛණතො විසිට්ඨො සිලොකො ඉති විසිලොකො

යම් ගාථාවකට කියන ලද ලක්ෂණයට වඩා විශිෂ්ට වූ කීර්තියක් ඇත්තේ බැවින් විසිලොකා නම් වේ.

සියල්ල මාත්‍රා 16 කි.									
ජොන්	ලා	ඨ	වාණ්	ණ	වා	වි	සි	ලො	කො
∪	∪	–	∪	–	∪	–	–	∪	∪
මුල් මාත්‍රා 4	ජගණ								

මුල් මාත්‍රා හතරෙන් පසු ජගණය නොයෙදෙන්නේ නම් නගණයක් සමග තවත් ලහු අක්ෂරයක් තිබිය යුතුයි. එනම් ලහු අක්ෂර පහ කි. (මත්තාවුත්තියෙහි නගණය යනු ලහු අක්ෂර හතර කි.) එය මෙසේ දැක්විය හැක.

සියල්ල මාත්‍රා 16 කි.											
∪	∪	–	–	–	–	–	∪	–	–	–	∪
මුල් මාත්‍රා 4	නගණ					ලහු					

41. තද්වයතො වානවාසිකා'ඛ්‍යා.

තද්වයතො = ඒ අණ්ණව දෙකකින් හෙවත් මාත්‍රා අටකින් පරව; (**ජො** = ජගණ වේ ද; **අඨවා** = නොහොත්; **න්ලා** = නගණ - ලහු යන මොහු වෙත් ද; එකල්හි ඕ මාත්‍රා සම ජාතී තොමෝ) **වානවාසිකා ඛ්‍යා** = "වානවාසිකා" නම් වන්නේ ය.

ඒ අණ්ණව දෙකකින් පරව (4×2 = මාත්‍රා අටකින් පසුව) ජගණයක් හෝ නගණයක් සමග ලහු එකක් තිබිය යුතුයි. එසේ සෑදෙන ගාථාව **වානවාසිකා** නම් වේ.

අට්ඨකලාතො ජොවා න්ලාවාති වුත්තත්තා වා නවාති අනියතා. තෙසු නියුත්තා වානවාසිකා.

වා ශබ්දය ද නවා ශබ්දය ද වානවා නම් වේ. (වානවා යන්නෙන් මෙහි අනියත බව කියවේ.) වානවා නම් වූ අනියත භාවයන්හි නියුක්ත වූ බැවින් වානවාසිකා නම් වේ.

සියල්ල මාත්‍රා 16 කි.									
තද්	ව	ය	තො	වා	න	වා	සි	කාඛ්	යා
∪	–	–	∪	∪	–	∪	–	∪	∪
මුල් මාත්‍රා 8					ජගණ				

මෙහි ද මුල් මාත්‍රා අටෙන් පසුව ජගණය නොයෙදෙන්නේ නම් නගණයක් සමග තවත් ලහු අක්ෂරයක් තිබිය යුතුයි. එය මෙසේ දැක්විය හැක.

සියල්ල මාත්‍රා 16 කි.											
∪	–	–	∪	∪	–	–	–	–	–	–	∪
මුල් මාත්‍රා 8					නගණ				ලහු		

[22] අණ්ණව යනු මුහුදට නමකි. අණ්ණව යන්නෙන් අංක 4 අදහස් කෙරේ. සතරමහා සාගරය නිසාවෙනි.

42. **පඤ්ච,ට්ඨ,නවසු යදි ලො චිත්‍රා.**

යදි = ඉදින්; **පඤ්චට්ඨනවසු** = පඤ්චම, අට්ඨම, නවම ස්ථානයන්හි; **ලො** = ලහුවෙක් වී නම්; (එකල්හි ඒ වුත්තය) **චිත්‍රා** = "චිත්‍රා" නම් වේ.

පාදයේ පස්වන අටවන නව වන මාත්‍රා ලහු වන්නේ නම් ඒ ගාථාව **චිත්‍රා** නම් වේ.

විසෙසලක්ඛණත්තා චින්ති තබ්බාති චිත්‍රා.
විශේෂ ලක්ෂණ ඇති බැවින්. සිතිය යුතු බැවින් චිත්‍රා නම් වේ.

සියල්ල මාත්‍රා 16 කි.										
පඤ්	චට්	ඨ	න	ව	සු	ය	දි	ලො	චිත්	රා
∪	∪	–	–	–	–	–	–	∪	∪	∪
		5 ලහු			8 ලහු	9 ලහු				

43. **ග,ල්‍යා'ට්ඨහි චෙ'සා වු'පචිත්‍රා.**

චෙ = ඉදින්; (**යස්සා** = යම් මාත්‍රා සමපාතියකගේ;) **අට්ඨහි** = මාත්‍රා අටකින් පරව; **ගල්‍යා** = ගරු - ලහු - යගණ යන මොහු වෙත් ද; **සා** = ඕ තොමෝ; **උපචිත්‍රා** = "උපචිත්‍රා" නම් වේ.

මාත්‍රා අටකින් පරව ගරු එකක් ලහු එකක් හා යගණයක් යෙදේ නම් එම ගාථාව **උපචිත්‍රා** නම් වේ.

චිත්‍රාය සමීපෙ පවත්තතීති උපචිත්‍රා.
චිත්‍රා ගාථාවේ සමීපයෙහි පවතින බැවින් උපචිත්‍රා නම් වේ.

සියල්ල මාත්‍රා 16 කි.									
ගල්	යාට්	ඨ	හි	චෙ	සා	වු	ප	චිත්	රා
∪	∪	–	–	∪	∪	–	–	∪	∪
මාත්‍රා 8 කි					ගරු	ලහු	යගණ		

44. **ය'මතීත ලක්ඛණ විසෙස යුතං, (චිත්‍රා)**
මත්තා සමා'දි පාද'භිහිතං; (විසිලොක)
අනියත වුත්ත පරිමාණ සහිතං, (වානවාසිකා)
පථිතං ජනෙසු පාදකුලකං. (විසිලොක)

යං = යම් වෘත්තයක්; **අතීත** = ඉකුත් වූ; **ලක්ඛණ විසෙස යුතං** = ලක්ෂණ විශේෂයෙන් යුක්ත වූ; **මතතාසමාදි** = මාත්‍රා සමකාදී වුත්තයන්ගේ; **පාදභිහිතං** = පාදයන්ගෙන් රචනා කරන ලදද; **අනියත වුත්ත පරිමාණ සහිතං** = අනියම වූ වුත්ත පරිමාණයෙන් හෙවත් අනියම් වූ (මාත්‍රා සමකාදී) වුත්තයෙන් හා සෝළස මාත්‍රා සංඛ්‍යාත පරිමාණයෙන් යුක්ත වූ; (**තං** = ඒ වුත්තය;) **ජනෙසු** = ඡන්දස් වෛදික ජනයා කෙරෙහි; **පාදකුලකං** = "පාදකුලකය" නම්; **පථිතං** = ප්‍රසිද්ධ වේ.

යම් කිසි ගාථාවක් පෙර (ඉහත ගාථාවන්හි) කියන ලද ලක්ෂණ විශේෂයෙන් යුක්ත වන්නේ ද, මත්තාසමක ආදී ගාථා වලින් පාදයන් සෑදී තිබේ ද, නියත ප්‍රමාණයක් නැති යම් ගාථා වක් ඇත් ද එය ඡන්දස්ආචාර්යයන් වහන්සේලා අතර පාදයන්ගෙන් ආකුල බැවින් "පාදකුලක" යැයි ප්‍රසිද්ධ වේ.

චිත්‍රා පාදය - සියල්ල මාත්‍රා 16 කි.											
ය	ම	තී	ත	ලක්	ඛ	ණ	වි	සේ	ස	යු	තං
–	–	∪	–	∪	–	–	–	∪	–	–	∪
			5 ලහු		8 ලහු	9 ලහු					

විසිලෝකා පාදය - සියල්ල මාත්‍රා 16 කි.									
මත්	තා	ස	මා	දි	පා	ද	හි	හි	තං
∪	∪	–	∪	–	∪	∪	–	–	∪
මුල් මාත්‍රා 4		ජගණ							

වානවාසිකා පාදය - සියල්ල මාත්‍රා 16 කි.												
අ	නි	ය	ත	වුත්	ත	ප	රි	මා	ණ	ස	හි	තං
–	–	–	–	∪	–	–	–	∪	–	–	–	∪
මුල් මාත්‍රා 8							ජගණ					

විසිලෝකා පාදය - සියල්ල මාත්‍රා 16 කි.										
ප	ථී	තං	ජ	නෙ	සු	පා	ද	කු	ල	කං
–	–	∪	–	∪	–	∪	∪	–	–	∪
මුල් මාත්‍රා 4		ජගණ								

මෙහි පාද සියල්ල වෙනස් නොවුනත් පාද දෙකක් පමණක් වෙනස් වීමෙන් ද පාදකුලක වේ.

❖ මෙම පහත ගාථාවෙන් මත්තාවුත්ති ගාථාවන් තව දුරටත් වර්ණනා කෙරේ.

45. විනා වණ්ණෙහි මත්තා ගා, විනා වණ්ණා ගරූහි තු;
විනා ලහූනි ගරවො, දලෙ පථ්‍යාදිනො මතා.

පථ්‍යාදිනො = පථ්‍යාදී වුත්තයාගේ; **මත්තා** = මාත්‍රාවෝ; **වණ්ණෙහි විනා** = අක්ෂරයන් හැර (සිටියාහු;) **ගා** = ගරු වෙති; **තු** = නැවත; **ගරූහි විනා** = ගරු අක්ෂර හැර (සිටියා වූ මාත්‍රාවෝ;) **වණ්ණා** = අක්ෂරයෝ වෙති; **ලහූනි විනා** = ලහු අක්ෂර හැර (සිටියා වූ මාත්‍රා;) **දලෙ** = අර්ධ කළ කල්හි; **ගරවො මතා** = ගරු වෙත් යයි ගන්නා ලද්දහු ය.

පථ්‍යා ආදී වූ ගාථාවගේ පාද වල මාත්‍රා ගණන අකුරු ගණනින් අඩු කළ කල්හි ගරු ගණන ලැබේ. මාත්‍රා ගණන තබා ගරු ගණන අඩු කල කල්හි අක්ෂර ගණන ලැබේ. වර්ණ ගණන තබා එයින් ගරු ගණන අඩු කළොත් ලහු ගණන ලැබේ.

නැවත අවධාරණය කළයුතු කරුණක් නම් අරියාජාතියෙහි ගරු එකක් මාත්‍රා දෙකක් වන අතර ලහු එකක් මාත්‍රා එකක් වීම යි.

උදා :-

ඡට්ඨො'ඛිලලහු,ජො වා, ගයුතා'ඤ්ඤෙ,ඡ'ග්ගණා,න ජො විසමෙ; (මෙහි මාත්‍රා 30 කි. අක්ෂර 20 කි)
අරියාය'න්තඩ්ඩෙ ලො, ඡට්ඨො,'න්තෙ ගො,ගණා ඡ'ඤ්ඤෙ. (මෙහි මාත්‍රා 27 කි. අක්ෂර 15 කි)

මාත්‍රා 30	2	2	1	1	1	1	2	2	1	1	2	2	2	1	2	1	2	1	1	2
අක්ෂර 20	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19	20
	ඡට්	ඨො	ඛි	ල	ල	හු	ජො	වා	ග	යු	තාඤ්	ඤෙ	ඡග්	ග	ණා	න	ජො	වි	ස	මෙ
	∪	∪	–	–	–	–	∪	∪	–	–	∪	∪	∪	–	∪	–	∪	–	–	∪

මාත්‍රා 27	1	1	2	2	2	2	2	2	2	2	2	1	2	2	2
අක්ෂර 15	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15
	අ	රි	යා	යන්	තඩ්	ඩෙ	ලො	ඡට්	ඨොන්	තෙ	ගො	ග	ණා	ඡඤ්	ඤෙ
	–	–	∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	–	∪	∪	∪

- ❖ සියලු මාත්‍රා 57 ක් සහ අක්ෂර 35 ක් ඇත.
- ❖ මාත්‍රා 57 - අක්ෂර 35 = ගරු 22 (57 - 35 = 22)
- ❖ මාත්‍රා 57 - ගරු 22 = අක්ෂර 35 (57 - 22 = 35)
- ❖ අක්ෂර 35 - ගරු 22 = ලහු 13 (35 - 22 = 13)

යනාදී වශයෙන් දත යුතු යි.

ඉති වුත්තොදයෙ ඡන්දසි මත්තාවුත්තිනිද්දෙසො නාම
දුතියො පරිච්ඡෙදෙ.

වුත්තොදය ඡන්දස් ග්‍රන්ථයෙහි මත්තාවුත්ති නිද්දේස නම් වූ
දෙ වෙනි පරිච්ඡේදය නිමි

සමවුත්තිනිද්දෙස - තතියපරිච්ඡේද

මෙතැන් පටන් ඇරඹෙන්නේ වණ්ණවුත්ති ගාථාවන් ය. මෙම වණ්ණවුත්ති ගාථාවන්ගේ සමවුත්ති, අඩ්ඪසමවුත්ති, විසමවුත්ති යනුවෙන් ප්‍රධාන ප්‍රභේද තුනකි. මෙම ගාථාවන්හි මාත්‍රා වලට නොව, අක්ෂර හෙවත් වර්ණ වලට වැදගත් තැනක් දෙන බැවින් වණ්ණ වුත්ති කියා ද කියනු ලැබේ. දෙ වෙනි පරිච්ඡේදයෙහි කී මත්තාවුත්ති ගාථාවන්හි වැදගත් තැනක් ගන්නේ මාත්‍රා ය. "ගණො ඉධ චතුක්කලො" යැයි කියා ගණයක් යනු මාත්‍රා හතරක් යැයි කීවේ ඒ නිසා ය. මේ වර්ණවුත්ති ගාථාවන්හි මාත්‍රාවන් අප්‍රධානව වර්ණ ප්‍රධාන වන බැවින් මෙහි ගණය මාත්‍රා අනුව නොකියනු ලැබේ. මම වණ්ණ වුත්ති ගාථාවන්ගේ ගණ අටකි.

❖ <u>මෙහි ගණයක් යනු වර්ණ (අක්ෂර) තුනක් ය.</u>

	1	2	3
මගණ	∪	∪	∪
නගණ	–	–	–
භගණ	∪	–	–
යගණ	–	∪	∪
ජගණ	–	∪	–
සගණ	–	–	∪
රගණ	∪	–	∪
තගණ	∪	∪	–

සමවුත්ති

මෙම නිද්දේසයේ එන ගාථාවන්ගේ පාද 4 ම සමාන වන බැවින් සමවුත්ති නම් වේ.

ගායත්‍රී ඡන්දස[23] (අක්ෂර 6)

මධරෙන සරෙන ගීයති උච්චාරීයතීති ගායත්‍රී.

මධුර වූ ශබ්දයකින් උච්චාරණය කරනු ලැබෙන බැවින් ගායත්‍රී නම් වේ.

46. ත්‍යා' චෙ තනුමජ්ඣා.

චෙ = ඉදින්; **ත්‍යා** = තගණ යගණයෝ වෙත්නම්; **තනුමජ්ඣා** = "තනුමජ්ඣා" නම් වේ.

ඉදින් මෙම ගායත්‍රී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණයක් හා යගණයක් ඇත්නම් මෙය **තනුමජ්ඣා** වුත්තය[24] නම් වේ. (වුත්තය = ගාථාව)

මෙම වුත්තයෙහි "**ත්‍යා**" යන අක්ෂර වලින් තගණ, යගණ අදහස් කරයි.

තනු මජ්ඣා යස්සාති තනුමජ්ඣා.

යම් ස්ත්‍රියකගේ ඉඟ කුඩා බැවින් තනුමජ්ඣා නම් වේ. කුඩා ඉඟක් ඇති ස්ත්‍රියක් බඳු බැවින් තනුමජ්ඣා නම් වේ.

1	2	3	4	5	6
ත්‍යා	චේ	ත	නු	මජ්	ඣා
∪	∪	–	–	∪	∪
තගණ			යගණ		

[23] ගාථාවේ තියෙන අක්ෂර ගණන නියම කිරීම ඡන්දස යනුවෙන් කියවේ. "අක්ඛර නියමො ඡන්දං."
[24] ගාථාවේ ගණ හා ගරු ලහු නියම කිරීම වුත්තය නම්. "ගරු ලහු නියමො භවෙ වුත්ති."

මෙම තනුමජ්ඣා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

ජෙනො ජිනමූලෙ, දිස්වා ජනකායං;
සංසාරනිමුග්ගං, සබ්බඤ්ඤුත මිච්ඡං.

(මහාපණාම පාඨ)

ජෙ	නො	ජි	න	මූ	ලෙ
∪	∪	–	–	∪	∪
තගණ			යගණ		

දිස්	වා	ජ	න	කා	යං
∪	∪	–	–	∪	∪
තගණ			යගණ		

සං	සා	ර	නි	මුග්	ගං
∪	∪	–	–	∪	∪
තගණ			යගණ		

සබ්	බඤ්	ඤු	ත	මිච්	ඡං
∪	∪	–	–	∪	∪
තගණ			යගණ		

උණ්හිකා ඡන්දස (අක්ෂර 7)

උසති දහතීති උණ්හො. උණ්හො අස්සා අත්තීති උණ්හිකා.
උෂ්ණගුණය යම් ඡන්දසකට ඇත් ද උණ්හිකා නම් වේ.

47. **කුමාර ලලිතා ජ්ස්ගා.**

ජ්ස්ගා = ජගණ - සගණ - ගරු යන මොහු වෙත් නම්; **කුමාරලලිතා** = ඒ වුත්තය "කුමාරලලිතා" නම් වේ.

ඉදින් මෙම උණ්හිකා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ජගණයක් සගණයක් හා ගරු එකක් එක් වීමෙන් සෑදේ නම්, ඒ ගාථාව **කුමාරලලිතා** වුත්තය නම් වේ.

කුමාරො විය ලලිතා යස්සාති කුමාරලලිතා.
යම් ගාථාවකට කුමාරයෙක් බඳු ලාලිත්‍යයක් ඇති බැවින් කුමාර ලලිතා නම් වේ.

1	2	3	4	5	6	7
කු	මා	ර	ල	ලි	තාජ්	ස්ගා
–	∪	–	–	–	∪	∪
ජගණ			සගණ			ගරු

මෙම කුමාර ලලිතා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

සුතායුභරියා මෙ, ධනඞ්ගමපි චජ්ජං.
චිනං බුධිනිදනෙ, අගා මුනිය මෙතං.

(මහා පණාම පාඨ)

සු	තා	සු	භ	රි	යා	මෙ
–	∪	–	–	–	∪	∪
ජගණ			සගණ			ගරු

ධ	නං	ග	ම	පි	චජ්	ජං
–	∪	–	–	–	∪	∪
ජගණ			සගණ			ගරු

චි	නං	බු	ධි	නි	ද	නෙ
–	∪	–	–	–	∪	∪
ජගණ			සගණ			ගරු

අ	ගා	මු	නි	ය	මෙ	තං
–	∪	–	–	–	∪	∪
ජගණ			සගණ			ගරු

අනුට්ඨුභා ඡන්දස (අක්ෂර 8)

අනු නිරන්තරං ථුතීයතෙ එතායාති අනුට්ඨුභා.
මෙම ඡන්දසින් නිරන්තරව ථුති කරන බැවින් අනුට්ඨුභා නම් වේ.

48. චිත්‍රපද යදි භා ගා.

යදි = ඉදින්; **භා** = භගණයෝ දෙදෙනෙක් වෙත් ද[25]; **ගා** = ගරු දෙකක් වෙත් ද; (ඒ වුත්තය) **චිත්‍රපද** = "චිත්‍රපද" නම් වේ.

ඉදින් මෙම අනුට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණ දෙකක් හා ගරු දෙකක් යෙදීමෙන් සෑදේ ද, ඒ ගාථාව **චිත්‍රපද** වුත්තය නම් වේ.

චිත්‍රං පදං එතිස්සාති චිත්‍රපද.
මෙම ගාථාවගේ විචිත්‍ර වූ කොට්ඨාසයක් ඇති බැවින් චිත්‍රපද නම් වේ.

1	2	3	4	5	6	7	8
චිත්	ර	ප	ද	ය	දි	භා	ගා
∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			ගරු	ගරු

මෙම චිත්‍රපද ගාථාවට උදහරණයක් මෙසේ ය.

සො සසජාතිය දෙහං, චජ්ජිය දනවරඤ්ච;
නාගුසභො වරසීලං, පූරයි සම්පරිවාගො.

(මහාපණාම පාඨ)

සො	ස	ස	ජා	ති	ය	දෙ	හං
∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			ගරු	ගරු

චජ්	ජි	ය	ද	න	ව	රඤ්	ච
∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			ගරු	ගරු

නා	ගු	ස	භො	ව	ර	සී	ලං
∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			ගරු	ගරු

පූ	ර	යි	සම්	ප	රි	චා	ගො
∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			ගරු	ගරු

49. මො මො ගො ගො විජ්ජුම්මාලා.

මො = මගණයක් ද; **මො** = (නැවත) මගණයක් ද; **ගො** = ගරුවක් ද; **ගො** = (නැවත) ගරුවක් ද වී නම්; **විජ්ජුම්මාලා** = (ඒ වුත්තය) "විජ්ජුම්මාලා" නම් වේ.

ඉදින් මෙම අනුට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ දෙකක් හා ගරු දෙකකින් සෑදේ ද, ඒ ගාථාව **විජ්ජුම්මාලා** වුත්තය නම් වේ.

විජ්ජුං විය මාලා එතිස්සාති විජ්ජුම්මාලා.
මෙම ගාථාවට විදුලියක් බඳු වූ ගණ මාලාවක් ඇති බැවින් විජ්ජුම්මාලා නම් වේ.

1	2	3	4	5	6	7	8
මො	මො	ගො	ගො	විජ්	ජුම්	මා	ලා
∪	∪	∪	∪	∪	∪	∪	∪
මගණ			මගණ			ගරු	ගරු

[25] "භා" යනු පාලියෙහි පුරිස ශබ්දයට අනුව බහු වචන බැවින් මෙහිදී භගන දෙකක් හැටියට ගනු ලැබේ. මෙම නීතිය සමහර තැන් වලදී පමණක් භාවිතා වී ඇත. පඤ්චමී විභක්ති රූපය ද මෙසේ ම වන බැවිනි. 50 වන ගාථාව බලන්න.

මෙම විජ්ජුම්මාලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

නෙක්ඛම්මග්ගං රාජා හුත්වා, සෙනබ්බිද්වා පඤ්ඤුසෙට්ඨං;
වෙදෙහින්දෙ වීරුක්කංසං, ඛන්තීවාදී ඛන්තීසෙට්ඨං.

(මහාපණාම පාඨ)

නෙක්	ඛම්	මග්	ගං	රා	ජා	හුත්	වා
∪	∪	∪	∪	∪	∪	∪	∪
මගණ			මගණ			ගරු	ගරු

සෙ	නබ්	බිද්	වා	පඤ්ඤ්	ඤු	සෙට්	ඨං
∪	∪	∪	∪	∪	∪	∪	∪
මගණ			මගණ			ගරු	ගරු

වෙ	දෙ	හින්	දෙ	වී	රුක්	කං	සං
∪	∪	∪	∪	∪	∪	∪	∪
මගණ			මගණ			ගරු	ගරු

ඛන්	තී	වා	දී	ඛන්	තී	සෙට්	ඨං
∪	∪	∪	∪	∪	∪	∪	∪
මගණ			මගණ			ගරු	ගරු

50. භා ත, ල, ගා මාණවකං.

භා = භගණයකින් පරව; **තලගා** = තගණ - ලහු - ගරු වෙත් නම්; **මාණවකං** = (ඒ වුත්තය) "මාණවක" නම් වේ.

ඉදින් මෙම අනුට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණයක් තගණයක් හා ලහු එකකින් හා ගරු එකකින් සෑදේ ද, ඒ ගාථාව **මාණවක** වුත්තය නම් වේ.

(පුරිමතො අභිනවත්තා වුත්තක්කමෙන පච්ඡිමකත්තා ච) මාණවකො වියාති මාණවකං.

පෙර ගාථාවට වඩා අභි නව වන බැවින් කියන ලද අනුක්‍රමයෙන් පසුව එන බැවින් මාණවයෙක් හා සමාන වේ. මාණවකයෙක් හා සමාන වන බැවින් මාණවක නම් වේ.

1	2	3	4	5	6	7	8
භා	ත	ල	ගා	මා	ණ	ව	කං
∪	–	–	∪	∪	–	–	∪
භගණ			තගණ			ලහු	ගරු

මෙම මාණවක ගාථාවට උදාහරණයක් මෙසේ ය.

සො සුතසොමො තථගං, තෙමිය ධිට්ඨානවරං;
එකභුගො මෙත්තවරං, ලොමහසොපෙක්ඛතරං.

(මහාපණාම පාඨ)

සො	සු	ත	සො	මො	ත	ථ	ගං
∪	–	–	∪	∪	–	–	∪
භගණ			තගණ			ලහු	ගරු

තෙ	මි	ය	ධිට්	ඨා	න	ව	රං
∪	–	–	∪	∪	–	–	∪
භගණ			තගණ			ලහු	ගරු

එ	ක	භු	ගො	මෙත්	ත	ව	රං
∪	–	–	∪	∪	–	–	∪
භගණ			තගණ			ලහු	ගරු

ලො	ම	හ	සො	පෙක්	ඛ	ත	රං
∪	–	–	∪	∪	–	–	∪
භගණ			තගණ			ලහු	ගරු

51. ග්ලා සමානිකා ර, ජා ච.

ග්ලා = (ආදියෙහි) ගරු හා ලහු ද; **රජා ච** = (අන්තයෙහි) රගණ - ජගණ දෙක වෙත් නම්; **සමානිකා** = (ඒ වුත්තය) "සමානිකා" නම් වේ.

ඉදින් මෙම අනුට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ගරු එකක් හා ලහු එකකින් පසුව රගණයක් හා ජගණයක් යෙදීමෙන් සෑදේ ද, ඒ ගාථාව **සමානිකා** වුත්තය නම් වේ.

ගරු ලහූනං සමානත්තා සමානං කරොතීති සමානිකා. සමානා වා ගරුලහවො යස්සා අත්ථීති සමානිකා.

ගරු ලහූන්ගේ සමාන භාවය කරන බැවින් සමානිකා නම් වේ.

1	2	3	4	5	6	7	8
ග්ලා	ස	මා	නි	කා	ර	ජා	ච
∪	–	∪	–	∪	–	∪	–
ගරු	ලහු	රගණ			ජගණ		

52. **පමාණිකා ජ, රා ල, ගා.**

ජරා = ජගණ - රගණයෝ වෙත් ද; **ලගා** = (අන්තයෙහි) ලහු ගරු වෙත් ද; **පමාණිකා** = (ඒ වුත්තය) "පමාණිකා" නම් වේ.

ඉදින් මෙම අනුට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ජගණය හා රගණයෙන් අනතුරුව ලහු එකක් හා ගරු එකක් යෙදීමෙන් සෑදේ ද, ඒ ගාථාව **පමාණිකා** වුත්තය නම් වේ.

ජාදීහි පරිමිත්තා පමාණං කරොතීති පමාණිකා.

ජගණාදියෙන් පරිමිත වූ බැවින් ප්‍රමාණයක් කරන බැවින් පමාණිකා නම් වේ.

1	2	3	4	5	6	7	8
ප	මා	ණි	කා	ජ	රා	ල	ගා
–	∪	–	∪	–	∪	–	∪
ජගණ			රගණ			ලහු	ගරු

බ්‍රහතී ඡන්දස (අක්ෂර 9)

අනුට්ඨුභතො (එකක්ඛරාධිකං හුත්වා) බ්‍රහති පවත්තති මහන්ත භාවෙනාති බ්‍රහති.

අනුට්ඨුභ ඡන්දසට වඩා එක් අකුරක් වැඩි වී මහන්ත භාවයෙන් පවතින බැවින් බ්‍රහතී නම් වේ.

53. **රා න, සා යදි හලමුඛී.**

යදි = ඉදින්; **රා** = රගණයෙන් පරව; **න සා** = නගණ - සගණයෝ වෙත් ද; **හලමුඛී** = (ඒ වුත්තය) "හලමුඛී" නම් වේ.

ඉදින් මෙම බ්‍රහතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම රගණයක් හා නගණයක් හා සගණයක් යෙදීමෙන් සෑදේ ද, ඒ ගාථාව **හලමුඛී** වුත්තය නම් වේ.

හලං (නඞ්ගලසදිසො රගණො) මුඛෙ යස්සාති හලමුඛී.

මෙම ගාථාවේ ආදියෙහි නඟුලක් බඳු වූ රගණය ඇති බැවින් හලමුඛී නම් වේ.

1	2	3	4	5	6	7	8	9
රා	න	සා	ය	දි	හ	ල	මු	ඛී
∪	–	∪	–	–	–	–	–	∪
රගණ			නගණ			සගණ		

54. **භුජග සුසු සටා නා මො.**

නා = නගණයෝ දෙදෙනෙක් වෙත් ද; **මො** = (නැවත) මගණයෙක් වේ ද; **භුජග සුසු සටා** = (ඒ වුත්තය) "භුජගසුසුසටා" නම් වේ.

ඉදින් මෙම බ්‍රහතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකකින් හා මගණයකින් සෑදේ ද, ඒ ගාථාව **භුජගසුසුසටා**[26] වුත්තය නම් වේ.

භුජෙන ගච්ඡතීති භුජගො. සයති ජීවතීති සුසු. භුජගසුසුනො සඨා භුජගසුසුසටා. භුජගසුසුසටා වියාති භුජගසුසුසටා.

වකුටුව යන බැවින් භුජග නම් වේ. ජීවත් වන බැවින් සුසු නම් වේ. භුජග නම් වන්නා වූ සර්පයා කුඩා පැටියෙක් ද වෙයි. එබැවින් භුජගසුසු නම් වෙයි. සර්පයෙකුගේ යෑම භජගසුසුසටා නම් වෙයි. සර්පපැටියෙකුගේ යෑම බඳු වන බැවින් භුජගසුසුසටා නම් වේ.

1	2	3	4	5	6	7	8	9
භු	ජ	ග	සු	සු	ස	ටා	නා	මො
–	–	–	–	–	–	∪	∪	∪
නගණ			නගණ			මගණ		

මෙම භුජග සුසු සටා ගාථාවට උදාහරණයක් නම්:-

නයනසුභගකායඛ්ගං, මධුරවරසරොපෙතං;
අමිතගුණගණාධාරං, දසබලමතුලං වන්දෙ.

(නමක්කාරටීකා)

න	ය	න	සු	භ	ග	කා	යඛ්	ගං
–	–	–	–	–	–	∪	∪	∪
නගණ			නගණ			මගණ		

ම	ධු	ර	ව	ර	ස	රො	පෙ	තං
–	–	–	–	–	–	∪	∪	∪
නගණ			නගණ			මගණ		

අ	මි	ත	ගු	ණ	ග	ණා	ධා	රං
–	–	–	–	–	–	∪	∪	∪
නගණ			නගණ			මගණ		

ද	ස	බ	ල	ම	තු	ලං	වන්	දෙ
–	–	–	–	–	–	∪	∪	∪
නගණ			නගණ			මගණ		

පන්ති ඡන්දස (අක්ෂර 10)

අත්තනො සන්තානං පඤ්චයති විත්ථාරෙතීති පන්ති.
තමාගේ සන්තානය විස්තාර කරන බැවින් පන්ති නම්වේ.

55. මිසා ජ්ගා සුද්ධවිරාජිතං මතං.

මිසා = මගණ - සගණයෝ වෙත් ද; **ජ්ගා** = (නැවත) ජගණ - ගරු යන මොහු වෙත් ද; (මේ වුත්තය) **සුද්ධවිරාජිතං** = "සුද්ධවිරාජිත" කියා; **මතං** = දන්නා ලදී.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ සගණ හා ජගණය සමග ගරු අක්ෂරයක් යෙදීමෙන් සෑදේ ද, ඒ ගාථාව **සුද්ධවිරාජිත** වුත්තය නම් වේ.

සුද්ධො විරාජිතො යස්සාති සුද්ධවිරාජිතං.
යම් ගාථාවක ශුද්ධ වූ ශෝභන භාවයක් ඇති බැවින් සුද්ධවිරාජිත නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
මිසාජ්	ගා	සුද්	ධ	වි	රා	ජි	තං	ම	තං
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මගණ			සගණ			ජගණ			ගරු

[26] භුජග සුසු යනු නාගයාගේ සූ සූ යන හඬ යනුවෙන් ද අර්ථ දී ඇත.

මෙම සුද්ධවිරාජිත ගාථාවකට උදාහරණයක් නම්:-

යො බුද්ධො ධිතිමාඤ්ඤධාරකො, සංසාරෙ අනුභොසි කායිකං;
දුක්ඛං චෙතසිකඤ්ච ලොකතො, තං වන්දෙ නරදෙවමඞ්ගලං.

(නමක්කාරටීකා)

යො	බුද්	ධො	ධි	ති	මාඤ්	ඤ	ධා	ර	කො
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මගණ			සගණ			ජගණ			ගරු

සං	සා	රෙ	අ	නු	භො	සි	කා	යි	කං
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මගණ			සගණ			ජගණ			ගරු

දුක්	ඛං	චෙ	ත	සි	කඤ්	ච	ලො	ක	තො
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මගණ			සගණ			ජගණ			ගරු

තං	වන්	දෙ	න	ර	දෙ	ව	මඞ්	ග	ලං
∪	∪	∪	–	–	∪	–	∪	–	∪
මගණ			සගණ			ජගණ			ගරු

56. ම්නා යො ගො යදි පණවො ඛ්‍යාතො.

යදි = ඉදින්; **ම්නා** = මගණ - නගණයෝ වෙත් ද; **යො** = (නැවත) යගණයක් වේ ද; **ගො** = (අන්තයෙහි) ගරුවක් වේ ද; **පණවො ඛ්‍යාතො** = (එකල්හි ඒ වුත්තය) "පණව" යයි ප්‍රසිද්ධ වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණය නගණය යගණය සමග ගරුවක් යෙදේ නම්, එම ගාථාව **පණව** වුත්තය නම් වේ.

පණියතීති පණවො. පණවො වියාති පණවො.
ප්‍රශංසා කරන බැවින් පණව නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
ම්නා	යො	ගො	ය	දි	ප	ණ	වොඞ්	යා	තො
∪	∪	∪	–	–	–	–	∪	∪	∪
මගණ			නගණ			යගණ			ගරු

57. භ්මා ස,ගයුත්තා රුම්මවතී සා.

(**යස්සා** = යම් වුත්තයකගේ;) **සගයුත්තා** = (අන්තයෙහි) සගණය හා ගරුවකින් යුක්ත වූ; **භ්මා** = භගණ - මගණයෝ වෙත් ද; **සා** = ඕ තොමෝ; **රුම්මවතී** = "රුම්මවතී" නම් වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණය භගණය සගණය සමග ගරුවක් යෙදේ නම්, එම ගාථාව **රුම්මවතී** වුත්තය නම් වේ.

රුම්මො රමණීයො සද්දො යස්සා අත්ථීති රම්මවති. තදෙව රුම්මවතී.
යම් ගාථාවක රමණීය වූ ශබ්දයක් ඇත් ද. එබැවින් රම්මවතී නම් වේ. එය ම රුම්මවතී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
භ්මා	ස	ග	යුත්	තා	රුම්	ම	ව	තී	සා
∪	–	–	∪	∪	∪	–	–	∪	∪
භගණ			මගණ			සගණ			ගරු

58. ඤෙය්‍යා මත්තා ම, භ, ස, ගයුත්තා.

ම භ ස ගයුත්තා = මගණ - භගණ - සගණ - ගරු යනු මෙයින් යුක්ත වූවා; **මත්තා** = "මත්තා" කියා; **ඤෙය්‍යා** = දත යුතු ය.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණය භගණය සගණය සමග ගරුවක් යෙදේ නම්, එම ගාථාව **මත්තා** වුත්තය නම් වේ.

සුණන්තානං මත්තෙති මත්තා.
අසන්නා වූ පුද්ගලයන් මත් කරවන බැවින් මත්තා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
ඤෙය්	යා	මත්	තා	ම	භ	ස	ග	යුත්	තා
∪	∪	∪	∪	–	–	–	–	∪	∪
මගණ			භගණ			සගණ			ගරු

මෙම මත්තා ගාථාවකට උදාහරණයක් නම්:-

කෙය්‍යං කෙය්‍යං අභිජයකෙතුං, ජෙය්‍යං ජෙය්‍යං වරජයපානං;
පෙය්‍යං පෙය්‍යං සුවිචි නමෙ තං, නෙය්‍යං නෙය්‍යං සමතමුපෙක්ඛිං.

(මහාපණාම පාඨ)

කෙය්	යං	කෙය්	යං	අ	භි	ජ	ය	කෙ	තුං
∪	∪	∪	∪	–	–	–	–	∪	∪
මගණ			භගණ			සගණ			ගරු

ජෙය්	යං	ජෙය්	යං	ව	ර	ජ	ය	පා	නං
∪	∪	∪	∪	–	–	–	–	∪	∪
මගණ			භගණ			සගණ			ගරු

පෙය්	යං	පෙය්	යං	සු	වි	චි	න	මෙ	තං
∪	∪	∪	∪	–	–	–	–	∪	∪
මගණ			භගණ			සගණ			ගරු

නෙය්	යං	නෙය්	යං	ස	ම	ත	මු	පෙක්	ඛිං
∪	∪	∪	∪	–	–	–	–	∪	∪
මගණ			භගණ			සගණ			ගරු

59. චම්පකමාලා වෙ භ, ම, සා ගො [ඉදං නාමන්තරඤ්ඤපනත්ථමෙව පුන වුත්තං (ටී.)].

වෙ = ඉදින්; **භ ම සා ගො** = භගණ - මගණ - සගණ - ගරුවකින් යුක්ත වේ ද; **චම්පකමාලා** = (ඒ වුත්තය) "චම්පකමාලා" නම් වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණය මගණය සගණය සමග ගරුවක් යෙදේ නම්, එම ගාථාව **චම්පකමාලා** වුත්තය නම් වේ. මෙය ඉහත කී රුම්මවතී ගාථාව හා සමාන වේ. "චම්පකමාලා" යි තවත් නමක් එයට ඇති බව දැක්වීමට නැවත කියන ලදී.

චම්පකමාලා වියාති චම්පකමාලා.

සපුමල් බඳු වන බැවින් චම්පකමාලා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
චම්	ප	ක	මා	ලා	වේ	භ	ම	සා	ගෝ
∪	–	–	∪	∪	∪	–	–	∪	∪
භගණ			මගණ			සගණ			ගරු

60. න, ර, ජ, ගෙහි සා මනොරමා.

න ර ජ ගෙහි = නගණ - රගණ - ජගණ - ගරු යන මොවුන් කරණ කොට ගෙන; (**යා** = යම් වුත්තයක් වේ ද;) **සා** = ඕ තොමෝ; **මනොරමා** = "මනොරමා" නම් වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණය රගණය ජගණය සමග ගරුවක් යෙදේ නම්, එම ගාථාව **මනොරම** වුත්තය නම් වේ.

මනං රමෙතීති මනොරමා.

මනස රමණය කරවන බැවින් මනොරමා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
න	ර	ජ	ගෙ	හි	සා	ම	නො	ර	මා
–	–	–	∪	–	∪	–	∪	–	∪
නගණ			රගණ			ජගණ			ගරු

61. උබ්භාසකං තං චෙ තො ම, රා ල්ච.

චෙ = ඉදින්; **තො** = තගණය ද; **ම රා** = (නැවත) මගණ - රගණයෝ ද; **ල්ච** = (අන්තයෙහි) ලහුවක් ද වී නම්; **තං** = ඒ වුත්තය; **උබ්භාසකං** = "උබ්භාසක" නම් වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණය මගණය රගණය සමග ලහුවක් ද යෙදේ නම් එම ගාථාව **උබ්භාසක** වුත්තය නම් වේ.

ඡන්නං උපරි භාසිතත්තා උද්ධං භාසෙතබ්බං. භාසෙතබ්බන්ති වා උබ්භාසකං.

සූත්‍ර සයකගේ මත්තතෙහි භාෂිත වූ බැවින් මත්තෙහි භාෂිත කළ යුතු වෙයි. එබැවින් උබ්භාසක නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
උබ්	භා	ස	කං	තං	චෙ	තො	ම	රාල්	ච
∪	∪	–	∪	∪	∪	∪	–	∪	–
තගණ			මගණ			රගණ			ලහු

පළමු පරිච්ඡේදයේ හත්වන ගාථාවෙහි පාදන්ත අක්ෂරය ද ගරු වන බව කියන ලදී. "**පදන්තො වා**" යන එම පාඨයෙහි ඇති වා-කාරයෙන් එම නීතිය සමහර තැනෙක නොවන බව පෙන්වයි. මෙම "**උබ්භාසකං තං චෙ**" ආදී ගාථාව එසේ පාදන්ත ගරු නැති ගාථාවන්ට උදාහරණය කි.

62. තො ජා ගරුනා'ය'මුපට්ඨිතා.

තො ජා = තගණ හා ජගණ දෙකක් වෙත් ද; **ගරුනා** = (අන්තයෙහි) ගරුවකින් යුක්ත වූ; **අයං** = මෝ තොමෝ; **උපට්ඨිතා** = "උපට්ඨිතා" නම් වේ.

ඉදින් මෙම පන්ති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණයක් ජගණ දෙකක් සමග ගරුවක් යෙදේ නම් එම ගාථාව **උපට්ඨිත** වුත්තය නම් වේ.

උපට්ඨාති පාකටභාවං ගච්ඡතීති උපට්ඨිතා.
ප්‍රකට බවට යන බැවින් උපට්ඨිතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10
තො	ජා	ග	රු	නා	ය	මු	පට්	ඨි	තා
∪	∪	–	–	∪	–	–	∪	–	∪
තගණ			ජගණ			ජගණ			ගරු

තිට්ඨුභා ඡන්දස (අක්ෂර 11)

තීසු ඨානෙසු භීයතෙති තිට්ඨුභා.
තුනක් වන ස්ථානයන්හි දී තදකරනු ලබන බැවින් තිට්ඨුභා නම් වේ.

63. ඉන්දදිකා තා වජිරා ජ, ගා ගො.

තා = තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජ ගා** = (නැවත) ජගණ - ගරු යන මොහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වෙත් ද; (ඒ වුත්තය) **ඉන්දදිකා** = "ඉන්ද" ශබ්දය ආදිකොට ඇති; **වජිරා** = "වජිරා" නම් වේ හෙවත් "ඉන්දවජිරා" නම් වන්නී ය.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණ දෙකක් ජගණයක් සමග ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව ඉන්දවජිරා වුත්තය නම් වේ.

ඉන්දස්ස වජිරා ඉන්දවජිරා. ඉන්දවජිරා වියාති ඉන්දවජිරා.
ශක්‍රයාගේ වජ්‍රායුධය හා සම වන බැවින් ඉන්දවජිරා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
ඉන්	ද	දි	කා	තා	ව	ජි	රා	ජ	ගා	ගෝ
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

මෙම ඉන්දවජිර ගාථාවකට උදාහරණ නම්:-

කච්චායනඤ්චාචරියං නමිත්වා, නිස්සාය කච්චායනවණ්ණනාදිං;
බාලප්පබොධත්ථමුජුං කරිස්සං, බ්‍යත්තං සුකණ්ඩං පදරූපසිද්ධිං.

(පදරූපසිද්ධි)

කච්	චා	ය	නඤ්	චා	ච	රි	යං	න	මිත්	වා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

නිස්	සා	ය	කච්	චා	ය	න	වණ්	ණ	නා	දිං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

බා	ලප්	ප	බො	ධත්	ථ	මු	ජුං	ක	රිස්	සං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

බ්‍යත්	තං	සු	කණ්	ඩං	ප	ද	රූ	ප	සිද්	ධිං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

64. උපාදිකා සා'ව ජ,තා ජ,ගා ගො.

ජ තා = ජගණ - තගණයෝ වෙත් ද; **ජ ගා** = (නැවත) ජගණ - ගරුහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වේ ද; (ඒ වුත්තය) **උපාදිකා** = "උප" ශබ්දය ආදි කොට ඇති; **සා + වජිරා** = ඕ තොමෝ "උපෙන්ද වජිරා" නම් වන්නී ය.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ජගණයක් තගණයක් සහ ජගණයක් සමග ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **උපේන්දවජිරා** වුත්තය නම් වේ.

උප ආදි යස්සාති උපාදි. උපාදි එව උපාදිකා. උපාදිකා ච සා වජිරා චාති උපෙන්දවජිරා.

යම් ගාථාවක උප නම් වූ ආදිය ඇත් ද. එබැවින් උපාදි නම් වේ. උපාදි යන්න ම උපාදිකා නම් වේ. උපාදිකා ද නම් වේ. වජිරා ද නම් වෙයි. එබැවින් උපේන්දවජිරා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
උ	පා	දි	කා	සා	ව	ජ	තා	ජ	ගා	ගෝ
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

මෙම උපේන්දවජිරා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

උපෙතපුඤ්ඤෙ වරබොධිමූලෙ - සසෙනමාරං සුගතො ජිනිත්වා;
අබොජ්ඣි බොධිං අරුණොදයම්හි - නමාමි තං මාරජිනං අභඞ්ගං.

(නමක්කාරටීකා)

උ	පෙ	ත	පුඤ්ඤ	ඤෙ	ව	ර	බො	ධි	මූ	ලෙ
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

ස	සෙ	න	මා	රං	සු	ග	තො	ජි	නිත්	වා
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

අ	බොජ්	ඣි	බො	ධිං	අ	රු	ණො	ද	යම්	හි
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

න	මා	මි	තං	මා	ර	ජි	නං	අ	භං	ගං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

65. අනන්තරො'දීරිත ලක්ඛණා වෙ, (උපෙන්දවජිර)
පාද විමිස්සා උපජාතියො තා; (ඉන්දවජිර)

එවං කිර'ඤ්ඤසුපි මිස්සිතාසු, (ඉන්දවජිර)
වදන්ති ජාතිස්විද' මෙව නාමං. (උපෙන්දවජිර)

වෙ = ඉදින්; **අනන්තරොදීරිත** = අනතුරු කොට කියන ලද; **ලක්ඛණා** = ඉන්දවජිර, උපේන්දවජිර දෙදෙනාගේ ලක්ෂණ ඇති; **පාදු** = පාදයො; **විමිස්සා** = විවිධාකාරයෙන් මිශ්‍ර වූවාහු වෙත් ද; **තා** = ඔවුහු; **උපජාතයො** = "උපජාති" නම් වෙති; **එවං** = මෙපරිද්දෙන්; **අඤ්ඤසු ජාතිසු** = අන්‍ය ඡන්දෙජාතීන්; **මිස්සිතාසු අපි** = මිශ්‍ර කළ කල්හි ද; **ඉදමෙව නාමං** = මේ නාමයම; **වදන්ති කිර** = කියති. (ව්‍යාවහාර කරති)

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් ගාථාවක් ඉහත කියන ලද්ද වූ ගාථා දෙකේ (ඉන්දවජිර, උපේන්දවජිර) ලක්ෂණ මිශ්‍ර වීමෙන් සෑදී තියේ නම් එම ගාථාව **උපජාති** වුත්ත නම් වේ. මෙසේ අනෙකුත් ජාතීන් මිශ්‍ර වීමෙන් ද **උපජාති** කියා කියනු ලැබේ.

ජාතියා උප උපජාති.
ජාතියෙහි සමීපයෙහි වන බැවින් උපජාති නම් වේ.

උපෙන්දවජිර										
1	2	3	4	5	6	7	8	9	10	11
අ	නන්	ත	රො	දී	රි	ත	ලක්	ඛ	ණා	වෙ
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
1	2	3	4	5	6	7	8	9	10	11
පා	දු	වි	මිස්	සා	උ	ප	ජා	ති	යො	තා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
1	2	3	4	5	6	7	8	9	10	11
ඒ	වං	කි	ලඤ්ඤ	ඤු	සු	පි	මිස්	සු	තා	සු
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

උපෙන්දවජිර										
1	2	3	4	5	6	7	8	9	10	11
ව	දන්	ති	ජා	තිස්	වි	ද	මෙ	ව	නා	මං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

මෙම උපජාති ගාථාවට උදාහරණයක් නම්:-

යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං; කාලං කරොන්තො අතිදුක්කරානි;
බෙදං ගතො ලොකහිතාය නාථො; නමො මහාකාරුණිකස්ස තස්ස[27].

(විනයපිටක, පාරාජිකකණ්ඩ-අට්ඨකථා)

[27] අවසාන "ස" අක්ෂරය පාදන්ත ගරු ලෙස ගෙන ඇත.

ඉන්දවජිර										
යො	කප්	ප	කො	ටී	හි	පි	අප්	ප	මෙය්	යං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
කා	ලං	ක	රොන්	තො	අ	ති	දුක්	ක	රා	නි
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
බෙ	දං	ග	තො	ලො	ක	හි	තා	ය	නා	ථො
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

උපෙන්දවජිර										
න	මො	ම	හා	කා	රු	ණි	කස්	ස	තස්	ස
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

සැ.යු. :- කුමන ආකාරයකින් හෝ මෙම ගාථා (වුත්ත) දෙක මිශ්‍ර වීමෙන් ගාථාවක් සෑදුනේ නම් එම ගාථාව උපජාති ගාථාවක් වේ. (මෙයට උදහරණ ගාථා ත්‍රිපිටක අටුවාවෙහි බොහෝ වේ.)

මෙම උපජාති ගාථාවකට තවත් උදහරණයක්:-

උපෙතපුඤ්ඤං වරලක්ඛණොකං - ණොකං විසුද්ධං ජලිතප්පදීමං;
දීපං පජානං අනිසං නවජ්ජං - නවජ්ජවාචං සුගතං නමාමි.

(මහාපණාම පාඨ)

උපෙන්දවජිර										
උ	පෙ	ත	පුඤ්ඤ්	ඤං	ව	ර	ලක්	ඛ	ණො	කං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
ණො	කං	වි	සුද්	ධං	ජ	ලි	තප්	ප	දී	මං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

ඉන්දවජිර										
දී	පං	ප	ජා	නං	අ	නි	සං	න	වජ්	ජං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

උපෙන්ද්‍රවජිර										
න	වජ්	ජ	වා	චං	සු	ග	තං	න	මා	මි
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

66. න, ජ, ජ, ල, ගා ගදිතා සුමුඛී.

න ජ ජ ල ගා = නගණ - ජගණ - ජගණ - ලහුවක් හා ගරුවක් යන මොවුහු වෙත් නම්; **සුමුඛී** = (ඒ වුත්තය) "සුමුඛී" යැයි; **ගදිතා** = කියන ලදී.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණයක් ජගණ දෙකක් සමග ලහුවක් හා ගරුවක් යෙදේ නම් එම ගාථාව **සුමුඛී** වුත්තය නම් වේ.

සුන්දරං මුඛං යස්සාති සුමුඛී. සුමුඛී වියාති සුමුඛී.

යම් ස්ත්‍රියකට සුන්දර වූ මුහුණක් ඇත් ද එබැවින් සුමුඛී නම් වේ. සුන්දර මුහුණක් ඇති ස්ත්‍රියක් බඳු වූ බැවින් සුමුඛී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
න	ජ	ජ	ල	ගා	ග	දි	තා	සු	මු	ඛී
–	–	–	–	∪	–	–	∪	–	–	∪
නගණ			ජගණ			ජගණ			ලහු	ගරු

67. දෙධක මිච්ඡති වෙ භ,භ,භා ගා.

වෙ = ඉදින්; **භ භ භා** = භගණයෝ තිදෙනෙක් ද; **ගා** = (නැවත) ගරු අක්ෂර දෙකක් ද[28] යන මොහු වෙත්නම්; **දෙධකං ඉච්ඡති** = "දෝධක" යැයි කැමති වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණ තුනක් සමග ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **දෝධක** වුත්තය නම් වේ.

දුධති දුහති වා හිංසතීති දෙධකං.

හිංසාකරන බැවින් දෙධක නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
දෙ	ධ	ක	මිච්	ඡ	ති	වෙ	භ	භ	භා	ගා
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

මෙම දෙධක ගාථාවකට උදාහරණයක් නම්:-

යෙ වදතං පවරො මනුජෙසු, සක්‍යමුනී භගවා කතකිච්චො;
පාරගතො බලවිරියසමඞ්ගී, තං සුගතං සරණත්ථමුපෙහි.

(සුත්තපිටක, ඛුද්දක නිකාය, විමානවත්ථුපාලි, ඡත්තමාණවක විමාන වත්ථු)

යෙ	ව	ද	තං	ප	ව	රො	ම	නු	ජෙ	සු
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

[28] මෙහි "ගා" අක්ෂරය බහු වචන ලෙස ගත යුතුයි.

සක්	ය	මු	නී	භ	ග	වා	ක	ත	කිච්	චො
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

පා	ර	ග	තො	බ	ල	විරි[29]	ය	ස	මං	ගී
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

තං	සු	ග	තං	ස	ර	ණත්	ථ	මු	පෙ	හි
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

මෙම දෙධක ගාථාවට තවත් උදහරණයක් නම්:-

චක්කවරඞ්කිතරත්තසුපාදෙ; ලක්ඛණමණ්ඩිතආයතපණ්හි;
චාමරඡත්තවිභූසිතපාදෙ; එස හි තුය්හ පිතා නරසීහො.

(විනය පිටක, සාරත්ථදීපනී ටීකා-3)

චක්	ක	ව	රඞ්	කි	ත	රත්	ත	සු	පා	දෙ
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

ලක්	ඛ	ණ	මණ්	ඩි	ත	ආ	ය	ත	පණ්	හි
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

චා	ම	ර	ඡත්	ත	වි	භූ	සි	ත	පා	දෙ
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

එ	ස	හි	තුය්	හ	පි	තා	න	ර	සී	හො
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

68. වෙද,ස්සෙහි[30],ම්තා ත්ගගා,සාලිනී සා.

ම්තා = මගණ - තගණයෝ වෙත් ද; **ත්ග** = (නැවත) තගණ හා ගරු යන මොහු වෙත් ද; **ගා** = (අන්තයෙහි නැවතත්) ගරුවෙක් වේ ද; **වෙදඅස්සෙහි** = සතරකින් හා සතකින් යති වේ ද; **සා** = ඕ තොමෝ; **සාලිනී** = "සාලිනී" නම් වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණයක් තගණ දෙකක් සමග ගරු දෙකක් යෙදේ ද, සතරකින් හා සතකින් යතිය වේ ද, නම් එම ගාථාව **සාලිනී** වුත්තය නම් වේ.

---

[29] මෙහි තුන්වන පදයෙහි විරිය යන වචනයෙහි විරි යන ලහු දෙක එක ගරු අකුරක් ලෙස සැලකිය යුතු ය.
[30] (වෙද + අස්සෙහි) වෙද යන්න චතුර්වේදය හැටියට ගෙන අංක 4 අදහස් කෙරේ. අස්ස යන්නෙන් අශ්වයන් 7 වර්ගයක් ඇති බැවින් අංක 7 අදහස් වේ. එමනිසා මෙහි යතිය තැබිය යුත්තේ 4 න් හා 7 නි.

සාරො එත්ථ අත්ථීති සාලිනී.

මෙම ගාථාවෙහි සාරය ඇති බැවින් සාලිනී නම් වේ.

මෙම වුත්තයෙහි "**ම්තා ත්ගගා**" යන අක්ෂර වලින් මගණ, තගණ, තගණ හා ගරු දෙක අදහස් කරයි. මෙහි යතිය මාත්‍රා 4 න් හා 7 න් යෙදිය යුතුය[31].

1	2	3	4	5	6	7	8	9	10	11
වේ	දස්	සෙ	හිම්	තාත්	ග	ගා	සා	ලි	නී	සා
∪	∪	∪	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			තගණ			ගරු	ගරු

69. වාතොම්මී සා, යති සා ම්භා ත, ගා ගො.

ම්භා = මගණ - භගණයෝ වෙත් ද; **තගා** = තගණ - ගරුහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වේ ද; **සා යති** = ඕ (සාලිනීයෙහි කී) යති වූ නම්; **සා** = ඕ තොමෝ; **වාතොම්මී** = "වාතොම්මී" නම් වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, භගණ හා තගණයක් සමග ගරු දෙකක් යෙදේ ද, කලින් කී සාලිනී නම් වුත්තයට සමානව යති යෙදෙයි ද, එම ගාථාව **වාතොම්මී** වුත්තය නම් වේ.

වාතෙන පහතා ඌමී වාතොම්මී. වාතොම්මී වියාති වාතොම්මි.

වාතයෙන් පහර දෙන ලද රළ වාතොම්මී නම් වේ. වාතයෙන් පහර දෙන රළ වැනි බැවින් වාතොම්මී නම් වෙයි.

මෙම වුත්තයෙහි අවසානයේ ඇති "**ම්භා ත, ගා ගො**" යන අක්ෂර වලින් මගණ, භගණ, තගණ හා ගරු දෙක අදහස් කරයි. මෙහි යතිය මාත්‍රා 4 න් 7 න් තැබිය යුතුය. (පෙර ගාථාව සේම මෙහි යතිය යෙදෙනු ලැබේ)

1	2	3	4	5	6	7	8	9	10	11
වා	තොම්	මී	සා	ය	ති	සාම්	භා	ත	ගා	ගො
∪	∪	∪	∪	–	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			තගණ			ගරු	ගරු

70. භා ත, න, ගා ගො'සු, රස සිරී සා.

භා = භගණයෙන් පරව; **ත න ගා** = තගණ - නගණ - ගරු යන මොහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වේ ද; **සා** = ඕ තොමෝ; **සුරසසිරී** = "සුරසසිරී" නම් වන්නී ය.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණ, තගණ, නගණ සමග ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **සුරසසිරී** වුත්තය නම් වේ.

කතපුඤ්ඤෙහි සෙවියතෙති සිරී. කතපුඤ්ඤපුග්ගලෙ නිස්සියතීති සිරී.

කළ පින් ඇත්තන් ආශ්‍රය කරන බැවින් සිරී නම් වේ. කළ පින් ඇති පුද්ගලයන් නිශ්‍රය කරන බැවින් සිරී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
භා	ත	න	ගා	ගො	සු	ර	ස	සි	රී	සා
∪	–	–	∪	∪	–	–	–	–	∪	∪
භගණ			තගණ			නගණ			ගරු	ගරු

[31] මෙහි දෙවන යතිය 7 න් තබා ඇත. එය ගණන් ගැනෙනුයේ මුළ පටන් නොව පළමු වන යතියේ අවසානයේ පටන් ය. 4 න් පසු ආරම්භ කොට 7 ගැනිය යුතුය. එවිට යතිය යෙදෙන්නේ ගාථාවේ අවසානයේ දී ය.

71. රො න, රා ඉහ රථොද්ධතා ල, ගා.

රො = රගණය වේ ද; **න රා** = නගණ - රගණයෝ වෙත් ද; **ල ගා** = (අන්තයෙහි) ලහු හා ගරුවෙක් වෙත් ද; (ඒ වුත්තය) **රථොද්ධතා** = "රථොද්ධතා" නම් වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම රගණ, නගණ, රගණ සමග ලහුවක් හා ගරුවක් යෙදේ නම් එම ගාථාව **රථොද්ධතා**[32] වුත්තය නම් වේ.

රථස්ස උද්ධතා රතොද්ධතා.
රථයේ සෙලවීම වැනි වූ බැවින් රතොද්ධතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
රො	න	රා	ඉ	හ	ර	ථොද්	ධ	තා	ල	ගා
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
රගණ			නගණ			රගණ			ලහු	ගරු

මෙම රථොද්ධතා ගාථාවට උදහරණයක් නම්:-

තෙජවාපි හි නරො විචක්ඛණො, සක්කතො බහුජනස්ස පූජිතො;
නාරිනං වසගතො න භාසති, රාහුනා උපහතොව චන්දිමා.

(සුත්තපිටක, ඛුද්දකනිකාය, ජාතකපාලි, කුණාලජාතකය)

තෙ	ජ	වා	පි	හි	න	රො	වි	චක්	ඛ	ණො
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
රගණ			නගණ			රගණ			ලහු	ගරු

සක්	ක	තො	බ	හු	ජ	නස්	ස	පූ	ජි	තො
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
රගණ			නගණ			රගණ			ලහු	ගරු

නා	රි	නං	ව	ස	ග	තො	න	භා	ස	ති
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
රගණ			නගණ			රගණ			ලහු	ගරු

රා	හු	නා	උ	ප	ග	තො	ව	චන්	දි	මා
∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
රගණ			නගණ			රගණ			ලහු	ගරු

72. ස්වාගතෙ'ති ර, න, භා ගරුකා ද්වෙ.

ර න භා = රගණ - නගණ - භගණයෝ වෙත් ද; **ගරුකා ද්වෙ** = ගරුහු දෙදෙනෙක් වෙත් ද; **ඉති** = මෙසේ සිටි වුත්තය; **ස්වාගතා** = "ස්වාගතා" නම් වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම රගණ, නගණ, භගණයක් සමග ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **ස්වාගතා** වුත්තය නම් වේ.

[32] රා+උද්ධ+අධා වේ. උඩින් සහ යටින් දෙපසින්ම රගනය තිබෙන බැවින් මේ නම් වේ. (නගනයට දෙපසින්ම රගනය තිබීම මෙයින් අදහස් වේ.)

සුන්දරා ආගතා යස්සාති ස්වාගතා.
යම් ගාථාවකට සුන්දර වූ පැමිණීමක් ඇති බැවින් ස්වාගතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
ස්වා	ග	තේ	ති	ර	න	භා	ග	රු	කාද්	වේ
∪	–	∪	–	–	–	∪	–	–	∪	∪
රගණ			නගණ			භගණ			ගරු	ගරු

73. **න,න,ර,ලහු,ගරුහි භද්දිකා.**

න න ර ලහු ගරුහි = නගණ - නගණ - රගණ - ලහු හා ගරු යන මොවුන් කරණ කොට ගෙන; **භද්දිකා** = "භද්දිකා" වුත්තය නම් වේ.

ඉදින් මෙම තිට්ඨුභා ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක් සහ රගණයක් ද ගරු දෙකක් ද යෙදේ නම් එම ගාථාව **භද්දිකා** වුත්තය නම් වේ.

භද්දං (සුන්දරං ලක්ඛණං) අස්සා අත්ථීති භද්දිකා.
මෙම ගාථාවට සුන්දර වූ ලක්ෂණයක් ඇති බැවින් භද්දිකා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11
න	න	ර	ල	හු	ග	රු	හි	භද්	දි	කා
–	–	–	–	–	–	∪	–	∪	–	∪
නගණ			නගණ			රගණ			ලහු	ගරු

ජගතී ඡන්දස (අක්ෂර 12)

ජනා ගච්ඡති එත්තාති ජගතී. ජගතී වියාති ජගතී.
මෙම පොළවෙහි ජනයා යන බැවින් ජගතී නම් වේ. ජගතී නම් වන පොළොව හා සම වන බැවින් ජගතී නම් වේ.

74. **වදන්ති වංසට්ඨමි'දං ජ, තා ජ, රා.**

ජ තා ජ රා = ජගණ - තගණ - ජගණ - රගණයෝ වෙත් ද; **ඉදං** = මේ වුත්තය; **වංසට්ඨ** = "වංසට්ඨ" යැයි; **වදන්ති** = කියත්.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ජගණ, තගණ, ජගණ, රගණ යෙදේ නම් එම ගාථාව **වංසට්ඨ** වුත්තය නම් වේ.

වංසස්ස එසො වංසො. වංසො විය සරො තිට්ඨති එත්ථාති වංසට්ඨං.
මෙම ශබ්දය උණ වලින් කරන ලද තූර්ය භාණ්ඩයේ ශබ්දය යි. එබැවින් වංස නම් වේ. මෙම ගාථාවෙහි උණ ගසින් කරන ලද තූර්ය භාණ්ඩය මෙන් ශබ්දයක් වෙන බැවින් වංසට්ඨ නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
ව	දන්	ති	වං	සට්	ඨ	මි	දං	ජ	තා	ජ	රා
–	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
ජගණ			තගණ			ජගණ			රගණ		

මෙම වංසට්ඨ ගාථාවට උදහරණයක් නම්:-

විසුද්ධසද්ධම්මසහස්සදීධිතිං, සුබුද්ධසම්බොධියුගන්ධරොදිතං;
තිබුද්ධඛෙත්තෙකදිවාකරං ජිනං, සධම්මසඞ්ඝං සිරසා'භිවන්දිය[33].

(පදරූපසිද්ධි)

[33] මෙහි අවසාන "ය" අක්ෂරය පාදන්ත ගරු ලෙස සැලකේ.

වි	සුද්	ධ	සද්	ධම්	ම	ස	හස්	ස	දී	ධි	තිං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
ජගණ			තගණ			ජගණ			රගණ		

සු	බුද්	ධ	සම්	බො	ධි	යු	ගන්	ධ	රො	දි	තං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
ජගණ			තගණ			ජගණ			රගණ		

ති	බුද්	ධ	ඛෙත්	තෙ	ක	දි	වා	ක	රං	ජී	නං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
ජගණ			තගණ			ජගණ			රගණ		

ස	ධම්	ම	සඞ්	සං	සි	ර	සා	භි	වන්	දි	ය
–	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
ජගණ			තගණ			ජගණ			රගණ		

75. **සා ඉන්දවංසා බලු යත්ථ තා ජ,රා.**

යත්ථ = යම් වුත්තයෙක්හි; **තා** = තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජ රා** = (නැවත) ජගණ රගණයෝ වෙත් ද; **සා බලු** = ඕ වනාහි; **ඉන්දවංසා** = "ඉන්දවංස" නම් වේ.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණ දෙකක් සමග ජගණයක් හා රගණයක් යෙදේ නම් එම ගාථාව **ඉන්දවංස** වුත්තය නම් වේ.

ඉන්දස්ස වංසො ඉන්දවංසො.

ඉන්දවජිර ගාථාව සමග බොහෝ සෙයින් සමාන වන බැවින් ඉන්දගාථාවගේ වංසය ඉන්දවංස නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
සා	ඉන්	ද	වං	සා	බ	ලු	යත්	ථ	තා	ජ	රා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

මෙම ඉන්දවංස ගාථාවට උදාහරණයක් මෙසේ ය.

මග්ගඞ්ගනාවං මුනිදක්ඛනාවිකො - ඊහාවීයං ඤාණකරෙන ගාහකො;
ආරුය්හ යො තාය බහූ භවණ්ණවා - තාරෙසි තං බුද්ධමසප්පහං නමෙ.

(නමක්කාරටීකා)

මග්	ගං	ග	නා	වං	මු	නි	දක්	ඛ	නා	වි	කො
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

ඊ	හා	වී	යං	ඤා	ණ	ක	රෙ	න	ගා	හ	කො
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

ආ	රුය්	හ	යො	තා	ය	බ	හූ	භ	වණ්	ණ	වා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

සා	ඉන්	ද	වං	සා	ඛ	ලු	යත්	ථ	තා	ජ	රා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

තා	රෙ	සි	තං	බුද්	ධ	ම	ඝප්	ප	හං	න	මෙ
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	–	∪
තගණ			තගණ			ජගණ			රගණ		

76. ඉධ තොටක මම්බුධි,සෙහි මිතං.

ඉධ = මෙහි; **අම්බුධි**[34] **සෙහි** = සගණ හතරකින්; **මිතං** = ප්‍රමාණ කරන ලද වුත්තය; **තොටක** = "තෝටක" නම් වේ.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම සගණ හතරක් යෙදේ නම් එම ගාථාව **තොටක** වුත්තය නම් වේ.

පුරිමලක්ඛණං තුටති හිංසතීති තොටකං.
පූර්ව ගාථාවේ ලක්ෂණයට හිංසා කරන බැවින් තොටක නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
ඉ	ධ	තො	ට	ක	මම්	බු	ධි	සෙ	හි	මි	තං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

මෙම තෝටක ගාථාවට උදාහරණයක් මෙසේ ය.

තිදිවෙ මහියං භුජගාවසථෙ, සකලත්ථසමව්හයදීපනි'යං;
ඉහ යො කුසලො මතිමා ස නරො, පටු හොති මහාමුනිනො වචනෙ.

(අභිධානප්පදීපිකා/ පාළිනිසණ්ඩු-නිගමන)

ති	දි	වෙ	ම	හි	යං	භු	ජ	ගා	ව	ස	ථෙ
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

ස	ක	ලත්	ථ	ස	මව්	හ	ය	දී	ප	නි	යං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

[34] මෙහි අම්බුධි යනු සාගරයට නමකි. එයින් කියවෙන්නේ අංක 4 යි. "සේ" අක්ෂරයෙන් සගණය අදහස් වේ. "අම්බුදිසේ" යන්නෙන් සගන හතරක් අදහස් වේ.

ඉ	හ	යො	කු	ස	ලො	ම	ති	මා	ස	න	රො
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

ප	ටු	හො	ති	ම	හා	මු	නි	නො	ව	ච	නෙ
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

මෙම තොටක ගාථාවට තවත් උදාහරණ නම්:-

සමතිංසතිපාරමිසම්භරණං - වරබොධිදුමෙ චතුසච්චදසං;
වරමිද්ධිගතං නරදෙවහිතං - තිභවූපසමං පණමාමි ජිනං.

(නමක්කාරටීකා)

ස	ම	තිං	ස	ති	පා	ර	මි	සම්	භ	ර	ණං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

ව	ර	බො	ධි	දු	මෙ	ච	තු	සච්	ච	ද	සං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

ව	ර	මිද්	ධි	ග	තං	න	ර	දෙ	ව	හි	තං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

ති	භ	වූ	ප	ස	මං	ප	ණ	මා	මි	ජි	නං
–	–	∪	–	–	∪	–	–	∪	–	–	∪
සගණ			සගණ			සගණ			සගණ		

77. දුතවිලම්බිත මාහ න, භා භ,රා.

න භා භ රා = නගණ - භගණ - භගණ - රගණයෝ වෙත් ද; **දුතවිලම්භිත** = (ඒ වුත්තය) "දුතවිලම්භිත" යැයි; **ආහ** = කියයි.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණයක් සහ භගණ දෙකක් සමග රගණයක් යෙදේ නම් එම ගාථාව **දුතවිලම්බිත** වුත්තය නම් වේ.

දුතෙහි විසෙසෙන ලම්බිතබ්බන්ති දුතවිංම්බිතං.

දුත නම් වූ න ගණය භගණය විසින් ගන්නා ලද්දේ වන බැවින් දුතවිලම්භිත නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
දු	ත	වි	ලම්	බි	ත	මා	භ	න	භා	භ	රා
–	–	–	∪	–	–	∪	–	–	∪	–	∪
නගණ			භගණ			භගණ			රගණ		

78. **වසු යුග විරතී**[35] **නා,ම්‍යා' පුටො'යං.**

නා ම්‍යා = නගණ - නගණ - මගණ හා යගණයෝ වෙත් ද; **වසු යුග විරතී** = අටකින් හා සතරකින් යති වේ ද; **අයං** = මේ වුත්තය; **පුටො** = "පුට" නම් වේ.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක් හා මගණයක් යගණයක් යෙදේ ද, අක්ෂර අටකින් හා සතරකින් යති යෙදේ ද, එම ගාථාව පුට වුත්තය නම් වේ.

පුටො වියාති පුටො.
ගොටුවක් හා සමානව වන බැවින් පුටො නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
ව	සු	යු	ග	වි	ර	තී	නාම්	යා	පු	ටො	යං
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ		

79. **න, ය, සහිතා න්‍යා' කුසුමවිචිත්තා.**

න ය සහිතා = නගණ - යගණ සහිත වූ ද; **න්‍යා** = (නැවතත්) නගණ - යගණයෝ වෙත් ද; **කුසුමවිචිත්තා** = (ඒ වුත්තය) "කුසුමවිචිත්තා" නම් වේ.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ, යගණ, නගණ, යගණ යෙදේ නම් එම ගාථාව **කුසුමවිචිත්තා** වුත්තය නම් වේ.

කුසුමං විය විචිත්තං එස්සාති කුසුමවිචිත්තා.
මෙම ගාථාවට පුෂ්පයක් මෙන් විචිත්‍ර බවක් ඇති බැවින් කුසුමවිචිත්තා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
න	ය	ස	හි	තාන්	යා	කු	සු	ම	වි	චිත්	තා
–	–	–	–	∪	∪	–	–	–	–	∪	∪
නගණ			යගණ			නගණ			යගණ		

80. **භුජඞ්ගප්පයාතං භවෙ වෙද, යෙහි.**

වෙදයෙහි[36] = යගණ සතරකින් යුක්ත වේ ද; **භුජඞ්ගප්පයාතං භවෙ** = (මේ වුත්තය) "භුජංගප්පයාත" නම් වන්නේ ය.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම යගණ හතරකින් යුක්ත වේ නම් එම ගාථාව **භුජඞ්ගප්පයාත** වුත්තය නම් වේ.

භජංගානං පයාතං ගමනං භුජංගප්පයාතං. භුජංගප්පයාතං විය පයාතං යස්සාති භුජංගප්පයාතං.
නාගයන්ගේ යෑම භුජංගප්පයාතං නම් වේ. යම් ගාථාවකට නාගයන්ගේ ගමන බඳු වන බැවින් භුජංගප්පයාත නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
භු	ජඞ්	ගප්	ප	යා	තං	භ	වෙ	වෙ	ද	යෙ	හී
–	∪	∪	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			යගණ			යගණ			යගණ		

[35] වසු යනු රත්නයි. එයින් අංක 8 අදහස් වේ. යුග යනු කලි යුග ආදී කාලයන්ය. එයින් 4 අදහස් වේ. විරති යනු යතියට නමෙකි. එමනිසා මෙහි යතිය 8 න් හා 4 විය යුතුයි යන්න එයින් අදහස් වේ.
[36] කලින් කී 68 වෙනි සාලනී වුත්තයේ සේම වේද යනු 4 ට නමකි. එබැවින් යගන 4 ක් යන්න අදහස් වේ.

81. **න, භ, ජ, රෙහි භවති'ප්පියංවද.**

න භ ජ රෙහි = නගණ - භගණ - ජගණ - රගණයෝ කරණ කොට ගෙන; **පියංවද භවති** = "පියංවද" වුත්තය වේ.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ, භගණ, ජගණ හා රගණ යෙදේ නම් එම ගාථාව **පියංවද** වුත්තය නම් වේ.

පියං වදතීති පියංවද. පියංවද වියාති පියංවද.
ප්‍රිය වූ වචන කියන්නා වූ ස්ත්‍රිය පියංවද නම් වේ. ප්‍රිය වූ වචන කියන ස්ත්‍රියක් බඳු වූ බැවින් පියංවද නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
න	භ	ජ	රෙ	හි	භ	ව	තිප්	පි	යං	ව	ද
–	–	–	∪	–	–	–	∪	–	∪	–	∪
නගණ			භගණ			ජගණ			රගණ		

82. **වුත්තා සුධීහි ලලිතා ත, භා ජ, රා.**

ත භා ජ රා = තගණ - භගණ - ජගණ - රගණයෝ වෙත් ද; **සුධීහි** = පණ්ඩිතයන් විසින්; **ලලිතා වුත්තා** = (ඒ වුත්තය) "ලලිතා" යයි කියන ලදී.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණ, භගණ, ජගණ හා රගණ යෙදේ නම් එම ගාථාව **ලලිතා** වුත්තයෙන් සෑදුන ගාථාවක් වේ.

ලලතීති ලලිතා.
ලාලිත්‍යයෙන් යුතු වූ බැවින් ලලිතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
වුත්	තා	සු	ධී	හි	ල	ලි	තා	ත	භා	ජ	රා
∪	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
තගණ			භගණ			ජගණ			රගණ		

83. **පමිතක්ඛරා ස, ජ, ස,සෙහු'දිතා.**

ස ජ ස සෙහි = සගණ - ජගණ - සගණ - සගණයෝ කරණ කොට ගෙන; **පමිතක්ඛරා** = (මේ වුත්තය) "පමිතක්ඛරා" යැයි; **උදිතා** = කියන ලදී.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම සගණ, ජගණ හා තවත් සගණ දෙකක් යෙදේ නම් එම ගාථාව **පමිතක්ඛරා** වුත්තය නම් වේ.

පකාරෙන මිතානි අක්ඛරානි යස්සාති පමිතක්ඛරා.
යම් ගාථාවකට ගණනය කරන ලද අක්ෂරයෝ ඇති බැවින් පමිතක්ඛරා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
ප	මි	තක්	ඛ	රා	ස	ජ	ස	සෙ	හු	දි	තා
–	–	∪	–	∪	–	–	–	∪	–	–	∪
සගණ			ජගණ			සගණ			සගණ		

84. **න,න,භ,ර,සහිතා'භිහිතු'ජ්ජලා.**

න න භ ර සහිතා = නගණ - නගණ - භගණ - රගණ සහිත වූ; (මේ වුත්තය) **උජ්ජලා අභිහිතා** = "උජ්ජලා" යයි කියන ලදී.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක් හා භගණයක් රගණයක් යෙදේ නම් එම ගාථාව **උජ්ජලා** වුත්තය නම් වේ.

උජ්ජලතීති උජ්ජලා.
දිදුලන බැවින් උජ්ජලා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
න	න	භ	ර	ස	හි	තා	හි	හි	තුජ්	ජ	ලා
–	–	–	–	–	–	∪	–	–	∪	–	∪
නගණ			නගණ			භගණ			රගණ		

85. **පඤ්ච'ස්ස'ච්ඡින්නා**[37], **වෙස්සදෙවී ම,මා යා.**

ම මා යා = මගණයෝ දෙදෙනෙක් සහ යගණයෝ දෙදෙනෙක් වෙත් ද; **පඤ්ච** = පසකින් හා; **අස්ස** = සතකින්; **ඡින්නා** = යති හෙයින් සිඳන ලද්දී ද; **වෙස්සදෙවී** = ඕ තොමෝ "වෙස්සදේවී" නම් වන්නී ය.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ දෙකක් හා යගණ දෙකක් යෙදේ ද, අක්ෂර පහකින් හා සතකින් යති යෙදේ ද, එම ගාථාව **වෙස්සදේවී** වුත්තය නම් වේ.

විස්සානං සකලානං දෙවානං දෙයෝ බලිවෙස්සදෙවි. වෙස්සදෙවී වියාති වෙස්සදෙවී.
සකල දෙවියන්ට දිය යුතු වූ පූජාව වෙස්සදෙවි නම් වේ. සියලු දෙවියන්ට දෙන පූජාව බඳු වූ බැවින් වෙස්සදෙවී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
පඤ්ද්	චස්	සච්	ඡින්	නා	වෙස්	ස	දෙ	වී	ම	මා	යා
∪	∪	∪	∪	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			මගණ			යගණ			යගණ		

86. **භවති හි තාමරසං න, ජ, ජා යො.**

න ජ ජා = නගණ - නගණ - ජගණයෝ වෙත් ද; **යො** = (අන්තයෙහි) යගණයක් වේ ද; **තාමරසං** = (ඒ වුත්තය) "තාමරස"; **භවති හි** = වන්නේ ම ය.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණයක් ජගණ දෙකක් සමග යගණයක් යෙදේ නම් එම ගාථාව **තාමරස** වුත්තය නම් වේ.

තාමරෙ ජලෙ සෙති තිට්ඨතීති තාමරසං. තාමරසං වියාති තාමරසං.
ජලයෙහි සිටින බැවින් තාමරසං නම් වේ. තාමරස නම් වූ පත්මය බඳු වූ බැවින් තාමරස නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
භ	ව	ති	හි	තා	ම	ර	සං	න	ජ	ජා	යො
–	–	–	–	∪	–	–	∪	–	–	∪	∪
නගණ			ජගණ			ජගණ			යගණ		

87. **'කමලා'ති ඤෙය්‍යා ස,ය,සෙහි යො වෙ.**

වෙ = ඉදින්; **ස ය සෙහි** = සගණ - යගණ - සගණයන්ගෙන් පරව; **යො** = යගණය වී නම්; **කමලා + ඉති** = "කමලා" යැයි; **ඤෙය්‍යා** = දත යුත්තී ය.

[37] පඤ්ච යනු 5 යි. අස්ස යනු 7 ට නමකි. ඡින්නා යනු යතියට නමකි. එහෙයින් මෙහි යතිය 5 න් හා 7 න් යෙදෙන බව දත යුතුයි.

ඉදින් මෙම ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම සගණ යගණ සගණ යගණ යෙදේ නම් එම ගාථාව **කමලා** වුත්තය නම් වේ.

කමං ලාති පවත්තෙතීති කමලා.

අනුක්‍රමය පවත්වන බැවින් කමලා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12
ක	ම	ලා	ති	ඤ්ඤෙය්	යා	ස	ය	සෙ	හි	යො	චෙ
–	–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
සගණ			යගණ			සගණ			යගණ		

අතිජගතී ඡන්දස (අක්ෂර 13)

අතිමහන්තී ජගතී අතිජගතී.

අති මහත් වූ ජගතිය අති ජගති නම් වේ.

88. **මිනා ජ්‍රා ගො, තිදසයති'ප්පහස්සිණී සා.**

මිනා = මගණ - නගණයෝ වෙත් ද; **ජ්‍රා** (ජ් + රා) = ජගණ - රගණයෝ වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වෙයි ද; **තිදසයති** = තුනකින් හා දසයකින් යති ඇති; **සා** = ඕ තොමෝ; **පහස්සිණී** = "පහස්සිණී" නම් වේ.

ඉදින් මෙම අති ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, නගණ, ජගණ, රගණ සමග ගරුවක් යෙදේ ද, අක්ෂර තුනකින් හා දහයකින් යති යෙදේ ද, එම ගාථාව **පහස්සිණී** වුත්තය නම් වේ.

පකාරෙන හාසෙතීති පහස්සිණී.

ප්‍රකාරයෙන් සතුටු කරවන බැවින් පහස්සිණී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13
මිනා	ජ්‍රා	ගො	ති	ද	ස	ය	තිප්	ප	හස්	සි	ණී	සා
∪	∪	∪	–	–	–	–	∪	–	∪	–	∪	∪
මගණ			නගණ			ජගණ			රගණ			ගරු

මෙම පහස්සිණී ගාථාවට උදාහරණයක් මෙසේ ය.

යො බුද්ධො සුමති දිවෙ දිවාකරොව - සොභන්තො රතිජනනෙ සිලාසනම්හි;
ආසීනො සිවසුඛදං අදෙසි ධම්මං - දෙවානං තමසදිසං නමාමි නිච්චං.

(නමක්කාරටීකා)

යො	බුද්	ධො	සු	ම	ති	දි	වෙ	දි	වා	ක	රො	ව
∪	∪	∪	–	–	–	–	∪	–	∪	–	∪	∪
මගණ			නගණ			ජගණ			රගණ			ගරු

සො	භන්	තො	ර	ති	ජ	න	නෙ	සි	ලා	ස	නම්	හි
∪	∪	∪	–	–	–	–	∪	–	∪	–	∪	∪
මගණ			නගණ			ජගණ			රගණ			ගරු

ආ	සී	නො	සි	ව	සු	ඛ	දං	අ	දෙ	සි	ධම්	මං
∪	∪	∪	–	–	–	–	∪	–	∪	–	∪	∪
මගණ			නගණ			ජගණ			රගණ			ගරු

දෙ	වා	නං	ත	ම	ස	දි	සං	න	මා	මි	නිච්	චං
∪	∪	∪	–	–	–	–	∪	–	∪	–	∪	∪
මගණ			නගණ			ජගණ			රගණ			ගරු

89. චතු,ග්ගහෙ,හි'හ[38] රුචිරා, ජ,භා ස්ජ,ගා.

ජ භා = ජගණ - භගණයෝ වෙත් ද; **සජ ගා** = සගණ - ජගණ - ගරුහු වෙත් ද; **චතුග්ගහෙහි** = සතරකින් හා නවයකින් යති වේ ද; (ඒ වුත්තය) **ඉහ** = මෙහි; **රුචිරා** = "රුචිරා" නම් වේ.

ඉදින් මෙම අති ජගතී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම ජගණ, භගණ, සගණ, ජගණ සමග ගරුවක් යෙදේ ද, අක්ෂර සතරකින් හා නවයකින් යති යෙදේ ද, එම ගාථාව **රුචිරා** වුත්තය නම් වේ.

රුචිං සොභං යතිං රාති පවත්තෙතීති රුචිරා.
සොභන වූ යතියක් පවත්වන බැවින් රුචිරා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13
ච	තුග්	ග	හේ	හි	හ	රු	චි	රා	ජ	භාස්	ජ	ගා
–	∪	–	∪	–	–	–	–	∪	–	∪	–	∪
ජගණ			භගණ			සගණ			ජගණ			ගරු

මෙයට උදහරණ ගාථාවක් මෙසේ ය.

අසඞ්ඛතං සිව මමතං සුදුද්දසං - පරායණං සරණ මනීතිකං තථා;
අනාසවං ධුව මනිදස්සනා' කතා - පලොකිතං නිපුණ මනන්ත මක්ඛරං.

(අභිධානප්පදීපිකාපාඨ)

අ	සං	ඛ	තං	සි	ව	ම	ම	තං	සු	දුද්	ද	සං
–	∪	–	∪	–	–	–	–	∪	–	∪	–	∪
ජගණ			භගණ			සගණ			ජගණ			ගරු

ප	රා	ය	ණං	ස	ර	ණ	ම	නී	ති	කං	ත	ථා
–	∪	–	∪	–	–	–	–	∪	–	∪	–	∪
ජගණ			භගණ			සගණ			ජගණ			ගරු

අ	නා	ස	වං	ධු	ව	ම	නි	දස්	ස	නා	ක	තා
–	∪	–	∪	–	–	–	–	∪	–	∪	–	∪
ජගණ			භගණ			සගණ			ජගණ			ගරු

ප	ලො	කි	තං	නි	පු	ණ	ම	නන්	ත	මක්	ඛ	රං
–	∪	–	∪	–	–	–	–	∪	–	∪	–	∪
ජගණ			භගණ			සගණ			ජගණ			ගරු

[38] චතු යනු 4 වේ. ගහේ යනු ග්‍රහයන්ට නමකි. ග්‍රහයන් නව දෙනෙක් නිසා එයින් 9 අදහස් වේ. එබැවින් මෙහි යති යෙදෙන්නේ 4 න් හා 9 නි.

සක්කරී ඡන්දස (අක්ෂර 14)

සංසයං ඡින්දිතුං සකති සමත්ථෙති. සක්කතෙ පූජීයතෙ වාති සක්කරී.
සැකය සිඳීමට සමත් වන බැවින් සක්කරී නම් වේ.

90. න,න,ර,ස,ලහු,ගා,සරෙහි[39],පරාජිතා.

න න ර ස ලහු ගා = නගණ - නගණ - රගණ - සගණ - ලහු - ගරු යන මොහු වෙත් ද; **සරෙහි** = සතකින් හා සතකින් යති වේ ද; **අපරාජිතා** = (ඒ වුත්තය) "අපරාජිතා" නම් වේ.

ඉදින් මෙම සක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක් ද රගණයක් සහ සගණයක් සමග ලහුවක් හා ගරුවක් යෙදේ ද, අක්ෂර සතකින් හා සතකින් යති යෙදේ ද, එම ගාථාව **අපරාජිතා** වුත්තය නම් වේ.

පරෙහි න පරාජිතාති අපරාජිතා.
අන්‍යයන් විසින් පරාජිත නොවන බැවින් අපරාජිතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
න	න	ර	ස	ල	හු	ගා	ස	රේ	හි	ප	රා	ජි	තා
–	–	–	–	–	–	∪	–	∪	–	–	∪	–	∪
නගණ			නගණ			රගණ			සගණ			ලහු	ගරු

91. න,න,භ,න,ල,ගි'ති,ප්පහරණකලිකා.

න න භ න ල ගි = නගණ - නගණ - භගණ - නගණ - ලහු - ගරු යන මොහු වෙත් නම්; **ඉති** = මෙසේ සිටි වුත්තය; **පහරණකලිකා** = "පහරණකලිකා" නම් වේ.

ඉදින් මෙම සක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක්, භගණයක් හා තවත් නගණයක් සමග ලහුවක් හා ගරුවක් යෙදේ නම් එම ගාථාව **පහරණකලිකා(තා)** වුත්තය නම් වේ. මෙහි යතිය යෙදෙන්නේ 7 න් හා 7 නි.

පකාරෙන යතිහරණං කරොන්ති විය පවත්තතීති පහරණකලිකා.
ප්‍රකාරයෙන් යතිය ගෙන යෑම කරන්නාක් මෙන් පවතින බැවින් පහරණකලිකා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
න	න	භ	න	ල	ගි	තිප්	ප	හ	ර	ණ	ක	ලි	කා
–	–	–	–	–	–	∪	–	–	–	–	–	–	∪
නගණ			නගණ			භගණ			නගණ			ලහු	ගරු

මෙම පහරණකලිකා(තා) ගාථාවට උදාහරණයක් මෙසේ ය.

විගතගතමලං මලගතවිගතං - මහිත හිතමනං මනහිතමහිතං;
විභවභවකරං කරභවවිභවං - සුජන ජනගුණං ගුණජනසුජනං.

(මහා පණාම පාඨ)

වි	ග	ත	ග	ත	ම	ලං	ම	ල	ග	ත	වි	ග	තං
–	–	–	–	–	–	∪	–	–	–	–	–	–	∪
නගණ			නගණ			භගණ			නගණ			ලහු	ගරු

[39] සර යනු පොකුණට නමකි. අනවතප්තාදී පොකුණු 7 ක් ඇති බැවින් එයින් 7 අදහස් වේ. එම නිසා යතිය 7 න් තැබිය යුතුය.

ම	හි	ත	හි	ත	ම	නං	ම	න	හි	ත	ම	හි	තං
–	–	–	–	–	–	∪	–	–	–	–	–	–	∪
නගණ			නගණ			භගණ			නගණ			ලහු	ගරු

වි	භ	ව	භ	ව	ක	රං	ක	ර	භ	ව	වි	භ	වං
–	–	–	–	–	–	∪	–	–	–	–	–	–	∪
නගණ			නගණ			භගණ			නගණ			ලහු	ගරු

සු	ජ	න	ජ	න	ගු	ණං	ගු	ණ	ජ	න	සු	ජ	නං
–	–	–	–	–	–	∪	–	–	–	–	–	–	∪
නගණ			නගණ			භගණ			නගණ			ලහු	ගරු

92. වුත්තා වසන්තතිලකා ත,භ,ජා ජ,ගා ගො.

ත භ ජා = තගණ - භගණ - ජගණයෝ වෙත් ද; **ජ ගා ගො** = (නැවත) ජගණ - ගරු දෙකක් වෙත් ද; **වසන්තතිලකා** = (ඒ වුත්තය) "වසන්තතිලකා" යයි; **වුත්තා** = කියන ලදි.

ඉදින් මෙම සක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම තගණ, භගණ, ජගණ දෙකක් හා ගරු දෙකක් යෙදේ නම් එම ගාථාව **වසන්තතිලකා** වුත්තය නම් වේ.

වසන්තෙ තිලකො විය (මෙසො විය) තිලකො යස්සාති වසන්තතිලකා.

යම් ගාථාවකට වසන්ත ඍතුවෙහි වළාකුළක් බඳු වන බැවින් වසන්තතිලකා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
වුත්	තා	ව	සන්	ත	ති	ල	කා	ත	භ	ජා	ජ	ගා	ගෝ
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

මෙම වසන්තතිලකා ගාථාවට උදහරණයක් මෙසේ ය. (මෙයට උදහරණ ගාථා සුලභ වේ.)

යො සබ්බලොකමහිතො කරුණාධිවාසො, මොක්ඛාකරො රවිකුලම්බර පුණ්ණ චන්දො,
ඤෙය්‍යොදධිං සුවිපුලං සකලං විබුද්ධො, ලොකුත්තමං නමථ තං සිරසා මුනින්දං;

(තෙලකටාහගාථා)

යො	සබ්	බ	ලො	ක	ම	හි	තො	ක	රු	ණා	ධි	වා	සො
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

මොක්	ඛා	ක	රො	ර	වි	කු	ලම්	බ	ර	පුණ්	ණ	චන්	දො
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

ඤෙය්	යො	ද	ධිං	සු	වි	පු	ලං	ස	ක	ලං	වි	බුද්	ධො
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

ලො	කුත්	ත	මං	න	ම	ථ	තං	සි	ර	සා	මු	නින්	දං
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

මෙම වසන්තතිලකා වුත්තයට තවත් උදාහරණයක් නම්:-

යො පාදපඞ්කජමුදුත්තලරාජිකෙහි, ලොකෙහි තීහිවිකලෙහි නිරාකුලෙහි;
සම්පාපුණෙ නිරුපමෙය්‍යතමෙව නාථො, තං සබ්බලොකමහිතං අසමං නමාමි.

(නමක්කාරටීකා)

යො	පා	ද	පඞ්	ක	ජ	මු	දුත්	ත	ල	රා	ජි	කෙ	හි
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

ලො	කෙ	හි	තී	හි	වි	ක	ලෙ	හි	නි	රා	කු	ලෙ	හි
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

සම්	පා	පු	ණෙ	නි	රු	ප	මෙය්	ය	ත	මෙ	ව	නා	ථො
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

තං	සබ්	බ	ලො	ක	ම	හි	තං	අ	ස	මං	න	මා	මි
∪	∪	–	∪	–	–	–	∪	–	–	∪	–	∪	∪
තගණ			භගණ			ජගණ			ජගණ			ගරු	ගරු

අතිසක්කරී ඡන්දස (අක්ෂර 15)

අතිමහන්තී සක්කරී අතිසක්කරී.

අති මහත් වූ සක්කරීය අතිසක්කරී නම් වේ.

93. **ද්විහත හය ලහු ර'ථ ගි'ති[40] සසිකලා.**

ද්විහත = දෙකින් ගුණ කරන ලද; **හය ලහු** = ලහු අක්ෂර හතක්[41] (ලහු 14 ක්) ඇත්තී වේ ද; **අථ** = නැවත; **ගො**[40] = (කෙළවර) ගරුවෙක් වේ ද; **ඉති** = මෙසේ සිටි වුත්තය; **සසිකලා** = "සසිකලා" නම් වේ.

ඉදින් මෙම අතිසක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ හතරක් සමග සගණයක් යෙදේ නම් එම ගාථාව **සසිකලා** වුත්තය නම් වේ.

සසො යස්ස අත්ථීති සසි. සසිනො කලා සසිකලා. සසිකලා විය කලා මත්තා යස්සාති සසිකලා

යම් චන්ද්‍රයෙකුට සාවෙකුගේ සන්ථාණය ඇති බැවින් සසි නම් වේ. සසි නම් වන චන්ද්‍රයාගේ කලාව සසිකලා නම් වේ. සදෙහි කලාව බඳු මාත්‍රා යම් ගාථාවකට ඇති බැවින් සසිකලා නම් වේ.

---

[40] "රථ ගි ති" යන්න "අථ ගො ඉති" යනුවෙන් බෙදිය යුතුය. එසේ වීමෙන් එන "ගො" අක්ෂරයෙන් අවසාන ගරුව ගෙන ඇති බව දත යුතුයි.

[41] හය යනු අස්වයන්ට නමකි. එයින් අස්වයන් 7 වර්ගයක් සිටින බැවින් හය යන්නෙන් අංක 7 අදහස් වේ. ද්වි යන්නෙන් එම 7 දෙකෙන් ගුණ කිරීමෙන් ලහු 14 ක් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15
ද්වි	හ	ත	හ	ය	ල	හු	ර	ථ	ගි	ති	ස	සි	ක	ලා
–	–	–	–	–	–	–	–	–	–	–	–	–	–	∪
නගණ			නගණ			නගණ			නගණ			සගණ		

ද්වි-යන තැන මාත්‍රා දෙකක් තිබුණ ද, ඡන්දස්ශාස්ත්‍රයේ දී එවැන්න එක ලහුවක් හැටියට සලකනු ලැබේ.

94. වසු,හය[42],යති රි'හ,මණිගුණනිකරො.

ඉහ = මේ සසිකලාවෙහි; **වසු හය යති** = අටකින් හා සතකින් යති ඇත්නම්; **මණිගුණනිකරො** = "මණිගුණනිකර" නම් වේ.

ඉදින් මෙම අතිසක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ හතරක් සහ සගණයක් යෙදේ ද, අක්ෂර අටකින් හා සතකින් යති යෙදේ ද, එම ගාථාව **මණිගුණනිකර** වුත්තය නම් වේ.

මණිනං ගුණො මණිගුණො. මණිගුණානං නිකරො මණිගුණනිකරො.

මාණික්‍යයන්ගේ ගුණය මණිගුණෝ නම් වේ. මාණික්‍ය ගුණයන්ගේ සමූහය මණිගුණනිකර නම් වේ. මාණික්‍ය ගුණයන්ගේ සමූහය බඳු වන බැවින් මණිගුණනිකර නම් වේ.

මෙය කලින් කී සසිකලා වුත්තයට සමාන වේ. නමුත් සසිකලා වුත්තයෙහි යති නැති අතර මෙහි යති පිහිටයි.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15
ව	සු	හ	ය	ය	ති	රි	හ	ම	ණි	ගු	ණ	නි	ක	රෝ
–	–	–	–	–	–	–	–	–	–	–	–	–	–	∪
නගණ			නගණ			නගණ			නගණ			සගණ		

95. න,න,ම,ය,ය,යුතා'යං,මාලිනී භොගි'සීහි.

න න ම ය ය යුතා = නගණ - නගණ - මගණ - යගණ - යගණ යන මොවුන්ගෙන් යුක්ත වූ; **භොගි සීහි** = අටකින් හා සතකින් යති ඇති; **අයං** = මෝ තෙමෝ; **මාලිනී** = "මාලිනී" නම් වේ.

ඉදින් මෙම අතිසක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ දෙකක් මගණයක් සමග යගණ දෙකක් යෙදේ ද, අක්ෂර අටකින් හා සතකින් යති යෙදේ ද, එම ගාථාව **මාලනී** වුත්තය නම් වේ.

මාලා අස්සා අත්ථීති මාලිනී. මාලිනී වියාති මාලිනී. මාලා එතිස්සා අත්ථීති මාලිනි.

යම් කන්‍යාවකට මල් දම් ඇති බැවින් මාලිනී නම් වේ. මාලිනී ම මාලිනී නම් වේ. මාලිනී නම් කන්‍යාව බඳු වන බැවින් මාලිනී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15
න	න	ම	ය	ය	යු	තා	යං	මා	ලි	නී	භෝ	ගි	සී	හී
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ			යගණ		

මෙම මාලිනී ගාථාවට උදාහරණයක් මෙසේ ය.

අඛිලගුණනිධානො යො මුනින්දෙපගන්ත්වා, වනමිසිපතනව්හං සඤ්ඤතානං නිකෙතං;
තහිමකුසලඡෙදං ධම්මචක්කං පවත්තො, තමතුලමභිකන්තං වන්දනෙය්‍යං නමාමි.

(නමක්කාරටීකා)

[42] වසු යනු රත්නයට නමකි. සප්ත රත්නය හා සජීවී රත්නය සමග රත්න 8 කි. වසු යන්නෙන් 8 අදහස් වේ. හය යනු 7 යි. එය කලින් විස්තර කරන ලදී. මෙහි යතිය 8 න් හා 7 න් විය යුතුය.

අ	ඛි	ල	ගු	ණ	නි	ධා	නො	යො	මු	නින්	දෙ	ප	ගන්ත්	වා
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ			යගණ		

ව	න	මි	සි	ප	ත	නව්	හං	සඤ්ඤ	ඤෙ	තා	නං	නි	කෙ	තං
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ			යගණ		

ත	හි	ම	කු	ස	ල	ජෙ	දං	ධම්	ම	චක්	ඛං	ප	වත්	තො
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ			යගණ		

ත	ම	තු	ල	ම	භි	කන්	තං	ධම්	ම	රා	ජං	න	මා	මි
–	–	–	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪	∪
නගණ			නගණ			මගණ			යගණ			යගණ		

96. භවති න,ජා,භ,ජා රසහිතා පභද්දකං.

න ජා = නගණ - ජගණයෝ ද; **භ ජා** = භගණ - ජගණයෝ ද; **රසහිතා** = (අන්තයෙහි) රගණ සහිත වූයේ වෙත් ද; **පභද්දකං භවති** = (ඒ වුත්තය) "පභද්දක" නම් වන්නේ ය.

ඉදින් මෙම අතිසක්කරී ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ, ජගණ, භගණ, ජගණ සමග රගණයක් යෙදේ නම් එම ගාථාව **පභද්දක** වුත්තය නම් වේ.

(යෙභුයෙන ගරුමිස්සගණෙහි යොගතො) පකාරෙන භද්දකො සුන්දරො ගණො යස්සාති පභද්දකං.

බොහෝ සෙයින් ගරු මිශ්‍ර ගණයන් හා යෙදෙන බැවින් ප්‍රකාරයෙන් සුන්දර වූ ගණයක් යම් ගාථාවකට ඇත් ද එය පභද්දකං නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15
භ	ව	ති	න	ජා	භ	ජා	ර	ස	හි	තා	ප	භද්	ද	කං
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ		

අට්ඨි ඡන්දස (අක්ෂර 16)

සකභාවෙන ආභුසො තිට්ඨතීති අට්ඨි.

තමාට අයත් දෙයක් වශයෙන් බොහෝ සෙයින් සිටින බැවින් අට්ඨි නම් වේ.

97. න,ජ,භ,ජ,රා සදෘ භවති වාණිනී ග, යුත්තා.

න ජ භ ජ රා = නගණ - ජගණ - භගණ - ජගණ - රගණයෝ වෙත් ද; **ග යුත්තා** = (අන්තයෙහි) ගරුවකින් යුක්ත වේ ද; **සදෘ** = සෑම කල්හි; **වාණිනී භවති** = "වාණිනී" නම් වන්නේ ය.

ඉදින් මෙම අට්ඨි ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ, ජගණ, භගණ, ජගණ, රගණය සමග ගරුවක් යෙදේ නම් එම ගාථාව **වාණිනී** වුත්තය නම් වේ.

වායතෙ සද්දයතෙති වාණී. සුන්දරා වාණී ගිරා අස්සා අත්ථීති වාණිනී.

ශබ්දකරනු ලැබෙන බැවින් වාණී නම් වේ. සුන්දර වූ කියනු ලැබෙන්නා වූ වචන මෙම ගාථාවට ඇති බැවින් වාණිනී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16
න	ජ	භ	ජ	රා	ස	ද	භ	ව	ති	වා	ණි	නී	ග	යුත්	තා
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ			ගරු

මෙම වාණිනී ගාථාවට උදහරණයක් මෙසේ ය.

සුවිපරිවාරිතං සුරුවිරප්පභාහි රත්තං, සිරිවිසරාලයං ගුපිතමින්ද්‍රියෙහුපෙතං;
රවිසසිමණ්ඩලප්පභුතිලක්ඛණොපචිත්තං, සුරනරපූජිතං සුගතමාදරං නමාමි.

(නමක්කාරටීකා)

සු	වි	ප	රි	වා	රි	තං	සු	රු	වි	රප්	ප	භා	හි	රත්	තං
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ			ගරු

සි	රි	වි	ස	රා	ල	යං	ගු	පි	ත	මින්ද්	රි	යෙ	හු	පෙ	තං
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ			ගරු

ර	වි	ස	සි	මණ්	ඩ	ලප්	ප	භු	ති	ලක්	ඛ	ණො	ප	චිත්	තං
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ			ගරු

සු	ර	න	ර	පූ	ජි	තං	සු	ග	ත	මා	ද	රං	න	මා	මි
–	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			භගණ			ජගණ			රගණ			ගරු

අච්චට්ඨි ඡන්දස (අක්ෂර 17)

අතිමහන්තී අට්ඨි අච්චට්ඨි.
අති මහත් වූ අට්ඨි ඡන්දස අච්චට්ඨි නම් වෙයි.

98. ය, මා නො සො භල්ගා, රස, හරවිරාමා සිඛරණී.

ය මා = යගණ - මගණයෝ වෙත් ද; **නො සො** = නගණය - සගණය වෙත් ද; **භල්ගා** = භගණ - ලහු - ගරු යන මොහු වෙත් ද; **රස හරවිරාමා** = හයකින් හා එකොළසකින් යති ඇත්තී ද; **සිඛරණී** = ඕ තොමෝ "සිඛරණී" නම් වන්නී ය.

ඉදින් මෙම අච්චට්ඨි ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම යගණ, මගණ, නගණ, සගණ, භගණ හා ලහු එකක් හා ගරු එකක් යෙදේ ද, අක්ෂර හයකින් හා එකොළසකින් යති යෙදේ ද, එම ගාථාව **සිඛරණී** වුත්තය නම් වේ.

සිඛරං කූටං එතිස්සා අත්ථීති සිඛරණී.
මෙම ගාථාවට ගණ නම් වන්නා වූ මුදුනක් ඇති බැවින් සිඛරණී නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
ය	මා	නො	සෝ	හල්	ගා	ර	ස	හ	ර	වි	රා	මා	සි	ඛ	ර	ණී
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	–	–	∪
යගණ			මගණ			නගණ			සගණ			භගණ			ලහු	ගරු

99. රස, යුගි[43], සිතො, නො සො ම්‍රා ස්ලා, ගාද හරිණී තද.

යද = යම් කලෙක්හි; **නො සො ම්‍රා (ම් + රා)** = නගණ - සගණ - මගණ - රගණයෝ ද; **ස්ලා** = සගණ - ලහුවෙක් ද; **ග්** = (අන්තයෙහි) ගරුවෙක් ද වී නම්; **රස යුග + ඉසිතො** = සයකින්, සතරකින් හා සතකින් යති වේ ද; **තද** = එකල්හි; **හරිණී** = "හරිණී" (වුත්තය) වේ.

ඉදින් මෙම අච්චට්ඨි ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම නගණ, සගණ, මගණ, රගණ, සගණ හා ලහු ගරු එක බැගින් යෙදේ ද, අක්ෂර හයකින්, සතරකින් හා සතකින් යති යෙදේ ද, එම ගාථාව **හරිණී** වුත්තය නම් වේ.

සුණන්තානං මනං හරතීති හරණී.

අසන්නවුන්ගේ සිත ගෙනයන බැවින් හරණී නම්වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
ර	ස	යු	ගි	සි	තෝ	නො	සොම්	රාස්	ලාග්	ය	ද	හ	රි	ණී	ත	ද
–	–	–	–	–	∪	∪	∪	∪	∪	–	∪	–	–	∪	–	∪
නගණ			සගණ			මගණ			රගණ			සගණ			ලහු	ගරු

100. මන්දක්කන්තා, ම,භ,න,ත,ත,ගා, ගො යුගු,ත්ව,ස්සකෙහි[44].

ම භ න ත ත ගා = මගණ - භගණ - නගණ - තගණ - තගණ - ගරුහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වේ ද; **යුග + උතු + අස්සකෙහි** = සතරකින්, සයකින් හා සතකින් යති වේ ද; **මන්දක්කන්තා** = (ඒ වුත්තය) "මන්දක්කන්තා" නම් වේ.

ඉදින් මෙම අච්චට්ඨි ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, භගණ, නගණ, තගණ, තගණ හා ගරු දෙකක් යෙදේ ද, අක්ෂර සතරකින්, හයකින් සහ හතකින් යති යෙදේ ද, එම ගාථාව **මන්දක්කන්තා** වුත්තය නම් වේ.

මන්ද අගම්භීරසරවතී ච සා කන්තාවාති මන්දක්කන්තා. මන්දක්කන්තා වියාති මන්දක්කන්තා.

මන්ද වූ නොගැඹුරු වූ ශබ්දයක් ඇත්තී ද වෙයි. එම කන්‍යාව කාන්ත ද වෙයි. එබැවින් මද්දක්කන්තා වෙයි. මද්දක්කන්තා වන කාන්තාව බඳු වන බැවින් මද්දක්කන්තා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
මන්	දක්	කන්	තා	ම	භ	න	ත	ත	ගා	ගො	යු	ගුත්	වස්	ස	කේ	හී
∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			නගණ			තගණ			තගණ			ගරු	ගරු

මෙම මන්දක්කන්තා ගාථාවට උදහරණයක් මෙසේ ය.

මග්ගොළුම්පෙන මුහපටිසාසාදිඋල්ලොලවීචිං,
සංසාරොඝං තරි තමභයං පාරපත්තං පජානං;
තාණං ලෙණං අසමසරණං එකතිත්ථං පතිට්ඨං,
පුඤ්ඤක්ඛෙත්තං පරමසුඛදං ධම්මරාජං නමාමි.

(නමක්කාරටීකා)

---

[43] රස 6 කි. යුග 4 කි. ඉසිවරු 7 කි. මෙහි යතිය 6 න් සහ 4 න් හා 7 න් වේ.

[44] මෙය යුග, උතු සහ අස්ස යන අර්ථයි. යුග 4 ක් බැවින් එයින් 4 අදහස් වේ. උතු 6 ක් බැවින් එයින් 6 අදස් වේ. අස්ස යනු 7 යි. එහෙයින් මෙහි යතිය 4 න් 6 න් සහ 7 නි.

මග්	ගො	ළම්	පෙ	න	මු	හ	ප	ටි	ඝා	සා	දි	උල්	ලො	ල	වී	චිං
∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			නගණ			තගණ			තගණ			ගරු	ගරු

සං	සා	රො	ගං	ත	රි	ත	ම	භ	යං	පා	ර	පත්	තං	ප	ජා	නං
∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			නගණ			තගණ			තගණ			ගරු	ගරු

තා	ණං	ලෙ	ණං	අ	ස	ම	ස	ර	ණං	එ	ක	තිත්	ථං	ප	තිට්	ඨං
∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			නගණ			තගණ			තගණ			ගරු	ගරු

පුඤ්ඤ	ඤක්	කෙත්	තං	ප	ර	ම	සු	ඛ	දං	ධම්	ම	රා	ජං	න	මා	මි
∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			භගණ			නගණ			තගණ			තගණ			ගරු	ගරු

ධුති ඡන්දස (අක්ෂර 18)

අවණ්ණං ධුනාති විද්ධංසෙතීති ධුති. ධුති වියාති ධුති.

වරද විනාශ කරන බැවින් ධුති නම් වෙයි. ධුතිය බඳු වන බැවින් ධුති නම් වේ.

101. මො තො නො යො යා, කුසුමිතලතා, වෙල්ලිතා' ක්ඛු,ත්වි,සීහි[45].

මො තො නො යො = මගණ - තගණ - නගණ - යගණයෝ වෙත් ද; **යා** = (නැවත) තවත් යගණයෝ දෙදෙනෙක් ද වෙත් නම්; **අක්ඛ + උතු + ඉසීහි** = පහකින් සයකින් හා සතකින් යති වී නම්; **කුසුමිතලතා වෙල්ලිතා** = (ඕ තොමෝ) "කුසුමිතලතා වෙල්ලිතා" නම් වේ.

ඉදින් මෙම ධුති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, තගණ, නගණ සමග යගණ තුනක් යෙදේ ද, අක්ෂර පහෙන්, සයෙන් සහ සතෙන් යති යෙදේ ද, එම ගාථාව **කුසුමිතලතා වෙල්ලිතා** වුත්තය නම් වේ.

කුසුමිතලතාය වෙල්ලිතා චලිතා කුසුමිතලතාවෙල්ලිතා.

මල් පිපීමට පැමිණියා වූ වැල කුසුමිතලතා නම් වෙයි. මල් පිපීමට පැමිණියා වූ ලතාවගේ සෙලවීම කුසුමිතලතාවෙල්ලිතා නම් වෙයි.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18
මො	තො	නො	යො	යා	කු	සු	මි	ත	ල	තා	වෙල්	ලි	තාක්	ඛුත්	වි	සී	හී
∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			නගණ			යගණ			යගණ			යගණ		

මෙම කුසුමිලතා වෙල්ලිතා ගාථාවට උදහණයක් මෙසේ ය.

කණ්ඩම්බංමූලෙ පරහිතකරො යො මුනින්දෙ නිසින්නො,
අච්ඡෙරං සීසං නයනසුභගං ආකුලණ්ණග්ගිජාලං;
දුජ්ජාලද්ධංසං මුනිභිජහිතං පාටිහෙරං අකාසි,
වන්දෙ තං සෙට්ඨං පරමරතිජං ඉද්ධිධම්මෙහුපෙතං.

(නමක්කාරටීකා)

[45] අක්ඛ, උතු සහ ඉසි මෙයින් අදහස් වේ. අක්ඛ පඤ්ච ඉන්ද්‍රිය ලෙස ගෙන 5 ක් ගැනේ. උතු වලින් 4 අදහස් වේ. ඉසි යන්නෙන් 7 අදහස් වේ. මේ නිසා යතිය 5 න් 4 න් 7 න් යෙදේ.

කණ්	ඩම්	බං	මූ	ලෙ	ප	ර	හි	ත	ක	රො	යො	මු	නින්	දෙ	නි	සින්	නො
∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			නගණ			යගණ			යගණ			යගණ		

අච්	ඡෙ	රං	සී	සං	න	ය	න	සු	භ	ගං	ආ	කු	ලණ්	ණග්	ගි	ජා	ලං
∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			නගණ			යගණ			යගණ			යගණ		

දුජ්	ජා	ලද්	ධං	සං	මු	නි	භි	ජ	හි	තං	පා	ටි	හෙ	රං	අ	කා	සි
∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			නගණ			යගණ			යගණ			යගණ		

වන්	දේ	තං	සෙට්	ඨං	ප	ර	ම	ර	ති	ජං	ඉද්	ධි	දම්	මෙ	හු	පෙ	තං
∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			තගණ			නගණ			යගණ			යගණ			යගණ		

අතිධුති ඡන්දස (අක්ෂර 19)

අතිමහන්තී ධුති අතිධුති.

අතිමහත් වූ ධුති ඡන්දස අතිධුති නම් වේ

102. රසු,ත්ව,ස්සෙහි[46] ය්මා, න,ස,ර,ර,ගරූ, මෙසවිප්ඵුජ්ජිතා සා.

ය්මා = යගණ - මගණයෝ වෙත් ද; **න ස ර ර ගරූ** = නගණ - සගණ - රගණ - රගණ - ගරුවකින් යුක්ත වේ ද; **රස + උසු + අස්සෙහි** = සයකින් සයකින් හා සතකින් යති වේ ද; **සා** = ඕ තොමෝ; **මෙසවිප්ඵුජ්ජිතා** = "මේසවිප්ඵුජ්ජිතා" නම් වේ.

ඉදින් මෙම අති ධුති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම යගණ, මගණ, නගණ, සගණ, රගණ, රගණ හා ගරුවක් යෙදේ ද, අක්ෂර හයකින්, තවත් හයකින් සහ සතකින් යති යෙදේ ද, එම ගාථාව **මෙසවිප්ඵුජ්ජිතා** වුත්තය නම් වේ.

මෙසස්ස විප්ඵුජ්ජිතො මෙසවිප්ඵුජ්ජිතො.

වලාවගේ ගෙරවීම මේසවිප්ඵුජ්ජිත නම් වේ. යම් ගාථාවකට වළාවගේ ගෙරවීම බඳු වූ ගෙරවීමක් ඇති බැවින් මෙසවිප්ඵුජ්ජිතා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19
ර	සුත්	වස්	සෙ	හිය්	මා	න	ස	ර	ර	ග	රූ	මෙ	ස	විප්	ඵුජ්	ජි	තා	සා
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			මගණ			නගණ			සගණ			රගණ			රගණ			ගරු

මෙම මෙසවිප්ඵුජ්ජිතා ගාථාවට උදහරණයක් මෙසේ ය.

මුනින්දක්කො ස්වෙකො දයුදයරුණො ඤාණවිත්ථිණ්ණබිම්බො,
විනෙය්‍යප්පාණොසං කමලකථිතං ධම්මරංසීවරෙහි;
සුබොධෙසී සුද්ධෙ තිභවකුහරෙ බ්‍යාපිතක්කිත්තිනඤ්ච,
තිලොකෙකච්චක්ඛුං දුඛමසහනං තං මහෙසිං නමාමි.

(නමක්කාරටීකා)

[46] මෙයින් රස, උතු සහ අස්ස විස්තර වේ. රස 6 කි. උතු 6 කි. අස්ස 7 කි. එහෙයින් යතිය 6 න් 6 න් හා 7 නි.

මු	නින්	දක්	කොය්	වෙ	කො	ද	යු	ද	ය	රු	ණො	ඤ	ණ	විත්	ථීන්	ණ	බිම්	බො
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			මගණ			නගණ			සගණ			රගණ			රගණ			ගරු

වි	නෙය්	යප්	පා	ණො	සං	ක	ම	ල	ක	ථී	තං	ධම්	ම	රං	සී	ව	රෙ	හි
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			මගණ			නගණ			සගණ			රගණ			රගණ			ගරු

සු	බො	ධෙ	සී	සුද්	ධෙ	ති	භ	ව	කු	හ	රෙ	බ්‍යා	පි	තක්	කිත්	ති	නඤ්	ච
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			මගණ			නගණ			සගණ			රගණ			රගණ			ගරු

ති	ලො	කෙ	කච්	චක්	බුං	දු	බ	ම	ස	හ	නං	තං	ම	හෙ	සිං	න	මා	මි
–	∪	∪	∪	∪	∪	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
යගණ			මගණ			නගණ			සගණ			රගණ			රගණ			ගරු

103. අක්කස්සෙහි[47] යති මිස,ජා ස,ත,ත,ගා, සද්දූලවික්කීළිතං.

(යදි = ඉදින්;) **මිස ජා ස ත ත ගා** = මගණ - සගණ - ජගණ - සගණ - තගණ - තගණ - ගරු යන මේවා වෙත් ද; **අක්ක + අස්සෙහි යති** = දෙළසකින් හා සතකින් යති වේ ද; **සද්දූලවික්කීළිතං** = (එකල්හි ඒ වුත්තය) "සද්දූලවික්කීළිත" නම් වේ.

ඉදින් මෙම අති ධුති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, සගණ, ජගණ, සගණ, තගණ, තගණ සහ ගරුවක් යෙදේ ද, අක්ෂර දෙළසකින් සහ හතකින් යති යෙදේ ද, එම ගාථාව **සද්දූලවික්කීළික** වුත්තය නම් වේ.

සරතීති සද්දූලො. සද්දූලස්ස වික්කීළිතො සද්දූලවික්කීළිතො. සද්දූලස්ස වික්කීළිතො යස්සාති සද්දූලවික්කීළිතං.

ශබ්දකරන බැවින් සද්දූල නම් වේ. ශබ්ද කරන්නා වූ ව්‍යාඝ්‍රයාගේ ක්‍රීඩා කිරීම සද්දූලවික්කීළිත නම් වේ. යම් ගාථාවකට ශබ්ද කරන්නා වූ ව්‍යාඝ්‍රයාගේ ක්‍රීඩාව මෙන් ක්‍රීඩා කිරීමක් ඇති බැවින් සද්දූලවික්කීළිත නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19
අක්	කස්	සෙ	හි	ය	තිම්	ස	ජා	ස	ත	ත	ගා	සද්	දූ	ල	වික්	කී	ළි	තං
∪	∪	∪	–	–	∪	–	∪	–	–	–	∪	∪	∪	–	∪	∪	–	∪
මගණ			සගණ			ජගණ			සගණ			තගණ			තගණ			ගරු

කති ඡන්දස (අක්ෂර 20)

යථාවුත්තගණයතීහි කරීයතෙති කති.

යම් සේ කියන ලද ගණයන්ගෙන් කරන ලද බැවින් කති නම් වේ.

104. වුත්ත මීදිසං තු නාමතො ර,ජා ර,ජා ර,ජා ගරු,ලහූ ච.

[47] අක්ක (හිරු) සහ අස්ස මෙයින් අදහස් වේ. අක්ක 12 වේ අස්ස 7 වේ. එහෙයින් මෙහි යතිය 12 න් හා 7 නි.

ර ජා ර ජා ර ජා = රගණ - ජගණ - රගණ - ජගණ - රගණ - ජගණයෝ වෙත් ද; **ගරු ලහු** = (අවසානයෙහි) ගරුවකින් හා ලහුවකින් යුක්ත වේ ද; **ඊදිසං තු** = මෙබඳු වූ වුත්තය වනාහි; **නාමතො** = නාම හෙයින්; **වුත්තං** = "වුත්ත" නම් වේ.

ඉදින් මෙම කති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම රගණ, ජගණ, රගණ, ජගණ, රගණ, ජගණ සමග ගරුවක් හා ලහුවක් යෙදේ නම් එම ගාථාව **වුත්ත** වුත්තය නම් වේ.

රජත්තයෙන වුච්චතෙති වුත්තං.

රගණ ජගණ ත්‍රයෙන් කියන ලැබෙන බැවින් වුත්ත නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19	20
වුත්	ත	මී	දි	සං	තු	නා	ම	තො	ර	ජා	ර	ජා	ර	ජා	ග	රු	ල	හූ	ච
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ			රගණ			ජගණ			ගරු	ලහු

මෙම වුත්ත ගාථාවට උදහරණයක් මෙසේ ය.

යො ජිනො අනෙකජාතියං සපුත්තදරමඞ්ගජීවිතම්පි,
බොධිපෙමතො අලග්ගමානසො අදසියෙව අත්ථිකස්ස;
දනපාරමිං තතො පරං අපූරි සීලපාරමාදිකම්පි,
තාසමිද්ධියොපයාතමග්ගතං තමෙකදීපකං නමාමි.

(නමක්කාරටීකා)

යො	ජි	නො	අ	නෙ	ක	ජා	ති	යං	ස	පුත්	ත	ද	ර	මඞ්	ග	ජී	වි	තම්	පි
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ			රගණ			ජගණ			ගරු	ලහු

බො	ධි	පෙ	ම	තො	අ	ලග්	ග	මා	න	සො	අ	ද	සි	යෙ	ව	අත්	ථි	කස්	ස
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ			රගණ			ජගණ			ගරු	ලහු

ද	න	පා	ර	මී	ත	තො	ප	රං	අ	පූ	රි	සී	ල	පා	ර	මා	දි	කම්	පි
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ			රගණ			ජගණ			ගරු	ලහු

තා	ස	මිද්	ධි	යො	ප	යා	ත	මග්	ස	තං	ත	මෙ	ක	දී	ප	කං	න	මා	මි
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ			රගණ			ජගණ			ගරු	ලහු

පකති ඡන්දස (අක්ෂර 21)

පුරිමතො පකාරෙන කරීයතෙති පකති.

පූර්වයෙහි කති ඡන්දසට වඩා ප්‍රකාරයෙන් කරන ලද බැවින් පකති නම් වේ.

105. ම්‍රා ඝ්නා යො යො'ත්‍ර යෙන,ත්ති,මුනි[48], යතියුතා, සන්ධරා කිත්තිතා'යං.

[48] ති,මුනි යන්නෙන් මුනි තුන් වතාවක් යැයි අදහස් වේ. මුනි යනු 7 කි. එහෙයින් යතිය 7 න් 7 න් 7 න් වේ.

ම්‍රා (ම් + රා) = මගණ - රගණයෝ වෙත් ද; **භ්නා යො යො** = භගණ - නගණ - යගණ - යගණයෝ වෙත් ද; **යෙන** = (අන්තයෙහි ද) යගණය වෙත් ද; **තිමුනියතියුතා** = සතකින් සතකින් හා සතකින් යති යුක්ත වූ; **අයං** = මෝ තොමෝ; **අත්‍ර** = මෙහි; **සන්ධරා** = "සන්ධරා" යයි; **කිත්තිතා** = කියන ලද්දී ය.

ඉදින් මෙම පකති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම මගණ, රගණ, භගණ, නගණ හා තවත් යගණ තුනක් යෙදේ ද, අක්ෂර සතෙන්, නැවතත් සතෙන් සහ නැවතත් සතකින් යතිය යෙදෙයි ද, එම ගාථාව **සන්ධරා (සද්ධරා)** වුත්තය නම් වේ.

සන්තං මාදිගණං යතිත්තයඤ්ච ධරෙතීති සද්ධරා.
ප්‍රකට වූ ම ආදී වූ ගණය ද යති ත්‍රය ද ධරන බැවින් සද්ධරා නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19	20	21
ම්‍රාභ්	නා	යො	යොත්	ර	යෙ	නත්	ති	මු	නි	ය	ති	යු	තා	සන්	ධ	රා	කිත්	ති	තා	යං
∪	∪	∪	∪	–	∪	∪	–	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			රගණ			භගණ			නගණ			යගණ			යගණ			යගණ		

මෙම ගාථාවට උදාහරණයක් මෙසේ ය.

බුද්ධොබුද්ධොතිසොසො අතිදුලභතරො කා කථා බුද්ධභාවො,
ලොකෙ තස්මා විභාවී විවිධහිතසුඛං සාධවො පත්ථයන්තා.
ඉට්ඨං අත්ථං වහන්තං සුරනරමහිතං නිබ්භයං දක්ඛිණෙය්‍යං,
ලොකානං නන්දිවඩ්ඪං දසබලමසමං තං නමස්සන්තු නිච්චං.

(නමක්කාරටීකා)

බුද්	ධො	බුද්	ධො	ති	සො	සො	අ	ති	දු	ල	භ	ත	රො	කා	ක	තා	බුද්	ධ	භා	වො
∪	∪	∪	∪	–	∪	∪	–	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			රගණ			භගණ			නගණ			යගණ			යගණ			යගණ		

ලො	කෙ	තස්	මා	වි	භා	වී	වි	වි	ධ	හි	ත	සු	ඛං	සා	ධ	වො	පත්	ථ	යන්	තා
∪	∪	∪	∪	–	∪	∪	–	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			රගණ			භගණ			නගණ			යගණ			යගණ			යගණ		

ඉට්	ඨං	අත්	ථං	ව	හන්	තං	සු	ර	න	ර	ම	හි	තං	නිබ්	භ	යං	දක්	ඛි	නෙය්	යං
∪	∪	∪	∪	–	∪	∪	–	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			රගණ			භගණ			නගණ			යගණ			යගණ			යගණ		

ලො	කා	නං	නන්	දි	වඩ්	ඪං	ද	ස	බ	ල	ම	ස	මං	තං	න	මස්	සන්	තු	නිච්	චං
∪	∪	∪	∪	–	∪	∪	–	–	–	–	–	–	∪	∪	–	∪	∪	–	∪	∪
මගණ			රගණ			භගණ			නගණ			යගණ			යගණ			යගණ		

ආකති ඡන්දස (අක්ෂර 22)

ආභුසො කරීයතෙති ආකති.
බොහෝ සෙයින් කරන බැවින් ආකති නම් වේ.

106. භ්‍රා න,ර,නා ර,නා ච ථ ගරු දස,ක්ක[49],විරමඤ්හි භද්දක'මිදං.

[49] දසක්ක යනු දස අක්ක වේ. දස යනු 10 යි. අක් යනු හිරුට බැවින් වුත්තෝදයට අනුව 12 වේ. එහෙයින් මෙහි යතිය විය යුත්තේ 10 න් හා 12 නි.

භ්‍රා (භ් + රා) = භගණ - රගණයෝ වෙත් ද; **න ර නා ර නා** = නගණ - රගණ - නගණ - රගණ - නගණ යන මේවායින් යුක්ත වේ ද; **අට** = නැවත; **ගරු** = ගරුවක් වේ ද; **දස + අක්ක විරමං** = දසයකින් හා දෙළොසකින් විරාම ඇති; (යති ඇති) **ඉදංහි** = මේ වුත්තය වනාහි; **භද්දකං** = "භද්දක" නම් වේ.

ඉදින් මෙම ආකති ඡන්දසෙහි යම් කිසි ගාථාවක සෑම පාදයක ම භගණ, රගණ, නගණ, රගණ, නගණ, රගණ, නගණ, ගරු යෙදේ ද, අක්ෂර දහයකින් හා දෙළසකින් යති යෙදේ ද, එම ගාථාව **භද්දක** වුත්තය නම් වේ.

භද්දති සොභති. භද්දීයතෙ වා උච්චතෙති භද්දකං.
හොබවන බැවින් භද්දක නම් වේ. කියනු ලැබෙන බැවින් භද්දක නම් වේ.

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	18	19	20	21	22
භ්‍රා	න	ර	නා	ර	නා	ච	ථ	ග	රු	ද	සක්	ක	වි	ර	මඤ්ඤ	හි	භද්	ද	ක	මි	දං
∪	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	–	–	∪	–	∪	–	–	–	∪
භගණ			රගණ			නගණ			රගණ			නගණ			රගණ			නගණ			ගරු

සමවුත්ති නිද්දේසය ආරම්භ වන්නේ අක්ෂර 6 ඡන්දසෙනි. අතීත ඡන්දස් ආචාර්යවරුන් විසින් අක්ෂර එකේ සිට පහ දක්වාත් ඡන්දස් පෙන්වා ඇති නමුත් ඒවා වුත්තෝදය නම් ග්‍රන්ථයෙහි දක්වා නොමැත. ඒවා නම් අක්ෂර එකක් ඇති ඡන්දස් = උත්තා, අක්ෂර දෙකක් ඇති ඡන්දස් = අච්චුත්තා, අක්ෂර තුනක් ඇති ඡන්දසි = මජ්ඣා, අක්ෂර හතරක් ඇති ඡන්දස් = පතිට්ඨා, අක්ෂර පහක් ඇති ඡන්දස් = සුපතිට්ඨා වශයෙනි.

එසේ ම මෙම වුත්තෝදය ග්‍රන්ථයෙහි සමවුත්ති නිද්දේසයේ ඡන්දස් අක්ෂර 22 න් අවසන් වුව ද, ඉන් ඉදිරයටත් අක්ෂර 26 දක්වා ඡන්දස් ඇති බව ඡන්දස් ආචාර්යවරු පෙන්වා ඇත. ඒවා නම් අක්ෂර 23 ක් ඇති ඡන්දස = විකති, අක්ෂර 24 ක් ඇති ඡන්දස = සංකති, අක්ෂර 25 ක් ඇති ඡන්දස = අතිකති, අක්ෂර 26 ක් ඇති ඡන්දස = උක්කති වශයෙනි.

සාරාංශය

එය බුරුම රට පූජනීය ගුණිස්සර නම් ස්වාමිපාදයන් වහන්සේ (ධම්මාචරිය, පාලි පාරගු) විසින් ලියන ලද වුත්තෝදයබොධි නම් ග්‍රන්ථයෙහි මෙසේ දක්වා ඇත.

ගායත්‍යණ්හිකානුට්ඨුභා, බ්‍රහතී පන්ති තිට්ඨුභා
ජගතී අතිජගතී, සක්කරී අති සක්කරී.

අට්ඨ ඉට්ඨී ධිත්‍යා ධිති, කතිප්පකති ආකති
සත්තරසෙව චන්දනි, වුත්තොදයෙ පකාසිතා.

උත්තා අච්චුතා මජ්ඣා ච, පතිට්ඨා ච සුප්පතිට්ඨා
විකති සංකති අති - කති උක්කති න දීපිකා.

ගායත්තී, උණ්හිකා, අනුට්ඨුභා, බ්‍රහතී, පන්ති, තිට්ඨුභා, ජගතී, අතිජගතී, සක්කරී, අතිසක්කරී,

අට්ඨී, අච්චට්ඨී, ධුති, අතිධුති, කති, පකති, ආකති යන දහත් ආකාර ඡන්දස් (මෙම) වුත්තෝදය ග්‍රන්ථයේ දක්වන ලදී

උත්තා, අච්චුතා, මජ්ඣා, පතිට්ඨා, සුපතිට්ඨා ද, විකති, සංකති, අතිකති, උක්කති යන ඡන්දස් මෙහි (මෙම වුත්තෝදය ග්‍රන්ථයෙහි) නො දක්වේ.

ඉති වුත්තොදයෙ ඡන්දසි සමවුත්තිනිද්දෙසො නාම
තතියො පරිච්ඡෙදෙ.

වුත්තෝදය ඡන්දස් ග්‍රන්ථයෙහි සමවුත්ති නිද්දේස නම් වූ
තෙ වෙනි පරිච්ඡේදය නිමි.

අඩ්ඪසමවුත්තිනිද්දෙස - චතුත්ථපරිච්ඡේද

මෙම ගාථාවන්හි පළමු පාදය තෙවන පාදය සමග ද, දෙ වෙනි පාදය හතර වෙනි පාදය සමග ද සමාන වීම් වශයෙන් පාද දෙක බැගින් සම වන බැවින් අඩ්ඪසමවුත්ති නම් වේ.

107. විසමෙ යදි සා ස,ල,ගා සමෙ,
භ,ත්තයතො ගරුකා වු'පචිත්තං.

විසමෙ = විසම පාදයෙහි; **යදි** = ඉදින්; **සා** = සගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ස ල ගා** = සගණ - ලහු - ගරු වෙත් ද; **සමෙ** = සමපාදයෙහි; **භත්තයතො** = භගණ තුනකින් පරව; **ගරුකා** = ගරුහු දෙදෙනෙක් වෙත් ද; **උපචිත්තං** = (ඒ වුත්තය) "උපචිත්ත" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි සගණ තුනක් ලහු හා ගරුවක් ඇත්නම් හා සම පාදයෙහි භගණ තුනකින් පසුව ගරු දෙකක් ඇත්නම් එම ගාථාව **උපචිත්ත** ගාථාව නම් වේ.

චිත්තස්ස සමීපෙ පවත්තතීති උපචිත්තං.
චිත්ත ගාථාවේ සමීපයෙහි පවතින බැවින් උපචිත්ත නම් වේ.

ගාථාවක පළමු පාදය හා තුන් වෙනි පාදය විසමපාද නම් වන අතර දෙ වෙනි පාදය හා හතර වෙනි පාදය සමපාද නම් වේ.

විසම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
වි	ස	මෙ	ය	දි	සා	ස	ල	ගා	ස	මෙ
–	–	∪	–	–	∪	–	–	∪	–	∪
සගණ			සගණ			සගණ			ලහු	ගරු

සම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
භත්	ත	ය	තො	ග	රු	කා	වු	ප	චිත්	තං
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

මෙහි පළමු වෙනි පාදය හා තුන් වෙනි පාදය සම වන අතර දෙ වෙනි පාදය හා හතර වෙනි පාදය සම වේ. ගාථාව අවසන් වූ විට මෙසේ විය යුතුය[50].

1 වන විසම පාදය	–	–	∪	–	–	∪	–	–	∪	–	∪
	සගණ			සගණ			සගණ			ලහු	ගරු
2 වන සම පාදය	∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
	භගණ			භගණ			භගණ			ගරු	ගරු
3 වන විසම පාදය	–	–	∪	–	–	∪	–	–	∪	–	∪
	සගණ			සගණ			සගණ			ලහු	ගරු
4 වන සම පාදය	∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
	භගණ			භගණ			භගණ			ගරු	ගරු

[50] පසුව එන ගාථාවන් ද මෙසේ ම දත යතු ය.

108. **භ,ත්තයතො යදි ගා දුතමජ්ඣා;**
යදි පුනරෙ'ව භවන්ති න, ජා ජාඃ.

යදි = ඉදින්; **භත්තයතො** = (විසම පාදයෙහි) භගණ තුනකින් පරව; **ගා** = ගරුහු දෙදෙනෙක් වෙත් ද; **යදි** = ඉදින්; **පුන + ඒව** = නැවතත්; (සම පාදයෙහි) **නජා** = නගණ - ජගණයෝ ද; **ජාඃ** = ජගණ - යගණයෝ; **භවන්ති** = වෙත් ද; (එකල්හි ඒ වුත්තය) **දුතමජ්ඣා** = "දුතමජ්ඣා" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි භගණ තුනකින් පසුව ගරු දෙකක් යෙදේ නම්, නැවතත් සම පාදයෙහි නගණයක් ජගණ දෙකක් සහ යගණයක් යෙදේ නම්, එය **දුතමජ්ඣ** ගාථාව නම් වේ.

දුතො වුද්ධිප්පත්තො භගණො යස්සාති දුතමජ්ඣා.
යම් ගාථාවක වෘද්ධියට පැමිණියා වූ භගණයක් ඇත් ද. එම ගාථාව දුතමජ්ඣා නම් වේ.

විසම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
භත්	ත	ය	තො	ය	දි	ගා	දු	ත	මජ්	ඣා
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

සම පාදය (අක්ෂර 12)

1	2	3	4	5	6	7	8	9	10	11	12
ය	දි	පු	න	රෙ	ව	භ	වන්	ති	න	ජාජ්	යා
–	–	–	–	∪	–	–	∪	–	–	∪	∪
නගණ			ජගණ			ජගණ			යගණ		

109. **යදි ස,ත්තිතයං ගරුයුත්තං,**
වෙගවතී යදි භ,ත්තිතයා ගා.

යදි = ඉදින්; (විසම පාදයෙහි) **ගරුයුත්තා** = (අන්තයෙහි) ගරුවකින් යුක්ත වූ; **සත්තිතයං** = සගණ තුනක් වෙත් ද; **යදි** = ඉදින්; (සම පාදයෙහි) **භත්තිතයා** = භගණ තුනකින් පරව; **ගා** = ගරු දෙදෙනෙක් වෙත් ද; **වෙගවතී** = (එකල්හි) "වේගවතී" වුත්තය වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි සගණ තුනක් සමග ගරුවක් යෙදේ ද, සම පාදයෙහි භගණ තුනක් සමග ගරු දෙකක් යෙදේ ද, එම ගාථාව **වේගවතී** ගාථාව නම් වේ.

වෙගො යස්සා අත්ථීති වෙගවතී.
යම් ගාථාවකට වේගය ඇත් ද වේගවතී නම් වේ.

විසම පාදය (අක්ෂර 10)

1	2	3	4	5	6	7	8	9	10
ය	දි	සත්	ති	ත	යං	ග	රු	යුත්	තං
–	–	∪	–	–	∪	–	–	∪	∪
සගණ			සගණ			සගණ			ගරු

සම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
වෙ	ග	ව	තී	ය	දි	භත්	ති	ත	යා	ගා
∪	–	–	∪	–	–	∪	–	–	∪	∪
භගණ			භගණ			භගණ			ගරු	ගරු

110. **තො ජො විසමෙ රතො ගරු චෙ;**
ම්සා ජ්ගා භද්දවිරාජ මෙත්ථ ගො චෙ.

විසමෙ = විසම පාදයෙහි; **චෙ** = ඉදින්; **තො** = තගණය වේ ද; **ජො** = ජගණය වේ ද; **රතො** = (නැවත) රගණයෙන් පරව; **ගරු** = ගරුවෙක් වේ ද; **එත්ථ** = මේ සම පාදයෙහි; **චෙ** = ඉදින්; **ම්සා** = මගණ - සගණයෝ වෙත් ද; **ජ්ගා** = ජගණ - ගරුවෙක් වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවෙක් වේ ද; **භද්දවිරාජං** = (එකල්හි ඒ වුත්තය) "භදවිරාජ" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි තගණ, ජගණ, රගණ වලින් පසුව තවත් ගරු අක්ෂරයක් ඇත්ද, එසේම සම පාදයෙහි මගණ, සගණ, ජගණයෙන් පසුව තවත් ගරු දෙකක් ඇත්ද, එවැනි ගාථාව **භද්දවිරාජ** ගාථාව නම් වේ.

භද්දෙහි තාදිගණෙහි විරාජතීති භද්දවිරාජං.
සුන්දර වූ ත ආදි ගණයන්ගෙන් හොබවයි නම් භද්දවිරාජ නම් වේ.

විසම පාදය (අක්ෂර 10)

1	2	3	4	5	6	7	8	9	10
තො	ජො	වි	ස	මෙ	ර	තො	ග	රු	චෙ
∪	∪	–	–	∪	–	∪	–	∪	∪
තගණ			ජගණ			රගණ			ගරු

සම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
ම්සාජ්	ගා	භද්	ද	වි	රා	ජ	මෙත්	ථ	ගො	චෙ
∪	∪	∪	–	–	∪	–	∪	–	∪	∪
මගණ			සගණ			ජගණ			ගරු	ගරු

111. **විසමෙ ස, ජා ස,ගරු,යුත්තා;**
කෙතුමතී සමෙ භ,ර,න,ගා ගො.

විසමෙ = විසම පාදයෙහි; **සජා** = සගණ - ජගණයෝ වෙත් ද; **ස ගරු යුත්තා** = (නැවත) සගණ - ගරුවකින් යුක්ත වෙත් ද; **සමෙ** = සම පාදයෙහි; **භ ර න ගා** = භගණ - රගණ - නගණ - ගරු යන මොහු වෙත් ද; **ගො** = (අන්තයෙහි) ගරුවක් වේ ද; **කේතුමතී** = (ඒ වුත්තය) "කේතුමතී" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි සගණ, ජගණ, සගණ සහ ගරුවක් ඇත්ද, සම පාදයෙහි භගණ, රගණ, නගණ සමග තවත් ගරු දෙකක් ඇත්ද එවැනි ගාථාව **කේතුමතී** ගාථාව නම් වේ.

කෙතු යස්සා අත්ථි තස්සං වා විජ්ජතීති කෙතුමතී.
මෙම ගාථවට ධජය ඇති බැවින් කෙතුමතී නම් වේ.

විසම පාදය (අක්ෂර 10)

1	2	3	4	5	6	7	8	9	10
වි	ස	මෙ	ස	ජා	ස	ග	රු	යුත්	තා
–	–	∪	–	∪	–	–	–	∪	∪
සගණ			ජගණ			සගණ			ගරු

සම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
කෙ	තු	ම	තී	ස	මෙ	භ	ර	න	ගා	ගො
∪	–	–	∪	–	∪	–	–	–	∪	∪
භගණ			රගණ			නගණ			ගරු	ගරු

112. ආඛ්‍යානකී තා විසමෙ ජ, ගා ගො; (ඉන්දවජිර)
ජ,තා ජ,ගා ගො තු සමෙ'ථ පාදෙ. (උපෙන්දවජිර)

විසමෙ = විසම පාදයෙහි; **තා** = තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජ ගා** = ජගණ - ගරුහු වෙත් ද; **ගො** = (නැවත) ගරුවෙක් වේ ද; **අථ** = නැවත; **සමෙ පාදෙතු** = සම පාදයෙහි වනාහි; **ජ තා ජ ගා** = ජගණ - තගණ - ජගණ - ගරුහු වෙත් ද; **ගො** = (නැවත) ගරුවෙක් වෙත් ද; **අඛ්‍යානකී** = (ඒ වුත්තය) "අඛ්‍යානකී" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි ඉන්දවජිර ලක්ෂණය වූ තගණ, තගණ, ජගණ සමග ගරු දෙකක් යෙදෙයි ද, සම පාදයෙහි උපෙන්දවජිර ලක්ෂණ වූ ජගණ, තගණ, ජගණ සමග ගරු දෙකක් යෙදෙයි ද, එම ගාථාව **ආඛ්‍යානකී** ගාථාව නම් වේ.

තාදිජාදිගණෙහි අඛයානං කරොතීති අඛ්‍යානකී.
ත ආදි වූ ද ජ ආදි වූ ද ගණයන්ගෙන් කීම කරයි නම් අඛ්‍යානකී නම් වේ.

විසම පාදය (අක්ෂර 11) ඉන්දවජිර

1	2	3	4	5	6	7	8	9	10	11
ආඛ්	යා	න	කී	තා	වි	ස	මෙ	ජ	ගා	ගො
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

සමපාදය (අක්ෂර 11) උපෙන්දවජිර

1	2	3	4	5	6	7	8	9	10	11
ජ	තා	ජ	ගා	ගො	තු	ස	මෙ	ථ	පා	දෙ
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

මෙම අඛ්‍යානකී ගාථාවට උදාහරණයක් මෙසේ ය.

ආකඞ්ඛමානෙන පරත්ථමිට්ඨං; මහත්ථසාරං සුවිනිච්ඡයඤ්ච;
සංවණ්ණනං සාධු පකුබ්බතා යං; චිතං මයා පුඤ්ඤමනප්පභූතං.

(කඞ්ඛාවිතරණිපුරාණ-ටීකා)

ආ	කඞ්	ක	මා	නෙ	න	ප	රත්	ථ	මිට්	ඨං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

ම	හත්	ථ	සා	රං	සු	වි	නිච්	ඡ	යඤ්	ච
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

සං	වණ්	ණ	නං	සා	ධු	ප	කුබ්	බ	තා	යං
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

වි	තං	ම	යා	පුඤ්ඤ	ඤ	ම	නප්	ප	භූ	තං
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

113. **ජ,තා ජ,ගා ගො විසමෙ සමෙ තු; (උපෙන්දවජිර)**
තා ජො ග,ගා චෙ විපරීතපුබ්බා. (ඉන්දවජිර)

විසමෙ = විසම පාදයෙහි; **ජ තා ජ ගා** = ජගණ - තගණ - ජගණ - ගරුහු වෙත් ද; **ගො** = (නැවත) ගරුවෙක් වේ ද; **තු** = නැවත; **සමෙ** = සම පාදයෙහි; **චෙ** = ඉදින්; **තා** = තගණයෝ දෙදෙනෙක් වෙත් ද; **ජො** = ජගණයෙක් වේ ද; **ග ගා** = (අන්තයෙහි) ගරුහු දෙදෙනෙක් වෙත් ද; (එකල්හි ඒ වුත්තය) **විපාරීතාපුබ්බා** = විපරීත යනු පූර්ව කොට ඇති; **අඛ්‍යානකී** = "අඛ්‍යානකී" නම් හෙවත් "විපරීත අඛ්‍යානකී" නම් වන්නී ය.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි උපෙන්දවජිර ලක්ෂණ වූ ජගණ, තගණ, ජගණ සමග ගරු දෙකක් යෙදෙයි ද, සම පාදයෙහි ඉන්දවජිර ලක්ෂණය වූ තගණ, තගණ, ජගණ සමග ගරු දෙකක් යෙදෙයි ද, එම ගාථාව **විපරීත අඛ්‍යානකී** ගාථාව නම් වේ. (මෙය ඉහත කී අඛ්‍යානකී ගාථාවේ සම විසම පාද මාරු වීමෙන් සෑදී ඇත.)

විපරීත පුබ්බං (පුරිමගාථාය ලක්ඛණං) යස්සාති විපරීතපුබ්බා. (විපරීත අඛයානකී)
යම් ගාථාවකට විපරීත වූ පූර්ව ගාථාවගේ ලක්ෂණයක් ඇති බැවින් විපරීත පුබ්බා (විපරීත අඛ්‍යානකී) නම් වේ.

විසම පාද (අක්ෂර 11) උපෙන්දවජිර

1	2	3	4	5	6	7	8	9	10	11
ජ	තා	ජ	ගා	ගො	තු	ස	මෙ	ථ	පා	දෙ
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

සම පාද (අක්ෂර 11) ඉන්දවජිර

1	2	3	4	5	6	7	8	9	10	11
තා	ජො	ග	ගා	චෙ	වි	ප	රී	ත	පුබ්	බා
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

අඛානකී, විපරීත අඛ්‍යානකී ආදී වූ මෙවැනි ගාථාවන් 65 වන ගාථාවෙහි කී උපජාති ගාථාවෙහිම සංග්‍රහ කළ හැකි ය. නමුත් සාමාන්‍ය උපජාති ගාථාවකට වඩා මේවායෙහි ඇති විශේෂත්වය නම් අඩ්ඪසමවුත්ති ලක්ෂණයෙන් යුක්ත වීම ය. හෙවත් පළමු හා තෙවන පාදත්, දෙ වෙනි හා හතර වෙනි පාදත් සම වීම ය.

මෙම විපරීත අඛ්‍යානකී ගාථාවට උදහරණයක් මෙසේ ය.

තථා මහාකස්සපඅව්හයෙන; ථෙරෙන සික්ඛාසු සගාරවෙන;
කුදිට්ඨිමත්තෙභවිදරකෙන; සීහෙන චොළාවනිපූජිතෙන.

(විනය විනිච්ඡය ටීකා)

ත	ථා	ම	හා	කස්	ස	ප	අව්	හ	යෙ	න
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

ථෙ	රෙ	න	සික්	ඛා	සු	ස	ගා	ර	වෙ	න
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

කු	දිට්	ඨි	මත්	තෙ	භ	වි	ද	ර	කෙ	න
–	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
ජගණ			තගණ			ජගණ			ගරු	ගරු

සී	හෙ	න	චො	ළා	ව	නි	පූ	ජි	තෙ	න
∪	∪	–	∪	∪	–	–	∪	–	∪	∪
තගණ			තගණ			ජගණ			ගරු	ගරු

114. **ස,ස,තො ස,ල,ගා විසමෙ සමෙ;**
න,භ,භ,රා භවතෙ හරිණප්ලුතා.

විසමෙ = විසම පාදයෙහි; **ස ස තො** = සගණ - සගණයන් කෙරෙන්; **ස ල ගා** = සගණ - ලහු - ගරුහු වෙත් ද; **සමෙ** = සම පාදයෙහි; **න භ භ රා** = නගණ - භගණ - භගණ - රගණයෝ වෙත් ද; **හරිණප්ලුතා භවති** = (ඒ වුත්තය) "හරිණප්ලුතා" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි සගණ තුනක් සමග ලහු ගරුවක් යෙදේ ද, සම පාදයෙහි නගණ, භගණ, භගණ සහ රගණයක් යෙදේ ද, එම ගාථාව **හරිණප්ලුතා** ගාථාව නම් වේ.

හරීයතෙති හරිණො. හරිණො විය ප්ලුතාති හරිණප්ලුතා.

ගෙනායන්නා වූ බැවින් මුවා හරිණෝ නම් වේ. හරිණෝ නම් මුවා මෙන් යන්නා වූ බැවින් හරිණප්ලුතා නම් වේ.

විසම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
ස	ස	තො	ස	ල	ගා	වි	ස	මෙ	ස	මෙ
–	–	∪	–	–	∪	–	–	∪	–	∪
සගණ			සගණ			සගණ			ලහු	ගරු

සම පාදය (අක්ෂර 12)

1	2	3	4	5	6	7	8	9	10	11	12
න	භ	භ	රා	භ	ව	තෙ	හ	රි	ණප්	ලු	තා
–	–	–	∪	–	–	∪	–	–	∪	–	∪
නගණ			භගණ			භගණ			රගණ		

115. **යදි න,න,ර,ල,ගා න,ජා ජ,රා,**
යදි ච තද'පරවත්ත මිච්ඡති.

යදි = ඉදින්; (විසම පාදයෙහි) **න න ර ල ගා** = නගණ - නගණ - රගණ - ලහු - ගරුහු වෙත් ද; **යදි** = ඉදින්; (සම පාදයෙහි) **න ජා ජ රා** = නගණ - ජගණ - ජගණ - රගණයෝ වෙත් ද; **තද** = එකල්හි; (ඒ වුත්තය) **අපරවත්තං** = "අපරවත්ත" නමැයි; **ඉච්ඡති** = කැමති වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි නගණ දෙකක් ද, රගණයක් සහ ලහු ගරුවෙක් යෙදේ ද, සම

පාදයෙහි නගණයක් සහ ජගණ දෙකක් සමග රගණයක් යෙදේද එම ගාථාව **අපරවත්ත** ගාථාව නම් වේ. මෙය වේතාලිය ගාථාවේ ප්‍රභේද වේ.

පුරිමතො අපරෙන ගණෙන වුච්චතෙ වත්තතෙ වාති අපරවත්තං.

පූර්ව ගාථාවට අපර වූ ගණයකින් කියනු ලැබෙන පවතිනු බැවින් අපරවත්ත නම් වේ.

විසම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11
ය	දි	න	න	ර	ල	ගා	න	ජා	ජ	රා
–	–	–	–	–	–	∪	–	∪	–	∪
නගණ			නගණ			රගණ			ලහු	ගරු

සම පාදය (අක්ෂර 11)

1	2	3	4	5	6	7	8	9	10	11	12
ය	දි	ච	ත	දැ	ප	ර	වත්	ත	මිච්	ඡ	ති
–	–	–	–	∪	–	–	∪	–	∪	–	∪
නගණ			ජගණ			ජගණ			රගණ		

116. **විසම මුපගතා න,නා ර,යා වෙ;**
න,ජ,ජ,ර,ගා සමකෙ ච පුප්ඵිතග්ගා.

වෙ = ඉදින්; **න නා** = නගණයෝ දෙදෙනෙක් ද; **ර යා** = රගණ - යගණයෝ ද; **විසමං** = විසම පාදයට; **උපගතා** = පැමිණියාහු වෙත් ද; **සමකෙ ච** = සම පාදයෙහි; **න ජ ජ ර ගා** = නගණ - ජගණ - ජගණ - රගණ - ගරු යන මොහු වෙත් ද; **පුප්ඵිතග්ගා** = (ඒ වුත්තය) "පුප්ඵිතග්ගා" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි නගණ දෙකක් සහ රගණයක් සමග යගණයක් යෙදේ ද, සම පාදයෙහි නගණ, ජගණ දෙකක් සහ රගණයක් සමග ගරුවක් පිහිටයි ද, එම ගාථාව **පුප්ඵිතග්ගා** ගාථාව නම් වේ. මෙය ඔපච්ඡන්දසක ගාථාවට සමාන වේ.

පුප්ඵානි සඤ්ජාතානි අස්සාති පුප්ඵිතො (රුක්ඛො). පුප්ඵිතො විය අග්ගො අස්සාති පුප්ඵිතග්ගො.

යම් වෘක්ෂයකට පුෂ්ඵයෝ හටගත්තාහු වෙත් ද. එබැවින් පුප්ඵිතග්ග නම් වේ. හටගත් පුෂ්ඵයන් ඇති වෘක්ෂයක් මෙන් ගරු නම් වූ 'ගණ කෙළවරවල් ඇති බැවින්' පුප්ඵිතග්ග නම් වේ.

විසම පාදය (අක්ෂර 12)

1	2	3	4	5	6	7	8	9	10	11	12
වි	ස	ම	මු	ප	ග	තා	න	නා	ර	යා	වෙ
–	–	–	–	–	–	∪	–	∪	–	∪	∪
නගණ			නගණ			රගණ			යගණ		

සම පාදය (අක්ෂර 13)

1	2	3	4	5	6	7	8	9	10	11	12	13
න	ජ	ජ	ර	ගා	ස	ම	කෙ	ච	පුප්	ඵි	තග්	ගා
–	–	–	–	∪	–	–	∪	–	∪	–	∪	∪
නගණ			ජගණ			ජගණ			රගණ			ගරු

ද්වයං මිදං වෙතාලීය'ප්පභෙදෙ - ඉහත කී 115 හා 116 ගාථා ද්වය වේතාලීය ජාතික ගාථාවල ප්‍රභේද වේ. එනම් අපරවත්ත ගාථාව වේතාලීය ගාථාවේත්, පුප්ඵිතග්ග ගාථාව ඕපච්ඡන්දසක ගාථාවේත් ප්‍රභේද වේ.

117. **සා යවාදිකා මතී ර,ජා ර,ජා ත්ව,**
සමෙ සමෙ ජ,රා ජ,රා ගරූ භවෙයුං.

අසමෙ = විසම පාදයෙහි; **ර ජා ර ජා** = රගණ - ජගණ - රගණ - ජගණයෝ වෙත් ද; **තු** = නැවත; **සමෙ** = සම පාදයෙහි; **ජ රා ජ රා** = ජගණ - රගණ - ජගණ - රගණයෝ ද; **ගරූ** = ගරුවෙක් යන මොහු ද; **භවෙයුං** = වන්නාහුද; **සා** = ඕ තොමෝ; **යවාදිකා** = යව ශබ්දය ආදිකොට ඇති; **මතී** = මතී හෙවත් "යවමතී" නම් වේ.

ඉදින් යම් ගාථාවක විසම පාදයෙහි රගණ, ජගණ, රගණ, ජගණ වශයෙන් යෙදේ ද, සම පාදයෙහි ජගණ, රගණ, ජගණ, රගණ, ගරු වශයෙන් යෙදේ ද, එම ගාථාව **යවමතී (යවාදිකාමතී)** ගාථාව නම් වේ.

යවසද්දෙ ආදි යස්සා මතියාති යවාදිකා.
යම් මාත්‍රා ගාථාවක ආදියෙහි යව ශබ්දය ඇති බැවින් යවාදිකා (යවමතී) නම් වේ.

විසම පාදය (අක්ෂර 12)

1	2	3	4	5	6	7	8	9	10	11	12
සා	ය	වා	දි	කා	ම	තී	ර	ජා	ර	ජාත්	ව
∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	–
රගණ			ජගණ			රගණ			ජගණ		

සම පාදය (අක්ෂර 13)

1	2	3	4	5	6	7	8	9	10	11	12	13
ස	මෙ	ස	මෙ	ජ	රා	ජ	රා	ග	රූ	භ	වෙය්	යුං
–	∪	–	∪	–	∪	–	∪	–	∪	–	∪	∪
ජගණ			රගණ			ජගණ			රගණ			ගරු

ඉති වුත්තොදයෙ ඡන්දසි අඩ්ඩසමවුත්තිනිද්දෙසො නාම
චතුත්ථො පරිච්ඡෙදෙ.

වුත්තෝදය ඡන්දස් ග්‍රන්ථයෙහි අඩ්ඩසම වුත්ති නිද්දෙස නම් වූ
හතර වෙනි පරිච්ඡේදය නිමි.

විසමවුත්තිනිද්දෙස - පඤ්චමපරිච්ඡේද

පාද 4 හි ගණ පිහිටීම එකිනෙකට වෙනස් වන බැවින් විසමවුත්ති නම් වේ.

වත්ත ප්‍රභේදය

❖ මෙම වර්ගයේ සියළුම ගාථා අක්ෂර 8 ඒවා බව දත යුතුයි.

118. න'ට්ඨක්ඛරෙසු පාදෙසු, ස්නා'දිම්හා යො'ණ්ණවා වත්තං.

අට්ඨක්ඛරෙසු පාදෙසු = අට්ඨක්ඛර පාදයෙහි; **ආදිම්හා** = ආදියෙහි අක්ෂරයා කෙරෙන් පරව; **ස්නා** = සගණ - නගණයෝ; **න** = නොවෙත් ද; **අණ්ණවා** = අකුරු සතරකින් පරව; **යො** = යගණයක් වේ ද; **වත්තං** = (ඒ වුත්තය) "වත්ත" නම් වේ.

අකුරු 8 බැගින් ඇත්තා වූ පාද 4 හි මුල් අකුරෙන් පසුව සගණ හා නගණය නොයෙදෙයි ද, මුල් අකුරු 4 න් පසුව යගණයක් යෙදෙයි ද, ඒ ගාථාව **වත්ත** ගාථාව නම් වේ.

වත්තති පරිවත්තතීති වත්තං.

පෙරළෙන්නා වූ බැවින් වත්ත නම් වේ.

විසම පාද (පළමු වෙනි හා තුන් වෙනි පාද) අක්ෂර 8

1	2	3	4	5	6	7	8
නට්	ඨක්	ඛ	රෙ	සු	පා	දෙ	සු
∪	∪	–	∪	–	∪	∪	∪
මුලකුර	රගණ			යගණ			ගරු
මුල් අක්ෂර 4							

සම පාද (දෙ වෙනි හා හතර වන පාද) අක්ෂර 8

1	2	3	4	5	6	7	8
ස්නා	දිම්	හා	යොණ්	ණ	වා	වත්	තං
∪	∪	∪	∪	–	∪	∪	∪
මුලකුර	මගණ			යගණ			ගරු
මුල් අක්ෂර 4							

මෙහි ඇති නීති නම්

1. අනිවාර්‍යයෙන්ම අක්ෂර 8 ක් විය යුතුයි.
2. මුල් අකුරෙන් පසුව සගණ හා නගණ නොයෙදිය යුතුයි.
3. මුල් අකුරු 4 න් පසුව යගණයක් යෙදිය යුතුයි.

119. සමෙසු සින්ධුතො ජෙන, පථ්‍යාවත්තං පකිත්තිතං.

සමෙසු = සමපාදයන් හි; **සින්ධුතො** = අකුරු සතරකින් පරව සිටි; **ජෙන** = ජගණය කරණකොට ගෙන; **පථ්‍යාවත්තං** = "පථ්‍යාවත්ත" යැයි; **පකිත්තිතං** = කියන ලදී.

යම් ගාථාවක සමපාදවල අකුරු 4 කින් පසු ජගණයකින් යුක්ත වේ ද, ඒ ගාථාව **පථ්‍යාවත්ත** ගාථාව නම් වේ.

පථ්‍යාව සා වත්තං චාති පථ්‍යාවත්තං.

ඇය පත්‍යාද වන බැවින් හා වත්ත ද වන බැවින් පථ්‍යාවත්ත නම් වේ.

විසම පාද (පළමු වෙනි හා තුන් වෙනි පාද) අක්ෂර 8

1	2	3	4	5	6	7	8
ස	මෙ	සු	සින්	ධු	තො	ජෙ	න
–	∪	–	∪	–	∪	∪	∪
මුලකුර	රගණ			යගණ			ගරු
මුල් අක්ෂර 4							

සම පාද (දෙ වෙනි හා හතර වන පාද) අක්ෂර 8

1	2	3	4	5	6	7	8
පඊ	යා	වත්	තං	ප	කිත්	ති	තං
∪	∪	∪	∪	–	∪	–	∪
මුලකුර	මගණ			ජගණ			ගරු
මුල් අක්ෂර 4							

මෙහි නීති 4 කි.

1. අකුරු අටක් විය යුතුය.
2. මුල් අකුරෙන් පසුව සගණ හෝ නගණ නොතිබිය යුතුය.
3. පළමු වෙනි පාදය හා තුන් වෙනි පාදය වන විසම පාදයන්හි පළ වෙනි අකුරු 4 න් පසුව යගණයක් තිබිය යුතුය.
4. දෙ වෙනි පාදය හා හතර වන පාදය වන සම පාදයන්හි මුල් අකුරු 4 න් පසුව ජගණයක් තිබිය යුතුය.

පථ්‍යාවත්ත ගාථාව මෙසේ විය යුතු යි.

		මුල් අක්ෂර හතරෙහි		
1	විසම පාද	මුල ඇති ගරු හෝ ලහුවෙන් පසු සගණ හෝ නගණ නොයෙදේ	යගණ	ගරු
2	සම පාද	මුල ඇති ගරු හෝ ලහුවෙන් පසු සගණ හෝ නගණ නොයෙදේ	ජගණ	ගරු
3	විසම පාද	මුල ඇති ගරු හෝ ලහුවෙන් පසු සගණ හෝ නගණ නොයෙදේ	යගණ	ගරු
4	සම පාද	මුල ඇති ගරු හෝ ලහුවෙන් පසු සගණ හෝ නගණ නොයෙදේ	ජගණ	ගරු

පථ්‍යාවත්ත ගාථාවට උදාහරණයක් (මෙම ගාථාවන්ට උදාහරණ සුලභ වේ.)

න හි වෙරෙන වෙරානි, සම්මන්තීධ කුදාචනං;
අවෙරෙන ච සම්මන්ති, එස ධම්මො සනන්තනො.

(ධම්මපදය, යමකවග්ග)

න	හි	වෙ	රෙ	න	වෙ	රා	නි
–	–	∪	∪	–	∪	∪	∪
මුලකුර	යගණ			යගණ			ගරු
මුල් අක්ෂර 4							

සම්	මන්	තී	ධ	කු	ද	ච	නං
∪	∪	∪	–	–	∪	–	∪
මුලකුර	තගණ			ජගණ			ගරු
මුල් අක්ෂර 4							

අ	වෙ	රෙ	න	ච	සම්	මන්	ති
–	∪	∪	–	–	∪	∪	∪
මුලකුර	තගණ			යගණ			ගරු
මුල් අක්ෂර 4							

එ	ස	ධම්	මො	ස	නන්	ත	නො
∪	–	∪	∪	–	∪	–	∪
මුලකුර	යගණ			ජගණ			ගරු
මුල් අක්ෂර 4							

120. ඔජෙසු ජෙන සින්ධුතො, ත'මෙව වීපරීතා'දි.

ඔජෙසු = විෂම පාදයන්හි; **සින්ධුතො** = අකුරු සතරකින් පරව සිටි; **ජෙන** = ජගණය කරණකොට ගෙන; **තමෙව** = ඒ "පථ්‍යාවත්තය" ම; **විපරීතාදි** = "විපරීත" යනු ආදි කොට ඇත්තේ වේ; (හෙවත්) "විපරීත පථ්‍යාවත්ත" නම් වේ.

යම් ගාථාවක විසම පාදයේ මුල් අක්ෂර 4 න් පසුව ජගණයක් ඇත්නම් හා සම පාදයන් හි මුල් අක්ෂර 4 න් පසුව යගණයක් ඇත්නම් එම ගාථාව **වීපරීත පථ්‍යාවත්ත** ගාථාව නම් වේ.

විපරීතෙසද්දෙ ආදි යස්සාති විපරීතාදි. විපරීතාදි පථ්‍යාවතං වීපරීතපථ්‍යාවත්තං.

විපරීත ශබ්දය ආදි කොට ඇති බැවින් විපරීතාදි වේ. විපරීතාදි වූ පථ්‍යාවත්තය වීපරීතපථ්‍යාවත්ත නම් වේ.

විසම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
ඔ	ජෙ	සු	ජෙ	න	සින්	ධු	තො
∪	∪	–	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

සම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
ත	මෙ	ව	වී	ප	රී	තා	දී
–	∪	–	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

මෙම විපරීත පථ්‍යාවත්ත ගාථාවට උදාහරණයක් මෙසේ ය.

පරනාමඤ්ච ජානනං, වත්ථුස්සෙකං බලක්කාරෙ;
එකධා සමචාරිකෙ, තස්මිං තප්පටිබන්ධොති.

(කඞ්ඛාවිතරණී පුරාණ ටීකා)

ප	ර	නා	මඤ්ඤ්	ච	ජා	න	නං
–	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

වත්	ථුස්	සෙ	කං	බ	ලක්	කා	රෙ
∪	∪	∪	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

එ	ක	ධා	ස	ම	චා	රි	කෙ
∪	–	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

තස්	මිං	තප්	ප	ටි	බන්	ධො	ති
∪	∪	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

121. න,කාරො වෙ ජලධිතො, චපලාවත්ත'මිච්චෙ'තං.

(විසම පාදයන්හි) **ජලධිතො** = අකුරු සතරකින් පරව; **වෙ** = ඉදින්; **නකාරො** = නගණය වේ ද; **ඉති** = මෙසේ සිටි කල්හි; **එතං** = මේ වුත්තය; **චපලාවත්තං** = "චපලාවත්ත" නම් වේ.

යම් ගාථාවක විසම පාදයේ මුල් අක්ෂර 4 න් පසුව නගණයක් ද, සම පාදයේ මුල් අක්ෂර 4 න් පසුව යගණයක් ද යෙදී තිබේ නම් එම ගාථාව **චපලාවත්ත** ගාථාව නම් වේ.

චුපති එකත්ථ න තිට්ඨතීති චපලො. චපලො අස්සා අත්ථීති චපලා. චපලා ච සා වත්තඤ්චාති චපලාවත්තං.

චලනය වෙයි. සෙලවෙයි. එකතැනක නොසිටියි එබැවින් චපලා නම් වේ. මෙම ගාථාවට සෙලවෙන බව ඇති බැවින් චපලා නම් වේ. චපලය ද වත්තය ද පිහිටන බැවින් චපලාවත්ත නම් වේ.

විසම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
න	කා	රො	වෙ	ජ	ල	ධි	තො
–	∪	∪	∪	–	–	–	∪
මුල් අක්ෂර 4				නගණ			ගරු

සම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
ච	ප	ලා	වත්	ත	මිච්	චෙ	තං
–	–	∪	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

122. සමෙ ලො සත්තමො යස්සා, විපුලා පිඞ්ගලස්ස සා.

යස්සා = යම් වුත්ත ජාතියෙක්හි; **සමෙ** = සම පාදයෙහි; **සත්තමො** = සත් වෙනි වර්ණය තෙම; **ලො** = ලහුවෙක් වේ ද; **පිඞ්ගලස්ස** = පිඞ්ගල මුනිහුගේ මතයෙහි; **සා** = ඕ තොමෝ; **විපුලා** = "විපුලා" නම් වේ.

යම් ගාථාවක සම පාදයේ පමණක් 7 වන අක්ෂරය ලහුවක් වේ නම් එය **පිංගලවිපුලා** නම් වේ.

පිංගලස්ස විපුලා පිංගලවිපුලා.

පිංගල ආචාර්යන් වහන්සේගේ විපුලා ගාථාව පිංගලවිපුලා නම් වේ.

විසම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
ස	මෙ	ලො	සත්	ත	මො	යස්	සා
–	–	∪	∪	–	∪	∪	∪

සම පාද (අක්ෂර 8)

1	2	3	4	5	6	7	8
වි	පු	ලා	පිං	ග	ලස්	ස	සා
–	–	∪	∪	–	∪	–	∪
						ලහු	

මෙම පිංගල විපුලා ගාථාවට උදාහරණයක් මේසේ ය.

උත්තමං වන්දනෙය්‍යානං, වන්දිත්වා රතනත්තයං;
බුද්දකානං කරිස්සාමි, කෙසඤ්ච් අත්ථවණ්ණනං.

(සුත්තපිටක, බුද්දකපාඨ අට්ඨකථා)

උත්	ත	මං	වන්	ද	නෙය්	යා	නං
∪	–	∪	∪	–	∪	∪	∪

වන්	දිත්	වා	ර	ත	නත්	ත	යං
–	∪	∪	–	–	∪	–	∪
						ලහු	

බුද්	ද	කා	නං	ක	රිස්	සා	මි
∪	–	∪	∪	–	∪	∪	∪

කෙ	සඤ්	චි	අත්	ථ	වණ්	ණ	නං
∪	∪	–	∪	–	∪	–	∪
						ලහු	

❖ මෙහි එන 2 වන පාදයේ සහ 4 වන පාදයේ 7 වන අක්ෂරය ලහු කිරීම පිණිස පළමු වෙනි අක්ෂර 4 න් පසුව නගණ, භගන, ජගන, තගන යන ගණ 4 න් එකක් යොදනු ලැබේ. එසේ එම ගණ 4 න් කුමන ගණයක් හෝ යෙදීමෙන් දෙ වෙනි හා හතර වන පාදයේ 7 වන අක්ෂරය ලහු වන්නේ නම් එම ගාථාව පිංගලවිපුලා නම් වේ.

123. **සෙතවස්සා'ඛිලෙසුපි**[51].

සෙතවස්ස = සේතව මුනිහුගේ මතයෙහි; **අඛිලෙසු** + **අපි** = සියලු පාදයන්හි ම; (**සත්තමො** = සත්වන වර්ණය තෙම; **ලො** = ලහුවෙක් වී නම්; **විපුලා** = "විපුලා" යැයි දන්නා ලදී.)

යම් ගාථාවක සියළුම පාදයන් හි 7 වන අක්ෂරය ලහු වේ නම් එම ගාථාව **සේතවවිපුලා** ගාථාව නම් වේ.

සෙතවස්ස විපුලා සෙතවවිපුලා.

[51] අන්ත ගරු ලෙස ගෙන ඇත.

සේතව ආචාර්යයන් වහන්සේගේ ගාථාව සේතවවිපුලා නම් වේ.

1	2	3	4	5	6	7	8
සෙ	ත	වස්	සා	බි	ලෙ	සු	පි
∪	–	∪	∪	–	∪	–	∪
						ලහු	

❖ මෙහි එන පාද හතරෙහි ම 7 වන අක්ෂරය ලහු වීමට පළමු වෙනි අක්ෂර 4 න් පසුව නගණ, භගන, ජගන, තගන යන ගණ 4 න් එකක් පැමිණීමෙන් සිදු වේ. එසේ එම ගණ 4 න් කුමන ගණයක් හෝ යෙදීමෙන් පාද 4 හි ම 7 වන අක්ෂරය ලහු වන්නේ නම් එම ගාථාව සේතවවිපුලා නම් වේ.

124. **හෙන'ණ්ණවා භ'බ්බිපුලා.**

(සියළු පාදයන්හි ම) **අණ්ණවා** = සතරකින් පරව සිටි; **හෙන** = භගණය කරණකොට ගෙන; **භබ්භිපුලා** = ඒ භකාරයෙන් පර වූ විපුලා නම්; ("භවිපුලා" යයි සේසි)

යම් ගාථාවක පාදයන් හි මුල් අක්ෂර 4 න් පසුව භගණයක් යෙදේ නම් එම ගාථාව **භකාරවිපුලා** නම් වේ.

භකාරෙන උපලක්ඛිතා විපුලා භබ්විපුලා.
භගණයෙන් උපලක්ෂිත වූ ගාථාව භබ්විපුලා (භකාරවිපුලා) නම් වේ.

1	2	3	4	5	6	7	8
හෙ	නණ්	ණ	වා	භබ්	බි	පු	ලා
∪	∪	–	∪	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

❖ පළ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **පඨම භකාරවිපුලා** නම් වේ.
❖ දෙ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **දුතිය භකාරවිපුලා** නම් වේ.
❖ තුන් වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **තතිය භකාරවිපුලා** නම් වේ.
❖ හතර වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **චතුත්ථ භකාරවිපුලා** නම් වේ.
❖ පාද 4 හිම මුලකුරු 4 න් පසුව භගණය යෙදේ නම් **සේතවභකාරවිපුලා** නම් වේ.
❖ පළමු වෙනි හා තුන් වෙනි යන විසම පාදයන්ගේ පමණක් මුලකුරු 4න් පසුව භගණය යෙදේ නම් එය **පිංගලභකාරවිපුලා** නම් වේ.

පාද හතරෙහි ම භගණය පිහිටන **සේතවභකාරවිපුලා** ගාථාව හැර අන් ගාථාවල ඉතිරි පාදයන් **පථ්‍යාවත්ත** ගාථාවට අනුව විය යුතුය.

උදා 1 :- පඨම භකාරවිපුලා ගාථාව මුල් අක්ෂර 4 න් පරව යෙදෙන ගණ භ, ජ, ය, ජ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු

උදා 2 :- දුතිය භකාරවිපුලා ගාථාව ය, භ, ය, ජ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු

උදා 3 :- තතිය භකාරවිපුලා ගාථාව ය, ජ, භ, ජ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු

උදා 4 :- චතුත්ථ භකාරවිපුලා ගාථාව ය, ජ, ය, භ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	යගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු

උදා 5 :- සේතවභකාරවිපුලා ගාථාව භ, භ, භ, භ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු

උදා 5 :- පිංගලභකාරවිපුලා ගාථාව භ, ජ, භ, ජ කියා වේ.

මුල් අක්ෂර හතර			
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	භගණ	ගරු
මුලකුර ගරු/ලහු	ස්නාදිම්හා (ස, නගණ හැර අන් ගණයක්)	ජගණ	ගරු

❖ ඉදිරියෙහි කියවෙන රකාර විපුලාදියද මේ අයුරින් ම දත යුතුය.

පඨම භකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

නිධි වා ඨානා චවති, සඤ්ඤු වාස්ස විමුය්හති;
නාගා වා අපනාමෙන්ති, යක්ඛා වාපි හරන්ති නං.

(බුද්දකපාඨපාළි, නිධිකණ්ඩසුත්තං)

නි	ධි	වා	ඨා	නා	ච	ච	ති
–	–	∪	∪	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

සඤ්ඤ	ඤු	වාස්	ස	වි	මුය්	හ	ති
∪	∪	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

නා	ගා	වා	අ	ප	නා	මෙන්	ති
∪	∪	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

යක්	ඛා	වා	පි	හ	රන්	ති	නං
∪	∪	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

තතිය භකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

පත්ථාරෙ සබ්බගෙ පාදෙ, පුබ්බගා'ධො ල්ප'රෙ සමා;
පුබ්බෙ ගරු තෙ ච මිමෙ, කත්තබ්බා යාව සබ්බලා.

(වුත්තෝදය - ගාථා අංක 129)

පත්	ථා	රෙ	සබ්	බ	ගෙ	පා	දෙ
∪	∪	∪	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

පුබ්	බ	ගා	ධොල්	ප	රෙ	ස	මා
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පුබ්	බෙ	ග	රු	තෙ	ච	මි	මෙ
∪	∪	–	–	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

කත්	තබ්	බා	යා	ව	සබ්	බ	ලා
∪	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පිංගලභකාරවිපුලා ගාථාවකට උදාහරණයක් මෙසේ ය.

පරත්ථ සම්පාදනතො, පුඤ්ඤෙනා'ධිගතෙන'හං;
පරත්ථ සම්පාදනකො, භවෙයාං ජාති ජාතියං.

(වුත්තෝදය - ගාථා අංක 136)

ප	රත්	ථ	සම්	පා	ද	න	තො
–	∪	–	∪	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

පුඤ්	ඤෙ	නා	ධි	ග	තෙ	න	හං
∪	∪	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

ප	රත්	ථ	සම්	පා	ද	න	කො
–	∪	–	∪	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

භ	වෙය්	යං	ජා	ති	ජා	ති	යං
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

125. **එව'මඤ්ඤු රො චතුත්ථා.**

එවං = මෙසේ; (මේ භවිපුලාවෙහි මෙන්) **චතුත්ථා** = හතර වෙනි අක්ෂරයෙන් පරව; **රො** = රගණය වී නම්; **අඤ්ඤු** = අන්‍ය වූ "රවිපුලා" නම් වේ.

යම් ගාථාවක පාදයන් හි මුල් අක්ෂර 4 න් පසුව රගණයක් යෙදේනම් එම ගාථාව **රකාරවිපුලා** නම් වේ.

රකාරෙන උපලක්ඛිතා විපුලා රකාරවිපුලා.

රගණයෙන් උපලක්ෂිත වූ ගාථාව රකාරවිපුලා නම් වේ.

1	2	3	4	5	6	7	8
එ	ව	මඤ්ඤ	ඤු	රො	ච	තුත්	ථා
∪	–	∪	∪	∪	–	∪	∪
මුල් අක්ෂර 4				රගණ			ගරු

- ❖ පළ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **පඨම රකාරවිපුලා** නම් වේ.
- ❖ දෙ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **දුතිය රකාරවිපුලා** නම් වේ.
- ❖ තුන් වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **තතිය රකාරවිපුලා** නම් වේ.
- ❖ හතර වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **චතුත්ථ රකාරවිපුලා** නම් වේ.
- ❖ පාද 4 හිම මුලකුරු 4 න් පසුව රගණය යෙදේ නම් **සේතවරකාරවිපුලා** නම් වේ.
- ❖ පළමු වෙනි හා තුන් වෙනි යන විසම පාදයන්ගේ පමණක් මුලකුරු 4න් පසුව රගණය යෙදේ නම් එය **පිංගලරකාරවිපුලා** නම් වේ.

මෙහි සඳහන් පඨම රකාරවිපුලා ගාථාවට උදාහරණයක් නම්:-

සා මාගධී මූලභාසා, නරා යායාදිකප්පිකා;
බ්‍රහ්මානො ච'ස්සුතාලාපා, සම්බුද්ධා චාපි භාසරෙ.

(පදරූපසිද්ධි)

සා	මා	ග	ධී	මූ	ල	භා	සා
∪	∪	–	∪	∪	–	∪	∪
මුල් අක්ෂර 4				රගණ			ගරු

න	රා	යා	යා	දි	කප්	පි	කා
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

බ්‍රහ්	මා	නො	චස්	සු	තා	ලා	පා
∪	∪	∪	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

සම්	බුද්	ධා	චා	පි	භා	ස	රෙ
∪	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

මෙහි සඳහන් තතිය රකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

මහාකාරුණිකං නාථං, අභිනත්වා සමාසතො;
පාචිත්‍යාදිවණ්ණනාය, කරිස්සාමත්ථයොජනං.

(පාචිත්‍යාදියොජනාපාළි)

ම	හා	කා	රු	ණි	කං	නා	ථං
–	∪	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

අ	භි	නත්	වා	ස	මා	ස	තො
–	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පා	චිත්	යා	දි	වණ්	ණ	නා	ය
–	∪	∪	∪	∪	–	∪	∪
මුල් අක්ෂර 4				රගණ			ගරු

ක	රිස්	සා	මත්	ථ	යො	ජ	නං
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

126. **නො'ණ්ණවා වෙ නවිපුලා.**

වෙ = ඉදින්; **අණ්ණවා** = අකුරු සතරකින් පරව; **නො** = නගණය වේ ද; (එකල්හි ඒ වුත්තය) **නවිපුලා** = "**නවිපුලා**" නම් වේ.

යම් ගාථාවක පාදයන් හි මුල් අක්ෂර 4 න් පසුව නගණයක් යෙදේනම් එම ගාථාව **නකාරවිපුලා** නම් වේ.

නකාරෙන උපලක්ඛිතා විපුලා නකාරවිපුලා.

නගණයෙන් උපලක්ෂිත වූ ගාථාව නකාරවිපුලා නම් වේ.

1	2	3	4	5	6	7	8
නොණ්	ණ	වා	වෙ	න	වි	පු	ලා
∪	–	∪	∪	–	–	–	∪
මුල් අක්ෂර 4				නගණ			ගරු

- ❖ පළ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **පඨම නකාරවිපුලා** නම් වේ.
- ❖ දෙ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **දුතිය නකාරවිපුලා** නම් වේ.
- ❖ තුන් වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **තතිය නකාරවිපුලා** නම් වේ.
- ❖ හතර වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **චතුත්ථ නකාරවිපුලා** නම් වේ.
- ❖ පාද 4 හිම මුලකුරු 4 න් පසුව නගණය යෙදේ නම් **සේතවනකාරවිපුලා** නම් වේ.
- ❖ පළමු වෙනි හා තුන් වෙනි යන විසම පාදයන්ගේ පමණක් මුලකුරු 4න් පසුව නගණය යෙදේ නම් එය **පිංගලනකාරවිපුලා** නම් වේ.

මෙහි එන පඨම නකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

සාකුන්තිකොව සකුණිං, යථා බන්ධිතුමිච්ඡති;
ආහරිමෙන රූපෙන, න මං ත්වං බාධයිස්සසි.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 281)

සා	කුන්	ති	කො	ව	ස	කු	ණිං
∪	∪	–	∪	–	–	–	∪
මුල් අක්ෂර 4				නගණ			ගරු

ය	ථා	බන්	ධි	තු	මිච්	ඡ	ති
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

ආ	හ	රි	මෙ	න	රූ	පෙ	න
∪	–	–	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

න	මංත්	වං	බා	ධ	යිස්	ස	සි
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

මෙහි එන තතිය නකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

නම'ත්ථු ජන සන්තාන, තම සන්තාන භෙදිනො;
ධම්මු'ජ්ජලන්ත රුචිනො, මුනින්දෙ'දත රොචිනො.

(වුත්තෝදය - ගාථා අංක 1)

න	මත්	ථු	ජ	න	සන්	තා	න
–	∪	–	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

ත	ම	සන්	තා	න	භෙ	දි	නො
–	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

ධම්	මුජ්	ජ	ලන්	ත	රු	චි	නො
∪	∪	–	∪	–	–	–	∪
මුල් අක්ෂර 4				නගණ			ගරු

මු	නින්	දෙ	ද	ත	රො	චි	නො
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

127. **තො'ණ්ණවා තථා'ඤ්ඤු සියා.**

තථා = එපරිද්දෙන්; **අණ්ණවා** = සතරකින් පරව; **තො** = තගණය වී නම්; **අඤ්ඤු සියා** = අන්‍ය වූ "තවිපුලා" නම් වන්නී ය.

යම් ගාථාවක පාදයන් හි මුල් අක්ෂර 4 න් පසුව තගණයක් යෙදේනම් එම ගාථාව **තකාරවිපුලා** නම් වේ.

තකාරෙන උපලක්ඛිතා විපුලා තකාරවිපුලා.
තගණයෙන් උපලක්ෂිත වූ ගාථාව තකාරවිපුලා නම් වේ.

1	2	3	4	5	6	7	8
තොණ්	ණ	වා	ත	ථාඤ්	ඤු	සි	යා
∪	–	∪	–	∪	∪	–	∪
මුල් අක්ෂර 4				තගණ			ගරු

- ❖ පළවෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **පඨම තකාරවිපුලා** නම් වේ.
- ❖ දෙ වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **දුතිය තකාරවිපුලා** නම් වේ.
- ❖ තුන් වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **තතිය තකාරවිපුලා** නම් වේ.
- ❖ හතර වෙනි පාදයේ පමණක් මේ ලක්ෂණය ඇත්නම් එය **චතුත්ථ තකාරවිපුලා** නම් වේ.
- ❖ පාද 4 හි ම මුලකුරු 4 න් පසුව තගණය යෙදේ නම් **සේතවතකාරවිපුලා** නම් වේ.
- ❖ පළමු වෙනි හා තුන් වෙනි යන විසම පාදයන්ගේ පමණක් මුලකුරු 4න් පසුව තගණය යෙදේ නම් එය **පිංගලතකාරවිපුලා** නම් වේ.

වුත්තෝදය පාළියෙහි නොකීව ද මේ අයුරින්ම පළමු අකුරු 4 න් පසු මගණ, සගණ, ජගණ යෙදෙන මකාර විපුලා, සකාර විපුලා හා ජකාර විපුලා ගාථා ද ඇති බව දත යුතු ය. මෙසේ යගණය හැර අන් ගණ 7 න් ම විපුලා ගාථා තිබෙන අතර වත්ත ගාථාව සම වන බැවින් යකාරවිපුලා කියා වෙනම ගාථාවන් නැත.

පඨම මකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය, ද්වීහි කම්මං පයොජයෙ;
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය, ආපදසු භවිස්සතී.

(දීඝ නිකාය, පාථිකවග්ගපාළි, සිඞ්ගාලසුත්තං)

එ	කෙ	න	භො	ගෙ	භුඤ්ජ්	ජෙය්	ය
∪	∪	∪	∪	∪	∪	∪	∪
මුල් අක්ෂර 4			මගණ				ගරු

ද්වී	හි	කම්	මං	ප	යො	ජ	යෙ
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4			ජගණ				ගරු

ච	තුත්	ථං	ච	නි	ධා	පෙය්	ය
–	∪	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4			යගණ				ගරු

ආ	ප	ද	සු	භ	විස්	ස	ති
∪	–	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4			ජගණ				ගරු

සේතවමකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

සාසනං පග්ගණ්හන්තානං, රාජූනං සහායො අස්සං;
සාසනං නිග්ගණ්හන්තානං, චාරෙතුං සමත්ථො අස්සං.

(විනයාලඞ්කාර ටීකා)

සා	ස	නං	පග්	ගණ්	හන්	තා	නං
∪	–	∪	∪	∪	∪	∪	∪
මුල් අක්ෂර 4			මගණ				ගරු

රා	ජූ	නං	ස	හා	යො	අස්	සං
∪	∪	∪	–	∪	∪	∪	∪
මුල් අක්ෂර 4			මගණ				ගරු

සා	ස	නං	නිග්	ගණ්	හන්	තා	නං
∪	–	∪	∪	∪	∪	∪	∪
මුල් අක්ෂර 4				මගණ			ගරු

වා	රෙ	තු	ස	මත්	ථො	අස්	සං
∪	∪	–	–	∪	∪	∪	∪
මුල් අක්ෂර 4				මගණ			ගරු

පිංගලමකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

ඡින්නං ධුතඞ්ගං සාසඞ්ක, සම්මතො සන්තරුත්තරං;
අචීවරස්සානාපත්ති, පච්චුද්ධාරාදිසිද්ධිතො.

(වජිරබුද්ධි ටීකා/ කඞ්ඛාවිතරණී පුරාණ ටීකා)

ඡින්	නං	ධු	තඞ්	ගං	සා	සඞ්	ක
∪	∪	–	∪	∪	∪	∪	∪
මුල් අක්ෂර 4				මගණ			ගරු

සම්	ම	තො	සන්	ත	රුත්	ත	රං
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

අ	චී	ව	රස්	සා	නා	පත්	ති
–	∪	–	∪	∪	∪	∪	∪
මුල් අක්ෂර 4				මගණ			ගරු

පච්	චුද්	ධා	රා	දි	සිද්	ධි	තො
∪	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පඨම සකාරවිපුලා ගාථාවකට උදාහරණයක් මෙසේ ය.

දූරඞ්ගමා සතිමන්තො, මන්තභාණී අනුද්ධතා;
දුක්ඛස්සන්තං පජානන්ති, තෙන මෙ සමණා පියා.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 281)

දූ	රඞ්	ග	මා	ස	ති	මන්	තො
∪	∪	–	∪	–	–	∪	∪
මුල් අක්ෂර 4				සගණ			ගරු

මත්	ත	භා	ණී	අ	නුද්	ධ	තා
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

දුක්	ඛස්	සන්	තං	ප	ජා	නන්	ති
∪	∪	∪	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

තෙ	න	මෙ	ස	ම	ණා	පි	යා
∪	–	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

තතිය සකාරවිපුලා ගාථාවකට උදාහරණයක් මෙසේ ය.

චෙතියම්හි ච සඞ්ඝෙ වා, පුග්ගලෙ අතිථීසු වා;
මාතරි පිතරි චාපි, අථො ජෙට්ඨම්හි භාතරි.

(බුද්දකපාඨපාළි, නිධිකණ්ඩසුත්තං)

චෙ	ති	යම්	හි	ච	සඞ්	ඝෙ	වා
∪	–	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

පුග්	ග	ලෙ	අ	ති	ථී	සු	වා
∪	–	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

මා	ත	රි	පි	ත	රි	චා	පි
∪	–	–	–	–	–	∪	∪
මුල් අක්ෂර 4				සගණ			ගරු

අ	ථො	ජෙට්	ඨම්	හි	භා	ත	රි
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පිංගලසකාරවිපුලා ගාථාවකට උදාහරණයක් මෙසේ ය.

කායකම්මං සුචි නෙසං, වචීකම්මඤ්ච තාදිසං;
මනොකම්මං සුචි නෙසං, තෙන මෙ සමණා පියා.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 277)

කා	ය	කම්	මං	සු	චි	නෙ	සං
∪	–	∪	∪	–	–	∪	∪
මුල් අක්ෂර 4				සගණ			ගරු

ව	චී	කම්	මඤ්ඤ්	ච	තා	දි	සං
–	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

ම	නො	කම්	මං	සු	චි	නෙ	සං
–	∪	∪	∪	–	–	∪	∪
මුල් අක්ෂර 4				සගණ			ගරු

තෙ	න	මෙ	ස	ම	ණා	පි	යා
∪	–	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

පඨම ජකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

බන්තී ච සොවචස්සතා, සමණානඤ්ච දස්සනං;
කාලෙන ධම්මසාකච්ඡා, එතං මඞ්ගලමුත්තමං.

(බුද්දක නිකාය, බුද්දකපාඨපාළි, මංගල සුත්තං)

බන්	තී	ච	සො	ව	චස්	ස	තා
∪	∪	–	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

ස	ම	ණා	නඤ්ඤ්	ච	දස්	ස	නං
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

කා	ලෙ	න	ධම්	ම	සා	කච්	ඡා
∪	∪	–	∪	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

එ	තං	මඞ්	ග	ල	මුත්	ත	මං
∪	∪	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

තතිය ජකාරවිපුලා ගාථාවට උදාහරණයක් මෙසේ ය.

එහි කාළ නිවත්තස්සු, භුඤ්ජ කාමෙ යථා පුරෙ;
අහඤ්ච තෙ වසීකතා, යෙ ච මෙ සන්ති ඤාතකා.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 296)

එ	හි	කා	ළ	නි	වත්	තස්	සු
∪	–	∪	–	–	∪	∪	∪
මුල් අක්ෂර 4				යගණ			ගරු

භුඤ්ජ්	ජ	කා	මෙ	ය	ථා	පු	රෙ
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

අ	හඤ්ඤ්	ච	තෙ	ව	සී	ක	තා
∪	∪	–	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

යෙ	ච	මෙ	සන්	ති	ඤා	ත	කා
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

❖ මෙම විපුලා ගාථාවන් මිශ්‍ර වී සෑදුන ගාථාව **සංකිණ්ණවිපුලා** නම් වේ.

සංකිණ්ණවිපුලා ගාථාවකට උදාහරණයක් නම්

සුභාසිතං සුලපිතං, "සාධු සාධූ"ති තාදිනො;
අනුමොදමානා සිරසා, සම්පටිච්ඡිංසු භික්ඛවො.

(සීලක්ඛන්ධවග්ග අට්ඨකථා)

සු	භා	සි	තං	සු	ල	පි	තං
–	∪	–	∪	–	–	–	∪
මුල් අක්ෂර 4				නගණ			ගරු

සා	ධු	සා	ධූ	ති	තා	දි	නො
∪	–	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

අනු[52]	මො	ද	මා	නා	සි	ර	සා
∪	∪	∪	–	–	–	∪	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

සම්	ප	ටිච්	ඡිං	සු	භික්	ඛ	වො
∪	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

මෙම ගාථාව පඨම නකාරවිපුලා හා තතිය භකාරවිපුලා මිශ්‍ර වීමෙන් සෑදී ඇත.

මෙම සංකිණ්ණවිපුලා ගාථාවකට තවත් උදාහරණයක් නම්

නෙතං අස්ස පතිරූපං, ආකිඤ්චඤ්ඤඤ්හි පත්ථයෙ;
යො ජාතරූපං රජතං, ඡඩ්ඩෙත්වා පුනරාගමෙ.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 343)

නෙ	සං	අස්	ස	ප	ති	රූ	පං
∪	∪	∪	–	–	–	∪	∪
මුල් අක්ෂර 4				සගණ			ගරු

ආ	කිඤ්	චඤ්	ඤඤ්	හි	පත්	ථ	යෙ
∪	∪	∪	∪	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

යො	ජා	ත	රූ	පං	ර	ජ	තං
∪	∪	–	∪	∪	–	–	∪
මුල් අක්ෂර 4				භගණ			ගරු

ඡඩ්	ඩෙත්	වා	පු	න	රා	ග	මෙ
∪	∪	∪	–	–	∪	–	∪
මුල් අක්ෂර 4				ජගණ			ගරු

මෙම ගාථාව පඨමසකාර විපුලා හා තතිය භකාරවිපුලා ගාථාවන් මිශ්‍ර වීමෙන් සෑදී ඇත. එසේ මිශ්‍ර වීමෙන් සෑදුන ගාථා සංකිණ්ණ විපුලා නම් වේ.

❖ නැවත අවධාරණය කළයුතු කරුණක් නම් අට්ඨක්ඛර ගාථා වන මෙම විපුලා ගාථාවන්හි සෑම විටම මුල් අක්ෂර හතර ඇතුලත පථ්‍යාවත්ත ගාථා ලක්ෂණය තිබිය යුතු ය. එනම් පළමු අක්ෂරයෙන් පසුව සගණ හෝ නගණ නො යෙදීම යි.

128. **නදිස්සතෙ'ත්ථ යං ඡන්දං, පයොගෙ දිස්සතෙ යදි;**
විසම'ක්ඛරපාදං තං, ගාථා සාමඤ්ඤනාමතො[53].

එත්ථ = මේ "වුත්තෝදය" නම් මාගධ ඡන්දස්ශාස්ත්‍රයෙහි; **යං ඡන්දං** = යම් ඡන්දසෙක්; **න දිස්සතෙ** = නොදක්නා ලැබේ ද; **යදි** = ඉදින්; **පයොගෙ** = ත්‍රිපිටකයෙහි; **දිස්සතෙ** = දක්නා ලැබේ ද; **විසමක්ඛරපාදං** = විසම වූ අක්ෂර හා පාද ඇති; **තං** = ඒ ඡන්දස; **සාමඤ්ඤනාමතො** = සාමාන්‍ය නාමයෙන්; **ගාථා** = "ගාථා" නම් වන්නී ය.

විසම වූ අක්ෂර, විසම වූ පාද ඇති යම් ඡන්දසක් (ගාථාවක්) මේ වුත්තෝදය ග්‍රන්ථයෙහි දක්නට නොලැබේ ද, නමුත් ප්‍රයෝගයෙහි හෙවත් ත්‍රිපිටකයෙහි දක්නට ලැබේ ද, එම ඡන්දස (ගාථාව) "ගාථා" යන සාමාන්‍ය නමින් ම දත යුතු ය. "සාමඤ්ඤගාථා" යන නමින් ව්‍යාවහාර කළ යුතු ය.

මෙහි දී ඡන්දස් ශාස්ත්‍රයෙහි එන ගරු, ලහු නියමයන් නොපැවතීම විසම වූ අක්ෂර ඇත්තේ යැයි කියනු ලැබේ. අට්ඨක්ඛර පාද, නක්ඛර පාද ආදී වූ පාදනියමයන් නොපැවතීම විසම වූ පාද ඇත්තේ යැයි කියනු ලැබේ. ප්‍රයෝග-යන්නෙන් ත්‍රිපිටකාගත බුද්ධ වචනයන් පමණක් නොව අනෙකුත් ප්‍රාඥයන් විසින්

[52] අනු අක්ෂර දෙකම එකක් කොට ගරු අක්ෂරයක් ලෙස යොදා ඇත.
[53] මෙම ගාථාවේ ගරු ලහු භේදය ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත.

රචිත ගාථාබන්ධයන් ද ගත යුතු ය. ඡන්දනුරක්ඛණය පිණිස එම බුද්ධ වචනාදිය වෙනස් නො කළ යුත්තේ ය. ඡන්දසෙහි දක්නට නොලැබෙන එවැනි ගාථා සාමඤ්ඤගාථා යන නමින් ව්‍යවහාර කළ යුත්තේ ය-යනු මෙහි අදහස යි.

ත්‍රිපිටකයෙහි එන සාමඤ්ඤ ගාථාවකට උදාහරණයක් මෙසේ ය.

අහුම්හ පුබ්බෙ ගණිනො, අස්සමණා සමණමානිනො;
ගාමෙන ගාමං විචරිම්හ, නගරෙ රාජධානියො.

(බුද්දක නිකාය, ථෙරීගාථාපාළි, 306)

1	2	3	4	5	6	7	8
අ	හුම්	හ	පුබ්	බෙ	ග	ණි	නො
–	∪	–	∪	∪	–	–	∪

1	2	3	4	5	6	7	8	9	10
අස්	ස	ම	ණා	ස	ම	ණ	මා	නි	නො
∪	–	–	∪	–	–	–	∪	–	∪

1	2	3	4	5	6	7	8	9
ගා	මෙ	න	ගා	මං	වි	ච	රිම්	හ
∪	∪	–	∪	∪	–	–	∪	∪

1	2	3	4	5	6	7	8
න	ග	රෙ	රා	ජ	ධා	නි	යො
–	–	∪	∪	–	∪	–	∪

ඉති වුත්තොදයෙ ඡන්දසි විසමවුත්ති නිද්දෙසො නාම
පඤ්චමො පරිච්ඡෙදො.

වුත්තෝදය ඡන්දස් ග්‍රන්ථයෙහි විසමවුත්ති නිද්දෙස නම් වූ
පස්වන පරිච්ඡේදය නිමි.

ජප්පච්චයවිභාග - ජට්ඨපරිච්ඡේද

පත්ථාරනය[54]

මෙම වුත්තෝදය ග්‍රන්ථයෙහි ඒ ඒ ඡන්දස යටතේ දී ඇත්තේ සුළු වුත්ත ප්‍රමාණයකි. නමුත් ලහු ගරු මාරු කර යෙදීමෙන් බොහෝ සේ ගාථාවන් සෑදිය හැක. එසේ සෑදිය හැකි ගාථාවන්ගේ විකල්ප ගණන සහ විකල්පයන්ගේ ගරු ලහු යෙදී ඇති ආකාරය පෙන්වීමට මෙම ප්‍රස්තාර නය උපකාර වේ.

129. **පත්ථාරෙ සබ්බගෙ පාදෙ, පුබ්බගා'ධො ල්ප'රෙ සමා;**
පුබ්බෙ ගරු තෙ ච මිමෙ, කත්තබ්බා යාව සබ්බලා.

පත්ථාරෙ = ප්‍රස්තාරයෙහි හෙවත් ප්‍රස්තාරය කළ යුතු කල්හි; **සබ්බගෙ පාදෙ** = සර්ව ගරු පාදයෙහි; **පුබ්බගා** = පූර්වයෙහි ගරුහු කෙරෙන්; **අධො** = යට; **ල්** = ලහුවෙක් වෙයි; **පරෙ** = අන්‍යයෝ; **සමා** = (උඩ වුත්තයට) සම වූවාහු වෙති; **පුබ්බෙ** = පූර්වයෙහි; **ගරු** = (ඌන ස්ථානයෙහි) ගරුවෙක් වෙයි; **ඉති** = මෙසේ කටයුත්තේ ය; **එවං** = මෙසේ උක්තප්‍රකාරයෙන්; **ඉමෙ** = මේ ත්‍රිවිධ විධීහු; **යාව** = යම්තාක්; **සබ්බලො** = සර්ව ලහු පාදය වේ ද; (**තාව** = ඒතාක්) **කත්තබ්බා** = කටයුත්තාහු ය.

යම් වුත්තයකින් ප්‍රස්තාරයක් හද ගත යුතු නම් පළමු ව සර්ව ගරු වලින් පටන් ගත යුතු ය. සම්පූර්ණයෙන් ගරු සහිත එම පළමු පේළියට යටින් දෙ වෙනි පේළිය ලියන විට පළමු පේළියේ හමුවන පළමු ගරුවට යටින් ලහුවක් ලියා ඇරඹිය යුතු ය. එම ලහුවට පසු ඒවා ඉහළ (පළමු) පේළියේ ඇති පරිදි (ලහු ගරු සමානව) ම ලිවිය යුතු ය. තුන් වෙනි පේළිය ආදියෙහි දී පළමු ව ලියන ලහුවට පූර්වයෙහි ඇති හිස්තැන්වල ඉහළ පේළියේ ගරු ද ලහු ද යන්න නොසළකා ගරු ම ලිවිය යුතු ය. අවසානයේ සර්ව ලහු වන තෙක් ඇඳ අවසන් කළ යුතු ය.

සර්ව ගරු ඇඳ ආරම්භ කරන මෙම ප්‍රස්තාර ක්‍රමයේ දෙ වෙනි පේළියේ පටන් ඇති පෙළි සඳහා ඊට පෙර ඇති පේළිය බලා ඒ අනුව ඇඳිය යුතු අතර එහිදී සැළකිය යුතු ප්‍රධාන නීති තුනකි.

1. දෙ වෙනි පේළියේ පටන් ඇති පේළි වළදී ඊට පෙර ඇති පේළියේ හමුවන පළමුවැනි ගරුව යටින් ලහුවක් ඇඳිය යුතු ය.
2. ඉන් පසු ඇති මාත්‍රා ස්ථාන සඳහා ඊට කලින් පේළියේ මාත්‍රා ස්ථානවල ඇති මාත්‍රාවලට (ගරු හෝ ලහු) සමානව ඇඳිය යුතු ය.
3. අළුත් පේළියේ පළමු ව අඳින ලහුවට පෙර ඇති මාත්‍රා ස්ථාන සඳහා ගරුම ඇඳය යුතු යි.

අවසානයේ සර්ව ලහුවෙන තෙක් මෙම නීති තුන අනුගමනය කළ යුතු යි.

සමපාද ගාථාවන්ගේ පත්ථාරනය.

උදා:- මාත්‍රා 3 ගාථාවක සටහන

	1	2	3	
1	∪	∪	∪	පළමු ව සර්ව ගරු වලින් පටන් ගත යුතුය.
2	–	∪	∪	පළමු වෙනි ගරු යටින් ලහු ලකුණු කළ යුතුයි. පසුව 2 හා 3 ඉහත යෙදූ ආකාරයෙන් ම යෙදිය යුතුයි.
3	∪	–	∪	මෙහි 2 පේළියේ පළමු වෙනි ගරු යටින් ලහු යොදා පසුව ඇති සඤ්ඤ ඒ ආකාරයෙන්ම යෙදිය යුතුයි. හැම විටම පළමු ව අඳින ලහු වලට පළමු ව ඇති ඒවා ගරුම යෙදිය යුතු යි.
4	–	–	∪	තුනවන පේළියේ පළමු ගරු යටින් ලහු යොදා ඉතිරිය පෙර ලෙසම යෙදිය යුතුය.
5	∪	∪	–	4 වන පේළියේ අවසාන ගරු යටින් ලහු යොදා පෙර ඒවා ගරු යෙදිය යුතුය.
6	–	∪	–	5 වන පේළියේ පළමු ගරු යටින් ලහු යොදා පසු ඒවා කලින් සේම ඇඳිය යුතුය.
7	∪	–	–	කලින් සේම ලහු යොදා පෙර ගරු ලෙසත් පසු ඒවා පෙර සේමත් ඇඳිය යුතුය.
8	–	–	–	මේ ආකාරයෙන් අවසානයේ සර්ව ලහු වන තෙක් ඇඳිය යුතුය.

[54] මෙම සයවන පරිච්ඡේදයේ එන ගාථාවන්ගේ ගරු ලහු ස්වරූපය ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත.

මෙසේ අකුරු 3 ක් ඇති මජ්ඣා ඡන්දසෙහි ගාථා 8 ක් තිබිය හැකි බව ද, ඒ ගාථාවල ගරු ලහු යෙදෙන හැටිද ප්‍රස්තාර නය දිග හැරීමෙන් දත හැකි ය.

මාත්‍රා 4 ක් ඇති ඡන්දසකට උදහරණයක්:- සර්ව ගරු වලින් ආරම්භ කළ යුතු ය. සර්ව ලහු වෙන තෙක් ඇඳ අවසන් කළ යුතු ය.

1	∪	∪	∪	∪
2	–	∪	∪	∪
3	∪	–	∪	∪
4	–	–	∪	∪
5	∪	∪	–	∪
6	–	∪	–	∪
7	∪	–	–	∪
8	–	–	–	∪

9	∪	∪	∪	–
10	–	∪	∪	–
11	∪	–	∪	–
12	–	–	∪	–
13	∪	∪	–	–
14	–	∪	–	–
15	∪	–	–	–
16	–	–	–	–

මාත්‍රා 4 ක් ඇති මෙම ඡන්දසෙහි ගාථා 16 ක් ඇති බව මෙම ප්‍රස්තාර නය ක්‍රමයෙන් පෙන්වා දෙයි.

මාත්‍රා 6 ක් ඇති ගායත්‍රී ඡන්දසෙහි ගාථා ගණන සෙවීම

1	∪	∪	∪	∪	∪	∪
2	–	∪	∪	∪	∪	∪
3	∪	–	∪	∪	∪	∪
4	–	–	∪	∪	∪	∪
5	∪	∪	–	∪	∪	∪
6	–	∪	–	∪	∪	∪
7	∪	–	–	∪	∪	∪
8	–	–	–	∪	∪	∪
9	∪	∪	∪	–	∪	∪
10	–	∪	∪	–	∪	∪
11	∪	–	∪	–	∪	∪
12	–	–	∪	–	∪	∪
13	∪	∪	–	–	∪	∪
14	–	∪	–	–	∪	∪
15	∪	–	–	–	∪	∪
16	–	–	–	–	∪	∪
17	∪	∪	∪	∪	–	∪
18	–	∪	∪	∪	–	∪
19	∪	–	∪	∪	–	∪
20	–	–	∪	∪	–	∪
21	∪	∪	–	∪	–	∪
22	–	∪	–	∪	–	∪
23	∪	–	–	∪	–	∪

33	∪	∪	∪	∪	∪	–
34	–	∪	∪	∪	∪	–
35	∪	–	∪	∪	∪	–
36	–	–	∪	∪	∪	–
37	∪	∪	–	∪	∪	–
38	–	∪	–	∪	∪	–
39	∪	–	–	∪	∪	–
40	–	–	–	∪	∪	–
41	∪	∪	∪	–	∪	–
42	–	∪	∪	–	∪	–
43	∪	–	∪	–	∪	–
44	–	–	∪	–	∪	–
45	∪	∪	–	–	∪	–
46	–	∪	–	–	∪	–
47	∪	–	–	–	∪	–
48	–	–	–	–	∪	–
49	∪	∪	∪	∪	–	–
50	–	∪	∪	∪	–	–
51	∪	–	∪	∪	–	–
52	–	–	∪	∪	–	–
53	∪	∪	–	∪	–	–
54	–	∪	–	∪	–	–
55	∪	–	–	∪	–	–

24	–	–	–	∪	–	∪
25	∪	∪	∪	–	–	∪
26	–	∪	∪	–	–	∪
27	∪	–	∪	–	–	∪
28	–	–	∪	–	–	∪
29	∪	∪	–	–	–	∪
30	–	∪	–	–	–	∪
31	∪	–	–	–	–	∪
32	–	–	–	–	–	∪

56	–	–	–	∪	–	–
57	∪	∪	∪	–	–	–
58	–	∪	∪	–	–	–
59	∪	–	∪	–	–	–
60	–	–	∪	–	–	–
61	∪	∪	–	–	–	–
62	–	∪	–	–	–	–
63	∪	–	–	–	–	–
64	–	–	–	–	–	–

මාත්‍රා 6 ක් ඇති ගායත්‍රී ඡන්දසෙහි ගාථා ගණන 64 කි. මේ ආකාරයෙන් සෑම ගණනකම මාත්‍රා ඇති ඡන්දස්හි ගාථා ගණන දැනගත හැකි ය.

අඩ්ඪසම පාදයන්ගේ පත්ථාරනය.

මෙහි දී විසම පාදය සහ සම පාදය යන දෙක ම එක පාදයක් හැටියට ගෙන සර්ව ගරුවෙන් ආරම්භ කළ යුතු යි. උදාහරණයක් ලෙස අක්ෂර දෙකක් ඇති අඩ්ඪස ම පාද ගාථාවක ප්‍රස්තාරය ඇඳීමේදී අක්ෂර දෙකේ පාද දෙක ම එක පාදයක් ලෙස ගෙන ගරු හතරකින් ආරම්භ කළ යුතු යි. මෙසේ ආරම්භ කර සමපාද ගාථාවක මෙන් සර්ව ලහුවෙන තෙක් ඇඳීම කළ යුතු යි.

	විසම පාදය		සම පාදය		
1	∪	∪	∪	∪	පළමු වෙනි ශුද්ධ සමවුත්ත පාදය
2	–	∪	∪	∪	අඩ්ඪසමවුත්ත පාද
3	∪	–	∪	∪	
4	–	–	∪	∪	
5	∪	∪	–	∪	
6	–	∪	–	∪	දෙ වෙනි ශුද්ධ සමවුත්ත පාදය
7	∪	–	–	∪	අඩ්ඪසමවුත්ත පාද
8	–	–	–	∪	
9	∪	∪	∪	–	
10	–	∪	∪	–	
11	∪	–	∪	–	තුන් වෙනි ශුද්ධ සමවුත්ත පාදය
12	–	–	∪	–	අඩ්ඪසමවුත්ත පාද
13	∪	∪	–	–	
14	–	∪	–	–	
15	∪	–	–	–	
16	–	–	–	–	සතරවන ශුද්ධ සමවුත්ත පාදය

මෙම අක්ෂර දෙකේ ගාථාවට සමවුත්ත ප්‍රස්තාරයක් ඇඳීමේදී ගාථා සංඛ්‍යාව 4 ක් වේ. අඩ්ඪසම ගාථාවක් ලෙද ඇඳීමේදී ගාථා ගණන 16 ක් වේ. මෙසේ අඩ්ඪසම ගාථාවක් ඇඳීමේදී සම වුත්ත ප්‍රස්තාරයේ එන වුත්තයන් ඒ ආකාරයෙන්ම මෙහිදීද දැකිය හැකිය. සමවුත්තයකදී එන ගාථා සංඛ්‍යාව එම අංකයෙන්ම ගුණ කිරීමෙන් අඩ්ඪසම ගාථාවකට එන ගාථා ගණන සොයා ගත හැකිය. (4×4=16) ශුද්ධ සමවුත්ත[55] සංඛ්‍යාව අඩ්ඪසම වුත්ත සංඛ්‍යාවෙන් අඩු කළවිට ශුද්ධ අඩ්ඪසම ගාථා සංඛ්‍යාව ලැබේ. (16-4=12) මෙහි ශුද්ධ අඩ්ඪසම ගාථා සංඛ්‍යාව 12 කි. අඩ්ඪසමවුත්ත ප්‍රස්තාරයේ ශුද්ධ වූ සමවුත්ත පාදයන් යෙදෙන ස්ථාන

[55] අඩ්ඪසමවුත්ත ප්‍රස්තාරයේ දැක්වෙන සමපාද වුත්තයන් ශුද්ධ සමවුත්ත නම් වේ.

සොයාගැනීමට නම් ශුද්ධ සමවුත්ත පාද සංඛ්‍යාවට එකක් එකතු කර මුලින් ලැබෙන සමවුත්ත පාදයාගේ අංකයට එකතු කළ යුතු ය. එවිට දෙ වෙනි ශුද්ධසමවුත්ත පාදය ලැබෙන ස්ථානය දැනගත හැකිය. හැම විටම පළමු වෙනි පාදය ශුද්ධසමවුත්ත පාදය වේ. එවිට මෙසේ ගණනය කළ හැකිය. (4+1=5+1=6) පළමු වෙනි ස්ථානය හැරුන විට දෙවනුව ශුද්ධසමවුත්ත පාදය ලැබෙන්නේ 6 වන ස්ථානයේ ය. එය ඉහත ප්‍රස්තාරයෙන් දැනගත හැකි ය. මෙසේ අන් ඒවාත් සොයාගත හැකි ය. (6+5=11)(11+5=16) තුන් වෙනි සහ සතරවන ශුද්ධසමවුත්ත පාදයන් ලැබෙන්නේ පිළිවෙළින් 11 වන සහ 16 වන ස්ථානයන්හි ය.

මෙම ඉහත ප්‍රස්තාරයේ ශුද්ධසමවුත්ත පාදස්ථානය සොයා ගැනීමට තවත් ක්‍රමයක් දැක්වේ. එනම් ශුද්ධසමවුත්ත පාද සංඛ්‍යාවට එකක් එකතු කොට සෙවිය යුතු පාදස්ථාන සංඛ්‍යාවෙන් එකක් අඩු කර මුලින් ආ සංඛ්‍යාවෙන් ගුණ කර එයට එකක් එකතු කළ යුතු ය. උදාහරණයක් ලෙස ඉහත දැක්වූ අක්ෂර දෙකේ අඩ්ඩසමවුත්ත පාද ගාථාවේ තුන් වෙනි ශුද්ධ සමවුත්ත පාදස්ථානය සොයා ගැනීමට නම් ශුද්ධ සමවුත්තපාද 4 ට එකක් එකතුකර සෙවිය යුතු ස්ථානය වන 3 න් එකක් අඩුකර පාදස්ථාන ගණනින් ගුණ කළ යුතු යි. (4+1=5/ 3-1=2) (5×2=10+1=11) තුන් වෙනි ශුද්ධසමවුත්ත පාදස්ථානය 11 වේ. ඉහත ප්‍රස්තාරයෙන් එහි නිරවද්‍ය තාවය පරීක්ෂා කළහැක.

මේ ආකාරයෙන් අනෙක් අඩ්ඩසමගාථාවන්ගේද ප්‍රස්තාර ඇඳගත හැකි ය.

විසම පාදයන්ගේ පත්ථාරනය.

මෙහි දී විසම පාද සියල්ල එක පාදයක් හැටියට ගෙන සර්ව ගරුවෙන් ආරම්භ කළ යුතු යි. උදාහරණයක් ලෙස එක් අක්ෂරයක්[56] ඇති විසම පාද ගාථාවක ප්‍රස්තාරය ඇඳීමේදී පාද සතරෙහිම අක්ෂර එක පාදයක් ලෙස ගෙන ගරු හතරකින් ආරම්භ කළ යුතු යි. මෙසේ ආරම්භ කර සමපාද ගාථාවක අක්ෂර 4 ගාථාවක මෙන් සර්ව ලහුවෙන තෙක් ඇඳීම කළ යුතු යි.

	1 බණ පාදය	2 බණ පාදය	3 බණ පාදය	4 බණ පාදය	
1	∪	∪	∪	∪	පළමු වෙනි ශුද්ධ සමවුත්තපාදය
2	–	∪	∪	∪	විසමවුත්ත පාද
3	∪	–	∪	∪	
4	–	–	∪	∪	
5	∪	∪	–	∪	
6	–	∪	–	∪	පළමු වෙනි ශුද්ධ අඩ්ඩසමවුත්ත පාදය
7	∪	–	–	∪	විසමවුත්ත පාද
8	–	–	–	∪	
9	∪	∪	∪	–	
10	–	∪	∪	–	
11	∪	–	∪	–	දෙ වෙනි ශුද්ධ අඩ්ඩසමවුත්ත පාදය
12	–	–	∪	–	විසමවුත්ත පාද
13	∪	∪	–	–	
14	–	∪	–	–	
15	∪	–	–	–	
16	–	–	–	–	දෙ වෙනි ශුද්ධ සමවුත්තපාදය

මෙහි දී ඒකක්ෂර සමපාදවුත්ත ගාථාවකට ප්‍රස්තාරය ඇඳීමේදී හමුවන ගාථා ගණන 2 කි. අඩ්ඩසමවුත්ත පාද ප්‍රස්තාරය ඇඳීමේ දී ගාථා ගණන 4 කි (2×2=4). විසමපාද වුත්ත ගාථා ගණන 16 කි

[56] ප්‍රස්තාරය බොහෝ දික්වන බැවින් එක් අක්ෂරයක් ඇති ගාථාවකට පමණක් උදාහරණයක් ලෙස දක්වන්නෙමු.

(4×4=16). අඩ්ඩසමවුත්ත පාද ප්‍රස්තාරයේ එන ගාථා සංඛ්‍යාවෙන් සමපාදවුත්ත ප්‍රස්තාරයේ එන ගාථා සංඛ්‍යාව අඩුකළ කල්හි මෙම විසමපාද ප්‍රස්තාරයෙහි එන ශුද්ධ අඩ්ඩසමවුත්ත පාද සංඛ්‍යාව ලැබේ. (4-2=2) මෙහි ඇති ශුද්ධ අඩ්ඩසමපාද සංඛ්‍යාව 2 කි.

මෙම ගාථා 16 තුල සමපාදවුත්ත ගාථා හා විසමපාද වුත්ත ගාථා යන සියල්ල ඇතුලත් වේ.

මෙහි ශුද්ධ සමපාද හා ශුද්ධ අඩ්ඩසම පාද යෙදෙන ස්ථානයන් සොයා ගැනීමට නම් අඩ්ඩසමවුත්ත පාද සංඛ්‍යාවට එකක් එකතු කර එය පළමු ශුද්ධ සමපාදස්ථාන අංකයට එකතු කළ යුතු යි. එවිට පළමු වෙනි ශුද්ධ අඩ්ඩසමවුත්ත පාදස්ථානය ලැබේ. (4+1=5+1=6)(6+5=11) මෙහි අනෙකුත් අඩ්ඩසමවුත්ත පාදස්ථාන වන්නේ 6 සහ 11 යන ස්ථානයයි.

ශුද්ධ සමවුත්තපාද පමණක් සොයා ගැනීමට නම් අඩ්ඩසමවුත්ත සංඛ්‍යාවට එකක් එකතු කර සොයාගැනීමට අවශ්‍ය ස්ථානයේ අංකයෙන් එකක් අඩුකර කලින් ආ අංකයෙන් ගුණ කර තවත් එකක් එකතු කිරීමෙන් ලැබේ. උදහරණයක් ලෙස ඉහත ඒකක්ෂර පාද විසමවුත්ත ප්‍රස්තාරයේ දෙ වෙනි සමවුත්තපාදය සොයාගැනීමට නම් එම සමවුත්තපාදස්ථානය වන 4 න් එකක් අඩුකර සම-අඩ්ඩසමවුත්තසංඛ්‍යාව වන 4 ට එකක් එකතු කර එම පිළිතුර කලින් ආ පිළිතුරෙන් ගුණ කර එකක් එකතු කළ යුතුයි. (4-1=3 × 4+1=5) (3×5=15+1=16) දෙ වෙනි සමපාදස්ථානය වන්නේ අංක 16 වන ස්ථානයයි. ඉහත ප්‍රස්තාරයෙන් එහි නිරවද්‍ය තාවය පරීක්ෂා කළහැක.

අවසාන පාදය සැමවිටම ශුද්ධ සමපාදස්ථානයක් වේ. මේ ආකාරයෙන් අනෙක් විසම ගාථාවන්ගේද ප්‍රස්තාර නය සාදගත හැකි ය.

අරියා ජාතියේ පත්ථාරනය.

අරියා ජාතියේ ගණයක් මාත්‍රා 4 කින් සෑදෙන බව ඉහත දී දක්වා ඇත. ඒ අනුව මෙම අරියා ජාතියේ ප්‍රස්තාරය ඇඳීමේදී ගරු ලහු විකල්පය පිළිවෙළින් යොදමින් ඇඳිය යුතු ය. මෙහි දී අරියා ජාතියේ නීති සියල්ල සිහියේ තබාගැනීම ඉතා වැදගත් වේ.

කලින් ප්‍රස්තාර ඇඳීමේදී සර්ව ගරු වලින් ආරම්භ කළත් මෙහිදී එසේ කළ නොහැක. කවර හෙයකින් ද යත් අරියාජාතියේ පූර්වාර්ධයේ 6 වන ගණස්ථානය අනිවාර්යයෙන් ජගන හෝ නගන යෙදිය යුතු බැවින් හා අපරාර්ධයේ 6 වන ස්ථානය ලහුවක් විය යුතු නිසා ය. ආරම්භයේ දී එය මෙසේ ඇඳගත යුතු ය.

පූර්වාර්ධය

1		2		3		4		5		6			7		8
∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	–	∪	–	∪	∪	∪

අපරාර්ධය

1		2		3		4		5		6	7		8
∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	∪	–	∪	∪	∪

මේ ආකාරයෙන් පූර්වාර්ධය සහ අපරාර්ධය ඇඳ ආරම්භ කළ යුතු ය. ඉගෙන ගන්නන්ගේ පහසුව පිණිස මෙහි මුල් ගණ තුන පමණක් මඳ දුරක් යනතෙක් ඇඳ පෙන්වන්නෙමු.

	1	2	3
1	∪ ∪	∪ ∪	∪ ∪
2	– – ∪	∪ ∪	∪ ∪
3	∪ – –	∪ ∪	∪ ∪
4	– – – –	∪ ∪	∪ ∪
5	∪ ∪	– – ∪	∪ ∪
6	– – ∪	– – ∪	∪ ∪

	1	2	3
7	∪ – –	– – ∪	∪ ∪
8	– – – –	– – ∪	∪ ∪
9	∪ ∪	– ∪ –	∪ ∪
10	– – ∪	– ∪ –	∪ ∪
11	∪ – –	– ∪ –	∪ ∪
12	– – – –	– ∪ –	∪ ∪

මේ ආකාරයෙන් පහතට ඇඳීමේ දී අරියා ජාතියේ ඇති නීතීන් උල්ලංඝනය නොකරමින් අඳීමට වග බලා ගත යුතු වන අතර සෑම වුත්තයකම අන්ත ගරුව අනිවාර්ය වන නිසා සර්ව ලහු වන තෙක් ඇඳීම නොකළ යුතු ය. මේ අනුව ඇඳීමේ දී ආරියා විකල්ප 81920200 ක් ලැබෙන බව වුත්තෝදය ග්‍රන්ථයන්හි සඳහන් ය. පථ්‍යා, චපලා, විපුලා ආදී සියල්ල මේ විකල්පයන් අතරට ඇතුලත් ය.

ගීති ජාතියේ ද මේ ආකාරයෙන්ම ප්‍රස්තාර නය සිද්ධවෙන අතර ඒ ඒ ගීති වුත්ත අනුව වුත්තසංඛ්‍යා අඩු වැඩි වීම පමණක් වෙනස් වේ.

මත්තා පත්ථාරනය.

මෙම මත්තා ප්‍රස්තාරය ද වණ්ණ ප්‍රස්තාරය මෙන් සර්ව ගරු වලින් පටන් ගෙන ඇඳීම ආරම්භ වේ. ඉහත කී සෙයින් ම මෙහිදී ගරු යටින් ලහු යෙදීම, ඉතිරිය ඉහත වුත්තයට සම වන සේ යෙදීම සහ මුලින් හිස් තැන් ගරු වලින් පිරවීම යන නීතීන්ට අමතරව මෙහි දී මාත්‍රා සම කිරීමක් ද සිදු වේ. එනම් ප්‍රස්තාරයෙහි හිස් තැන් පිරවූ කල මාත්‍රා ගණන අඩුනම් වැඩි කිරීම ද, වැඩින් අඩුකිරීම ද සිදු වේ.

මෙයට උදහරණයක් ලෙස මාත්‍රා සතරක් ඇති වෘත්තයක් දක්වනු ලැබේ. පළමු ව සර්ව ගරු වලින් ආරම්භ කළ යුතු ය. ආරම්භයේදී ඇති මාත්‍රා ගණන හැම ගාථාවකම තිබිය යුතු ය. එසේ නොවේ නම් එකක් එකතු කිරීම හෝ එකක් අඩු කිරීම කර මාත්‍රා ගණන සම කළ යුතු ය.

1	∪ ∪	මාත්‍රා 4 කි.
	– ∪	දෙ වෙනි පාදය මෙසේ වීමේ දී මාත්‍රා ගණන අඩු වේ. එනිසා එකක් එකතු කළ යුතු ය. එවිට අංක දෙකෙහි පරිදි වේ.
2	– – ∪	මාත්‍රා 4 කි.
	∪ ∪ –	මෙසේ යෙදීමේ දී මාත්‍රාවක් වැඩි වී ඇත. එනිසා එකක් අඩු කළ යුතු ය. එය අංක 3 හි පරිදි විය යුතු ය.
3	– ∪ –	මාත්‍රා 4 කි.
4	∪ – –	මාත්‍රා 4 කි.
	– – –	මෙසේ යෙදෙන විට මාත්‍රා ගණන අඩුවන නිසා එකක් එකතු කළ යුතු ය. එවිට අංක 5 පරදි වේ.
5	– – – –	සර්ව ලහුවෙන තෙක් ඇඳ අවසන් කෙරේ.

මාත්‍රා 5 ක ගාථාවක ප්‍රස්තාර උදහරණය. මාත්‍රා 5 ක් නිසා සර්ව ගරු වලින් ආරම්භ කළ නොහැක.

1	– ∪ ∪
2	∪ – ∪
3	– – – ∪
4	∪ ∪ –
5	– – ∪ –
6	– ∪ – –
7	∪ – – –
8	– – – – –

නට්ඨනය

ප්‍රස්තාරයක් සටහන් නොකොට යම් කිසි ඡන්දසක කියනාලද වුත්ත විකල්පය ඇඳීම මෙම නට්ටනයින් සිදු කෙරේ. එම නොදන්නා වූ (නැති වී ඇති) විකල්පය සොයනා බැවින් මේ සඳහා නට්ඨනය යැයි කියනු ලැබේ. උදහරණයක් ලෙස අකුරු තුනක් ඇති ඡන්දසෙහි ප්‍රස්තාර නය දිග හැරි පසු එම ප්‍රස්තාරයේ 7-වන ගාථාව කෙසේ වන්නේ දැයි ප්‍රස්තාරය දිග නොහැර ම මේ නට්ඨ නයින් සොයා ගත හැකි ය.

130. නට්ඨස්ස යො භවෙය්‍ය'ඞ්කො, තස්මිං ලො'ද්ධිකතෙ සමෙ;
විසමෙ ත්වෙ'කසහිතෙ, භවෙය්‍ය'ද්ධිකතෙ ගරු.

නට්ඨස්ස = නෂ්ඨ වුත්තයාගේ; **යො අඞ්කො** = යම් අංකයෙක්; **භවෙය්‍ය** = වන්නේ ද; **අද්ධිකතෙ** = අධිකලා වූ; (= දෙකින් බෙදූ යයි සේයි) **තස්මිං** = ඒ (නෂ්ඨ වුත්තයාගේ) අංකය; **සමෙ** = සම වූ කල්හි; **ලො** = ලහුවෙක් වන්නේ ය; **විසමෙ තු** = විසම වූ කල්හි වනාහි; **එකසහිතෙ** = එකක් සහිත වූ ඒ අංකය; **අද්ධිකතෙ** = අධි කළ කල්හි; **ගරු භවෙය්‍ය** = ගරුවෙක් වන්නේ ය.

එක්තරා ඡන්දසක පවතින යම් කිසි ගාථාවක් නොලැබ එම ඡන්දසට අදළ ප්‍රස්තාරයෙහි එම ගාථාව පිහිටන පේළියේ පේළි අංකය ලැබුණේ යැයි සිතමු. එම පේළි අංකය භාවිතයෙන් අදළ ගාථාවේ ගරු ලහු පිහිටීම සොයා ගන්නේ මෙසේ යි. එම අංකය දෙකෙන් බෙද ඉතිරි නැතිව සම වුවහොත් ලහු සටහන් කර ගත යුතු ය. එකක් ඉතිරි වුවහොත් හෙවත් සම නොවුනහොත් ගරු සටහන් කර ගත යුතු ය. උත්තරයෙහි එකක් ඉතිරි වේ නම් එම උත්තරයට එකක් එකතු කළ යුතු ය.

සමවුත්ත නට්ඨනය.

උදා:- නැතිවී ඇති ගාථාව ඉහත කී පරිදි අකුරු 3 ක් ඇති ඡන්දසෙහි 7 වන ගථාව වේ.

(1) එවිට අපි 7 දෙකෙන් බෙදිය යුතු ය. 7 ÷ 2 = 3 එයින් එකක් ඉතිරි වේ. එකක් ඉතිරි වෙන නිසා ගරු ලකුණක් (∪) ඇඳ ගත යුතු ය. එය ගණයේ පළමු වෙනි ලකුණයි.

(2) කලින් බෙදීමේ දී ඉතිරි වූ 1 උත්තරය වූ 3 ට එකතු කළ යුතු ය. (3 + 1 = 4 එය නැවතත් දෙකෙන් බෙදිය යුතු ය.) 4 ÷ 2 = 2 ඉතිරි නොවේ. එසේ නම් සම වන නිසා ලහු ලකුණක් ඇඳ ගත යුතු ය. (–) එය ගණයේ දෙ වෙනි ලකුණ යි.

(3) කලින් බෙදීමේ දී ඉන්පසු ඉතිරි වන 2 නැවතත් දෙකෙන් බෙදිය යුතු ය. 2 ÷ 2 = 1 ඉතිරි නොවේ. එය සම වන නිසා තවත් ලහු ලකුණක් (–) ඇඳ ගත යුතු ය. එය ගණයේ තුන් වෙනි ලකුණ යි.

1		7 ÷ 2 = 3	1 ක් ඉතිරි වේ	විසම	∪
2	1 + 3 =	4 ÷ 2 = 2	ඉතිරි නොවේ	සම	–
3		2 ÷ 2 = 1	ඉතිරි නොවේ	සම	–

❖ මෙය අකුරු 3 ක් ඇති ඡන්දසක් නිසා බෙදීම කර ඇත්තේ තුන් වතාවක් පමණි. ඡන්දසෙහි ඇති අකුරු ගණනට බෙදෙන වාර ගණන සමාන විය යුතු ය.

එයින් ලැබුණු ගාථාව වන්නේ ගරු 1 ක් හා ලහු 2 (∪ – –) කි. මෙය 7 වන ගාථාව යි. ඉහත ප්‍රස්තාරනයෙහි ප්‍රස්තාරයෙන් එහි නිරවද්‍ය තාවය පරීක්ෂා කළහැක.

මේ ආකාරයට අක්ෂර 4 ක් ඇති ඡන්දසෙහි 10 වන ගාථාව සෙවීම.

1		10 ÷ 2 = 5	ඉතිරි නොවේ	සම	–
2		5 ÷ 2 = 2	1 ක් ඉතිරි වේ	විසම	∪
3	1 + 2 =	3 ÷ 2 = 1	1 ක් ඉතිරි වේ	විසම	∪
4	1 + 1 =	2 ÷ 2 = 1	ඉතිරි නොවේ	සම	–

එවිට ලැබුණු ගාථාව (– ∪ ∪ –) කි. මෙය 10 වන ගාථාව යි. ඉහත ප්‍රස්තාරනයෙහි මාත්‍රා 4 ක් ඇති ඡන්දසකට දී ඇති උදාහරණ ප්‍රස්තාරයෙන් එහි නිරවද්‍ය තාවය පරීක්ෂා කළහැක.

මේ ආකාරයට අක්ෂර 6 ක් ඇති "ගායත්‍රී" ඡන්දසෙහි 15 වන ගාථාව සෙවීම.

1		15 ÷ 2 = 7	1 ක් ඉතිරි වේ	විසම	∪
2	7 + 1 =	8 ÷ 2 = 4	ඉතිරි නොවේ	සම	–
3		4 ÷ 2 = 2	ඉතිරි නොවේ	සම	–
4		2 ÷ 2 = 1	ඉතිරි නොවේ	සම	–
5		1 ÷ 2 = 0	1 ක් ඉතිරි වේ	විසම	∪
6	0 + 1 =	1 ÷ 2 = 0	1 ක් ඉතිරි වේ	විසම	∪

එවිට ලැබෙන්නා වූ (∪ – – – ∪ ∪) මෙම පාදය ඉහත කී ඡන්දසෙහි 15 වන ගාථාව යි. මෙම ඡන්දසෙහි ඇත්තේ අක්ෂර 6 ක් බැවින් බෙදීම කර ඇත්තේ 6 වතාවකි. මෙහි නිවැරදි භාවය ඉහත පත්ථාර නය ක්‍රමයෙහි අක්ෂර 6 ක් ඇති ඡන්දසෙහි ගාථා ගණන සෙවීමට ඇදි ප්‍රස්තාරයෙන් බලා ගත හැක. ඒ ආකාරයෙන් සියළුම අංකයන් පිළිබඳ සොයා ගත හැකි ය.

අද්ධසමවුත්ත නට්ඨනය.

මෙහිදී ද පළමු කී පරිද්දෙන් ම සෙවිය යුතු අංකය බෙදීමෙන් ම නට්ඨ වූ වුත්තය සොයාගනු ලැබේ. මෙහි පාද දෙකම එක් පාදයක් ලෙස ගෙන, පාද දෙකේම ඇති අක්ෂර ගණන අනුව බෙදන වාර ගණන තීරණය කළ යුතු වේ.

අක්ෂර තුනක් ඇති ඡන්දසෙහි අර්ධසම ප්‍රස්තාරයෙහි 50 වෙනි ගාථාවෙහි ගරු ලහු යෙදී ඇති ආකාරය සෙවීම.

1		50 ÷ 2 = 25	ඉතිරි නොවේ	–
2		25 ÷ 2 = 12	1 ක් ඉතිරි වේ	∪
3	12+1=13	13 ÷ 2 = 6	1 ක් ඉතිරි වේ	∪
4	6+1=7	7 ÷ 2 = 3	1 ක් ඉතිරි වේ	∪
5	3+1=4	4 ÷ 2 = 2	ඉතිරි නොවේ	–
6		2 ÷ 2 = 1	ඉතිරි නොවේ	–

එවිට ලැබෙන්නා වූ මෙම පාදය (– ∪ ∪, ∪ – –) ඉහත කී අක්ෂර තුනක් ඇති ඡන්දස්හි අර්ධසම ප්‍රස්තාරයෙ එන 50 වෙනි ගාථාව යි. අක්ෂර 3 ක් ඇති පාද දෙකක අක්ෂර 6 ක් ඇති බැවින් මෙහි බෙදීම කර ඇත්තේ 6 වතාවකි. මෙම 50 වෙනි අංකය බැලීමේ දී එම අඩ්ඩසම වුත්ත ප්‍රස්තාරයේ සමපාද වුත්තයන් නොහැර බැලිය යුතුයි. එසේ හැරීයාමෙන් මෙය වැරදේ.

විසමවුත්ත නට්ඨනය

මෙහිදී ද පළමු කී පරිද්දෙන් ම සෙවිය යුතු අංකය බෙදීමෙන් ම නට්ඨ වූ වුත්තය සොයාගනු ලැබේ. මෙහි වෙනස නම් පාද සතරම එක පදයක් ලෙස ගෙන සෙවීම යි.

උදාහරණයක් ලෙස වණ්ණ 2 ක් ඇති ඡන්දස්හි විසමවුත්ති ප්‍රස්තාරයේ එන 200 වෙනි ගාථාවෙහි ගරු ලහු යෙදී ඇති ආකාරය සෙවීම.

1		200 ÷ 2 = 100	ඉතිරි නොවේ	–
2		100 ÷ 2 = 50	ඉතිරි නොවේ	–
3		50 ÷ 2 = 25	ඉතිරි නොවේ	–
4		25 ÷ 2 = 12	1 ක් ඉතිරි වේ	∪
5	12+1=13	13 ÷ 2 = 6	1 ක් ඉතිරි වේ	∪
6	6+1=7	7 ÷ 2 = 3	1 ක් ඉතිරි වේ	∪
7	3+1=4	4 ÷ 2 = 2	ඉතිරි නොවේ	–
8		2 ÷ 2 = 1	ඉතිරි නොවේ	–

එවිට විසම පාදයේ පාද 4 මෙසේ ය. (– –, – ∪, ∪ ∪, – –) පාද සතරෙහිම අක්ෂර අටක් ඇති බැවින් 8 වතාවක් බෙදීම කර ඇත.

අරියා නට්ඨනය.

මෙයද කලික් කී සේම බෙදා ඉතිරිවන සංඛ්‍යාව අනුව තීරණය වේ. මෙහි ඇති වෙනස නම් ගණස්ථානයෙන් ගණස්ථානයට විකල්ප වෙනස් බැවින් බෙදන සංඛ්‍යාව වෙනස් වීමයි. මෙම ආර්යා ජාතියේ ගාථාවල ඒ ඒ ගණස්ථානයන්ට ඇති විකල්ප සංඛ්‍යා මෙසේ දැක්විය හැකි ය.

පූර්වාර්ධය								
ගණස්ථානය	1	2	3	4	5	6	7	8
විකල්ප සංඛ්‍යාව	4	5	4	5	4	2	4	1

අපරාර්ධය								
ගණස්ථානය	1	2	3	4	5	6	7	8
විකල්ප සංඛ්‍යාව	4	5	4	5	4	1	4	1

මෙහි ඇති විකල්ප සංඛ්‍යාව අනුව බෙදීම කළ යුතු ය. බෙදීම කිරීමෙන් ඉතිරිවන ගණන අනුව එම ගණස්ථානයට යෙදිය යුතු ගණය තීරණය වේ. එය අරියා ජාතියේ එන ගණ 5 න් ම යෙදිය යුතු ය.

1	බෙදීමෙන් 1 ක් ඉතිරි වේ නම්	මගණ	∪	∪		
2	බෙදීමෙන් 2 ක් ඉතිරි වේ නම්	සගණ	–	–	∪	
3	බෙදීමෙන් 3 ක් ඉතිරි වේ නම්	ජගණ	–	∪	–	
4	බෙදීමෙන් 4 ක් ඉතිරි වේ නම්	භගණ	∪	–	–	
5	ඉතිරි නොවේ නම්	නගණ	–	–	–	–

මෙයට උදාහරණයක් ලෙස 352654 (තුන්ලක්ෂ පණස් දෙදහස් හයසියපණස් හතර) වෙනි අරියා ගාථාවේ පූර්වාර්ධයෙහි ගරු ලහු යෙදී ඇති ආකාරය කෙසේදැයි සොයන්නේ මෙසේ ය.

1 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන 4 බැවින් පළමු ව බෙදිය යුතෙත් 4 නි.	352654 ÷ 4 = 88163	ඉතිරිය 2	සගණ
2 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන 5 බැවින් 5 න් බෙදිය යුතු ය. කලින් සංඛ්‍යාවේ එකක් හෝ ඉතිරි නම් පමණක් බෙදීමට පළමු ව 1 ක් එකතු කළ යුතු ය. (ඉතිරි ගණන කොපමණ වුවත් එකතු කළ යුත්තේ එකක් පමණි.)	1 + 88163 ÷ 5 = 17632	ඉතිරිය 4	භගණ
3 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් බෙදීමේදී ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 17632 ÷ 4 = 4408	ඉතිරිය 1	මගණ
4 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 5 බැවින් 5 න් බෙදිය යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 4408 ÷ 5 = 881	ඉතිරිය 1	මගණ
5 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 881 ÷ 4 = 220	ඉතිරිය 2	සගණ
6 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 2 බැවින් 2 න් බෙදීම කළ යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 220 ÷ 2 = 110	ඉතිරිය 1	ජගණ[57]
7 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 110 ÷ 4 = 28	ඉතිරිය 2	සගණ
8 වන ගණස්ථානය ගරු බැවින් එහි ගරුවක් යෙදේ.	-	-	ගරු

මේ ආකාරයෙන් පූර්වාර්ධය සොයාගත් පසු එම ගාථාවේම අපරාර්ධය සොයා ගැනීමට පූර්වාර්ධයේ 7 වෙනි ගණස්ථානය බෙදා ලැබුණ පිළිතුරු සංඛ්‍යාවට එකක් එකතු කර අපරාර්ධයේ 1 වන විකල්ප සංඛ්‍යාවේ පටන් කලින් සේම බෙදීම කළ යුතු ය.

1 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන 4 බැවින් පළමු ව බෙදිය යුත්තේ 4 නි. පටන්ගැනීමේ දී ම මෙයට 1 ක් එකතු කළ යුතු ය.	1 + 28 ÷ 4 = 7	ඉතිරිය 1	මගණ
2 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන 5 බැවින් 5 න් බෙදිය යුතු ය. කලින් බෙදීමේදී ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 7 ÷ 5 = 1	ඉතිරිය 3	ජගණ
3 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් බෙදීමේදී ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 1 ÷ 4 = 0	ඉතිරිය 2	සගණ
4 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 5 බැවින් 5 න් බෙදිය යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 0 ÷ 5 = 0	ඉතිරිය 1	මගණ
5 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 0 ÷ 4 = 0	ඉතිරිය 1	මගණ

[57] 6 වන ගණස්ථානයේ බෙදීමෙන් කිසිවක් ඉතිරි නොවුන හොත් නගණය ද එකක් ඉතිරි වුවහොත් ජගණය ද යෙදිය යුතුය. එසේ වන්නේ මෙම ස්ථානයෙහි යෙදෙන්නේ විකල්ප 2 ක් පමණක් නිසාය. එම විකල්ප දෙක නම් ජගණ හා නගණ යි.

6 වන ගණස්ථානයේ ලහු බැවින් එහි බෙදීමක් නැතිව ම ලහු යොදනු ලැබේ.	-	-	ලහු
7 වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව 4 බැවින් 4 න් බෙදීම කළ යුතු ය. කලින් 5 වන ගණස්ථානයේ බෙදීමෙන් කලින් ඉතිරි බැවින් 1 ක් එකතු කළ යුතු ය.	1 + 0 ÷ 4 = 0	ඉතිරිය 1	මගණ
8 වන ගණස්ථානය ගරු බැවින් කිසිම බෙදීමක් නොකරම එහි ගරුවක් යෙදේ.	-	-	ගරු

මෙය අරියා ගාථා ප්‍රස්තාරයේ 3545 වෙනි ගාථාව යි. එය ගණනය කිරීමෙන් ලැබුණු ගණ අනුව මෙසේ දැක්විය හැකි ය.

පූර්වාර්ධය මෙසේ ය.

1			2			3		4		5			6			7			8
–	–	∪	∪	–	–	∪	∪	∪	∪	–	–	∪	–	∪	–	–	–	∪	∪
සගණ			භගණ			මගණ		මගණ		සගණ			ජගණ			සගණ			ගරු

අපරාර්ධය මෙසේ වේ.

1		2			3			4		5		6	7		8
∪	∪	–	∪	–	–	–	∪	∪	∪	∪	∪	–	∪	∪	∪
මගණ		ජගණ			සගණ			මගණ		මගණ		ලහු	මගණ		ගරු

මත්තාවුත්ත නට්ඨනය

මත්තාවුත්තයාගේ නට්ඨ වූ වුත්තයන් සොයාගැනීමට නම් පළමු කොට එම ඡන්දස සර්ව ලහු කොට ඇඳ ගත යුතු ය. ඉන් පසු එම මාත්‍රාවන් එකින් එකට අංකයන් දමා ගත යුතු ය. එසේ අංක යොද ගැනීමේ දී පෙර අංකයන් දෙක එකට එකතු කර ඊළඟ අංකය එන සේ කළ යුතු ය. ඉන්පසුව අවසානයේ එන අංකයෙන් සෙවීමට ඇති ඡන්දසෙහි අංකය අඩු කරනු ලැබේ. ඉතිරි වූ පිළිතුරු සංඛ්‍යාවෙන් අඩුකළ හැකි, වගුවෙහි ඇති ඉහළම අගය ගෙන එය අඩු කළ යුතු ය. අඩු කළ සංඛ්‍යාව ඇති ස්ථානයේ ලහු මාත්‍රාව සහ ඊට පසු ඇති අංකය සහිත ස්ථානයෙහි ලහු මාත්‍රාවත් යන මාත්‍රා දෙක එකතු කොට එක ගරුවක් ලෙස ඇඳ ගත යුතු යි. ඒ ක්‍රමයෙන් වගුවෙහි අඩු කළහැකි සංඛ්‍යාවන් නැතිවනතෙක් කළ යුතු යි. ඒ ආදි වශයෙන් මත්තාවුත්තයෙහි නෂ්ට වුත්තයාගේ ගරු ලහු යෙදී ඇති ආකාරය සොයා ගත හැකි ය.

උදාහරණය 1:-

මෙය උදාහරණයන් උපකාරයෙන් වඩාත් පැහැදිලි කරගත හැක. උදාහරණයක් හැටියට මාත්‍රා 6 ක් ඇති ඡන්දසක 10 වෙනි විකල්පස්ථානයට අයත් ගාථාව සොයන්නේ නම් එම මාත්‍රා 6 ඡන්දස ලහු පමණක් යොද ගනිමින් ඇඳ ගත යුතු ය.

a	b	c	d	e	f
–	–	–	–	–	–

මෙසේ ඇඳගැනීමෙන් පසු මෙම ලහු මාත්‍රාවන්ට අංක යොද ගැනීම කළ යුතු ය[58]. එහි දී a යටතේ අංක 1 ත් b යටතේ අංක 2 ත් යොදගත් පසු ඉන් ඉදිරියට අංකයන් එකතු කරමින් යොද ගැනීම කළ යුතු ය. ඒ මෙසේ ය.

a	b	c	d	e	f
–	–	–	–	–	–
1	2	3	5	8	13

(a + b = c , 1 + 2 = 3) (b + c = d , 2 + 3 = 5) (c + d = e , 3 + 5 = 8) (d + e = f , 5 + 8 = 13) මේ ආදී වශයෙන් එකතු කිරීම කළ යුතු ය. ඉන්පසු අවසානයේ ලැබුණ පිළිතුරෙන් (f) සෙවිය යුතු ඡන්දසෙහි අංකය අඩු කළ යුතු ය. එනම් (13-10 = 3). එම ලැබුණ පිළිතුරෙන් ඊළඟට අඩු කළ හැකි අංකය සොයා ගත යුතු ය. පිළිතුර තුන නිසා ඊළඟට අඩු කළ හැකි අංකය නම් 3 යි. එය (c) යටතේ දක්වා ඇත. (3-3 = 0) එසේ අඩු කොට එම අඩුකල අංකයට අදාල ලහුවත්, එයට ඉදිරියෙන් ඇති ලහුවත් (එනම් c සහ d යන ස්ථානයන්හි ඇති ලහු මාත්‍රාවන්) එකට එකතු කර එක් ගරුවක් කළ යුතු ය. පෙර අඩු කිරීමෙන් කිසිවක් ඉතිරි නොවුන නිසා අඩු කිරීම එතනින් අවසන් වේ. එයින් ඡන්දසෙහි ගරු ලහු සෙවීම අවසන් වේ. ලැබුණු ඡන්දස මෙසේ යි.

[58] මෙය විස්තර කිරීමේ පහසුව පිණිස ලහු වලට ඉහලින් a සිට f දක්වා යොද ඇත.

–	–	∪	–	–
සියල්ල මාත්‍රා 6 කි.				

උදාහරණය 2:-

තවත් උදාහරණයක් මෙසේ ය. මාත්‍රා 10 ක් ඇති ඡන්දසක 25 වෙනි විකල්පස්ථාන ගාථාව සොයා ගැනීමේ දී පළමු ව සියල්ල ලහු යොදා ගනිමින් ඇඳගත යුතු ය. ඉන්පසු කලින් ක්‍රමයට මුල් අංකය දෙ වෙනි අංකයත් සමග එකතු කරමින් ලහු මාත්‍රා අවසන් වනතුරු අංකයන් යොදා ගත යුතු ය.

–	–	–	–	–	–	–	–	–	–
1	2	3	5	8	13	21	34	55	89

මෙසේ අංක යොදාගත් පසු ලැබුණු පිළිතුරෙන් සෙවීමට ඇති ගාථා අංකය (25) අඩු කළ යුතු ය. එසේ අඩු කළ විට ලැබෙන පිළිතුර වන්නේ (89 - 25 = 64) වේ. එම 64 න් ඊළඟට අඩු කළ හැකි සංඛ්‍යාව වන්නේ 55 යි. (64 - 55 = 9) එසේ අඩු කොට 55 ස්ථානයේ ඇති ලහුවත් ඊට ඉදිරියෙන් ඇති 89 ස්ථානයේ ඇති ලහුවත් එකතු කොට එක් ගරුවක් කළ යුතු යි. අඩු කිරීමෙන් ලැබුණු පළිතුර වූ 9 න් ඊළඟට අඩු කළ හැකි අංකය වන්නේ 8 යි. (9 - 8 = 1) එසේ අඩු කිරීමෙන් පසු එම අංක 8 ඇති ස්ථානයේ ලහුවත් ඊට ඉදිරියෙන් ඇති අංක 13 ස්ථානයේ ඇති ලහුවත් එකතු කර ගරුවක් කළ යුතු යි. ඉන්පසු ඉතිරි 1 අඩු කළ හැක්කේ පළවෙන් ලහුව ඇති අංක 1 න් පමණි. (1 - 1 = 0) එසේ අඩු කිරීමෙන් පසු අංක 1 ඇති ස්ථානයේ ඇති ලහුවත් ඊට ඉදිරියෙන් ඇති අංක 2 ඇති ස්ථානයේ ඇති ලහුවත් එකතු කර ගරුවක් කළ යුතු යි. අවසාන පිළිතර (0) ලැබුණු පසු අඩු කිරීම එයින් අවසන් වේ.

1	2	3	5	8	13	21	34	55	89
–	–	–	–	–	–	–	–	–	–
∪		–	–	∪		–	–	∪	

සෙවීම මාත්‍රා 10 ක් ඇති ඡන්දසක බැවින් අවසානයේ ගරු ලහු යෙදීමෙන් පසු ලැබුණ ගාථාවේ මාත්‍රා ගණන 10 ක් විය යුතු යි. මෙසේ සොයා ගැනීමෙන් ලැබුණු මාත්‍රා 10 ක් ඇති ඡන්දසෙහි 25 වෙනි ගාථාව මෙසේ දැක්විය හැකි ය.

∪	–	–	∪	–	–	∪
සියල්ල මාත්‍රා 10 කි						

උද්දිට්ඨනය

යම්කිසි ගාථාවක් ලැබී ඇත. එහි ලහු ගරු පිහිටීම දනී. මෙය ප්‍රස්තාරයේ කී වෙනි අංකයට අයත් ගාථාවදැයි සොයා ගැනීමට මෙම උද්දිට්ඨනයෙන් හැකිය.

131. **එකා'දිනුක්කමෙන'ඞ්කෙ, පුබ්බාධො ද්විගුණෙ ලිඛෙ;**
මිස්සකෙහි ලහුට්ඨෙහි, සෙ'කෙහු'ද්දිට්ඨකං භවෙ.

පුබ්බා = (උදෙසන ලද වුත්තයාගේ) පූර්වාක්ෂරයෙහි පටන්; **අධො** = (අක්ෂරයන්ගේ) යට භාගයෙහි; **එකාදි + අනුක්කමෙන** = එක (දෙක) ආදී පිළිවෙළින්; **ද්විගුණෙ** = දියුණු වූ හෙවත් දෙකෙන් ගුණ වූ; **අඞ්කෙ** = අංකයන්; **ලිඛෙ** = ලියන්නේ ය; **ලහුට්ඨෙහි** = ලහු අක්ෂරයන් යට සිටියා වූ; **සෙකෙහි** = එකක් සහිත වූ; **මිස්සකෙහි** = මිශ්‍රකරන ලද හෙවත් එකතු කරන ලද අංකයන් කරණ කොටගෙන; **උද්දිට්ඨකං භවෙ** = උද්දිට්ඨ වුත්තය වන්නේ ය.

ගාථා පාදය ගරු ලහු සලකුණු වලින් ලියා ගත යුතු ය. එහි පළමු ලකුණ යටින් එක ලිවිය යුතු ය. ඉන් පසු ලකුණ යටින් 2, 4, 8 ආදී වශයෙන් දෙගුණ දෙගුණ කොට ලිවිය යුතු ය. පසුව ලහු ලකුණු යට ඇති සංඛ්‍යාවන් එකතු කර එම එකතුවට එකක් (1) එකතු කළ යුතු ය. එවිට ලැබෙන්නේ ප්‍රස්තාරයේ අදාළ ගාථා අංකය යි. (පේළි අංකය යි.)

සමවුත්ත උද්දිට්ඨනය

උදා:- මාත්‍රා 3 ක් ඇති ගාථාවක ලැබී ඇති ගරුලහු අනුව ප්‍රස්තාරයේ අදළ අංකය සොයා ගැනීම.

–	∪	–	ගරු ලහු යොද පාදය ලියා ගත යුතුය.
1	2	4	ගුණ වෙමින් ඉදිරියට ලිවිය යුතුයි.
1 + 4 = 5			ලහු අක්ෂර වල පමණක් අංකයන් එකතු කළ යුතුයි.
5 + 1 = 6			එයට එකක් එක් කළ යුතුයි.

මෙය ප්‍රස්තාරයේ 6 වන ස්ථානයේ ඇති ගාථාව වේ.

උදා:- මාත්‍රා 4 ක් ඇති ගාථාවක අදළ අංකය සොයා ගැනීම.

–	∪	–	∪	ගරු ලහු යොද පාදය ලියා ගත යුතුය.
1	2	4	8	ගුණ වෙමින් ඉදිරියට ලිවිය යුතුයි.
1 + 4 = 5				ලහු අක්ෂර වල පමණක් අංකයන් එකතු කළ යුතුයි.
5 + 1 = 6				එයට එකක් එක් කළ යුතුයි.

මෙය ප්‍රස්තාරයේ 6 වන ස්ථානයේ ඇති ගාථාව වේ.

උදා:- මාත්‍රා 6 ක් ඇති ගාථාවක අදළ අංකය සොයා ගැනීම.

–	–	–	∪	∪	∪	ගරු ලහු යොද පාදය ලියා ගත යුතුය.
1	2	4	8	16	32	ගුණ වෙමින් ඉදිරියට ලිවිය යුතුයි.
1 + 2 + 4+ = 7						ලහු අක්ෂර වල පමණක් අංකයන් එකතු කළ යුතුයි.
7 + 1 = 8						එයට එකක් එක් කළ යුතුයි.

මෙය ප්‍රස්තාරයේ 8 වන ස්ථානයේ ඇති ගාථාව වේ.

අද්ධසමවුත්ත/ විසමවුත්ත උද්දිට්ඨනය

මෙය සමවුත්ත උද්දිට්ඨනය ක්‍රමයට සමාන ය. මෙහි ඇති වෙනස නම් අඩ්ඩසමවුත්තයක ගාථාංකය සොයන්නේ නම් පාද දෙකම එක් පාදයක් හැටියට ඇඳගෙන සෙවිය යුතු යි. විසම පාදයක් නම් පාද සතරම එක පාදයක් ලෙස ඇඳගෙන සෙවිය යුතු ය. අනෙක් සියල්ල ම සමවුත්තයෙහි මෙනි.

අරියා උද්දිට්ඨනය

අරියා ගාථාවේ උද්දිට්ඨනය සෙවීමේ දී පළමු ව, සෙවීමට ඇති ගාථාවේ උභයාර්ධයේ ම ප්‍රථම ගණස්ථානයේ පටන් අටවන ගණස්ථානය දක්වා යෙදෙන ගරු ලහු ස්වරූපයන් ලියා ගත යුතු ය. ඉන් පසුව අපරාර්ධයේ අවසාන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාව[59] සත්වන ගණස්ථානයේ විකල්ප සංඛ්‍යාවෙන් ගුණ කළ යුතු යි. අනතුරුව ලියාගත් ගාථාවේ සත්වන ගණස්ථානයේ ඇති ගරු ලහු ස්වරූපය අනුව ගණය නිෂ්චය කළ යුතු ය. ඉන් අනතුරුව මතු දැක්වෙන නීතියට අනුව අඩු කළ යුතු ය. ගණස්ථානයේ යෙදී ඇති විකල්ප ගණනින් යෙදී ඇති ගණය අඩු කළ යුතු ය. (1 ක් අඩුකළ යුතු ය.) එම ගණස්ථානය විසමස්ථානයක් නිසා, අරියා ජාතියේ විසමස්ථානයේ ජගනය නොයෙදෙන බැවින් එම විකල්ප සංඛ්‍යාවෙන් ජගණය ද අඩු කළ යුතු යි. එම අඩු කිරීමෙන් ලැබුණු පිළිතුරු සංඛ්‍යාව ඉහත ගුණ කිරීමෙන් ලැබුණු පිළිතුරු සංඛ්‍යාවෙන් අඩු කළ යුතු යි.

ඊළඟ ගණස්ථානය අපරාර්ධයේ 6 වෙනි ගණස්ථානය යි. එය නිත්‍ය ලහුඅක්ෂරයක් නිසා ගුණ කිරීමක් නැත. ඉක්බිති සත් වෙනි ගණස්ථානයේ පිළිතුර පඤ්චම ගණස්ථානයේ විකල්ප ගණ සංඛ්‍යාවෙන් ගුණ කළ යුතු යි. අනතුරුව පස්වන ගණස්ථානයේ ඇති ගරු ලහු ස්වරූපය අනුව ගණය නිෂ්චය කළ යුතු ය. ඉන් අනතුරුව පෙර දැක් වූ නීතියට ම අනුකූලව ගණස්ථානයේ යෙදී ඇති විකල්ප ගණනින් යෙදී ඇති ගණය අඩු කළ යුතු ය. (1 ක් අඩුකළ යුතු ය.) එම ගණස්ථානය විසමස්ථානයක් නිසා, එම විකල්ප

[59] ඉහත නට්ඨනයෙහි එන අරියා නට්ඨනයෙහි විකල්ප සංඛ්‍යාවන් දක්වා ඇත.

සංඛ්‍යාවෙන් ජගණය ද අඩු කළ යුතු යි. එම අඩු කිරීමෙන් ලැබුණු පිළිතුරු සංඛ්‍යාව ඉහත ගුණ කිරීමෙන් ලැබුණු පිළිතුරු සංඛ්‍යාවෙන් අඩු කළ යුතු යි.

මේ ආකාරයෙන් අපරාර්ධයේ පළමු වෙනි ගණස්ථානය තෙක් සොයා ඒ ආකාරයෙන් ම නැවත පූර්වාර්ධයේ සත්වන ගණස්ථානයේ (අටවන ගණස්ථානය ගරුවක් නිසා ගුණකිරීමක් නැත.) පටන් ගුණකිරීම හා අඩු කිරීම කළ යුතු යි. එයින් අවසානයට ලැබෙන පිළිතුර අරියා ගාථාවේ උද්දිට්ඨ අංකය යි. අරියා ගාථාවේ උද්දිට්ඨනය සෙවීමේ දී එම ගාථාවගේ නීති සියල්ලම සිහියේ තබාගෙන ම කළ යුතු යි.

මෙයට උදහරණයක් ලෙස අරියා ගාථාවක් වන කරුණාසීතලහදයං ගාථාවේ උද්දිට්ඨ නය සොයන්නේ නම් පළමු ව ඒ ගාථාව ගරු ලහු වින්‍යාස යොදා ලියා ගත යුතු ය. (ඉගෙන ගැනීමට පහසු වීම පිණිස විකල්ප සංඛ්‍යාව නැවතත් ගාථාවේ ගණ පේළියට යටින් දක්වා ඇත.)

පූර්වාර්ධය

1			2			3			4		5		6				7			8
ක	රු	ණා	සී	ත	ල	හ	ද	යං	පඤ්ඤ	ඤු	පජ්	ජො	ත	වි	ග	ත	මො	හ	ත	මං
–	–	∪	∪	–	–	–	–	∪	∪	∪	∪	∪	–	–	–	–	∪	–	–	∪
සගණ			භගණ			සගණ			මගණ		මගණ		නගණ				භගණ			ගරු
4			5			4			5		4		2				4			1

අපරාර්ධය

1			2			3			4		5			6	7			8
ස	න	රා	ම	ර	ලො	ක	ග	රුං	වන්	දෙ	සු	ග	තං	ග	ති	වි	මුත්	තං
–	–	∪	–	–	∪	–	–	∪	∪	∪	–	–	∪	–	–	–	∪	∪
සගණ			සගණ			සගණ			මගණ		සගණ			ලහු	සගණ			ගරු
4			5			4			5		4			1	4			1

මෙසේ ලියාගත් පසු සෙවීම ආරම්භ වන්නේ ගාථාවේ අපරාර්ධයේ 8 වන ගණස්ථානයෙන් ය.

පළමු ව අපරාර්ධයේ අවසාන ගරුව එක් විකල්පයක් ලෙස ගෙන එය සත්වන ගණස්ථානයේ ඇති විකල්ප සංඛ්‍යා 4 න් ගුණ කළ යුතු යි.	1×4 = 4
සත්වන ගණස්ථානය ගාථාවේ සගණය හෙයින් විකල්ප ගණ තුනක් ඉතිරි වේ. සත්වන ස්ථානයේ ජගණය ද නොයෙදෙන නිසා එය ද ඉවත් කළ යුතු ය. එවිට ඉතිරි 2 කි. එම 2 කලින් ලද පිළිතුරෙන් අඩු කළ යුතු ය.	4-2 = 2
6 වන ගණස්ථානය නිත්‍ය ලහු නිසා එහිදී කිසිවක් නොකළ යුතු ය.	-
7 වන ගණස්ථානය අවසානයේ පිළිතුර වූ 2, 5 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන වන 4 න් ගුණ කළ යුතු ය.	2×4 = 8
ගාථාවේ 5 වන ගණස්ථානයේ යෙදී ඇත්තේ සගණය යි. එයත් විසම ගණස්ථානයක් නිසා ජගණය නොයෙදෙන බැවින් ජගණය අඩු කොට ඉතිරි ගණ දෙක ලැබුණ පිළිතුරෙන් අඩු කළ යුතු ය.	8-2 = 6
පිළිතුර වූ 6 හතර වෙනි ගණස්ථානයේ විකල්ප ගණන වන 5 න් ගුණ කළ යුතු ය.	6×5 = 30
4 වෙනි ගණස්ථානයේ ඇත්තේ මගණ නිසා එය ඉවත් කර ඉතිරි විකල්ප ගණන වූ 4 එම ලද පිළිතුරෙන් අඩු කළ යුතු යි.	30-4 = 26
3 වෙනි ගණස්ථානයේ විකල්ප ගණන 4 බැවින් කලින් ලද පිළිතුර 4 න් ගුණ කර විකල්ප ගණනින් අඩු කළ යුතු යි. එහි යෙදෙන්නේ සගණය නිසා සගණයත් එය විසමස්ථානයක් නිසා ජගණයත් අඩු කර 2 ක් අඩු කළ යුතු යි.	26×4 = 104 104-2 = 102
2 වෙනි ගණස්ථානයේ විකල්ප ගණන 5 බැවින් කලින් ලද පිළිතුර 5 න් ගුණ කර විකල්ප ගණනින් අඩු කළ යුතු යි. එහි යෙදෙන සගණය හැර ඉතිරි 4 අඩුකළ යුතු යි.	102×5 = 510 510-4 = 506
පළ වෙනි ගනස්ථානයේ විකල්ප ගණන 4 කි. කලින් ලැබුණ පිළිතුර 4 න් ගුණ කර එහි	506×4 =

යෙදෙන සගණයත්, විසමස්ථානයක් නිසා ජගණයත් යන දෙක ඉවත් කර ඉතිරි 2 පිළිතුරෙන් අඩු කළ යුතු යි.	2024-2 = 2022

අපරාර්ධයේ අවසානයේ ලැබුණ පිළිතුර 2022 වේ. එම සංඛ්‍යාව පූර්වාර්ධයේ 8 වන ගණස්ථානයේ පටන් නැවතත් කලින් සේ ම ගුණ කිරීම හා අඩු කිරීම ආරම්භ කළ යුතු ය. පූර්වාර්ධයේ අවසානය එක් ගරුවක් නිසා එය අතහැර සත්වන ගණස්ථානයේ පටන් ආරම්භක ළ යුතු ය.

පූර්වාර්ධයේ සත්වන ගණස්ථානයේ විකල්ප 4 ක් ඇති බැවින් 4 න් ගුණකර, ගාථාවේ සත්වන ගණය සගණය හෙයින් විකල්ප ගණ තුනක් ඉතිරි වේ. සත්වන ස්ථානයේ ජගණය ද නොයෙදෙන නිසා එය ද ඉවත් කළ යුතු ය. එවිට ඉතිරි 2 කි. එම 2 කලින් ලද පිළිතුරෙන් අඩු කළ යුතු ය.	2022×4 = 8088-2 = 8086
6 වන ගණස්ථානයේ විකල්ප 2 ක් නිසා දෙකෙන් ගුණ කළ යුතු ය. එම ස්ථානයේ නගණය යෙදුන නිසාත් අනෙක් විකල්පය ජගණය අත හරින නිසා අඩු කිරීමක් නැත.	8086×2 = 16172
6 වන ගණස්ථානයේ පිළිතුර වූ 16172, 5 වන ගණස්ථානයේ ඇති විකල්ප ගණන වන 4 න් ගුණ කර එම ගණස්ථානයේ ඇති මගණයත් විසමස්ථාන නිසා ජගණයත් ඉවත් කර ඉතිරි 3 අඩු කළ යුතු ය.	16172×4 = 64688-3 = 64685
පිළිතුරු සංඛ්‍යාව 4 වෙනි ගණස්ථානයේ විකල්ප ගණන වන 5 න් ගුණ කර එම ගණස්ථානයේ ඇති මගණය ඉවත් කර ඉතිරි 4 අඩු කළ යුතු යි.	64685×5 = 323425-4 = 323421
3 වෙනි ගණස්ථානයේ විකල්ප ගණන 4 ක් බැවින් කලින් ලද පිළිතුර 4 න් ගුණ කර විකල්ප ගණනින් අඩු කළ යුතු යි. එහි යෙදෙන්නේ සගණය නිසා සගණයත් එය විසමස්ථානයක් නිසා ජගණයත් අඩු කර 2 ක් අඩු කළ යුතු යි.	323421×4 = 1293684-2 = 1293682
2 වෙනි ගණස්ථානයේ විකල්ප ගණන 5 බැවින් කලින් ලද පිළිතුර 5 න් ගුණ කර විකල්ප ගණනින් අඩු කළ යුතු යි. එහි යෙදෙන සගණය හැර 4 ක් අඩු කළ යුතු යි.	1293682×5 = 6468410-4 = 6468406
පළ වෙනි ගණස්ථානයේ විකල්ප ගණන 4 කි. කලින් ලැබුණ පිළිතුර 4 න් ගුණ කර එහි යෙදෙන සගණ යත්, විසමස්ථානයක් නිසා ජගණයත් යන දෙක ඉවත් කර ඉතිරි 2 පිළිතුරෙන් අඩු කළ යුතු යි.	6468406×4 = 25873624-2 = 25873622

මෙම ගණනය අවසානයේ කරුණාසීතලහදයං යන ගාථාව ආර්යාජාති ප්‍රස්තාරයේ 25873622 වන ගාථාව බව ලැබුණ පිළිතුරෙන් පෙන්වා දෙයි[60]. මේ ආකාරයෙන් සෑම අර්යා ගාථාවකගේ ම උද්දිට්ඨනය සොයා ගත හැකි ය.

මත්තාවුත්ත උද්දිට්ඨනය

මෙහි උද්දිට්ඨය සොයා ගැනීමට පළමුවෙන් ම සෙවිය යුතු ගාථාව ගරු ලහු යොද ඇඳ ගත යුතු ය. ඉන් පසු මෙහි කලින් මත්තාවුත්ත නට්ඨනයෙහි කී ආකාරයට එකින් එක එකතු කරමින් ඉදිරියට අංකයන් යෙදිය යුතු ය. මෙහි දී ගරුවක මාත්‍රා 2 ක් ඇති බව මතක තබා ගත යුතු යි. සියල්ල ලහු වලින් පමණක් නො අඳින නිසා ගරු මාත්‍රාවන් ගේ එක් මාත්‍රාවක අංකයක් ගරුවට ඉහළිනුත් අනෙක් අංකය ගරුවට පහළිනුත් ලිවිය යුතු යි. ඉන් පසු ගරු මාත්‍රාවන්ගේ ඉහළින් ලියූ අංකයන් පමණක් එකතු කොට අවසානයේ ඇති අංකයෙන් අඩු කළ යුතු යි. ඒ එන පිළිතුර සොයනා ගාථාවේ ප්‍රස්තාරයෙහි ස්ථානාංකය යි. ලහු මාත්‍රා 10 ක් ඇති වුත්තයක අංකයන් යෙදෙන්නේ මේ අයුරිනි. මෙහි විස්තරය නට්ඨනයෙන් බලා ගත යුතු ය.

1	2	3	5	8	13	21	34	55	89
–	–	–	–	–	–	–	–	–	–

උදහරණයක් ගරු ලහු මිශ්‍රව ඇති මාත්‍රා 10 ක ගාථාවක උද්දිට්ඨය සොයන්නේ නම් පළමු ව එය ගරු ලහු යොදමින් ලියා ගත යුතු යි.

[60] මෙය පැරණි වුත්තෝදය ග්‍රන්ථයක දක්වා ඇති ආකාරය යි. මෙහි යම් තැන් නොගැලපේ යැයි හැඟේ. එබැවින් විමසිය යුතු.

1	2	5	13	21	55	89
–	∪	∪	–	∪	–	–
	3	8		34		

මෙහි ගරු අක්ෂරයන් හි මාත්‍රා දෙකක් ඇති නිසා එම ගරු මාත්‍රා 2 න් පළමු වෙනි මාත්‍රාවේ අංකය ගරුවට උඩිනුත් දෙ වෙනි මාත්‍රාවේ අංකය ගරුවට පහළිනුත් ලිවිය යුතු ය.

ඉන්පසු ගරු මාත්‍රාවන්ගේ ඉහළින් ඇති අංකයන් පමණක් එකතු කළ යුතු ය. (2 + 5 + 21 = 28) එම ලැබුණ පිළිතුර ගාථාවේ අවසාන මාත්‍රාවේ ඉහළින් ඇති අංකයෙන් අඩු කළ යුතු ය. (89-28 = 61). අවසානයේ ලැබුණ පිළිතුර 61 ය. එය මාත්‍රා 10 ක් ඇති ප්‍රස්තාරයේ 61 වෙනි ස්ථානයේ ඇති ගාථාව වේ.

මේ ආකාරයෙන් මත්තාවුත්ති ගාථාවන්ගේ උද්දිට්ඨය සොයා ගත හැකි ය.

සබ්බගලකිරියනය[61]

යම් ඡන්දසක, උදාහරණයක් ලෙස අක්ෂර 6 ක් ඇති ඡන්දසක ගරු 6 ක් ඇති ගාථා කීයක් ද? ගරු 5 ක් හා ලහුවක් ඇති ගාථා කීයක්ද? යනාදී වශයෙන් ගරු සහ ලහු යෙදෙන ගණන සොයා ගැනීමට මෙම සබ්බගලකිරිය නය උපකාර වේ.

132. **වුත්ත'ක්ඛර සමා සඞ්ඛ්‍යා, ලික්ඛ්‍ය සෙකො'පරූ'පරි;**
එකෙකහීන මෙකාදි, නු'ට්ඨානෙ සබ්බගාදිකං.

වුත්තක්ඛර සමා = ඡන්දස්හුගේ අක්ෂරයන් හා සම වූ; **සඞ්ඛ්‍යා** = සංඛ්‍යාවන්; **සෙකා** = එකක් සහිත වූවන් කොට; **උපරූපරි** = මතු මතුයෙහි; **ලික්ඛ්‍ය** = ලියා; **එකෙකහීනං** = (අන්තයෙහි) එක එක අඩු කොට; **එකාදීනං** = එක දෙක ආදීන්ගේ; **උට්ඨානෙ** = උට්ඨානය (=එකතු) කළ කල්හි; **සබ්බගාදිකං** = සර්ව ගරු පාදදිය වේ.

ගාථාවේ අක්ෂර සංඛ්‍යාවට එකක් (1) ක් එකතු කර ලැබෙන එකතුවට සමාන ගණනක් වූ එකේ සංඛ්‍යාවන් සිරස් අතටත් තිරස් අතටත් ලිවිය යුතු ය. ඉන් පසුව පහළ කොටුවේ ඇති සංඛ්‍යාවත්, පෙර කොටුවේ ඇති සංඛ්‍යාවත් එකතු කර එම එකතුව ලියමින් ඉහළට ඉහළට යා යුතු ය. ඉහළ ම ඇති සංඛ්‍යාද්වය එකතු නොකර හිස් තැනක් තැබිය යුතු ය. මෙසේ පළමු සිරස් පේළිය අවසන් වූ පසු දෙ වෙනි පේළිය ඇරඹිය යුතු ය.

සමවුත්ත සබ්බගලකිරියනය

මෙය උදාහරණයකින් පැහැදිලි කිරීම පහසු වේ.

ක්‍රමය 1,

අක්ෂර 6 ක ගාථාවකට උදාහරණය:-

මෙය අක්ෂර 6 ක ගාථාවක් සඳහා වන බැවින් 6 ට එකක් එකතු කර එකේ ඒවා 7 ක් සිරස් අතටත් තිරස් අතටත් ලිවිය යුතු ය. එය තද පාටින් කොටු කර දක්වා ඇත[62].

7	1						
6	1						
5	1						
4	1						
3	1						
2	1						
1	1	1	1	1	1	1	1
	A	B	C	D	E	F	G

(1.) පළමු වෙනි පේළිය (A) පහත සිට ඉහළට 1 ඉලක්කම පමණක් ඇත. දෙ වෙනි (B) පේළියේ පටන් එකතු කිරීම ආරම්භ කළ යුතුය. (මෙම කොටස පහළ වගුව හා සම්බන්ධව විස්තර කර ඇත.)

(2.) දෙ වෙනි (B) පේළිය පහත සිට ඉහළට (A2+B1=2) (A3+B2=3) (A4+B3=4) (A5+B4=5) (A6+B5=6). (B7) කොටුවට කිසිවක් එකතු නොකර එය හිස්ව තැබිය යුතු ය.

(3.) තුන් වෙනි (3C) පේළිය පහත සිට ඉහළට (B2+C1=3) (B3+C2=6) (B4+C3=10) (B5+C4=15). (C6) කොටුවට කිසිවක් එකතු නොකර එය හිස්ව තැබිය යුතු ය.

(4.) සතරවන (D) පේළිය පහත සිට ඉහළට (C2+D1=4) (C3+D2=10) (C4+D3=20). (D5) කොටුවට කිසිවක් එකතු නොකර එය හිස්ව තැබිය යුතු ය.

[61] මෙය ගලනය, සබ්බගලනය, සබ්බගලක්‍රියනය යනාදී නම් වලින් ද සමහරක් වුත්තෝදය ග්‍රන්ථයන්හි සඳහන් ව ඇත.
[62] තෙරුම් කිරීමට පහසු වීම පිණිස වගුවට පිටින් Aසිට Gදක්වාත් 1 සිට 7 දක්වාත් ලකුණු කර ඇති බව සැලකිය යුතුය.

(5.) පස්වන (E) පේළිය ඉහළට (D2+E1=5)(D3+E2=15). (E4) කොටුවට කිසිවක් එකතු නොකර එය හිස්ව තැබිය යුතු ය.

(6.) හයවන (F) පේළිය ඉහළට (E2+F1=6). (F3) කොටුව හිස්ව තබා එකතු කිරීම අවසන් කල යුතුය. (G2) කොටුවද හිස් විය යුතුය.

7	1						
6	1	6					
5	1	5	15				
4	1	4	10	20			
3	1	3	6	10	15		
2	1	2	3	4	5	6	
1	1	1	1	1	1	1	1
	A	B	C	D	E	F	G

7	1							සර්ව ලහු 1 කි
6	1	6						ගරු 1 ඒවා 6 කි
5	1	5	15					ගරු 2 ඒවා 15 කි
4	1	4	10	20				ගරු 3 ඒවා 20 කි
3	1	3	6	10	15			ගරු 4 ඒවා 15 කි
2	1	2	3	4	5	6		ගරු 5 ඒවා 6 කි
1	1	1	1	1	1	1	1	සර්ව ගරු 1 කි
	A	B	C	D	E	F	G	

ඉහත වගුවට අනුව මාත්‍රා හයක් ඇති ඡන්දසක සර්ව ලහු ගාථා 1 කි, ගරු එකක් හා ලහු පහක් ඇති ගාථා 6 කි. ආදී වශයෙනි. එය තද පාටින් කොටු කර ඇති සංඛ්‍යාව වේ. ඒ අනුව අක්ෂර 6 ක් ඇති ගාථාවක ඇති පාදයන් ප්‍රස්තාර නය ක්‍රමය භාවිතා නො කර මෙම සබ්බගල නය ක්‍රමයෙන් ඉතා ඉක්මනින් ගරු 1 ක් ඇති ගාථා, ගරු 2 ක් ඇති ගාථා යනාදී වශයෙන් ගරු ලහු යෙදී ඇති ගාථා ගණන සොයා ගත හැකිය[63].

අක්ෂර 3 ක ගාථාවකට උදාහරණය:-

මෙය අක්ෂර 3 ක ගාථාවක් සඳහා වන බැවින් 3 ට එකක් එකතුකර එකේ ඒවා 4 ක් සිරස් අතටත් තිරස් අතටත් ලිවිය යුතු ය.

1				සර්ව ලහු ඒවා 1 කි
1	3			ගරු එකේ ඒවා 3 කි
1	2	3		ගරු දෙකේ ඒවා 3 කි
1	1	1	1	සර්ව ගරු 1 කි

අක්ෂර 4 ක ගාථාවකට උදාහරණය:-

1					සර්ව ලහු ඒවා 1 කි
1	4				ගරු එකේ ඒවා 4 කි
1	3	6			ගරු දෙකේ ඒවා 6 කි
1	2	3	4		ගරු තුනේ ඒවා 4 කි
1	1	1	1	1	සර්ව ගරු 1 කි

❖ මේ ආකාරයට ඕනෑම අක්ෂර සංඛ්‍යාවක ගාථාවක සබ්බගලකිරියනය සොයා ගත හැකි ය.

ක්‍රමය 2,

මෙම සමවුත්ත සබ්බගලකිරියනය සඳහා තවත් ක්‍රමයක් දැක් වේ. සෙවීමට අවශ්‍ය ගාථාවේ ඇති අක්ෂර ගණන එකේ සිට අනුලෝම වශයෙන් ලියා ගත යුතු ය. ඉන්පසුව එම පේළියට උඩින් එම අංකයන්

[63] මෙම විස්තරය අක්ෂර 6 ක ගාථාවක් සඳහාය. සෙවිය යුතු ගාථා වල අක්ෂර ගණන අනුව සුදුසු තැන් සුදුසු ලෙස වෙනස් කර ගත යුතු ය.

ම පටිලොම වශයෙන් ද ලියා ගත යුතු ය. උදහරණයක් ලෙස අක්ෂර 6 ක් ඇති ගාථාවක ගරු ලහු සොයන්නේ නම් පළමු ව එම අක්ෂර ගණනට සමානව අංකයන් ලියා ගත යුතු ය.

6	5	4	3	2	1
1	2	3	4	5	6

මෙසේ ලිවීමෙන් අනතුරුව දෙ වෙනි පේළියේ පළමු අංකය පළමු වෙනි පේළියේ පළමු වෙනි අංකයෙන් ගුණ කර පළමු වන අංකයට යටින් ලිවිය යුතු ය. ඉන්පසු එම පිළිතුර පළමු වන පේළියේ දෙ වෙනි අංකයෙන් ගුණ කර දෙ වෙනි පේළියේ දෙ වෙනි අංකයෙන් බෙදා යටින් ලිවිය යුතු ය. ඉන්පසු එම පිළිතුර පළමු වෙනි පේළියේ තුන් වෙනි අංකයෙන් ගුණ කර දෙ වෙනි පේළියේ තුන් වෙනි අංකයෙන් බෙදා යටින් ලිවිය යුතු ය. ඒ ආකාරයෙන් අංකයන් අවසාන වන තෙක් ගුණ කරමින් ලිවිය යුතු ය. ලියා අවසන් වන විට දෙ වෙනි පේළියට යටින් තවත් අංක පේළියක් ලැබී ඇත.

පළමු වෙනි පේළිය	6	5	4	3	2	1
දෙ වෙනි පේළිය	1	2	3	4	5	6
	6	15	20	15	6	1

මෙසේ ලැබුණ අංකයන්ට මුලින් තවත් 1 ක් යොදා ගත යුතු ය. එවිට 1, 6, 15, 20, 15, 6, 1 වේ. එවිට ලැබුණ අංකයන් මෙසේ ගරු ලහු වශයෙන් ගණනය කර ගත හැකි ය.

සර්ව ලහු එකකි, ගරු එකෙ ඒවා හයකි, ගරු දෙකේ ඒවා 15 කි, ගරු තුනේ ඒවා 20 කි, ගරු හතරේ ඒවා 15 කි, ගරු පහේ ඒවා 6 කි, සර්ව ගරු 1 කි.

ක්‍රමය 3

මෙම සබ්බගලකිරිය නය සඳහා වුත්තෝදය සඳහා ලියැවුණු පැරණි ග්‍රන්ථයන්හි තවත් ක්‍රමයක් දක්වේ. එය මේරු ප්‍රස්තාර ක්‍රමය නම් වේ. එය ආරම්භ කිරීමට පළමුවෙන් ම සතරැස් කොටුවක් ඇඳ මේරු මස්තකය සාදා ගත යුතු ය. ඉන් පසු ඊට යටින් කොටු 2 ක් ද, ඊටත් යටින් කොටු 3 ක් ද, ඊටත් යටින් කොටු 4 ක් ද යනාදී වශයෙන් එකින් එක වැඩි කරමින් සෙවිය යුතු ගාථාවේ අක්ෂර ගණනට එකක් එකතු කොට ලැබුණ සංඛ්‍යාවට සමාන ප්‍රමාණයකින් කොටු පෙළි ඇඳිය යුතු යි.

උදහරණයක් ලෙස අක්ෂර 6 ක් ඇති ගාථාවක ගරු ලහු යෙදී ඇති ආකාරය සොයන්නේ නම් පළමු ව සෙවිය යුතු ගාථාවේ අක්ෂර ගණනට එකක් වැඩියෙන් කොටු පේළි 7 ක් ඇඳිය යුතු ය. ඉන්පසු පහත වගුවේ දක්වෙන ආකාරයට මුදුනේ සිට දෙපස කෙළවර කොටු තුල එකේ ඉලක්කම යෙදිය යුතු ය.



ඉන් පසු හිස් කොටු පුරවා ගත යුතු ය. එසේ පිරවීමේ දී හිස් කොටුවේ ඉහළින් සම්බන්ධ වී ඇති කොටු දෙකේ අංකයන් එකතු කරමින් ඉහළ සිට පහළට පුරවාගෙන යා යුතු ය.

			1				
		1	1	1			
	2	1	2	1			
	3	1	3	3	1		
	4	1	4	6	4	1	
	5	1	5	10	10	5	1
6	1	6	15	20	15	6	1

සය වන පේළියේ ඇති අංකයන් අක්ෂර 6 ක් අති ගාථාවේ ගරු ලහු භේදය යි. ඒ අනුව එහි සර්ව ලහු එක කි, ගරු එකේ ඒවා 6 කි, ගරු දෙකේ ඒවා 15 කි, ගරු තුනේ ඒවා 20 කි, ගරු හතරේ ඒවා 15 කි, ගරු පහේ ඒවා 6 කි, සර්ව ගරු 1 කි. මෙම ක්‍රමය ද පළමු ක්‍රමයට බොහෝ සෙයින් සමාන වේ. වෙනස නම් මෙය කන්දක් (මේරු) සේ ඇඳීම ය.

අඩ්ඩසමවුත්ත සබ්බගලකිරියනය

පෙර කියවුනු ප්‍රස්තාරනය, නට්ඨනය, උද්දිට්ඨනය යන නයක්‍රියාවන්හි දී අඩ්ඩසම පාද දෙක එක් පාදයක් ලෙස සලකන ලදී. මෙහි දී ද පාද දෙකක් එක් පාදයක් ලෙස ගෙන කටයුතු කළ යුතු ය. අර්ධසම වුත්ත ප්‍රස්තාරය තුල ම සම වුත්තයන් ද පිහිටන බැවින් එම සමවුත්තයන් අත් හරිමින් අඩ්ඩසම වුත්තයන්ගේ සබ්බගලකිරියනය සෙවිය යුතු ය.

අඩ්ඩසම පාද දෙක ම එක පාදයක් ලෙස ගනිමින් පළමු ව සමවුත්තයන්ගේ ආකාරයට පළමු ක්‍රමයට හෝ අන් ක්‍රමයකට සබ්බගලකිරියනය සොයාගත යුතු යි. උදහරණයක් ලෙස අක්ෂර දෙකක් ඇති අර්ධසම ගාථාවක පාද දෙක ම එකට ගෙන අක්ෂර 4 ක් ඇති ඡන්දසෙහි සබ්බගලක්‍රියනය සෙවිය යුතු ය. එහිදී එන පිළිතුර 1, 4, 6, 4, 1 යි. එනම් සර්ව ලහු ගාථා 1 කි. ගරු එකක් ඇති ගාථා 4 කි. ගරු දෙකක් ඇති ගාථා 6 කි. ගරු ගරු තුනක් ඇති ගාථා 4 කි. සර්ව ගරු ගාථා 1 කි. මේ ආකාරයෙන් පිළිතුර ලැබුණු පසු මෙයින් සමවුත්ත පාදයන් ඉවත් කර ගත යුතු ය. එනම් සර්ව ලහු හා සර්ව ගරු යන පාද සමවුත්ත පාද නිසා ඒ දෙක පළමු ව ඉවත් කෙරේ. සෙසු වුත්ත 14 අතුරෙන් ප්‍රස්තාර නයෙහි එන පාදයක අක්ෂර දෙකක අඩ්ඩසම ප්‍රස්තාර නයෙහි ඇති ද්ලහු වුත්ත ඇතුලත අක්ෂර දෙකක සමවුත්ත ප්‍රස්තාර නයෙහි එකලහු වුත්ත ඇතුලත් වේ. (ප්‍රස්තාරනය නැවත බලන්න.) ඒ ආකාරයෙන් ම සමවුත්ති සබ්බගලක්‍රියාවෙහි "ඒකලහු" වුත්ත අඩ්ඩසම සබ්බගලක්‍රියාවෙහි "ද්විලහු" වුත්ත සංඛ්‍යාව තුළ පවතී. එහෙයින් අඩ්ඩසමවුත්තයන්ගේ ද්විලහු වුත්ත සංඛ්‍යාවෙන් සමවුත්තයන්ගේ ඒකලහු වුත්ත සංඛ්‍යාව අඩු කළ යුතු ය.

			1		
		1	1	1	
	2	1	2	1	
	3	1	3	3	1
4	1	4	6	4	1

මෙම ප්‍රස්තාරයේ දෙ වෙනි පෙළියෙන් දැක්වෙන්නේ අක්ෂර දෙකක් ඇති සමපාද වුත්තයක සබ්බගලකිරියනය යි. එහි සර්ව ලහු පාද 1 කි. ගරු එකක් ඇති පාද 2 කි. සර්ව ගරු පාද 1 කි. හතර වෙනි පේළියෙන් දැක්වෙන්නේ අක්ෂර දෙකක් ඇති පාද සහිත ගාථාවක අඩ්ඩසමපාදවුත්ත සබ්බගලක්‍රියනය යි. එහි සර්ව ලහු පාද එකකි. ගරු එකක් ඇති පාද 4 කි. ගරු දෙකක් ඇති පාද 6 කි. ගරු තුනක් ඇති පාද 4 කි. සර්ව ගරු පාද එකකි.

ලහු එකක් සහ ගරු එකක් ඇති අක්ෂර දෙකක සමපාදයක් ගෙන එයින් අඩ්ඩසම පාදයක් කළ කල්හි එහි ලහු දෙකක් හා ගරු දෙකක් ඇත. අක්ෂර දෙකක් ඇති අඩ්ඩසම පාදයක සබ්බගලකිරිය නය සෙවීමට සඳහා අක්ෂර දෙකක් ඇති අඩ්ඩසමපාද සබ්බගලකිරියනයෙහි ගරු දෙකේ වුත්ත හයෙන් අක්ෂර දෙකක් ඇති සමපාද සබ්බගලකිරිය නයෙහි ගරු එකක් ඇති වුත්ත සංඛ්‍යාව වන දෙක අඩු කළ යුතු ය. එවිට ඉතිරි වන්නේ ශුද්ධ වූ අඩ්ඩසමපාද වුත්ත සංඛ්‍යාව යි.

එසේ කොට ලැබූ (6-2=4) පිළිතුර 4 කි. ඒ අනුව ගරු 2 ක් යෙදෙන අඩ්ඩසමවුත්තපාද ගණන 4 කි. කලින් කී සේ ම සබ්බ ලහු හා සබ්බ ගරු සමවුත්තපාද නිසා ඉවත් වේ. එවිට පිළිතුර වන්නේ 4, 4, 4 යි. එනම් ගරු එකක් යෙදෙන පාද 4 කි. ගරු දෙකක් යෙදෙන පාද 4 කි. ගරු තුනක් යෙදෙන පාද 4 කි.

මේ ආකාරයට සමවුත්ත සබ්බගලක්‍රියාවේ ද්විලහු - තිලහු - චතුලහු ආදී වුත්තයන් අඩ්ඩසමවුත්ත සබ්බගලක්‍රියාවේ පිළිවෙළින් චතුලහු - ඡලහු - අට්ඨලහු ආදියෙන් අඩු කිරීමෙන් ශුද්ධ අඩ්ඩසම සබ්බගලක්‍රියාව ලැබෙන බව දත යුතු යි.

විසමවුත්ත සබ්බගලකිරියනය

විසමවුත්තයක සබ්බගලක්‍රියනය සෙවීමේදී පළමුවෙන් විසමපාද 4 ම එක් පාදයක් ලෙස ගෙන සබ්බගලක්‍රිය නය සොයා ගත යුතු ය. පසුව එයින් සමවුත්තපාදයන් හා අඩ්ඩසමවුත්තපාදයන් අඩු කරගනිමින් සුද්ධ විසමවුත්තයන්හි සබ්බගලක්‍රියනය සොයා ගත යුතු ය.

උදාහරණයක් ලෙස අක්ෂර දෙකක විසමවුත්තපාදයක ගරු ලහු සෙවීමේ දී පාද 4 ම එකක් ලෙස ගෙන අක්ෂර 8 ක් ඇති පාදයක ගරු ලහු යෙදෙන ආකාරය පළමු ව සොයා ගත යුතු ය.

මෙසේ අදළ ගණන අනුව මේරු ප්‍රස්තාරය කළ කල්හි මේ එක ම ප්‍රස්තාරය තුල සමවුත්ත, අඩ්ඩසමවුත්ත සහ විසමවුත්ත යන සියළුම පාදයන් පෙන්වයි. අඩ්ඩසමවුත්තයන් කෙරෙන් සමවුත්තයන් ඉවත් කරන ලද්දක් මෙන්, මෙහි දී විසමවුත්තයන් කෙරෙන් සමවුත්ත, අඩ්ඩසම වුත්ත යන දෙවර්ගය ම ඉවත් කළ යුතු ය. එවිට ඉතිරි වන්නේ ශුද්ධවිසමවුත්ත සබ්බගලයන් ය.

					1					
				1	1	1				
			2	1	2	1				
		3	1	3	3	1				
	4	1	4	6	4	1				
5	1	5	10	10	5	1				
6	1	6	15	20	15	6	1			
7	1	7	21	35	35	21	7	1		
8	1	8	28	56	70	56	28	8	1	

අක්ෂර 2 ක සමවුත්ත ගරුක්‍රියාව

අක්ෂර 2 ක අඩ්ඩසමවුත්ත ගරුක්‍රියාව

අක්ෂර දෙකක විසමවුත්තපාද ගරුක්‍රියා

මෙහි දැක්වෙන විසමවුත්තපාද සබ්බගලක්‍රියාවෙන් අඩ්ඩසමවුත්තපාද සබ්බගලක්‍රියාව අඩු කිරීමෙන් ශුද්ධ වූ විසමවුත්තපාද සබ්බගලක්‍රියාව ලැබේ. පෙර පරිදි මෙහි ආ පිළිතුරෙන් (1, 8, 28, 56, 70, 56, 28, 8, 1) මුල් අංක 1 හා අවසන් අංක 1 සබ්බගරු හා සබ්බලහු හෙයින් සමවුත්ති වේ. එය ඉවත් කරගත යුතු ය. ඉන් අනතුරුව පෙර පරිදි ම විසමවුත්තයෙන් අඩ්ඩසමවුත්තයන් අඩුකරගත යුතු ය.

විසමවුත්තිපාද සබ්බගලක්‍රියා	8	28	56	70	56	28	8
අඩ්ඩසමවුත්තිපාද සබ්බගලක්‍රියා	-	4	-	6	-	4	-
ශුද්ධ විසමවුත්තිපාද සබ්බගලක්‍රියා	8	24	56	64	56	24	8

ඒ අනුව විසමවුත්තිපාද සතරේ ම ගරු 1 ක් යෙදෙන පාද 8 කි. ගරු 2 ක් යෙදෙන පාද 24 කි. ගරු 3 ක් යෙදෙන පාද 56 කි. ගරු 4 ක් යෙදෙන පාද 64 කි. ගරු 5 ක් යෙදෙන පාද 56 කි. ගරු 6 ක් යෙදෙන පාද 24 කි. ගරු 7 ක් යෙදෙන පාද 8 කි. මේ ආකාරයෙන් සෙසු විසමවුත්ති පාදයන්ගේ ද සබ්බගලක්‍රියනය සොයාගත හැකි ය.

අරියා සබ්බගලකිරියනය

අරියාජාතියේ සබ්බගරු, සබ්බලහු පාදයන් නො යෙදේ. ගරු එකක් ඇති පාද, දෙකක් ඇති පාදයන් සෙවීම දුෂ්කර හෙයින් හෝ වෙනත් හේතුන් මත පැරණි ඡන්දස්ආචර්යන් වහන්සේලා අරියා ජාතියට සබ්බගලක්‍රියනයක් දක්වා නොමැත.

මත්තාවුත්ත සබ්බගලකිරියනය

මත්තාවුත්තයෙහි සබ්බගලකිරිය සෙවීම පිණිස මේරු ප්‍රස්තාරය ම යොදා ගැනේ. මෙහිදී වණ්ණවුත්තියේදී භාවිතා කල සතරස් කොටු ද්විත්ව කිරමින් මේරු ප්‍රස්තාරය ඇඳගත යුතු ය. පළවෙනි පේළිය ද්විත්ව නො කෙරේ. යම් මත්තා ඡන්දසක සබ්බගලකිරිය සෙවීමට, ඒ ඡන්දසෙහි ඇති මාත්‍රා ගණනට

සමානව ද්විත්ව කරන ලද කොටු පේළි ගණනක් ඇඳිය යුතු ය. උදහරණයක් ලෙස මාත්‍රා 7 ක් ඇති ගාථාවක සබ්බගලකිරියනය සොයන්නේ නම් කොටු පේලි 7 ක් ඇඳිය යුතු ය. මාත්‍රා 8 ක් ඇති ගාථාවක සොයන්නේ නම් කොටු පේලි ඇඳිය යුත්තේ 8 කි. එහි 8 වන පේළියේ අංකයන් මාත්‍රා 8 ක් ඇති ගාථාවේ සබ්බගලක්‍රියනය වේ. එසේ ඇඳීමෙන් පසු එම ප්‍රස්තාරයේ මුදුනේ සිට ද්විත්වකළ කොටු වල උඩ පේළියේ දෙකෙළවර ඇති කොටු තුල පමණක් එකේ ඉලක්කම යෙදිය යුතු ය.

	1	1		
2	1	1		
3	2	1		
4	1		1	
5	3		1	
6	1			1
7	4			1

මෙසේ ප්‍රස්තාරය ඇඳගත් පසු මුදුන් කොටුවෙන් පටන් අවසානය දක්වා ද්විත්ව කළ කොටුවල යට පේළියේ වම් පස කෙළවර පමණක් 1, 2, 3, 4 පිළිවෙළින් අංක යෙදිය යුතු ය. දකුණු පස කොටුවල එකේ ඉලක්කම යෙදිය යුතු ය.

ඊළඟට කළ යුත්තේ හිස් කොටු පිරවීමයි. එය පැහැදිලි කිරීම පිණිස මෙම උදහරණයේ අක්ෂර යොද පෙන්වනු ලැබේ.

	1	1		
2	1	b		
3	a	c		
4	1	e	f	
5	g	h	i	
6	1	j	k	1
7	4	l	m	1

මෙම ප්‍රසතාරයෙහි දක්වා ඇති පරිදි a සහ b කොටුවල අංකයන් එකතු කර එම සංඛ්‍යාව දෙ වෙනි කොටු යුගලයේ e කොටුවට යෙදිය යුතු වේ. නැවතත් c සහ e එකතු කර එම සංඛ්‍යාවෙන් h කොටුව පිරවිය යුතු වේ. නැවත නැවතත් ඒ ආකාරයෙන් ම එකතු කිරීම සිදු කළ යුතු ය. එය මෙසේ දැක්විය හැකි ය.

(a + b = e / c + e = h / g + e = j / h + j = l / h + f = k / i + k = m) මේ ක්‍රමයෙන් එකතු කිරීමෙන් ප්‍රස්තාරයේ හිස්තැන් සම්පූර්ණ වේ. එසේ සම්පූර්ණ කළ පසු ප්‍රස්තාරයේ අංකයන් මෙසේ දිස් වේ.

	1	1		
2	1	1		
3	2	1		
4	1	3	1	
5	3	4	1	
6	1	6	5	1
7	4	10	6	1

මෙසේ එකතු කිරීමෙන් පසුව මෙහි මුදුනෙහි පිහිටි පළවෙනි කොටුවෙහි එක් මාත්‍රාවක් ඇති ඡන්දසෙහි එක් ලහුවක් ඇති වුත්තය ද, දෙ වෙනි පෙළියෙහි මාත්‍රා 2 ක් ඇති ඡන්දසෙහි එන එක ලහුවක් ඇති වුත්තය හා සර්වගරු වුත්තය ද, තුන්වෙනි පෙළියෙහි මාත්‍රා 3 ක් ඇති ඡන්දසෙහි එකගරුවක් ඇති වුත්ත 2 හා සර්වගරු වුත්තය ද ලැබේ. අනෙක් පේළිවල ද පිළිවෙළින් මාත්‍රා 4 ක් ඇති, මාත්‍රා 5 ක් ඇති, මාත්‍රා 6 ක් ඇති, මාත්‍රා 7 ක් ඇති ඡන්දස්වල ද සබ්බගලක්‍රියනය පෙන්වා ඇත. මේ ලෙස මාත්‍රා 20 ක් ඇති මත්තා ඡන්දසක සබ්බලගක්‍රියනය සෙවීම පිණිස මෙම ප්‍රස්තාරය අඳින්නේ නම් එම ප්‍රස්තාරය තුල ම මාත්‍රා 20 ට අඩු සියළුම ඡන්දස්හුගේ සබ්බගලක්‍රියනය බලා ගත හැක.

මෙහි වුත්ත සංඛ්‍යාව දැක්වීමෙදී පේළියේ මුල පටන් සර්වගරු, ඒකගරු, ද්විගරු යනාදිය දැක්විය යුතු ය. මාත්‍රා 3 ක්, මාත්‍රා 5 ක්, මාත්‍රා 7 ක් ආදී ඡන්දස්හි සර්වගරු වුත්ත නොයෙදෙන හෙයින් ඒක ගරු වලින් ආරම්භ කළ යුතු ය.

මේ ආදී නයෙන් මත්තාවුත්ත ගාථාවල සබ්බගලක්‍රියනය සොයාගත හැකිය.

වුත්ත සඞ්ඛ්‍යානය

ප්‍රස්තාරනය භාවිතා නොකොට ඡන්දසක ලැබෙන ගාථා විකල්ප සංඛ්‍යාව හෙවත් පේළි කොපමණක් ලැබේ ද, යන්න මෙයින් සොයාගත හැකිය.

133. **ගරුක්‍රියා'ඞ්ක සන්දෙහෙ, භවෙ සඞ්ඛ්‍යා විමිස්සිතෙ;**
උද්දිට්ඨ'ඞ්ක සමාහාරො, සෙ'කො වෙ'මං සමා'නයෙ.

ගරුක්‍රියා = එක දෙක ආදී ගරු ක්‍රියාවගේ; **අඞ්ක සන්දෙහෙ** = අංක සමූහය; **විමිස්සිතෙ** = මිශ්‍ර කළ කල්හි හෙවත් එක් කළ කල්හි; **සඞ්ඛ්‍යා භවෙ** = (ඡන්දසෙහි වුත්තය) සංඛ්‍යාව වන්නේ ය; **වා** = නොහොත්; **සෙකො** = එකක් සහිත වූ; **උද්දිට්ඨ + අඞ්ක සමාහාරො** = උද්දිට්ඨයෙහි අංකයන්ගේ එක් කිරීම; **ඉමං** = මේ (වුත්තයන්ගේ) සංඛ්‍යාතය; **සමානයෙ** = සමානයයි එළවන්නේ ය.

සබ්බගලකිරිය නයේ අවසානයේ එන අංක සමූහය එකට එකතු කිරීමෙන් යම් ඡන්දසක ඇති ගාථා ගණන සොයාගත හැක. (මෙහි ක්‍රම තුනක් මඟින් මෙම ගාථා ගණන සොයා ගන්නා ආකාරය දක්වා ඇත.)

සමවුත්ත සංඛ්‍යානය

ඡන්දස් ප්‍රස්තාරයක් භාවිතා නොකරමින් ඡන්දසක ලැබෙන විකල්ප ගාථා සංඛ්‍යාව සොයා ගැනීමට පළමුවෙන් සබ්බගලකිරියනය ක්‍රමයේ පරිදි අංකයන් ලියා ගත යුතු ය. (ඉහත සබ්බගලකිරියනය බලන්න.)

පළමු වෙනි ක්‍රමය.

අක්ෂර 3 ක් ඇති ඡන්දසක තිබිය හැකි ගාථා ගණන සොයා ගැනීම. ඉහත 132 ගාථාව යටතේ දැක්වූ සබ්බගලක්‍රියානයෙහි අක්ෂර 3 ක් ඇති ගාථාවට දී ඇති උදහරණයේ ඉහළින් ම ඇති සංඛ්‍යාවන් එකතු කළ යුතු ය.

1 + 3 + 3 + 1 = 8 (ගාථා ගණන 8 කි.)

සබ්බගලකිරියනය අනුව අක්ෂර 4 ක් ඇති ඡන්දසක ගාථා ගණන සෙවීම.

1 + 4 + 6 + 4 + 1 = 16 (ගාථා ගණන 16 කි.)

සබ්බගලකිරියනය අනුව අක්ෂර 6 ක් ඇති ඡන්දසක ගාථා ගණන සෙවීම.

1 + 6 + 15 + 20 + 15 + 6 + 1 = 64 (ගාථා ගණන 64 කි.)

දෙ වෙනි ක්‍රමය

උද්දිට්ඨනය ක්‍රමය අනුව ගුණ කරමින් සංඛ්‍යාවන් ලියා ඒ සියල්ල එකතු කර තවත් එකක් (1) එකතු කිරීමෙන්ද විකල්ප ගණන ලැබේ.

අක්ෂර තුනක් ඇති ඡන්දසකට උදහරණය

–	–	∪
1	2	4

1 + 2 + 4 = 7

7 + 1 = 8 (ගාථා ගණන 8 කි.)

අක්ෂර 4 ක් ඇති ඡන්දසකට උදහරණය. උද්දිට්ඨ නය ක්‍රමය අනුව ගුණ කරමින් ලියා එකතු කර තවත් 1 ක් එකතු කිරීම.

–	–	∪	∪
1	2	4	8

1 + 2 + 4 + 8 = 15

15 + 1 = 16 (ගාථා ගණන 16 කි)

අක්ෂර 6 ක් ඇති ඡන්දසකට උදහරණය. උද්දිට්ඨ නය ක්‍රමය අනුව ගුණ කරමින් ලියා එකතු කර තවත් 1 ක් එකතු කිරීම.

–	–	∪	–	∪	∪
1	2	4	8	16	32

1 + 2 + 4 + 8 + 16 + 32 = 63

63 + 1 = 64 (ගාථා ගණන 64 කි)

තුන් වෙනි ක්‍රමය

ඉහත කියන ලද උද්දිට්ඨනයේ අවසාන අක්ෂරයේ අංකය 2 න් ගුණ කිරීමෙන් ද එම ඡන්දස් ප්‍රස්තාරයෙහි ඇති විකල්ප ගාථා ගණන සොයා ගත හැකි ය.

අක්ෂර 6 ක් ඇති ඡන්දසකට උදාහරණය. අක්ෂර 6 ක් ඇති ඡන්දසෙහි උද්දිට්ඨ නය ක්‍රමය අනුව අවසාන අංකය වන්නේ 32 යි. එය දෙකෙන් ගුණ කිරීමෙන් ද විකල්ප ගාථා ගණන සොයා ගත හැකි ය.

$$32 \times 2 = 64$$

වණ්ණවුත්තයන්හි එක් අක්ෂරයක ලහු ගරු වශයෙන් විකල්ප දෙක කි. එබැවින් වුත්තසංඛ්‍යානය සොයන විට වුත්තයේ මුල් අක්ෂරයේ ඇති ලහු ගරු විකල්ප දෙක, දෙ වෙනි අක්ෂරයේ විකල්ප දෙකෙන් ගුණ කළ යුතු ය. එම පිළිතුර තුන් වෙනි අක්ෂරයේ විකල්ප දෙකෙන් ද, නැවතත් සතරවෙනි අක්ෂරයේ විකල්ප දෙකෙන් ද යනාදි වශයෙන් ගුණ කිරීමෙන් ද වුත්තසංඛ්‍යානය ලැබේ.

උදාහරණයක් ලෙස අක්ෂර 6 ක් ඇති ඡන්දසෙහි ගුණ කිරීම කළ යුත්තේ පස් වතාවකි. පස් වෙනි වතාව ගුණ කිරීමෙන් ලැබෙන පිළිතුර වුත්ත සංඛ්‍යානය වේ. එසේ අක්ෂර 5 ක් ඇති වුත්තයේ සංඛ්‍යානය ලැබෙන විට එක් අක්ෂරයක් ඇති, දෙකක් ඇති, තුනක් ඇති සහ හතරක් ඇති වුත්තයන්ගේ සංඛ්‍යානය ද ලැබී ඇත.

$2\times2 = 4$ $\quad$ $4\times2 = 8$ $\quad$ $8\times2 = 16$ $\quad$ $16\times2 = 32$ $\quad$ $32\times2 = 64$

මේ අනුව ගුණ කරන වාර ගණන අනුව ඒ ඒ අක්ෂර ගණනින් ඇති වුත්තයන්ගේ සංඛ්‍යානය ලැබේ.

අඩ්ඪසම, විසමවුත්ත සංඛ්‍යානය

ඒ ඒ ඡන්දසෙහි සමවුත්ත සංඛ්‍යාව එම සංඛ්‍යාවෙන් ම ගුණ කළ විට අඩ්ඪසම වුත්තසංඛ්‍යානය ලැබේ. අඩ්ඪසමවුත්ත සංඛ්‍යාව ඒ සංඛ්‍යාවෙන් ගුණ කළ විට විසම වුත්ත සංඛ්‍යාව ලැබේ. එය කලින් කියන ලද පත්ථාරනයේ දී පැහැදිලි කර ඇත.

උදාහරණයක් ලෙස අක්ෂර 4 ක් ඇති අඩ්ඪසමවුත්තයක වුත්ත සංඛ්‍යානය සෙවීමේ දී පළමු ව අක්ෂර 4 ක් ඇති සමපාද වුත්ත සංඛ්‍යාව ලබා ගත යුතු යි. ඒ සඳහා ක්‍රම කිහිපයක් ඉහත දක්වන ලදී. අක්ෂර 4 ක් ඇති සමපාද වුත්ත සංඛ්‍යාව 16 කි (4×4=16). අනතුරුව අඩ්ඪසම වුත්ත සංඛ්‍යානය සෙවීමට සමපාද වුත්ත සංඛ්‍යාව එම අංකයෙන් ම වැඩි කළ විට 256 කි (16×16=256). මෙම වුත්ත සංඛ්‍යා 256 තුළ සමවුත්ත පාදයන් ද ඇතුලත් වේ. එම නිසා එයින් සමපාද වුත්ත සංඛ්‍යාව අඩු කළ යුතු ය. (256-16=240) ශුද්ධ අඩ්ඪසමපාද සංඛ්‍යාව 240 වේ.

අක්ෂර 4 ක් ඇති විසමවුත්ත පාදයන්ගේ වුත්තසංඛ්‍යානය සෙවීමේ දී අඩ්ඪසම වුත්ත සංඛ්‍යාව එම සංඛ්‍යාවෙන් ම වැඩි කළ යිට 65536 කි (256×256=65536). මෙම සංඛ්‍යාව සියළුම විසමවුත්ත පාද සංඛ්‍යාවයි. මෙම වුත්ත සංඛ්‍යා 65536 තුල සමවුත්ත පාද හා අඩ්ඪසමවුත්ත පාදයන් ද ඇතුලත්ව ඇත.එම නිසා එයින් විසමවුත්ත පාද පමණක් ලබා ගැනීමට අඩ්ඪසමවුත්ත පාද සංඛ්‍යානය අඩු කළ යුතු ය. අක්ෂර 4 ක් ඇති විසමවුත්ති සංඛ්‍යානය 65280 කි (65536-256=65280).

මේ ආකාරයට වෙනස් අක්ෂර සංඛ්‍යාවන් ඇති වුත්තයන්ගේ ද අඩ්ඪසම, විසම වුත්ත සංඛ්‍යානයන් සොයාගත හැකි ය.

අරියා, මත්තා වුත්ත සංඛ්‍යානය

අරියා ගාථාවන්ගේ වුත්ත සංඛ්‍යානය සෙවීම සඳහා ඒ ඒ අරියාගාථාවේ අර්ධ දෙකෙහි ම ඇති ගණයන්ගේ විකල්ප සංඛ්‍යාවන් වෙන් වෙන් ව ගුණ කළ යුතු ය. එම පිළිතුරු දෙක ගුණ කිරීමෙන් අරියා ගාථාවගේ වුත්ත සංඛ්‍යානය ලැබේ. එය මෙසේ ය.

පූර්වාර්ධය								
ගණස්ථානය	1	2	3	4	5	6	7	8
විකල්ප සංඛ්‍යාව	4	5	4	5	4	2	4	1

අපරාර්ධය								
ගණස්ථානය	1	2	3	4	5	6	7	8
විකල්ප සංඛ්‍යාව	4	5	4	5	4	1	4	1

පූර්වාර්ධය :- 4×5×4×5×4×2×4×1 = 12800, අපරාර්ධය :- 4×5×4×5×4×1×4×1 = 6400, අරියා ගාථාවේ වුත්ත සංඛ්‍යාන 12800×6400 = 81920000 කි.

මත්තාවුත්ති නට්ඨනය ක්‍රමයට අනුව සංඛ්‍යාවන් එකතු කරමින් ලිවීමේ දී වුත්තයේ අවසාන මාත්‍රාවට ලැබෙන අංකය මත්තාවුත්ති සංඛ්‍යානය යි. එය මත්තාවුත්ති නට්ඨනය බලා තේරුම් කරගත යුතු ය.

වුත්ත අද්ධානය

ප්‍රස්තාරනයෙහි දක්වන ලද ප්‍රස්තාරයේ ප්‍රමාණය ඒ ඒ ගාථාවට අනුව ප්‍රස්තාරය නො ඇඳ දැන ගැනීමට මෙම වුත්ත අද්ධානය උපකාර වේ.

134. **සඞ්ඛ්‍යෙව ද්විගුණෙ'කූනා, විත්ථාරා'යාමසම්භවා;**
වුත්තස්ස'ද්ධ'න්තරානඤ්ච, ගරුලානඤ්ච අඞ්ගුලං.

ද්විගුණා = දෙකෙන් ගුණ වූ; **එකූණා** = එකක් ඌන වූ; **සඞ්ඛ්‍යා එව** = (අක්ෂරයන්ගේ ද වුත්තයන්ගේ ද) සංඛ්‍යා තොමෝමැ; **වුත්තස්ස** = ඡන්දස්හුගේ; **විත්ථාරා'යාමසම්භවා** = විස්ථාරයෙන් ද ආයාමයෙන් ද හටගත්තා වූ; **අද්ධා** = මාර්ගය වෙයි; **අන්තරානඤ්ච** = (ගරු - ලහුන්ගේ හා වුත්තයන්ගේ) අන්තරයන්ට ද; **ගරුලානඤ්ච** = ගරු - ලහුන්ට ද; **අඞ්ගුලං** = (ප්‍රමාණය) අඟුලක්[64] වේ.

ප්‍රස්තාරයේ දිග අඟුල් වලින් දැන ගැනීමට නම් වුත්ත සංඛ්‍යානයින් සොයා ගන්නා ලද අදුල ඡන්දසෙහි තිබිය හැකි ගාථා සංඛ්‍යාව ගෙන එය දෙගුණ කළ යුතු ය. ඉන් පසු එම පිළිතුරින් එකක් (1) අඩු කළ යුතු ය. එවිට ලැබෙන්නේ දිග වන අඟල් ගණන යි.

දෙගුණ කළ යුත්තේ මන්ද යත් ගරු ලහු වලට අඟුල බැගිනුත්, ඔවුන්ගේ අතරමැද හිස්ව අඟුල බැගිනුත් (තබන) බැවිනි. පහත උදහරණයෙන් එය පැහැදිලි කෙරේ.



එකක් අඩු කළ යුත්තේ ගාථා ගණනට වඩා එක් හිස්තැනක් අඩු වන බැවිනි. ඉහත උදහරණයට අනුව පාද දෙකක් ඇති ගාථාවේ ඇත්තේ එක් හිස් තැනකි.

පළල සොයා ගැනීමට නම් කලින් මෙන් ගාථා සංඛ්‍යාව නොව අදුළ ගාථාවේ අකුරු සංඛ්‍යාව දෙගුණ කොට එකක් අඩු කළ යුතු ය. එය ඉහත උදහරණ සටහනින් පෙන්වා ඇත.

උදා:- අකුරු 2 ක් ඇති ගාථාවක ප්‍රස්තාරයේ දිග දැන ගැනීමට නම් එම ඡන්දසෙහි ගාථා ගණන දෙකෙන් ගුණ කර එකක් අඩු කළ යුතුයි. (4×2 = 8, 8-1= 7)

පළල දැන ගැනීමට නම් අක්ෂර ගණන දෙකෙන් ගුණ කර එකක් අඩුකළ යුතුයි. (2×2 = 4, 4-1 = 3) එම ප්‍රස්තාරය මෙසේ දැක්විය හැකි ය.



[64] මෙහි අඟලක් යනු ඇඟිල්ලක පළල යි.

උදා :- අකුරු 3 ක් ඇති ගාථාවක ප්‍රස්තාරයේ දිග දැන ගැනීමට එම ඡන්දසෙහි ගාථා ගණන (වුත්ත සංඛ්‍යානයට අනුව) 8 ක් වන බැවින්, 8 දෙගුණ කළ යුතු ය. එවිට ලැබෙන 16 න් 1 ක් අඩු කළ යුතු ය.

පිළිතුර වන 15 යනු දිග වන අඟුල් ගණන යි (8 × 2 = 16, 16-1 = 15).

පළල දැන ගැනීමට එම ගාථාවේ අකුරු 3 ක් ඇති බැවින් 3 දෙගුණ කළ පසු ලැබෙන 6 න් 1 ක් අඩු කළ යුතු ය. (3 × 2 = 6, 6-1 = 5) එය මෙසේ දැක්විය හැකි ය.

∪		∪		∪
–		∪		∪
∪		–		∪
–		–		∪
∪		∪		–
–		∪		–
∪		–		–
–		–		–

උදා :- අකුරු 4 ක් ඇති ප්‍රස්තාරයක දිග සහ පළල දැන ගැනීම. අකුරු 4 ක් ඇති ඡන්දසක ගාථා ගණන 16 කි. එවිට

දිග සොයා ගැනීමට - 16 × 2 = 32, 32-1 = 31. පළල සොයා ගැනීමට - 4 × 2 = 8, 8-1 = 7.

උදා :- අකුරු 6 ක් ඇති ප්‍රස්තාරයක දිග සහ පළල දැන ගැනීම. අකුරු 6 ක් ඇති ඡන්දසක ගාථා ගණන 64 කි. එවිට

දිග සොයා ගැනීමට - 64 × 2 = 128, 128-1 = 127. පළල සොයා ගැනීමට - 6 × 2 = 12, 12-1 = 11.

ප්‍රස්තාරයේ දිග සොයා ගැනීමට තවත් ක්‍රමයක් දැක්විය හැකි ය. වුත්තයේ ඇති අක්ෂර සංඛ්‍යාවේ බලය යොදා ගැනීම යි. උදාහරණයක් ලෙස අක්ෂර 6 ක් ඇති වුත්තයේ දිග සොයා ගැනීමට වුත්තයේ ඇති අක්ෂර සංඛ්‍යාවේ දෙකේ බලයක් ලෙස ගැනීමෙනි.

$$(2^6 \times 2)-1 = 127$$

මේ ආකාරයට ඕනෑම අක්ෂර ඇති ගාථාවක ප්‍රස්තාරයේ දිග හා පළල දැනගත හැකි ය.

ඉති වුත්තොදයෙ ඡන්දසි ඡප්පච්චයවිභාගො නාම
ඡට්ඨො පරිච්ඡෙදො.

මෙම වුත්තෝදය ඡන්දස් ග්‍රන්ථයෙහි ඡප්පච්ඡය විභාග නම් වූ
හයවෙනි පරිච්ඡේදය නිමි.

නිගමන

135. **සෙල'න්තරා'යතන වාසික සීල'ථෙර[65],**
පාදෙ ගරුග්ගුණගරුජ්ජයතං මමෙ'සො;
යස්සප්පභාව'මවලම්බ මයෙ'දිසොපි,
සම්පාදිතො'භිමත සිද්ධිකරො පරත්ථො.

යස්ස = යම් ආචාර්ය ස්ථවිර කෙනෙකුගේ; **පභාවං** = (ත්‍රිපිටකධර ආදී) මහිමය; **අවලම්බ** = ඇසුරු කොට; **අභිමත සිද්ධිකරො** = ඉෂ්ඨාර්ථ පරිනිෂ්පත්තිය කරන්නා වූ; **ඊදිසො** = මෙබඳු වූ හෙවත් මාගධික ඡන්දස්ශාස්ත්‍රයාගේ නිෂ්පාදන ස්වරූපය වූ; **පරත්ථො** = පරාර්ථයෙක්; **මයා අපි** = මා විසිනිදු; **සම්පාදිතො** = සම්පාදනය කරන ලද්දේ ද; **එසො** = මේ; **ගුණගරු** = (සීලාදී) ලෞකික ගුණ සම්පත්තියෙන් මහත් වූ; **මම** = මාගේ; **ගුරු** = ආචාර්ය වූ; **සෙලන්තර ආයතන වාසික** = සේලාන්තරායතන (=ගලතුරුමුල විහාර) වාසී වූ; **සීලථෙර පාදෙ** = "සීල" නම් ස්ථවිරපාද තෙම; **ජයතං** = (සර්ව උත්කර්ෂයෙන්) ජයග්‍රහණය කෙරේවා.

යම්කිසි ආචාර්යන් වහන්සේ කෙනෙකුන්ගේ ඥාණ ප්‍රභාව පිහිට කොට මා විසින් මෙවන් වූ ද, කැමති වූ අර්ථය සිද්ධ කරන්නා වූ පරාර්ථයක් සම්පාදනය කරන ලද්දේ ද, සේලන්තර විහාරයෙහි වාසය කරන්නා වූ සීල[66] ථේරපාදයන් වහන්සේ නම් වූ ගුණයෙන් බර වූ ඒ ආචර්යන් වහන්සේ දිනාවා!

136. **පරත්ථ සම්පාදනතො, පුඤ්ඤෙනා'ධිගතෙන'හං;**
පරත්ථ සම්පාදනකො, භවෙය්‍යං ජාති ජාතියං.

පරත්ථ සම්පාදනතො = (මෙසේ) පරාර්ථ නිෂ්පාදනය හේතු කොටගෙන; **අධිකතෙන** = ලබන ලද; **පුඤ්ඤෙන** = පිනෙන්; **අහං** = මම; **ජාති ජාතියං** = භවයක් භවයක් පාසා; **පරත්ථ සම්පාදනකො** = (ලෞකික ලෝකෝත්තර සංඛ්‍යාත) පරාර්ථ නිෂ්පාදනය කරන්නෙක්; **භවෙය්‍ය** = වෙම්වා.

පරාර්ථය සම්පාදනය කිරීම් වශයෙන් ලැබුවාවූ පුණ්‍ය බලයෙන් මම ජාතියක් ජාතියක් පාසා පරාර්ථය සම්පාදනය කරන්නෙක් වෙම්වා!

137. **අවලොකිත මත්තෙන, යථා ඡප්පච්චයා මයා;**
සාධිතා සාධයන්තෙ'ව, මිච්ඡිතත්ථම්පි පාණිනොති.

ඡප්පච්චයා = (ප්‍රස්තාරාදි) සය ප්‍රත්‍යයෝ; **අවලොකිත මත්තෙන** = (නිබන්ධයන්) අවලෝකනය කිරීම් මාත්‍රයකින්; **මයා** = මා විසින්; **යථා** = යම් සේ; **සාධිතා** = සිද්ධ කරන ලද්දහු ද; **එවං** = එපරිද්දෙන්; **පාණිනො අපි** = (ලෝකවාසී) සත්ත්වයෝ ද; **ඉච්ඡිතත්ථං** = ලෞකික (ලෝකෝත්තර සුඛ සංඛ්‍යාත) ප්‍රාර්ථනා අර්ථය; **සාධයන්තු** = සිද්ධ කෙරෙත්වා.

බැලුම් මාත්‍රයෙන් ඡප්පච්චය විභාගයන් (විභාග නය 6 ආකාරය) මා විසින් සම්පාදනය වූවා සේ මෙසේ සත්ත්වයාගේ ප්‍රාර්ථනීය අර්ථයෝ ද සම්පාදනය වෙත්වා!

ඉති සඞ්ඝරක්ඛිතමහාසාමිත්ථෙරෙන විරචිතං
වුත්තොදයප්පකරණං පරිනිට්ඨිතං.

සංඝරක්ඛිත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචිත
වුත්තෝදය ප්‍රකරණය නිමි.

---

[65] සමහර වුත්තෝදය ග්‍රන්ථයන්හි "සීලත්ථෙර" යනුවෙන් ද සඳහන් වේ.
[66] සාරිපුත්ත සංඝරාජ ස්වාමින්වහන්සේ සහ ගලතුරු විහාරවාසී සීල ස්වාමින්වහන්සේ යනුවෙන් මේ ගත් කතුවරයන් වහන්සේට ගුරුවරු දෙදෙනෙකි.

වුත්තාලංකාර නිගමනය

1. **වුත්තොදයස්ස කතලංකරවුත්තගන්ථො,**
තෙනෙව ලද්ධනුබලෙන සුබොධ යන්තු;
මෙත්තෙන සබ්බජනතායතිගාරවෙන,
නිට්ඨෙමි මෙ සුපකතං ඉද වුත්තගන්ථං.

වුත්තොදයස්ස, වුත්තෝදය නම් වූ ග්‍රන්ථයට; **කත,** කරන ලද, **අලංකාර,** අලංකාරය නමැති, **වුත්ත ගන්ථො,** (යම්) වුත්ත ග්‍රන්ථයක් වේ ද, **තෙන,** එයින් ; **ලද්ධ,** ලද **අනුබලෙන** එව, උපකාරයෙන් ම; **සුබොධං යන්තු,** (ගාථා බන්ධනය ගැන) මනා අවබෝධයකට පැමිණෙත්වා; **සබ්බජනතාය,** සියළු ජනතාව කෙරෙහි; **මෙත්තෙන,** මෛත්‍රී සිතින් (හා); **අතිගාරවෙන,** අති මහත් ගෞරවයෙන්; **මෙ,** මා විසින්; **සුපකතං,** මනාව කරන ලද; **ඉදං වුත්තගන්ථං,** මේ වුත්ත ග්‍රන්ථය; **නිට්ඨෙමි,** නිමාකරමි.

වුත්තෝදය නම් වූ පාලි ගාථා බන්ධන ග්‍රන්ථයට කරන ලද අලංකාරය නැමැති (වුත්තාලංකාරය නම් වූ) යම් ග්‍රන්ථයක් වේ ද, ඒ ග්‍රන්ථය අනුව කිරීමෙන් (අනුව යමින්) ගාථා බනධන ගැන අවබෝධයකට පැමිණෙත්වා (ඥානයක් ලබත්වා). සියළු ජනතාව කෙරෙහි මෙත් සිතින් සහ අති මහත් ගෞරවයෙන් මා විසින් කරන ලද මෙම වුත්ත ග්‍රන්ථය, නිමා කරමි.

2. **සාසනෙ ඉධ බුද්ධස්ස, ලභිත්වා උපසම්පදං;**
ධම්මචක්කෙ චරිස්සාමි, ලභිතුං අමතං ධුවං. (පථ්‍යාවත්ත ගාථා)

බුද්ධස්ස, බුදු රජාණන් වහන්සේගේ; **ඉධ සාසනෙ,** මෙම සාසනයෙහි; **උපසම්පදං,** උපසම්පදාව; **ලභිත්වා,** ලබා; **ධුවං,** ඒකාන්තයෙන්; **අමතං,** නිවන; **ලභිතුං,** ලබන්නට; **ධම්මචක්කෙ,** ධර්මයෙහි; **චරිස්සාමි,** හැසිරෙන්නෙමි.

මෙම බුද්ධ සාසනයෙහි උපසම්පදාව ලැබ ඒකාන්ත නිවන ලැබීම පිණිස (නිවන් පිණිස) ධර්මයෙහි හැසිරෙන්නෙමි.

3. **උග්ගහෙත්වාචරියෙහි, ලිඛිත්වා ඉද පොත්ථකං;**
පුඤ්ඤදනං කරිස්සාමි, නිබ්බානසුඛසිද්ධියා. (පඨම සකාර විපුලා ගාථා)

ආචරියෙහි, ආචාර්යවරුන්ගෙන්; **උග්ගහෙත්වා,** උගෙනගෙන; **ඉද,** මෙම; **පොත්ථකං,** ග්‍රන්ථය; **ලිඛිත්වා,** ලියා; **නිබ්බානසුඛසිද්ධියා,** නිවන් සුව පිණිස; **පුඤ්ඤ,** පින්; **දනං,** දීම; **කරිස්සාමි,** කරන්නෙමි.

ආචයීවරුන්ගෙන් ඉගෙනගෙන මෙම පොත ලියා නිවන් සුව පිණිස පින් අනුමෝදන් කිරීම කරන්නෙමි.

4. **ඉමිනා පුඤ්ඤතෙජෙන, සබ්බද සබ්බපාණිනො;**
සුජීවිතෙ ලභිත්වාන, දීඝායුකා භවන්තු තෙ. (පථ්‍යාවත්ත ගාථා)

ඉමිනා, මේ; **පුඤ්ඤ,** පින්; **තෙජෙන,** බලයෙන්; **සබ්බද,** සැමද; **සබ්බපාණිනො ච;** සියළු සත්වයො; **සුජීවිතෙ,** සැපවත් ජීවිත; **ලභිත්වාන,** ලබා; **තෙ,** ඔවුහු; **දීඝායුකා,** දීර්ඝායුෂ ඇත්තාහු, **භවන්තු,** වෙත්වා.

මේ පින් බලයෙන් සියළු සත්වයො සැමද සැප ජීවිත ලබා දීර්ඝායුෂ ඇත්තෝ වෙත්වා.

5. **නිරොගං ඛණසම්පත්තිං, ලභිත්වාව අනාගතෙ;**
පුඤ්ඤසෙට්ඨං කරිත්වාන, ලභන්තු අමතං වරං. (පථ්‍යාවත්ත ගාථා)

අනාගතෙ, අනාගතයෙහි; **නිරොගං,** නිරෝගී භාවය ද; **ඛණසම්පත්තිං,** ක්ෂණසම්පත්තිය ද; **ලභිත්වාව,** ලබා ම; **සෙට්ඨං,** ශ්‍රේෂ්ඨ වූ, **පුඤ්ඤං,** පින්; **කරිත්වාන,** කර; **වරං,** උතුම් වූ; **අමතං,** නිවන; **ලභන්තු,** ලබත්වා.

අනාගතයේ දී නිරෝගී බව ද, ඛණ සම්පත්තිය ද ලැබ ශ්‍රෙෂ්ට වූ පින් කර උතුම් වූ නිවන ලබත්වා.

වුත්තාලංකාරය නම් වූ වුත්තෝදය වර්ණනාව නිමි.

වුත්තාලංකාරය ප්‍රශ්නෝත්තර සංග්‍රහය

පළමු වෙනි පරිච්ඡේදය

1. වුත්තෝදය ග්‍රන්ථය ලියන සංඝරක්ඛිත මහාසාමී තෙරුන් වහන්සේ විසින් වුත්තෝදය ලිවීමට පළමු ව කුමක් නිසා "නමත්ථු" යනාදී ගාථා සතර ලීවේද?

   බුද්ධපණාමාදීනි පඤ්ච පුබ්බකිච්චානි දස්සෙතුං අවුත්තෙ වුත්තොදයචන්දෙගන්ථෙ "නමත්ථු" ත්‍යාදිකා චතස්සො ගාථා වුත්තා.

2. නමත්ථු යන පණාම ගාථාවට අර්ථය දෙන්න.

   ජනසන්තානතමසන්තානභෙදිනො - ජනානං ඛන්ධසන්තානෙ අනුසෙන්තියා මොහසංඛාතාය තමසන්තතියා විද්ධංසකස්ස, ධම්මුජ්ජලන්තරුචිනො - ධම්මසංඛාතෙන උජ්ජලන්තොභාසෙන සමන්නාගතස්ස, මුනින්දෙදුතරොචිනො - මුනින්දසංඛාතස්ස ඔදතොභාසෙන සමන්නාගතස්ස සක්කරාජස්ස වා චන්දස්ස වා (සම්පදනභූතස්ස), මෙ - මම, නමො - නමනං, අත්ථු - භවතු.

3. නමත්ථු යන ගාථා සතරෙහි ඇති පූර්වකෘත්‍යයන් 5 වෙන්කොට දක්වන්න.

   "නමත්ථු" ත්‍යාදිපඨමගාථාය බුද්ධපණාමං මුඛ්‍යතො දස්සෙති. තත්ථ "ධම්මුජ්ජලන්තරුචිනො" තිපදෙන ධම්මපණාමං ච "ජනසන්තානතමසන්තානභෙදිනො"ති පදෙන සංඝපණාමං ච පරියායෙන දස්සෙති.
   "පිංගලාචරියා" ත්‍යාදිදුතියගාථාය ඉමස්ස ගන්ථස්ස රචිතකාරණං (නිමිත්තං) දස්සෙති. "තතො මාගධභාසාය" ත්‍යාදිතතියගාථාය ගන්ථපරිමාණං දස්සෙති. (ගන්ථපරිමාණං නාම ගන්ථස්ස රචනාකාරො.) චතුත්ථගාථායං "වුත්තොදයෙනා" තිපදෙන ගන්ථනාමං දස්සෙති. "ආරභිස්ස"න්ති පදෙන පටිඤ්ඤං දස්සෙති.

4. මුනින්දෙදුතරොචිනො යන පදයෙහි මුනි යන පදය පහදන්න. මුනි, ඉන්ද, මුනින්ද යන ඒවායේ ද වෙනස පෙන්වා දෙන්න.

   මුනින්දෙති එත්ථ අගාරමුනි, අනාගාරමුනි, සෙක්ඛමුනි, අසෙක්ඛමුනි, පච්චෙකමුනීති පඤ්ච මුනයො හොන්ති. තත්ථ මුනීති පඤ්ච මුනයො ලබ්භන්ති. ඉන්දෙති බුද්ධමුනි ලබ්භති. මුනින්දෙති බුද්ධමුනියෙව ලබ්භති.

5. පිංගලාචරියාදයො යන්නෙහි ආදි ශබ්දයෙන් ගතයුතු ආචාර්‍යන්වහන්සේලා පෙන්වාදෙන්න.

   පිංගලාචරියාදයොති එත්ථ ආදිසද්දෙන යජදෙව, සුරාම, කාලීදාසාදයො ඡන්දෙසත්ථාචරියා ගය්හන්තෙ.

6. ඡන්දං යමුදිතං පුරා යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

   වජ්ජං ඡාදයතීති ඡන්දං. අක්ඛරපරිමාණෙසු වා සම්මොහං ඡින්දති අනෙනාති ඡන්දං. ඡන්දති හිලාදෙති වා මත්තාවණ්ණවිසෙසහීති ඡන්දං.

   සම්මොහසංඛාතස්ස වජ්ජස්ස පටිච්චන්නත්තා ඡන්දං නාම. අක්ඛරපරිමාණෙසු වා සම්මොහස්ස ඡින්දිතකාරණතො ඡන්දං නාම. මත්තාවණ්ණනියමිතෙහි වුත්තිවිසෙසෙහි වා මොදපනතො ඡන්දං නාම.

7. යථිච්ඡිතං, යදිච්ඡිතං, යතිච්ඡිතං යන පාඨ තුනෙහි වැරදි නිවැරදි භාවය පෙන්වීමට පදච්ඡේදයකොට අර්ථය පෙන්වා දෙන්න.

   යථිච්ඡිතන්ති එත්ථ යථා+ඉච්ඡිතන්ති පදච්ඡෙදෙ. යථා යථා ඉච්ඡිතං පයොජනං න සාධෙතීති අත්ථො. අයං සුද්ධපාඨො.

   යදිච්ඡිතන්ති එත්ථ යං+ඉච්ඡිතන්ති පදච්ඡෙදෙ. යං යස්මා කාරණා ඉච්ඡිතං. තතො තස්මා කාරණා න සාධෙතීති අත්ථො. අයම්පි සුද්ධපාඨො.

   යතිච්ඡිතන්ති එත්ථ යතො+ඉච්ඡිතන්ති පදච්ඡෙදෙ. යතො යස්මා කාරණා ඉච්ඡිතං. තතො තස්මා කාරණා න සාධෙතීති අත්ථො. අයම්පි සුද්ධපාඨො.

8. මාගධභාසාව කවරෙකුගේ භාවිතයක්ද? හේතුව පෙන්වා ත්‍රිපිටකයෙහි එයට කියන නාමය ලියන්න.

   මාගධභාසා මාගධානං සන්තකා හොති. මරම්මභාසා විය මරම්මිකානං. සා බුද්ධවචනභූතෙ පිටකත්තයෙ "පාළිභාසා"තිපි වුච්චති.

9. මත්තාවණ්ණවිභෙදනං යන පදයෙහි මත්තා සහ වණ්ණ යන්නෙහි අදහස ලියා මත්තාවණ්ණවිභෙදනං යන තනි පදයෙහි අර්ථය ලියන්න.

   මියතෙති මත්තා. අචිරට්ඨිතිකං වා හුත්වා මරති චවතීති මත්තා.

   අච්ඡරාසංඝාතවිජ්ජුනිච්ඡරණක්ඛණ අක්ඛිනිමීලසංඛාතෙන කාලෙන මිනිතබ්බතො මත්තා නාම. අචිරට්ඨිතිකං වාහුත්වා මරණතො චවනතො විනස්සනතො මත්තා නාම.

"ගො" ත්‍යාදිසද්දෙන අත්ථස්ස කථනතො වණ්ණො නාම.

මත්තාවණ්ණවිභෙදනන්ති එත්ථ ඉමස්මිං වුත්තොදයෙ ගණවිචාරණෙ මත්තාය වා වණ්ණෙන වා විචාරෙතබ්බන්ති වුත්තං හොති.

10. වුත්තෝදයේ එන ඡන්දස් වර්ග කීයද? ඒවා වුත්තෝදයට අනුව පහදන්න.

ගණඡන්දං මත්තාඡන්දං වණ්ණඡන්දං තිබ්බිධං ඡන්දං.

තෙසු නව අරියා ජාතිගාථායො ගණඡන්දං නාම ගණෙන නියමෙත්වා බන්ධිතබ්බතො.

නව වෙතාලියජාතිගාථායො ච සත්ත මත්තාසමකගාථායො ච මත්තාඡන්දං නාම මත්තාහි නියමෙත්වා බන්ධිතබ්බො.

සෙසා තනුමජ්ඣාදිගාථායො වණ්ණඡන්දං නාම වණ්ණෙහි නියමෙත්වා බන්ධිතබ්බො.

11. ඡන්දස් තුන් වර්ගයක් තිබෙන නමුත් මත්තාවණ්ණවිභේදනං යනුවෙන් මත්තාඡන්දස් හා වණ්ණ ඡන්දස් ගැන පමණක් ඡන්දස් ආචර්යන් වහන්සේලා විසින් කුමක් නිසා කියන ලද්දේ ද?

මත්තාය නියමිතෙ ගණෙනපි නියමිතං හොති. එවං ගණඡන්දස්ස මත්තාඡන්දෙ අන්තොගධත්තා ගණඡන්දං විසු අවත්වා "මත්තාවණ්ණවිභෙදනං" ති ද්වෙයෙව වුත්තා.

12. මත්තා වණ්ණ යන පදයන් පැහැදිලි කරන්න.

මත්තාති එත්ථ අට්ඨ සරාව ගය්හන්තෙ. න බ්‍යඤ්ජනානි. වණ්ණොති එත්ථාපි අට්ඨ සරාව ගය්හන්තෙ. න බ්‍යඤ්ජනානි සරස්ස එකමත්තත්තා බ්‍යඤ්ජනස්ස ච අඩ්ඩමත්තත්තා.

13. "ලබ්‍ය ලක්ඛණ සංයුත්තං" යන පදය පැහැදිලි කරන්න.

ලබ්‍යං නාම ලක්ඛීයතෙති ලක්ඛන්ති වචනත්ථෙන යස්සින්ද්‍රියානිත්‍යාදීනි විය අරියා තනුමජ්ඣාත්‍යාදීනි උදහරණානි හොන්ති.

ලක්ඛණං නාම ලක්ඛීයතෙ අනෙනාති වචනත්ථෙන සරාසරෙලොපංත්‍යාදීනි විය ගාථානං මත්තාවණ්ණ ගරුලහූනං නියමහෙතු සුත්තං.

14. කච්චායන, අලංකාර ග්‍රන්ථ ආදියේ මෙන් සූත්‍රයොද ඇති මුත් වුත්තෝදයයෙහි ඇති වෙනස කුමක්ද?

එත්ථ වුත්තොදයෙ කච්චායනඅලංකාරසත්ථෙසු විය සුත්තොදහරණානි න විසුං වුත්තානි. එකසදිසානෙව වුත්තානි. සුත්තස්සෙව උදහරණං, උදහරණමෙව සුත්තං හොති.

15. ලබ්‍යලක්ඛණසංයුත්තං - ලක්ඛ යනු සූත්‍රය යි. ලක්ඛණ යනු උදහරණයි. මෙයට කම්මධාරය සහ ද්වන්ද සමාස අතුරින් යොජිත කුමක්දැයි දක්වන්න.

ද්වීසු ද්වන්දකම්මධාරයසමාසත්ථනයෙසු කම්මධාරයසමාසත්ථනයො යුත්තො සුන්දරතරො සුත්තොදහරණානි විසුං අවත්වා සුත්තස්සෙව උදහරණභාවෙන වචනතො.

16. වුත්තෝදය ග්‍රන්ථයේ "පසන්නත්ථපදක්කමං" යන පදය විශේෂ වශයෙන් දක්වා ඇත්තේ ඇයි?

සයමෙව විරචිතෙ අලංකාරසත්තෙ විය සුත්තොදහරණානි විසුං න හොන්ති. සුත්තස්සෙව උදහරණභාවෙන පවත්තනතො "පසන්නත්ථපදක්කමං"ති විසෙසෙත්වා වුත්තං.

17. වුත්තෝදය ආචාර්යන් වහන්සේලා වුත්තොදය ලිවීමේ දී වෛදික චන්දස් අනුව නොගොස් ලෝකිය ඡන්දස් අනුව රචනා කළේ ඇයි?

ආකාසගමනාදිකස්ස පකාසනතො ගාථාබන්ධනස්ස අනුපකාරකත්තා වෙදිකඡන්දං අනිස්සාය, නක්ඛත්තවාදස්ස පකාසනතො ගාථාබන්ධනස්ස උපකාරකත්තා ලොකියච්ඡන්දං නිස්සාය අයං වුත්තොදයො ආචරියෙන කතො.

18. මෙම වුත්තෝදය ග්‍රන්ථයෙහි ගණ අටක් පමණක් දක්වා ඇත්තේ ඇයි?

ති අක්ඛරස්ස මජ්ඣාඡන්දස්ස පත්ථාරෙ කතෙ අට්ඨ පත්ථාරසංඛ්‍යා හොන්ති. තස්මා අට්ඨෙව ගණා ඉධ ආචරියෙන දස්සිතා.

19. මෙම ගණ අටෙන් ඉට්ඨ ගණ හා අනිට්ඨ ගණ බෙද දක්වන්න.

චත්තාරො භනයමගණා ඉට්ඨගණා හොන්ති.

චත්තාරො ජසරතගණා අනිට්ඨගණා හොන්ති.

20. මත්තාඡන්දස්හි භාවිතා වන ගණයන් දක්වන්න.

භජසා සබ්බගලහූ, පඤ්චිමෙසණ්ඨිතා ගණා.

අරියාදිම්හි විඤ්ඤෙය්‍යා.

අරියාදිම්හි මත්තාඡන්දෙ භජසගණා ච සබ්බගරුසබ්බලහුගණා චාති පඤ්චගණා සණ්ඨිතා හොන්ති.

21. මත්තාඡන්දසෙහි භජස යන ගණ තුන යෙදේ. අනෙක් ගණ පස නොයෙදෙන්නේ ඇයි?

භජසගණා චතුමත්තත්තා මත්තාඡන්දෙ වුත්තා.

අඤ්ඤෙසු පන පඤ්චසු යමරතගණා චතුමත්තාධිකා. න, ගණො ඨානචතුමත්තිකො. තස්මා මත්තාඡන්දෙ න වුත්තා. (වෙතාලියජාතියං පන ද්වෙ රයගණා විසුංභාවෙන වුත්තා.)

22. "අරියාදිම්හි විඤ්ඤෙය්‍යා" යනපදයේ අරියාදි යන්නෙහි ආදි සද්දයෙන් ගත යුත්තේ කුමක්ද?

මත්තාය අංකිතබ්බගාථායො දුතියපරිච්ඡෙදෙ දස්සිතගාථායො හොන්ති. තස්මා අරියාදිම්හීති එත්ථ ආදිසද්දෙන ගීති වෙතාලිය මත්තාසමකජාතියො ගහෙතබ්බා.

23. මත්තාවුත්තියෙදී ගණ පහක් දක්වන්නේ ඇයි?

චතුන්නං මත්තානං පත්ථාරෙ කතෙ පඤ්ච පත්ථාරඅංකා හොන්ති. තස්මා පඤ්චෙව ගණා අරියාදිම්හි ආචරියෙන දස්සිතා.

24. මත්තාඡන්දස්හි ගණයකට මාත්‍රා 4 ක් පමණක් ගෙන ඇත්තේ ඇයි?

චතුමත්තපරිමාණා චත්තාරො ලහවො ච ද්වෙ ගරවො ච අඤ්ඤමඤ්ඤං සමභාවෙන ඨිතා. මත්තාගණෙසු ච ආදිභූතගණා හොන්ති. තස්මා චතුමත්තා එකගණභාවෙන ගහිතා.

25. වුත්තෝදය ග්‍රන්ථයෙහි ගරු වර්ග කීයද? පහදන්න.

සංයොගාදිගරු දීඝගරු නිග්ගහීතගරු පාදන්තගරුචාති චත්තාරොගරවො හොන්ති.

තෙසු සංයොගස්ස පුබ්බෙ ඨිතක්ඛරො සංයොගාදිගරුනාම. පඤ්ච දීඝසරා ච තන්නිස්සිතබ්‍යඤ්ජනානි ච දීඝගරු නාම. නිග්ගහීතස්ස පුබ්බෙ ඨිතක්ඛරො නිග්ගහීතපරගරු නාම. ලහු වා හොතු ගරු වා හොතු ගාථාපාදන්තෙ ඨිතක්ඛරො පාදන්තගරු නාම.

26. සංයෝගයක් ඇතත් සංයෝගාදි ගරු නොගැනේ. උදහරණයක් ගෙන පහදන්න.

පාදදිසංයොගෙ පරෙ තස්ස සංයොගස්ස පුබ්බපාදන්තක්ඛරො ගරුකොති න දට්ඨබ්බො.

"විම්භයජනනී සඤ්ඤතක්‍රියා නු කං නානුරඤ්ජයතී"ති එත්ථ "ක්‍රි" ඉති සංයොගෙ පරෙහි පුබ්බපාදන්තො තකාරො ගරුකොති න දට්ඨබ්බො.

27. දස්සනරසානුභවනෙ යන ගාථාවේ "ත" අක්ෂරය ගරුවක් ලෙස නොගන්නේ ඇයි? පහදන්න.

දස්සනරසානුභවනෙත්‍යාදිගාථා අරියපථ්‍යාගාථා නාම. තස්සා ච නාම විසමපාද ත්‍යංසෙහි යුත්තා. යදි "තක්" ඉති ගරුකො හොති. ද්වාදසමත්තාධිකා භවෙය්‍ය. ද්වාදසමත්තාධිකාපි නාපි විපුලා ගාථා විපුලාගාථා ලක්ඛණෙන විසමත්තා. ඡන්දෙවිචිති න කරීයති. එවං ඡන්දෙලක්ඛණභෙදනතො ඊදිසෙ ඨානෙ පාදන්ත ගරුහි න ගහෙතබ්බං.

28. සංයොගාදිගරු නොයෙදෙන ගාථාවේ තේරුම ලියන්න.

නිබද්ධගෙධා - නිච්චං අනුරාගඅකුසලච්ඡන්දිකා, අයං ජනතා - ඊදිසො ජනසමූහො, ජිනස්ස - බුද්ධස්ස (ඡට්ඨීකම්මභූතස්ස), දස්සනරසානුභවනෙ - දස්සනරසස්ස අනුභවනස්මිං, නිබද්ධගෙධා - නිච්චං අභිකංඛිංතකුසලච්ඡන්දිකා, භවති - හොති, විම්භයජනනී - විම්භයං යනෙන්තී, සඤ්ඤතක්‍රියා - විනීතා කායවාචාකිරියා, කං - කීදිසං නාම ජනං, නානුරඤ්ජයතිනු - අනුරඤ්ජිතුං න සමත්තෙතිනු, අනුරඤ්ජයති එවාත්‍යාත්ථො.

29. සමුද්දෙසුරසාදිනං යන පදයෙහි ආදි සද්දයෙන් ගැනෙන සංකේතයන් මොනවාද?

සමුද්දෙ ජලති සින්ධු - යුගංවෙදණ්ණවාම්බුධිං;
ඉමෙ චතුසඞ්ඛ්‍යා ඉති - ලොකතො ධීමතා මතා.
උසු අක්ඛං පඤ්චසඞ්ඛ්‍යා - ඡසඞ්ඛ්‍යා තු රසො උතු;
සත්තසඞ්ඛ්‍යා හයො අස්සො - සරො ඉති මුනී මතා.
වසු භොගා අට්ඨසඞ්ඛ්‍යා - නවසඞ්ඛ්‍යා ගහො මතො;
හරො එකාදසො චාති - අක්කො තු ද්වාදසො මතො.

30. "පාදෙ ඤෙය්‍යා චතුත්ථංසො" ගාථාවකට පාද 4 ක් ඇතැයි කීවද හැම ගාථාවකටම පාද 4 ක් තිබේද? වුත්තෝදය එයට කුමක් දක්වයිද?

"පාදෙ ඤෙය්‍යා චතුත්ථංසො"ති ඉති යෙභුය්‍යවසෙන වුත්තං. ගාථායං ගාථායං න චතුප්පාද හොන්ති. කාසුචි ගාථාසු ඡ පාද. කාසුචි තයො පාද. වක්ඛති හි "පාදෙහි ඡහි තීහිතු"ති.

31. මෙම වුත්තොදය ග්‍රන්ථයෙහි යති කීයද? ඒවා පහදන්න.

පාදන්තයති පාදමජ්ඣයතීති ද්වෙයෙව යතියො හොන්ති. තත්ථ පාදන්තයති චතුන්නංපි පාදනං අන්තෙ ලබ්භති. පාදමජ්ඣයති පඨමදුතියපාදනං වා තතියචතුත්ථපාදනං වා මජ්ඣෙ ලබ්භති.

32. වුත්තොදය ග්‍රන්ථයෙහි ගාථා වර්ග කීයද? ඒවා පහදන්න.

සමගාථා අඩ්ඩසමගාථා විසමගාථා තිස්සො ගාථායො. තත්ථ යස්සා චත්තාරො පාද ගණගරුලහුයතිලක්ඛණතො සමා. සා සමගාථා නාම. යස්සා පඨමපාදෙ තතියපාදෙන දුතියපාදෙ ච චතුත්ථපාදෙන ගණගරුලහුයතිලක්ඛණතො සමො. සා අඩ්ඩසමගාථා නාම. යස්සා චත්තාරොපි පාද ගණගරුලහුයතිලක්ඛණතො අසමා. සා විසමගාථා නාම.

33. වුත්තොදයෙහි ඡන්දස් බෙද දක්වා ඇත්තේ කෙසෙද?

එකක්ඛරපාදතො පට්ඨාය යාව ඡබ්බීසතක්ඛරානි ඡන්දනි දස්සිතානි.

34. මෙම වුත්තොදය ග්‍රන්ථයෙහි දැකිය හැකි සහ නොදැකිය හැකි ඡන්දස් පැහැදිලි කරන්න.

ඉමස්මිං වුත්තොදයෙ ඡ අක්ඛරපාදතො පට්ඨාය යාව බාවීසඅක්ඛර ඡන්දනි දස්සිතානි. එකක්ඛර පාදතො පට්ඨාය යාව පඤ්චමක්ඛරඡන්දනි ච, තෙවීසතක්ඛරපාදතො පට්ඨාය යාව ඡබ්බීසතක්ඛරඡන්දනි ච න දස්සිතානි.

35. අක්ෂර 1 සිට 5 දක්වාත් 23 සිට 26 දක්වාත් ඇති ඡන්දස් වුත්තෝදය ග්‍රන්ථයෙහි නොදක්වා ඇත්තේ ඇයි?

අප්පචුරප්පයොගත්තා තානි ඉධ න දස්සිතානි.

36. මෙම වුත්තොදය ග්‍රන්තයෙහි නොදැක්වූ ඡන්දස්හි නම් දක්වන්න.

උත්තා අච්චුතා මජ්ඣා ච - පතිට්ඨා ච සුප්පතිට්ඨා;
විකති සංකති අති-කති උක්කති න දීපිකා.

37. මෙම වුත්තෝදය ග්‍රන්ථයෙහි දක්වා ඇති ඡන්දස්හි නම් දක්වන්න.

ගායත්‍යණ්හිකානුට්ඨුභා, බ්‍රහතී පන්ති තිට්ඨුභා
ජගතී අතිජගතී, සක්කරී අති සක්කරී.
අට්ඨ ඉට්ඨී ධිත්‍යා ධිති, කතිප්පකති ආකති
සත්තරසෙව චන්දනි, වුත්තොදයෙ පකාසිතා.

38. නානානාමොදිතං යන්නෙන් දක්වෙන්නේ මොනවාද?

උත්තාඅච්චුත්තාත්‍යාදිකානි ඡබ්බීසති ඡන්දෙනාමානි හොන්ති.

39. දණ්ඩකාචණ්ඩවුට්ඨ්‍යාදි යන පදයේ දණ්ඩක යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? ආදි සද්දයෙන් අදහස් වන්නේ මොනවාද?

ඡබ්බීසතක්ඛරතො අධිකක්ඛරා ගාථා "දණ්ඩකඡන්දං"ති ච "දණ්ඩකගාථා"ති ච වුච්චති. තීහි වා ඡහි වා පාදෙහි යුත්තා "ගාථා"ති වුච්චති.

ආදිසද්දෙන අණ්ණගාථා අණ්ණවගාථා බ්‍යාලගාථා ජීමූතගාථා ලිලාකරගාථා උදමගාථා සංඛගාථාති එවමාදිකා ගාථා ගහෙතබ්බා.

40. දණ්ඩක ඡන්දස්හි ගාථා ගණන කීයද? චණ්ඩගාථා පාදයක ගණ යෙදී ඇත්තේ කෙසේද? එක් පාදයක අක්ෂර කීයද?

දණ්ඩකඡන්දෙ චණ්ඩවුට්ඨිප්පයාතාදිකා අට්ඨවීසති ගාථායො සන්ති. චණ්ඩවුට්ඨිප්පයාතගාථාය එකෙකස්මිං පාදෙ ද්වෙ න, ගණා ච සත්ත ර, ගණා ච සන්ති. එකස්මිං පාදෙ සත්තබ්බීසක්ඛරා සන්තීති වදන්ති.

41. බුද්ධවචනයෙහි එන ගාථාවන්ගේ වුත්ත සහ ඡන්දස් යෙදී ඇති/ නැති දැයි පහදන්න.

මුනින්දවචනෙ නානානාමකානි ඡන්දනි ච නානානාමිකා ගාථායො ච නත්ථි. සාමඤ්ඤනාමතො ගාථා ඉච්චෙව නිද්දිට්ඨං.

අනන්තරොදිතං චඤ්ඤ - මෙතං සාමඤ්ඤනාමතො;
ගාථාඉච්චෙව නිද්දිට්ඨං - මුනින්දවචනෙ පන.
අයං සාධිකා පාළි.

42. "අනන්තරොදිතං චඤ්ඤ - මෙතං සාමඤ්ඤනාමතො;" යන පදයෙහි අඤ්ඤ යනු කුමක්ද? පහදන්න.

අඤ්ඤන්ති එත්ථ මත්තාවුත්තිඡන්දෙයෙව ගහෙතබ්බං. පඤ්චපරිච්ඡෙදෙ වත්ථගාථානං සදිසභාවෙන අනුට්ඨුභඡන්දසිචෙව, චතුත්ථපරිච්ඡෙදෙ උපචිත්තාදීනං අඩ්ඪසමගාථානං උපජාතිගාථායං ච, වෙතාලියපභෙදභූතානං අපරවත්තපුප්ඵිතග්ගගාථානං දින්නං මත්තාඡන්දසි ච අන්තොගධත්තා.

43. පළමු වෙනි පරිච්ඡේදයෙහි අන්තිම ගාථාවේ පළමු කොටසෙහි තේරුම ලියන්න.

එත්ථ - ඉමස්මිං වුත්තොදයඡන්දෙසත්ථෙ, විසෙසනාමතො - පථ්‍යාරියාතනුමජ්ඣාදිවිසෙසනාමතො, සබ්බතා - සබ්බෙන පකාරෙන, උචිතං - ගහෙතබ්බ, කිඤ්චි - මනං අප්පකං ගාථානාමං ච ඡන්දෙ නාමං ච, ගහෙත්වා - ආදය, අහං - සංසරක්ඛිතමහාසාමිභූතො අහං, දස්සයිස්සාමි - පකාසෙස්සාමි, තෙ - තානි නාමානි, ආවිභවිස්සරෙ - පාකටී භවිස්සන්ති.

44. ඡන්දස් හා වුත්ති අතර වෙනස ලියන්න.

වණ්ණනියමො ඡන්දෙ, ගරුලහු නියමො වුත්ති. අයමෙතාසං විසදිසො.

45. ඡන්දස් හා ගථා අතර වෙනස ලියන්න.

ගායත්‍යාදිපරිච්ඡෙදෙ කවීහි ඉච්ඡීයතෙති ඡන්දෙ. ගායති උච්චාරීයතීති ගාථා. අක්ඛරපදනියමිතං වා වචනං ගාථා. අයමෙතාසං විසදිසො.

46. "ඉති වුත්තොදයෙ" යන වචනයෙන් ගැනෙන්නේ කුමක්ද?

ඉති වුත්තොදයෙති එත්ථ වුත්ඤ්ච ඡන්දෙ ද වුත්තානීති විරූපෙකසෙසං කත්වා ගාථා ච ඡන්දෙ ච ලබ්භති.

47. "සඤ්ඤපරිභාසා නිද්දෙසො" යන්නෙහි සඤ්ඤ හා පරිභාස යන නිද්දේස යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වන්නේ කෙසේද?

සබ්බගලාත්‍යාදිකා අට්ඨගාථායො සඤ්ඤනිද්දෙසො නාම. අවසෙසා පාදමෙකක්ඛරාරබ්භත්‍යාදිකා චතස්සො ගාථායො පරිභාසානිද්දෙසො නාම.

දෙ වෙනි පරිච්ඡේදය

අරියා ජාතියො

1. මත්තාඡන්දස් වණ්ණඡන්දස් දෙකින් මත්තාඡන්දස් පළමු ව විස්තර කර ඇත්තේ ඇයි? එයිනුත් අරියා ජාතිය පළමු ව විස්තර කර ඇත්තේ ඇයි?

වත්තාවුත්තිවණ්ණවුත්තීසු මත්තාවුත්තිපුබ්බකත්තා මත්තාවුත්තිඡන්දං පඨමං දස්සෙති. මත්තාවුත්තීසුපි අරියාජාතිපුබ්බකත්තා අරියාජාතිංයෙව පඨමං දස්සෙති.

2. අරියා යන වචනයේ තේරුම ලියන්න.

යස්මා මත්තානියමෙන අරති පවත්තති. තස්මා අරියා නාම හොති. අථ වා අරියානං වාචාය සදිසත්තා අරියා නාම හොති.

3. අරියාගාථා වර්ග 9 ලියාදක්වන්න.

පථ්‍යාචෙව විපුලා ච - චපලා චපලා ච ද්වෙ;
ගීතූපගීති උග්ගීති - අරියා ගීති මානව.

4. සාමඤ්ඤඅරියාගාථාවක ගණලක්ෂණ විස්තර කරන්න.

පුබ්බඩ්ඩෙ ඡට්ඨො ගණො සබ්බලහු වා ජො වා. පාදන්ත ගරුයුත්තා. අඤ්ඤෙ ඡ ගණා. චතුසු විසමට්ඨානෙසු ජගණො න හොති.

අපරඩ්ඩෙ ඡට්ඨො ගණො එකොව ලහු. පාදන්ත ගරුයුත්තා. අඤ්ඤෙ ඡ ගණා. චතුසු විසමට්ඨානෙසු ජගණො න හොති. ඉදං අරියා සාමඤ්ඤගාථාය ලක්ඛණං.

5. අරියා සාමඤ්ඤගාථාවන්ගේ යති යෙදෙන අකාරය පහදන්න.

පුබ්බඩ්ඩෙ යදි ඡට්ඨො සබ්බලහුගණො හොති. ඡට්ඨගණස්ස පඨමක්ඛරෙ යති භවති. යදි සත්තමො සබ්බලහුගණො හොති. ඡට්ඨගණස්ස අන්තක්ඛරෙ යති භවති. අපරඩ්ඩෙ පඤ්චමො සබ්බලහුගණො හොති. චතුත්ථගණස්ස අන්තක්ඛරෙ යති භවති. ඉදං අරියාසාමඤ්ඤගාථාය යතිලක්ඛණං.

6. පථ්‍යාවෙහි අර්ථය ලියන්න.

යස්මා සාමඤ්ඤතො විසෙසෙන පථයතෙ උච්චාරීයතෙ. තස්මා පථ්‍යා නාම.

7. පථ්‍යාඅරියා ගාථාවගේ සම්පූර්ණ ගණ ලක්ෂණ දක්වන්න.

පුබ්බඩ්ඪෙ ඡට්ඨො ගණො සබ්බලහු වා ජගණො වා. පාදන්ත ගරුයුත්තා. අඤ්ඤෙ ඡ ගණා. චතුසු විසමට්ඨානෙසු ජගණො න හොති.

පඨමසංඛාතෙ විසමපාදෙ ද්වාදසමත්තිකෙසු තීසු ගණෙසු යති හොති. (ඉදං පච්චෙක ලක්ඛණං)

අපරඩ්ඪෙ ඡට්ඨො ගණො එකොව ලහු. පාදන්ත ගරුයුත්තා. අඤ්ඤෙ ඡ ගණා. චතුසු විසමට්ඨානෙසු ජගණො න හොති.

තතියසංඛාතෙ විසමපාදෙ ද්වාදසමත්තිකෙසු තීසු ගණෙසු යති හොති. (ඉදං පච්චෙක ලක්ඛණං)

8. අරියාගාථාවන්ගේ පූර්වාර්ධය හා අපරාර්ධය අතර වෙනස පෙන්වන්න.

යදි යත්ථ ඡට්ඨො ජගණො වා සබ්බලහුගණො වා හොති තං පුබ්බඩ්ඪං. යදි සොයෙව ඡට්ඨො එකොව ලහු. තං අපරඩ්ඪං.

9. විපුලා නාමයෙහි අර්ථය ලියන්න.

යස්මා පථ්‍යාතො විසිට්ඨෙ පකාරෙන උලති පවත්තති. තස්මා විපුලා නාම. අථ වා විසෙසෙන පුලභාවතො විපුලා නාම.

10. විපුලාඅරියා ගාථාවගේ සාමාන්‍ය අර්ථය ලියන්න.

පඨමතතියසංඛාතෙ විසමපාදද්වයෙ ද්වාදසමත්තිකෙසු තීසු ගණෙසු ද්වාදසමත්තිකෙ ගණත්තයෙ යති න හොති. (පඨමතතිය සංඛාතං විසමපාදද්වයං ගණත්තයං උල්ලඞ්ඝිත්වා පවත්තති.) ඉදං විපුලා අරියාගාථාය පච්චෙකලක්ඛණං.

11. විපුලා ගාථාවේ සහ පථ්‍යා ගාථාවේ ඇති වෙනස පහදන්න.

පථ්‍යාගාථාය පඨමතතියපාදෙසු පච්චෙකං ද්වාදසමත්තා හොන්ති. ඉමාය පන විපුලාගාථාය තෙරසමත්තා. පථ්‍යාය දුතියපාදෙ අට්ඨාරසමත්තා. ඉමාය සත්තරසමත්තා. තාය චතුස්සපාදෙ පණ්ණරසමත්තා. ඉමාය චුද්දසමත්තා. ඉච්චෙවං විසමපාදෙසු විපුලාගාථාය එකමත්තාධිකත්තාචෙව සමපාදෙසු ඌනෙකමත්තත්තා ච අයං පථ්‍යාතො විසෙසෙන පවත්තති.

12. විපුලාඅරියා ගාථාවෙහි පදච්ඡේදයේ දී "මුල්ලිං" හෝ "මුල්ලංඝි" යන පදදෙකෙන් කුමකින්ද? පහදන්න.

"මුල්ලඞ්ඝි"ති එත්ථ පදච්ඡෙදෙ කාතබ්බා. න "මුල්ලිං"ති එත්ථ. අරියාවිපුලාගාථායං හි විසමපාදෙ එකමත්තං වා ද්වත්තිමත්තං වා අතික්කමිත්වා භවති. එත්ථ පන එකමත්තං. තස්මා මුල්ලඞ්ඝීති එත්ථෙව පදච්ඡෙදෙ කාතබ්බො.

"ආදිමො ගණත්තයං උල්ලඞ්ඝිය භවෙ."ති සාධිකා පාළි.

13. අරියා ජාතියේ විපුලා වර්ග කීයද? පහදන්න.

මුඛවිපුලා, ජඝනවිපුලා, උභයවිපුලා, තිස්සො විපුලා. තත්ථ යදි පඨමපාදෙ ගණත්තයං අතික්කමිත්වා භවති, සා මුඛවිපුලා නාම. යදි තතියපාදෙ ගණත්තයං අතික්කමිත්වා භවති, සා ජඝනවිපුලා නාම. යදි පාදද්වයං ගණත්තයං අතික්කමිත්වා භවති. සා උභයවිපුලා නාම.

14. විපුලා ගාථාවන් සියල්ල කීයද? එය අරියා සහ ගීති යන දෙකට බෙද දක්වන්න.

විපුලාගාථායො අරියාජාතියං ද්විනවුත්‍යාධිකං එකසතං, ගීතිජාතියං අට්ඨසට්ඨ්‍යාදිකානි සත්තසතානි චාති එවං සට්ඨ්‍යාධිකානි නවසතානි හොන්ති.

15. චපලා ගාථාවගේ විශේෂ ලක්ෂණ ලියන්න.

දුතියචතුත්ථට්ඨානෙසු ජගණො. සො ජගණො පුබ්බාපරගරූනං මජ්ඣෙ භවති. ඉදං චපලාගාථාය පච්චෙක ලක්ඛණං.

16. "ගරුමජ්ඣගොජකාරො" යන්නෙහි ගරු මැද පිහිටි ජගණය යෙදෙන ආකාරය පහදන්න.

ජගණස්ස පුබ්බෙ සගණසබ්බගරුගණෙහි ච, ජගණස්ස පච්ඡා භගණ සබ්බගරුගණෙහිච භවිතබ්බන්ති අධිප්පායො සිද්ධො.

17. චපලාගාථාවගේ කොටස් කීයද? එකින් එක පහදන්න.

පථ්‍යාචපලා, මුඛවිපුලාචපලා, ජඝනවිපුලාචපලා, උභයවිපුලාචපලාති චතස්සො චපලා.

යදි චපලා ලක්ඛණං පථ්‍යාලක්ඛණං භජති, සා පථ්‍යාචපලා නාම. යදි මුඛවිපුලා ලක්ඛණං, මුඛවිපුලාචපලා නාම. යදි ජඝනවිපුලා ලක්ඛණං, ජඝනවිපුලාචපලා නාම. යදි උභයවිපුලා ලක්ඛණං, උභයවිපුලාචපලා නාම.

18. මුඛවිපුලා ගාථාවගේ සාමාන්‍ය ලක්ෂණ පෙන්වන්න.

පුබ්බඩ්ඪෙ චපලාගාථාලක්ඛණෙන සදිසං. අපරඩ්ඪෙ පථ්‍යාගාථා ලක්ඛණෙන සදිසං.

19. මුඛචපලා ගාථා කීයද? එකින් එක පහදන්න.

පථ්‍යාමුඛචපලා, මුඛවිපුලාමුඛචපලා, ජඝනවිපුලාමුඛචපලා, උභයවිපුලාමුඛචපලාති චතස්සො මුඛචපලා.

යදි මුඛචපලාලක්ඛණං පථ්‍යා ලක්ඛණං භජති, සා පථ්‍යාමුඛචපලා නාම. යදි මුඛවිපුලා ලක්ඛණං මුඛවිපුලාමුඛචපලා නාම. යදි ජඝනවිපුලා ලක්ඛණං, ජඝනවිපුලාමුඛචපලා නාම. යදි උභයවිපුලා ලක්ඛණං, උභයවිපුලාමුඛචපලා නාම.

20. ජඝනචපලා ගාථාවගේ සාමාන්‍ය ලක්ෂණ ලියන්න.

පුබ්බඩ්ඪෙ පථ්‍යාගාථා ලක්ඛණෙන සදිසං. අපරඩ්ඪෙ චපලාගාථා ලක්ඛණෙන සදිසං.

21. ජඝනචපලා ගාථාවන් කීයද? එකින් එක පහදන්න.

පථ්‍යාජඝනචපලා, මුඛවිපුලාජඝනචපලා, ජඝනවිපුලාජඝනචපලා, උභයවිපුලාජඝනචපලාති චතස්සො ජඝනචපලා.

යදි ජඝනචපලා ලක්ඛණං පථ්‍යා ලක්ඛණං භජති, සා පථ්‍යාජඝනචපලා නාම. යදි මුඛවිපුලා ලක්ඛණං, මුඛවිපුලාජඝනචපලා නාම. යදි ජඝනවිපුලා ලක්ඛණං, ජඝනවිපුලාජඝනචපලා නාම. යදි උභයවිපුලාලක්ඛණං, උභයවිපුලාජඝනචපලා නාම.

22. අරියාගාථාවන්ගෙ ගණන සංක්ෂෙප වශයෙන් හා විස්ථාර වශයෙන් දක්වන්න.

පථ්‍යාරියා, විපුලා, චපලා, මුඛචපලා, ජඝනචපලාති අරියාජාති ගාථායො පඤ්චවිධා හොන්ති. (අයං සංඛෙපො)

පථ්‍යාරියා එකා, විපුලා තිස්සො, චපලා චතස්සො, මුඛචපලා චතස්සො, ජඝනචපලාචතස්සො චාති සොළසවිධා හොන්ති. (අයං විත්ථාරනයො)

ගීති ජාතියො

23. ගීතිගාථාවගේ ගණ ලක්ෂණ පෙන්වන්න.

එත්ථ උභයෙසු දලෙසු ඡට්ඨො ජගණො. පාදන්තගරු යුත්තා. අඤ්ඤෙ ච ගණා. චතුසු විසමට්ඨානෙසු ජගණො න හොති.

පඨමතතියසංඛාතෙ විසමපාදද්වයෙ ද්වාදසමත්තිකෙසු තීසු ගණෙසු යති හොති. ඉදං ගීතිගාථාය ලක්ඛණං.

24. ගීතිගාථා ගණන කීයද? පහදන්න.

ගීතිගාථායො අට්ඨවිධා හොන්ති. (ගීතිගාථාහි අට්ඨවිධාහි භවිතබ්බං.)

ගීතිජාති හි නාම අරියාජාතිතො ජායති. අරියාජාතිං නිස්සාය ච ජායති. තස්මා නස්සයෙ නිස්සිතවොහාරෙන අට්ඨවිධා හොන්ති.

